සන්නසහිත

# මහ පිරිත් පොත් වහන්සේ

(සතර කමටහන්, සෙත් පිරිත්, දෙරකඩ අස්න
අනුශාසනාදිය සහිතයි.)

ආචාර්ය දෙවුන්දර වාචිස්සර
ස්වාමිපාදයන් වහන්සේ
විසින්
ශුද්ධකොට සකස් කරණ ලදී.



කොළඹ
සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

'මහා කීර්ති' ශෝක' බුද්ධත්වයේ'

පටුන

ප්‍රථම


1. සදේශාගමනං.
2. අභිසම්බෝධි සඳහන්.
3. සාමනේර ප්‍රශ්නය.
4. ඔව්තිං මනාරයේ.
5. පතාස වේනා.
7. උසබෙශ ප්‍රශ්නය.

12 මහා මංගල ප්‍රශ්නය
19 ජනන ප්‍රශ්නය.
29 කරණීය මෙත්ත ප්‍රශ්නය.
33.. ගිරිම විභාගං
39 රතන ප්‍රශ්නය.
42. ධම්මචක්කපවත්තන ප්‍රශ්නය.
46. රජුගේ සිරිත.
49 බ්‍රහ්ම විජිත
52 ප්‍රශ්නීය විජිත.
56 බවරානා ප්‍රශ්නය.


'පළමුවන කොටස'

බොජ්ඣංගය


66 මහාකස්සපස්ථවිර
72 මහා මොග්ගල්ලාන බොජ්ඣංගය
78 මහා චුන්ද ස්ථවිර ,,
83 ගිරිමානන්ද සූත්‍රය.
102 ඉසිගිලි සූත්‍රය.

115 ධම්මචක්කප්පවත්තන සූත්‍රය 2
139 මහා සමය සූත්‍රය
171 ආලවක සූත්‍රය.
181 කසිභාරද්වාජ සූත්‍රය
193 පරාභව සූත්‍රය.
204 වසල සූත්‍රය
219. සච්ච විභංග සූත්‍රය.

247 ආටානාටිය සූත්‍රය. 1
286 ,, ,, 2
313 [illegible] පිරිත.
,, බුද්ධානුස්සති භාවනාව
314 මෛත්‍රී ,,
315. අසුභ ,,
315 මරණානුස්සති ,,

# මහා පිරිත් පොත

316 [illegible] සංවේග වත්ථූනි.
" රත්නදාන ගාථා
316 ජින පඤ්ජරය.

319 ජය පිරිත.
320 අංගුලිමාල පිරිත.
320 ජය පිරිත.
321 ද්වේවිසි පිරිත

322. පිරිත් සංක්ෂිප්ත
323 ජය මංගල ගාථා
325 මහා ජය මංගල ගාථා
327 විහාර දර්ශන.

193. පරාභව සූත්‍රං.

204. වසල සූත්‍රං

219. සච්ච විභංග සූත්‍රය.

# සංඥාපනය

පරිත්‍රාණ ධර්මය වනාහි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ ත්‍රිපිටක ධර්මයට ම ඇතුළත් ධර්ම කොට්ඨාශයකි. අනුරාධපුර මහා විහාරවාසී වූ ත්‍රිපිටක ධාරී මහ තෙරුන්වහන්සේලා විසින් විශේෂයෙන් මනුෂ්‍යයන්ට මෙලොව වශයෙන් ඇති වන රෝග භය, අමනුෂ්‍ය භය, දුර්භික්ෂ භයාදිය සංසිඳවීම පිණිස බුදු රදුන් විසින් දේශනා කරණ ලද ඒ ඒ සූත්‍රාන්ත ධර්ම තුන් පිටකයෙන් ගෙන "පරිත්‍රාණ ධර්මය" නමින් මේ ධර්ම කොට්ඨාශය හඳුන්වන ලදී. මනුෂ්‍යයන්ට පැමිණෙන ඒ ත්‍රිවිධභය පමණක් නොව මෙලොව වශයෙන් ඇති වන අනිකුත් අපල උපද්‍රවාදිය ද නැති කරගැණිමේ අදහසින් ක්‍රමානුකූලවද, ශාසනානුලෝමවද සංග්‍රහ කරන ලද මේ ධර්ම කොට්ඨාශය දේශනා කරවීමෙන් හා හැදෑරීමෙන්ද, ශ්‍රවණය කිරීමෙන්ද බෞද්ධයෝ ස්වකීය ශාන්තිය සිද්ධකර ගණිත්. පිරුවානා පොත් වහන්සේ නමින් ප්‍රසිද්ධ මේ සම්භාවනීය ධර්ම පුස්තකයට සරණා ගමනය, දස සික්ඛාපද, සතර පස් විකුන්, ද්වත්තිංසාකාරය ඇතුළු බණවර සතරක්ද ඇතුළත් වේ අතිරේක වශයෙන් සතර කමටහන් ද, සෙත් පිණිස භාවිතා කරනු ලබන තවත් අවශ්‍යයයි සලකන පිරිත් දේශනාද, දෙරකඩ අසුන් අනුශාසනාදියද ඇතුළත් කොට තිබේ. ගුණසේන සහ සමාගමේ මහතුන්ගේ ආරාධනයෙන් මේ පොත ශුද්ධ කරදෙන ලදී.

මීට,

දෙවුන්දර වාචිස්සර

ගඞ්ගාරාමය,
හුනුපිටිය.

සන්න සහිත

# මහ පිරිත් පොත.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

---

## සරණාගමනං

1. බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සඞ්ඝං සරණං ගච්ඡාමි, දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි, දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි, දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි, තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි, තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි, තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි.

---

භාග්‍යවත්වූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ සර්වඥයන් වහන්සේට නමස්කාර වේවා.

## සරණාගමනය.

1. බුද්ධං සරණං ගච්ඡාමි, බුදුන් සරණකොට යෙමි; ධම්මං සරණං ගච්ඡාමි, ධර්මය සරණකොට යෙමි; සඞ්ඝං සරණං ගච්ඡාමි, (සර්වඥ පුත්‍රවූ) සඞ්ඝයා සරණකොට යෙමි; දුතියම්පි, දෙවනුවද, බුද්ධං සරණං ගච්ඡාමි, බුදුන් සරණකොට යෙමි; දුතියම්පි, දෙවනුවද; ධම්මං සරණං ගච්ඡාමි, ධර්මය සරණකොට යෙමි; දුතියම්පි, දෙවනුවද; සඞ්ඝං සරණං ගච්ඡාමි, සඞ්ඝයා සරණකොට යෙමි; තතියම්පි, තුන්වෙනුවද; බුද්ධං සරණං ගච්ඡාමි, බුදුන් සරණකොට යෙමි; තතියම්පි, තුන්වෙනුවද; ධම්මං සරණං ගච්ඡාමි, ධර්මය සරණකොට යෙමි; තතියම්පි, තුන්වෙනුවද; සඞ්ඝං සරණං ගච්ඡාමි: සඞ්ඝයා සරණකොට යෙමි.

### දසසික්ඛාපදානි.

**2. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං, අදින්නාදානා වේරමණී සික්ඛාපදං, අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං, මුසාවාදා වේරමණී සික්ඛාපදං, සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං, විකාලභෝජනා වේරමණී සික්ඛාපදං, නච්චගීතවාදිත විසූකදස්සනා වේරමණී සික්ඛාපදං, මාලාගන්ධවිලේපනධාරණමණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛා පදං, උච්චාසයන**

---

### දශශික්‍ෂාපද

2. පාණාතිපාතා, ප්‍රාණාතිපාතයෙන්; වේරමණී සික්ඛාපදං, විරමණ ශික්‍ෂාපදය; අදින්නාදානා, අදත්තාදානයෙන්; වේරමණී සික්ඛාපදං, විරමණ ශික්‍ෂාපදය; අබ්‍රහ්මචරියා, අබ්‍රහ්මචරියාවෙන්; වේරමණී සික්ඛාපදං, විරමණ ශික්‍ෂාපදය; මුසාවාදා, මුසාවාදයෙන්, වේරමණී සික්ඛාපදං, විරමණ ශික්‍ෂාපදය; සුරාමේරය මජ්ජපමාදට්ඨානා; මදයට ප්‍රමාදයට කාරණවූ රහමෙරින්; වේරමණී සික්ඛාපදං, විරමණ ශික්‍ෂාපදය; විකාලභෝජනා, විකාල භෝජනයෙන්; වේරමණී සික්ඛාපදං, විරමණ ශික්‍ෂාපදය, නච්ච, තමා නැටීමය; ගීත, තමා ගී කීමය; වාදිත, තමා බෙර ආදිය වාදනය; විසූකදස්සනා, යම්කෙනෙකුත් විසින් කරණ නෘත්‍යාදී විසුලුබැලීමය යන මෙයින්, වේරමණී සික්ඛාපදං, විරමණ ශික්‍ෂාපදය; මාලා, දෑසමන් ආදිවූ යම් කිසි මල් ජාතිය; ගන්ධ, සුගන්ධ ද්‍රව්‍යය; විලේපන, කසා සඳුන් ආදී අඹරා ඇඟ ආලේපකරන ඡවිරාග කරණය යන මෙකී දෙය; ධාරණ, පැලඳීමෙන් දැරීමය; මණ්ඩන, උනුතැන බල බලා නැවත

මහාසයනා වෙරමණී සික්ඛාපදං, ජාතරූපරජතපටිග්ගහණා වෙර මණී සික්ඛාපදං.

---

### සාමණේරපඤ්හා.

3. එකනාම කිං? සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා, ද්වේ නාම කිං? නාමඤ්ච රූපඤ්ච, තීණි නාම කිං? තිස්සො වේදනා, චත්තාරි නාම කිං? චත්තාරි අරියසච්චානි, පඤ්ච නාම කිං? පඤ්චුපාදානක්ඛන්ධා, ඡ නාම කිං? ඡ අජ්ඣත්තිකානි ආයතනානි, සත්ත නාම කිං? සත්ත බොජ්ඣඞ්ගා, අට්ඨ නාම කිං?

---

නැවත සැරසීමෙන් මණ්ඩනය; විභූසන, ඡවිරාග වශයෙන් ඉවසා සැරසීමය සත; ඨානා, කාරණයෙන්; වෙරමණී සික්ඛාපදං, විර මණ ශික්ෂාපදය; උච්චාසයන මහාසයනා, උසසුත් මහ අස්නෙන්; වෙරමණී සික්ඛාපදං, විරමණ ශික්ෂාපදය; ජාතරූපරජත පටිග්ගහණා, රන්, රිදී, මසු කහවණු පිළිගැන්මෙන්; වෙරමණී සික්ඛාපදං; විරමණ ශික්ෂාපදය.

---

### සාමණේරප්‍රශ්නය.

3. එකනාම කිං? (මේ ශාසනයෙහි) එක නම් කිම? සබ්බ-සත්තා, හැමසත්හු; ආහාරට්ඨිතිකා, ආහාර පසයෙන් සිටිති; ද්වෙ නාම කිං? දෙක නම් කිම? නාමඤ්ච රූපඤ්ච, නාමය හා රූපය යි, තීණි නාම කිං? තුණ නම් කිම? තිස්සො වෙදනා, තුන් වේදනාවෝය චත්තාරි නාම කිං? සතර නම් කිම? චත්තාරි අරිය සච්චානි,

අරියො අට්ඨඞ්ගිකො මග්ගො, නව නාම කිං? නව සත්තාවාසා, දස නාම කිං? දසහඞ්ගෙහි සමන්නාගතො අරහාති වුච්චතීති.

---

### ද්වත්තිංසාකාරො.

4. අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං, හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං, අන්තං අන්තගුණං උදරියං කරීසං, පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො, අස්සු වසා ඛෙළො, සිඞ්ඝාණිකා ලසිකා මුත්තං මත්ථකෙ මත්ථලුඞ්ගන්ති.

---

සතර ආර්‍ය්‍ය සත්‍යයෝය. පඤ්ච නාම කිං? පස නම් කිම? පඤ්චුපාදානක්ඛන්ධා, පස් උපාදානස්කන්ධයහ. ඡ නාම කිං? සය නම් කිම? ඡ අජ්ඣත්තිකානි ආයතනානි, ආධ්‍යාත්මික ෂඩායතනයහ. සත්ත නාම කිං? සත නම් කිම? සත්තබොජ්ඣඞ්ගා, සත් බොජ්ඣඞ්ගයහ. අට්ඨ නාම කිං? අට නම් කිම? අරියො අට්ඨඞ්ගිකො මග්ගො, අරී අටඟ මඟ; නව නාම කිං? නවය නම් කිම? නව සත්තාවාසා, සත්තවාස නවය යි. දස නාම කිං? දශය නම් කිම? දසහි අඞ්ගෙහි සමන්නාගතො, දසඟින් යුත් මහණතෙමේ; අරහාති වුච්චති, „රහතැයි කියනු ලැබෙයි.

පච්චවෙක්ඛණා.

5. පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටිඝාතාය, උණ්හස්ස පටිඝාතාය, ඩංස මකස වාතාතප සිරිංසප සම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපීන පටිච්ඡාදනත්ථං; පටිසංඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවාමි, නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා, බ්‍රහ්මචරියානුග්ගහාය,

---

ද්වත්තිංසාකාරය.

4. ඉමස්මිං කායෙ, (ව්‍යාමමාත්‍ර සඞ්ඛ්‍යාතවූ) මේ ශරීරයෙහි; කෙසා, කෙසයෝ; අත්ථි, ඇත; ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; ලොමා, ලොමයෝද; අත්ථි ඇත; (එසේම) නඛා, (දෙඅත් දෙපාහි විසි) නිය පොත්තෝ ද; දන්තා, දන්තයෝද; තචො, සමෙක්ද; මංසං මස්පිඬුද; නහාරු; නහරද; අට්ඨී, ඇටද; අට්ඨිමිඤ්ජා ඇටමිදුලුද; වක්කං, වකුගඩුවක්ද; හදයං, හෘදයමාංසයෙක්ද, යකනං; අක්මාවෙක්ද; කිලොමකං, දලබෙක්ද; පිහකං, බඩදිවෙක්ද, පප්ඵාසං, පපුවෙක්ද; අන්තං, බඩවැලෙක්ද; අන්තගුණං, (ඒ බඩවැල බැඳ සිටිනා) අතුණු බහනෙක් ද; උදරියං, (කෑ අහර සිටිනා උදරයෙක් හෙවත්) නොපැසුනු ආහාරයද; කරීසං, අහර මලය; පිත්තං, පිතය; සෙම්හං, සෙමය; පුබ්බො, පූයාය (හෙවත්) සැරවය; ලොහිතං, ලෙහෙය; සෙදො, සෝදියය; මෙදො, මේදතෙලය; අස්සු, කඳුලුය; වසා, වුරුණු තෙලය; ඛෙලො, කෙලය; සිඞ්ඝානිකා, මුකුණුය (හෙවත්) සොටුය; ලසිකා,(සන්ධි අතුරෙහි සිටිනා)

ඉති පුරාණඤ්ච වෙදනං පටිහං
ඛාමි, නවඤ්ච වෙදනං න උප්පා
දෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති,
අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති
පටිසඞ්ඛායොනිසො සෙනාසනං
පටිසෙවාමි, යාවදෙව සීතස්ස පටි
ඝාතාය, උණ්හස්ස පටිඝාතාය,
ඩංස මකස වාතාතප සිරිංසප සම්
ඵස්සානං පටිඝාතාය, යාවදෙව
උතුපරිස්සයවිනොදනං පටිසල්ලා

---

සඳමිදුලුය; මුත්තං, මූත්‍රය; මත්ථකෙ, හිසමුදුනෙහි; මත්ථලුඞ්ගන්ති, හිස්මොලය යි (යන මේ දෙතිස් කොටස් කුණපයෝ මේ සිරුරෙහි ඇත්තාහ.)

---

**පස් විකුම්.**

5. පටිසංඛායොනිසො, නුවණින් පරීක්ෂාකොට (හෙවත් සීත නැසීම් ආදිවූ ඒ ඒ ප්‍රයොජන වෙන් වෙන් කොට සලකා); චීවරං පටිසෙවාමි, සිවුරු වළඳිමි; යාවදෙව, යම්තාක්; සීතස්ස පටිඝාතාය, (ඇතුළත්හි ධාතු කුපිතතාවයකින් හෝ පිටත ඍතුපරිණාමයකින් හෝ උපන්) සීත නසන පිණිස; උණ්හස්ස පටිඝාතාය (එබඳුවූ) උෂ්ණ නසන පිණිස; ඩංස (ඩැහැලේබොන) ඇටමැසිය; මකස, (විද ලේ බොන) මදුරුය; වාත, සුළඟය; ආතප, අව්වය; සිරිංසප, (සර්පාදිවූ) දීඝජාතිය යන මොවුන් සම්බන්ධවූ; සම්ඵස්සානං, ස්පර්ශයන්ගේ; පටිඝාතාය, නසන පිණිස; (හෙවත් මෙකී උවදුරු පැමිණි පැමිණිවිට නසනු පිණිස යාවදෙව, යම්තාක්ම, (හෙවත් හැමවේලෙහිම); හිරිකොපිණ, ලජ්ජා නසන තැන; පටිච්ඡාදනත්ථං, මුවහකරණ පිණිස; (සිවුරු වැළඳගනිමි.)

නාරාමත්ථං, / පටිසඞ්ඛායොනිසො ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි, යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතායාති.

---

දසධම්ම සුත්තං 7

1. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ

---

පටිසංඛායොනිසො, නුවණින් පරීක්ෂාකොට (හෙවත් ආහාර වැළඳීමෙන් වන ඒ ඒ ප්‍රයොජන වෙන් වෙන් කොට සලකා); පිණ්ඩපාතං පටිසෙවාමි, පිඬු වළඳිමි; නෙවදවාය, (ගම් දරුවන්සේ) කෙළනා සඳහා නොවළඳමි; න මදාය, බල මද පුරුෂමද වඩනා පිණිසද නො වළඳමි; න මණ්ඩනාය, අලඞ්කාර පිණිස නො වළඳමි; න විභූසනාය, සැරසීම පිණිස නො වළඳමි; යාවදෙව, යම්තාක්ම; ඉමස්ස කායස්ස, මේ ශරීර ප්‍රතිබඬවූ ජීවිතයාගේ; ඨිතියා, සිටීම පිණිස; යාපනාය, යැපනය පිණිස; විහිංසූපරතියා, සාපෙළහරණ පිණිස; බ්‍රහ්මචරියානුග්ගහාය, බඹසර සපයන පිණිස, මේ අහර වළඳමි; ඉති, මෙසේ; පුරාණඤ්ච වෙදනං (නොවැළඳීමෙන් වන) පරණදුක් වේදනාව, පටිහංඛාමි, නසන්නෙමි; නවඤ්ච වෙදනං, (වඩා වැළඳුම් පසයෙන් උපදනා) අලුත් දුක්වේදනාව; න උප්පා-දෙස්සාමි, නූපදවමි; මෙ, මට: යාත්‍රා ච, සතර ඉරියව් සෙමෙහි පැවැත්මද; අනවජ්ජතා ච, නිවරදබැව්ද, ඵාසුවිහාරො ච, (සැප අහර පමණ දැන වැළඳීමෙන් කායබල ලදින්) සෙහෙන් විසීමද; භවිස්සති, වන්නේය යි; (සලකා මේ අහර වළඳිමි.)

භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච: දස ඉමෙ භික්ඛවෙ ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බා. කතමෙ දස?

2. වෙවණ්ණියම්හි අජ්ඣුපගතොති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; පරපටිබද්ධා මෙ ජීවිකාති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; අඤ්ඤො මෙ

---

යොනිසො, නුවණින්; පටිසඞ්ඛාය, සීත නැසීම ආදි ඒ ඒ ප්‍රයොජන වෙන් වෙන් කොට සලකා, සෙනාසනං, මේ සෙනසුන්; පටිසෙවාමි, වැළඳගනිමි; යාවදෙව; යම්තාක්; සීතස්ස පටිඝාතාය, (සීගතු ආදි) සීත පීඩා නසන පිණිස; උණ්හස්ස පටිඝාතාය, (ගිනිරුස් ආදී) උෂ්ණ පීඩා නසන පිණිස; ඩංස, ඩැහැ ලේ බොන මැස්සන්; මකස, විද ලේ බොන මදුරුවන්, වාත, සුළඟ; ආතප, අව්ව; සිරිංසප, දීඝ ජාති සර්පාදීහුය යන මෙකිවවුන්ගේ; සමථස්සානං, දුක් පහස්, පටිඝාතාය. නසන පිණිස; යාවදෙව, හැමවේලෙහිම; උතු, ගිම් වැසි හිම වලායෙන් ඇති සෘතුදු; පරිස්සය, (සිංහ ව්‍යාඝ්‍රාදි භයද) රාගවෙෂාදි උපද්‍රවද; විනොදනං, නසන; පටිසල්ලානාරාමත්ථං, සිත එකඟ කිරීමෙහි ඇලෙන පිණිස; සෙනාසනං, සෙනසුන්; පටිසෙවාමි, වැළඳගනිමි.

යොනිසො, නුවණින්; පටිසංඛාය (ඒ ඒ ප්‍රයෝජන වෙන් වෙන් කොට) සලකා; ගිලානපච්චය, යම් ගිලන්හුගේ රොගසන්-හිඳුම්; භෙසජ්ජ, වෙදහු විසින් අනුදන්නාලද; පරික්ඛාරං, (මේ) ගිලන්පස බෙහෙත් පිරිකර; පටිසෙවාමි, වළඳමි, යාවදෙව, හැම වේලෙහිම; උප්පන්නානං, උපන්; වෙය්‍යාබාධිකානං, සිරුරු පෙළෙන්නාවූ; වෙදනානං, දුක්වෙදනාවන්; පටිඝාතාය, නසන පිණිස; අබ්‍යාපජ්ඣ, නිරොගිබැව්, පරමතාය, උතුම් බැවින්; (මේ ගිලන්පස බෙහෙත් පිරිකර වැළඳගණිමි.)

ආකප්පා කරණීයොති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; කච්චි නු ඛො මෙ අත්තා සීලතො න උපවදතීති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; කච්චි නුඛො මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතො න උපවදන්තීති. පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; සබ්බෙහි මෙ

---

## දසධම්ම සූත්‍රය

1. එවං මෙ සුතං—මෙ, මා විසින්, එවං සුතං, මෙසෙයින් අසනලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවත්වූ බුදුරජතෙම; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, (ජෙත නම් රාජකුමාරයාගේ උයන්හි කරණලද බැවින් - ජෙතවන) නම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬු මහ සිටාණන්ගේ අරම්හි; විහරති වැඩවාසය කර වදරණසේක; තත්‍රඛො, එකිලා (හෙවත්) එකල්හි; භගවා, බුදුරජතෙම; භික්ඛවෝ ඉති, මහණෙනි යි කියා; භික්ඛූ ආමන්තෙසි, භික්ෂූන්ට ආමන්ත්‍රණයකර වදාළසේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු, භදන්තෙ ඉති, ස්වාමින්වහන්සැයි කියා; භගවතො, භාග්‍යවත්හට; පච්චස්සොසුං, ප්‍රතිවචන දුන්නාහුය; භගවා, බුදුරජතෙම; එතදවොච, මේ (මතු කියනුලබණ තෙපුල) වදාළසේක. භික්ඛවෙ, මහණෙනි; ඉමෙ දසධම්මා, මේ දශධර්මයෝ; පබ්බජිතෙන, (ගිහිගෙය හැර) පැවිදිවූවහු විසින්; අභිණ්හං පච්ච-වෙක්ඛිතබ්බා, එක්වන් සැලකියයුත්තාහුය; කතමෙ දස, ඒ දශ ධර්මයෝ කවුරුදයත්?—

2. වෙවණ්ණියං, විවර්ණ බවට; අජ්ඣුපගතො අම්හිති, පැමිණියෙමියි; පබ්බජිතෙන, පැවිදිවූවහු විසින්; අභිණ්හං පච්චවෙක්ඛි-තබ්බං; නිරන්තරයෙන් සැලකියුතු; මෙ ජීවිකා, මාගේ දිවිපැවැත්ම; පරපටිබද්ධා ඉති, පරා පිළිබඳය යි; පබ්බජිතෙන, පැවිදිවූවහු විසින්,

පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවොති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; කම්මස්සකොම්හි කම්මදායාදො, කම්මයොනි කම්මබන්ධු කම්ම පටිසරණො, යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා, තස්ස දායාදො භවිස්සාමීති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; කථම්භූතස්ස මෙ රත්තිංදිවා වීතිපතන්තීති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛි

---

අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, එක්වත් සැලකියයුතු; මෙ, මා විසින්; අඤ්ඤ ආකප්පො; අන්‍යවූ ආකල්පයෙක්; කරණීයො, කටයුතුය සි; පබ්බජිතෙන, පැවිද්ද විසින්; අභිණ්හං, සතතයෙන්; පච්ච වෙක්ඛිතබ්බං, පස්විකියයුතු; කච්චිනුඛො, කිම හෝ; මෙ අත්තා, මාගේ සිත; සීලතො, සීලයෙන්; න උපවදතීති, උපවාද නො කෙරේ හෝයි; පබ්බජිතෙන, පැවිදියක්හු විසින්; අභිණ්හං පච්ච වෙක්ඛිතබ්බං, එක්වත් සැලකියයුතු; කච්චිනුඛො, කිම හෝ; මං, මා; අනුවිච්ච, විචාරා; විඤ්ඤූ සබ්‍රහමචාරී, නුවණැති සබ්‍රම්සරහු; සීලතො න උපවදන්තීති, ශීලයෙන් පරිභව නොබෙණෙද්ද්ශ් හෝයි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, එක්වත් සැලකියයුතුයි; පියෙහි, ප්‍රියවූ – ඉෂ්ටවූ; මනාපෙහි, මනාප වූ, සිත්කලූවූ – මනවඩන්නාවූ; සබ්බෙහි, හැමදෙනා කෙරෙන්; මෙ, මාගේ; නානාභාවො විනාභාවොති; ජාතියෙන් නානා භාවය මර ණින් විනාභාවය සි; පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, මහණවූවහු විසින් නිති සැලකියයුතු; කම්මස්සකොම්හි, කම්පිළිබඳ යෙම් (හෙවත්) කම්හු අයිතියෙමි: කම්මදායාදො, කම්හු හිමියෙමි ලබෙන්, කුමිය දායාදකොට ඇත්තෙමි; කම්මයොනි, කම්යම

තබ්බං; කච්චි නුබොහං සුඤ්ඤාගාරෙ අභිරමාමීති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; අත්ථි නුබො මෙ උත්තරිමනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසො අධිගතො, සොහං පච්ඡිමෙ කාලෙ සබ්‍රහ්මචාරීහි පුට්ඨො න මඞ්කු භවිස්සාමීති, පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං; ඉමෙ ඛො

---

යොනිකොට ඇත්තෙමි (හෙවත්) උපකරණකොට ඇත්තෙමි; කම්මබන්ධු, කර්මය නෑකොට ඇත්තෙමි; කම්මපටිසරණො, කර්මහු පිළිසරණකොට ඇත්තෙමි; කල්‍යාණං වා, යහපත්වූ හෝ; පාපකං වා, පවිටු නොමැනවක් හෝ, යං කම්මං කරිස්සාමි, (තුන්දෙරින්) යම් කර්මයක් කෙරෙම්ද; තස්ස දායාදො භවිස්සාමීති, ඒ කර්මය විසින් දෙනලද්ද අයත්මියි; පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, පැවිද්ද විසින් එක්වන් සැලකියයුතු; – කථම්භූතස්ස මෙ, කෙසේ වූ මට; රත්තිං දිවා, රෑ දවල්හු; වීතිපතන්තීති, ඉක්මෙත් ද්‍යේ හෝයි; පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, මහණහු විසින් නිති සැලකියයුතු,—කච්චිනුබොහං, කිම හෝ මම; සුඤ්ඤාගාරෙ, ජනයා විසින් සිස්වූ පියසෙහි; අභිරමාමිති, සියලු ඉරියව්වෙහි හුදකලාව ඇලෙම්දෝහෝයි; පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, මහණහු විසින් එක්වන් සැලකියයුතු;—මෙ, මාගේ සතන්හි; උත්තරිමනුස්සධම්මා, උතුරු මිනිස්දම්; අත්ථිනුබො, ඇද්දෝ හෝයි; අලමරිය ඤාණදස්සන විසෙසො අධිගතො, ආර්‍ය්‍යඥාන දර්ශනයට පොහොසත් විශෙෂයෙක් ලබනලද්දේ හෝ; සොහං, හේ මම; පච්ඡිමෙකාලෙ, මරණ කල්හි; සබ්‍රහ්මචාරීහි, සබ්‍රම්සරුන් විසින්; පුට්ඨො, විචාරණ ලද්දෙම්; නමඞ්කුභවිස්සාමීති, කරනොබාම් ද්‍යේහෝයි; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; අභිණ්හං පච්ච

භික්ඛවෙ දස ධම්මා පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බාති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

---

### මහා මංගල සුත්තං.

1. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්-තවණ්ණා කෙවලකප්පං ජෙතව-

---

වෙක්ඛිතබ්බං, එක්වත් සැලකියයුතු; භගවා, බුදුරජහු; ඉදං, මෙය; අවොච, මෙසේ වදාළසේක; අත්තමනා, ප්‍රියමනාපවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂුහු; භගවතො, බුදුරජහුගේ; භාසිතං, මේ ධර්ම දෙශනාවට; අභිනන්දුං ඉති, විශෙෂයෙන් සතුටු වූවාහුයි.

### මහා මඞ්ගල සූත්‍රය.

1. මෙ, මා විසින්; (මේ සූත්‍රය) එවං සුතං, මෙයාකාරයෙන්; අසන ලදී. එකං සමයං, එක් සමයෙක්හි; භගවා, බුදුරජහු; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවනනම් වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬු මහසිටුහුගේ විහාරයෙහි විහරති, වැඩවාසයකරවදාරනසේක. අථ ඛො, ඉක්බිත්තෙන්; අඤ්ඤතරා දෙවතා, නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ එක්තරා දිව්‍ය පුත්‍රයෙක්; අභික්කන්තාය රත්තියා, (ඉකුත් රාත්‍රියෙහි හෙවත්) ප්‍රථමයාමය ඉකුත් කල්හි; අභික්කන්තවණ්ණා, අභිරූපවූ ඡවි වර්ණණ ඇත්තේ; කෙවලකප්පං ජෙතවනං, සියලු ජෙතවනය

.න්තං ඔභාසෙත්වා, යෙන භගවා තෙනු පසඞ්කමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි, ඒකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.–

2. බහූ දෙවා මනුස්සා ච
මඞ්ගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං
බ්‍රෑහි මඞ්ගලමුත්තමං.

---

(ගාත්පසිත්) ඔභාසෙත්වා, බබුළුවා; යෙන, යම්තැනෙක්හි; භගවා, බුදුරජහු වෙසෙත්ද, තෙන, එතන්හි; උපසංකමි, එළඹිය; උප සංකමිත්වා, (භාග්‍යවත්හු සමීපයට) එළඹ; භගවන්තං, අභිවාදෙත්වා; (භාග්‍යවත්වූ) බුදුරජහු වැඳ; එකමන්තං, එක්පසෙක; අට්ඨාසි, සිටියේය; එකමන්තං ඨිතාඛො, එකත්පස්ව සිටියාමවූ; සාදෙවතා, ඒ දිව්‍යපුත්‍රතෙම; භගවන්තං, භාග්‍යවත්වූ බුදුරජහට; ගාථාය, ග්‍රථිත වචනයකින්; අජ්ඣභාසි, දැක්වී. (කිසේදයත්?)

2. සොත්ථානං, (තමන්ට ඓහලෞකික පාරලෞකික සියලු) කුශල ධර්මයන්ගේ ප්‍රාප්තිය (හෙවත්) පැමිණීම, ආකඞ්ඛමානා, කැමතිවන්නා වූ (හෙවත්) පතන්නාවූ; බහූ, බොහෝවූ; දෙවා, දෙවියෝද, මනුස්සා ච, මනුෂ්‍යයෝද; මඞ්ගලානි, අභිවෘද්ධියට කාරණයන්; අචින්තයුං, සිතූහ; (ඒ දෙවියන්ගේ අනුමතියෙන් දූතැ මනුෂ්‍යයන්ට අනුග්‍රහයෙන්ද මා විසින් විචාරණලද භාග්‍ය වතුන් වහන්සේ අප හැමදෙනාහට එකාන්ත හිත සුව එළවන බැවින්) උත්තමං මඞ්ගලං, (උතුම් මඟුල් වීද ඒ) උතුම් මඟුල් (අපට අනුකම්පා පිණිස;) බ්‍රෑහි, දෙසා වදාළ මැනවි හෙවත් ප්‍රකාශකොට වදාළ මැනවැයි දූත්වී; (මෙසේ දිව්‍යපුත්‍රයාගේ වච නය අසා මඟුල් වදාරන්නාවූ බුදුරජතෙම.)

**3\. අසෙවනාච බාලානං**
**පණ්ඩිතානඤ්ච සෙවනා**
**පූජාච පූජනීයානං**
**එතං මඞ්ගලමුත්තමං.**

**4\. පතිරූපදෙස වාසො ච**
**පුබ්බෙ ච කතපුඤ්ඤතා**
**අත්තසම්මාපණිධි ච**
**එතං මඞ්ගලමුත්තමං.**

---

3\. බාලානං, (ආත්මාර්ථ පරාර්ථ සාධක ප්‍රඥා ජීවිකාරහිත පූරණ කාශ්‍යපාදී) අඥාන සත්වයන්ගේ; අසෙවනාච, (යම්) භජනය නොකිරීමෙක් ඇද්ද - නොසෙවීමෙක් ඇද්ද; පණ්ඩිතානඤ්ච, (ආත්මාර්ථ පරාර්ථ සාධක ප්‍රාඥගති ඇති බුඬ ප්‍රත්‍යෙක බුඬාදී) ප්‍රාඥයන්ගේ; සෙවනා, යම් සේවනයෙක් - එළඹීමෙක් ඇද්ද; පූජනීයානං, බුඬාදී ආයර්‍යයන්ට (කළමනා) පූජාච, (ප්‍රත්‍ය ප්‍රතිපත්ති ආදී යම් පූජාවෙක් ඇද්ද යත; එතං, මේ තෙම; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

4\. පතිරූප දෙස වාසො ච, (යම් ගම් නියම්ගම් රාජධානියෙක්හි තුනුරුවන් වොරජිද, සිව්වණක් පිරිත් හැසිරෙද්ද, දානශීලාදී දශ පුණ්‍ය ක්‍රියා වස්තූන් පවතිද්ද එසේවූ) සුදුසු පියෙස්හි විසීමද; පුබ්බෙච කත පුඤ්ඤතා, අතීත ජාතියෙහි) බුද්ධප්‍රත්‍යෙක බුද්ධාදීන් අරහයා) කරණලද පින් ඇති බවද; අත්තසම්මා පණිධිච, (දුශ්ශීල අශ්‍රද්ධා මත්සරිවූ තමා ශීල ශ්‍රද්ධා ත්‍යාග සම්පත්තියෙහි) මනාකොට පිහිටීමද යත; එතං, මේ තෙම; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

5. බාහුසච්චඤ්ච සිප්පඤ්ච
විනයො ච සුසික්ඛිතො
සුභාසිතා ච යා වාචා
එතං මඞ්ගලමුත්තමං.

6. මාතා පිතු උපට්ඨානං
පුත්තදාරස්ස සඞ්ගහො
අනාකුලා ච කම්මන්තා
එතං මඞ්ගලමුත්තමං.

---

5. බාහුසච්චඤ්ච, බහුශ්‍රැත බවද; සිප්පඤ්ච, (අකුසලකම්පථ විරහිත මණිකාර සුවණ්ණකාරාදි අගාරික ශිල්පය, චීවර විචාරණ සිබ්බනාදී ප්‍රව්‍රජ්‍යාර්හවූ ශිල්පය යන ද්විප්‍රකාර ශිල්පදැන්මද; විනයොච සුසික්ඛිතො, (දශ අකුශල කම්පථ වර්ජිතව) මනාකොට හික්මෙන ලද (දශ කුශල කම්පථ සඞ්ඛ්‍යාත අගාරිය විනය, අඛණ්ඩ අච්ඡිද්‍රාදි වශයෙන් මනාකොට හික්මෙන ලද චතුපාරිසුද්ධි සීල සඞ්ඛ්‍යාත අනගාරිය විනය යන ද්විප්‍රකාර) විනය ඇති බවද; සුභාසිතාච යාවාචා, (මුසාවාදාදී චතුර්විධ වාග්දුශ්චරිත විරහිත නිර්වාණ ප්‍රාප්ත කර්ණ රසායන) සුභාෂිතවූ යම් තෙපුලෙක් ඇද්ද යන; එතං, මේ තෙම; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

6. මාතා පිතු උපට්ඨානං, (වන්දන මාතන පාද ධොවන සම්බාහනා දී වශයෙන්ද, සිවුපසය සම්පාදනය කිරීමෙන්ද,) මවුපියන්ට කරන උපකාර උපස්ථානද; පුත්තදාරස්ස සඞ්ගහො, අඹුදරුවන්ට කළමනා (දාන ශීල සමාදාන ප්‍රිය වචන වස්ත්‍රාභරණාදී ධාර්මික) සඞ්ග්‍රහද; අනාකුලාච කම්මන්තා, (අකුසල කම්පථ විරහිතවූ කෘෂි වණිජ්‍යාදිවූ නිරවුල් කර්මාන්තද යන; එතං, මේ තෙම; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

**7. දානඤ්ච ධම්මචරියා ච**
**ඤාතකානඤ්ච සඞ්ගහො**
**අනවජ්ජානි කම්මානි**
**එතං මඞ්ගලමුත්තමං**

**8. ආරති විරති පාපා**
**මජ්ජපානා ච සඤ්ඤමො**
**අප්පමාදො ච ධම්මෙසු**
**එතං මඞ්ගලමුත්තමං**

---

7 දානඤ්ච, (ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දියයුතු) ආමිස දාන ධර්ම දානාදියද; ධම්මචරියා ච, දශ කුශල කර්මපථාදියෙහි හැසිරීම ද; ඤාතකානඤ්ච සඞ්ගහො, (මවු පක්ෂයෙන් හෝ පිය පක්ෂයෙන් හෝ සත්වන කුලපරම්පරාව දක්වා අවිච්ඡින්නව පැවැති නෑයන් අතුරෙන් තමා සමීපයට දුක්ඛිතව ආ) නෑයන්ට ධන ධාන්‍යාදියෙන් කරන්නාවූ සඞ්ග්‍රහයද, අනවජ්ජානි කම්මානි, සීලසමාදානාදී වෛය්‍යාවච්චකරණාදි) නිවරද්‍ය කර්මාන්තයෝද යන; එතං, මේ තෙම; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

8. ආරති, පාපයෙහි ආදීනව දන්නහුගේ මනසින් අනභිරතියද (නොඇල්මද); පාපා, ප්‍රාණාතිපාතාදි අකුශලකර්මයෙන්, විරති; කාය වාග් දෙකින් වැලැක්මද; මජ්ජපානාචසඤ්ඤමො; (ස්වර්ග මොක්ෂ දෙකට බාධකවූ උන්මත්තතාදි අනෙකප්‍රකාර අනර්ථාවහවූ) රහ පීම වැලැක්මද; අප්පමාදො ච ධම්මෙසු, (ඓහලෞකික පාරලෞකික හිත සුව එලවන්නාවූ) සියලු කුශලධර්මයෙහි අප්‍රමාද වීමද... සමෘතියගේ අවිප්‍රවාශයද) යන; එතං, මේ තෙමේ; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

## 9. ගාරවො ච නිවාතො ච
## සන්තුට්ඨී ච කතඤ්ඤුතා
## කාලෙන ධම්මසවණං
## එතං මඞ්ගල මුත්තමං.

## 10. ඛන්තී ච සොවචස්සතා
## සමණානඤ්ච දස්සනං
## කාලෙන ධම්මසාකච්ඡා
## එතං මඞ්ගල මුත්තමං.

---

9. ගාරවො ච, (බුද්ධාදි රත්නත්‍රයයෙහිද මව් පිය ආදි වෘද්ධයන් කෙරෙහිද වන්දනමානනාදි වශයෙන් කරන්නාවූ) ගෞරවයද; නිවාතොච, (මාන ඖද්ධත්‍ය වශයෙන් ආත්මොත්කර්ෂණයක් නැතිව ගුරුවරුන් කෙරෙහිද මවුපිය ආදි වෘද්ධයන් කෙරෙහිද) යටත්වූ පැවතුම් ඇතිවීමද; සන්තුට්ඨිච, (ත්‍රිවිධ සන්තොෂයෙන් සන්තුෂ්ට බවද; කතඤ්ඤුතා, (මදවූද බොහෝවූද) කෘතොපකාර දන්නා බවද; කාලෙන ධම්මසවනං, යම්කලෙක්හි සිත උඩගු වේද කාම විතර්කාදීන් විසින් මඩනා ලද්දේ වේද) එකල්හි කල්‍යාණ මිත්‍රයන් සමීපයට එළඹ තදනුරූපවූ බණ ඇසීමද යන; එතං, මේ තෙම; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

10. ඛන්ති ච, (පරොපකාර සහනතාදී ක්ෂමාලක්ෂණවූ) ක්ෂාන්ති යද; සොවචස්සතා (සකාරණයෙන් කියා අවවාද කරන කල්හි ගුණාගුණ චින්තන වශයෙන් වික්ෂෙපයට නොපැමිණ යහපතැයි, වරද පිළිගන්නා බවද; සමණානඤ්ච දස්සනං, (සංසිඳුවන ලද ක්ලෙශයන් හා වඩනා ලද ප්‍රඥාශීල සමාධ්‍යාදි ගුණයන් ඇති) ශ්‍රමණයන්ගේ දර්ශනයද; කාලෙන ධම්ම සාකච්ඡා (පෙරයම හෝ අළුයම හෝ සූත්‍රාභිධර්ම විනයෙන් ඔවුනොවුන් හා කරන්නාවූ) ධර්ම සාකච්ඡාවද යන; එතං, මේ තෙම; උත්තමං ම්ඞ්ගලං, උතුම් මඟුලි.

11. තපො ච බ්‍රහ්මචරියං ච
අරියසච්චාන දස්සනං
නිබ්බාන සච්ඡිකිරියා ච
එතං මඞ්ගල මුත්තමං.

12. ඵුට්ඨස්ස ලොකධම්මෙහි
චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං
එතං මංගල මුත්තමං.

---

11. තපොච, (අභිධ්‍යා දෞර්මනස්‍යාදීන්ගේ තැවීමෙන්) ඉන්ද්‍රිය සංවරයද (කෞසීද්‍ය කෘත්‍යයාගේ තාපනයෙන්) වීර්‍ය්‍යයද යන දෙකින් සමන්විත වීමද; බ්‍රහ්මචරියංච – මෛථුනධර්ම ප්‍රතිසංයුක්ත අබ්‍රහ්මචරයට ප්‍රතිපක්ෂවූ උතුම් ශාසනමාර්ග බ්‍රහ්මචරණයද; අරිය සච්චාන දස්සනං, දුක්ඛාදී චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේ දර්ශනයද; නිබ්බාන සච්ඡිකිරියාච, පඤ්ච ගති නිවාරණයයි දන්නා ලද තෘෂ්ණාවෙන් නික්මුණු හෙයින් 'නිවනැයි කියන ලද නිර්වාන පුර යට පැමිණීම ප්‍රත්‍යවේක්ෂා කිරීමද යන; එතං, මේ තෙම; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

12. ඵුට්ඨස්ස ලොකධම්මෙහි, ලාභාලාභ යනාදි අෂ්ටලොක ධර්මයෙන් පහරණ ලද්දාවූ හෙවත් මඩනා ලද්දාවූ; යස්ස, (ස්ථවිර නවක මධ්‍යමවූ) යමක්හුගේ; චිත්තං, සිත; නකම්පති, නොසැලේද හෙවත් නොවෙව්ලාද නොහොත් කම්පා නොවේද; (එසේවූ ක්ෂීණ ශ්‍රවයාගේ ඒ සිතද) අසොකං, (ශොකරහිතවද; විරජං, අර්හත්මාර්ග ඥනයෙන් හරණ ලදරාග ද්වෙෂ මොහාදි පාප ධර්මයන් ඇති හෙයින්) රජස් රහිතව නිර්මලද; ඛෙමං, (ක්ෂීණාශ්‍රවයාගේ සිත චතුර්විධ ඔඝයෙන් විනිර්මුක්ත හෙයින්) අභයද, නිරුපද්‍රවද යන; එතං මේ තෙම; උත්තමං මඞ්ගලං, උතුම් මඟුලි.

**13. ඒතාදිසානි කත්වාන**
**සබ්බත්ථමපරාජිතා**
**සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං**
**තෙසං මංගල මුත්තමන්ති.**

රතනසුත්තං

**14. යානීධ භූතානි සමාගතානි**
**භුම්මානිවා යානිව අන්තලික්ඛෙ**
**සබ්බෙව භූතා සුමනා භවන්තු**
**අථොපි සක්කච්ච සුණන්තු**
**භාසිතං,**

13. ඒතාදිසානි කත්වාන, (අප විසින් කියනලද ප්‍රකාර ඇති බාල අසේවනාදි) මෙබඳු මඞ්ගල්‍යයන් කොට; සබ්බත්ථ මපරාජිතා ස්කන්ධක්ලෙශ අභිසංස්කාර දෙවපුත්‍ර මාරප්‍රභෙද චතුර්විධ පස මිතුරන් අතුරෙන් එකකු හාත් නොපැරද මෙලෝ පරලෝ දෙක්හිද ස්ථාන චංක්‍රමණාදි සියලුම ඉරියව්වෙහිද, ක්ලෙශක්ෂය කළ හෙයින් නිරුපද්‍රව වූවාහුය. දිව්‍යපුත්‍රය මෙබඳු මඞ්ගල්‍යයන්ම කොට; සබ්බත්ථසොත්ථිං ගච්ඡන්ති, හැම තන්හි සවස්ථ භාවයට යම් හෙයකින් යෙද්ද; තෙසං, ඔවුන්ට; තං, ඒ "බාලානං අසේවනා" යනාදි අටතිස් මඞ්ගලතෙම, උත්තමං මඞ්ගලං, උතුම් මඟුලැයි දෙශනාව නිමවා වදාළසේක.

රතන සූත්‍රය.

14. ඉධ, මෙතැන්හි; සමාගතානි, රැස්වූ; භුම්මානි, භූමියෙහිවූ; යානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; අන්තලික්ඛෙවා, අන්තරීක්ෂයෙහිවූ හෝ; යානිභූතානි, යම් අමනුෂ්‍යකෙනෙක් ඇද්ද; තෙ සබ්බෙ එව භූතා, ඒ අමනුෂ්‍යයෝ හැමදෙනම; සුමනා භවන්තු, සුඛිතවූ සිත් ඇත්තාහු වෙත්වා; අථොපි, නැවතද; භාසිතං, (ලෞකික ලොකොත්තර සැපත් සාදන මාගේ) තෙපුල්; සක්කච්චං, සකස්කොට (අර්ථව්‍යඤ්ජන හෙයින් නොපිරිහෙළා), සුණන්තු, අසත්වා.

15. තස්මාහි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය
දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං
තස්මාහිනෙ රක්ඛථ අප්පමත්තා,

16. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා යං රතනං පණීතං
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු,

---

15. තස්මාහි (යම් හෙයකින් තෙපි එබඳු දෙව්ලොව සැපත් හැර බණ අසනු පිණිස අවුද, මාගේ දෙශනාව අතිදුර්ලභද නොයෙක් අනුසස් ඇත්තිද) එහෙයින්; භූතා, අමනුෂ්‍යයෙනි; නිසාමෙථ, මාගේ දම් දෙසුම් අසව්; මානුසියාපජාය, (රොගාමනුෂ්‍ය දුර්භික්‍ෂ යන ත්‍රිවිධොපද්‍රවයෙන් උපද්‍රැතවූ) මනුෂ්‍යප්‍රජාව කෙරෙහි; සබ්බෙ, හැමදෙනාම; මෙත්තංකරොථ, හිත අදහස් කරව්; යෙ, යම් මිනිස්කෙනෙක්; දිවා ච, දහවල්ද; රත්තො ච රාත්‍රියෙහිද; බලිං හරන්ති, (දෙවතා ප්‍රතිමාකොට දෙවොල් ආදියෙහි පුෂ්පාදියෙන් පූජා කෙරෙද්ද නොහොත් දහවල් ලාබත් ආදිවූ දන් දීමෙන් පුදද්ද දීපමාලා සජ් රාත්‍රික ධර්‍මශ්‍රවණාදිය කරවා ඒ පින් දීමෙන් රෑ) තිලියම් කෙරෙද්ද; තස්මා, ඒ (බලිකර්‍ම කරණය) හෙතුකොටගෙන (කෘතඥතා ගුණයෙහි පිහිටා); තෙ, ඒ මිනිසුන්; අප්පමත්තා, නොපමා වූවාහු; රක්ඛථ, (අහිත දුරුකොට හිත සැප එලවීමෙන්) රකිව්.

16 ඉධ, මේ මනුෂ්‍යලොකයෙහිද; හුරං වා, නාගසුපර්‍ණාදි භවනයෙහිද; යංකිඤ්චිවිත්තං, තුෂ්ටි ජනකවූ යම්කිසි සැපයෙක් ඇද්ද, සග්ගෙසුවා, ස්වර්ගයයි කියනලද කාමාවචර රූපාවචර ලොකයෙහිද; පණීතං, උතුම්වූ; යංකිඤ්චිරතනං, (රතිජනනාදිවූ අර්ථයෙන් රතනයයි ප්‍රසිද්ධවූ) යම්කිසි රතනයෙක් ඇද්ද;

17. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු,

18. යම්බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධි මානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු,

---

(විතානයයි ප්‍රසිද්ධවූ) ඒ දෙකම; තථාගතෙන සමං, සම්බුදුන් හා සදෘශයෙක්, නත්‍ථි, නොමැති; බුද්ධෙ, බුදුන් කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, ශ්‍රෙෂ්ඨය; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන්; සුවත්ථි හොතු, සියලු සතුන්ට සුවවේවා.

17. සමාහිතො, (ආර්‍ය්‍යමාර්ග සමාධින්) සමාහිතවූ සිත් ඇති; සාක්‍යමුනි, ශාක්‍යකුල ප්‍රසූතවූ තථාගතතෙම; ඛයං, (රාගක්‍ෂයට නිමිත්ත හෙයින්) ක්‍ෂයනම්වූ; විරාගං, විරාගවූ; අමතං (ආලම්බන හෙයිනුත් සම්ප්‍රයොග හෙයිනුත්) අමෘතයයි කියනලද; පණීතං, උතුම්වූ (නොහොත්) අනල්පවූ; යං, යම් කිසි නිවනක්; අජ්ඣගා, (පරොපදෙශ රහිතව) දත්ද; තෙන ධම්මෙන, ඒ නිර්‍වාණ ධර්‍මය හා; සමං; සදෘශවූ; කිඤ්චි න අත්ථි, කිසි ධර්‍මයෙක් නැත; ධම්මෙ, ධර්‍මයෙහි, ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන; මේ සත්‍යයෙන්; සුවත්ථිහොතු, (සියලු සතුන්ට) සුව වේවා.

18. බුද්ධසෙට්ඨො; (අනුබුද්ධ ප්‍රත්‍යෙක බුද්ධයන්ට උතුම් හෙයින්ද අතිශයින් ප්‍රශංසා කටයුතු යෙයින්ද) බුද්ධශ්‍රෙෂ්ඨනම්වූ තථාගතොත්තම තෙම; සුචිං, (තමා උපන් සන්තානයෙහි රාගාදී මල සමුච්ඡෙදකොට නිර්මල කරන හෙයින්) සුචිවූ; යං, මේ ආර්‍ය්‍ය මාර්ගයක්; පරිවණ්ණයි, ("මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො" යනාදීන්

**19. යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා**
**චත්තාරි එතානි යුගානි හොන්ති**
**තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා**
**එතෙසු දින්නානි මහප්ඵලානි**
**ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු,**

---

ඒ ඒ තන්හි ප්‍රශංසා කෙළේද, යං, යම් මාර්ගධර්මයක්; ආනන්තරිකං සමාධිං, (තමාගේ ප්‍රවෘත්තියට අනතුරුව නියමයෙන් ඵල දෙන හෙයින්) ආනන්තරිය සමාධිය යි; ආහු, (බුද්ධාදී ආර්‍ය්‍යයෝ) කියද්ද; තෙන සමාධිනා, ඒ (උක්ත ප්‍රකාර මාර්ග) සමාධිය හා; සමො, සදෘශ (රූපාවචර සමාධි) යෙක්; න විජ්ජති, නැති; ධම්මෙ, (මාර්ග) ධර්මයෙහි; ඉදම්පිරතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන්; සුවත්ථි හොතු, සියලු සතුන්ට සුව වේවා.

19. යෙ පුග්ගලා, යම් අෂ්ටාර්‍ය්‍ය පුද්ගල කෙනෙක්; සතං, බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ශ්‍රාවකයන් විසින්ද සෙසු සාධුගුණොපෙත දිව්‍ය මනුෂ්‍යයන් විසින් ද; පසත්ථා, (චම්පක වකුලාදී කුසුමයන්ගේ සහජාත වර්ණ ගන්ධාදීන් මෙන් මාර්ග ගත හෙයින් සහජාතවූ ශීල සමාධ්‍යාදී ගුණයොගය හෙතුකොටගෙන) ප්‍රශංසා කරන ලදහුද (නොහොත්); යෙ පුග්ගලා, යම් සත්වකෙනෙක්; අට්ඨසතං (එක බීජිය කොලංකොලය යනාදී) අෂ්ටොත්තර ශත සඞ්ඛ්‍යායෙන් පරිමිතවූවාහු; පසත්ථා, (බුද්ධාදීන් විසින්) පසස්නාලදහු; චත්තාරි එතානි යුගානි හොන්ති, මොහු සැම්දෙන (සංක්‍ෂෙපයෙන් ශ්‍රොත ආපත්ති සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරමාර්ගස්ථ ඵලස්ථයයි සතර යුගලයෙක් වෙති; සුගතස්ස, (ශොභන ගමනාදී අර්ථයෙන්) සුගතනම්වූ තථාගතයාගේ; සාවකා, ශ්‍රාවකවූ; තෙ, උක්තප්‍රකාරවූ) ඒ අරිපුතුලෝ; දක්ඛිණෙය්‍යා, (කම්පල අදහා දියයුතු දෙය ධර්මාබ්‍යවූ) දක්ෂිණාවට අර්හයෝය; එතෙසු, මේ දක්ෂිණාර්හවූ (සර්ඥ ශ්‍රාවකයන් කෙරෙහි; දින්නානි, දෙනලද (ඉතා මදවූ) දෙය්‍යධර්මයෝ; මහප්ඵලානි (ප්‍රතිග්‍රාහක සම්පත්තීන් දක්ෂිණා විශුද්ධිය වන හෙයින්) මහත් අනුසස් ඇත්තාහ; (එහෙයින්)

20\. යෙ සුප්පයුත්තා මනසාදළ්හෙන
නික්ඛාමිනො ගොතමසාසනම්හි
තෙපත්තිපත්තා අමතං විගය්හ
ලද්ධාමුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු,

21\. යථින්දඛීලො පඨවිංසිතො සියා
චතුබ්භි වාතෙභි අසම්ප
කම්පියො

---

සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන්; සුවත්ථිහොතු (සත්නට) සැපවේවා.

20\. යෙ, යම් (රහත්) කෙනෙක්; දළ්හෙනමනසා, (අචල සමාධියෙන් යුක්තහෙයින්) ස්ථිරවූ සිතින්; සුප්පයුත්තා, සුපරිශුද්ධ කාය වාක් ප්‍රයොගයෙහි යෙදුනාහුද, ගොතම සාසනම්හි, (ගොත්‍ර හෙයින්) ගෞතම නම් වූ තථාගතයාගේ ශාසනයෙහි; නික්ඛාමිනො, (ප්‍රඥා ප්‍රධානවූ වීර්‍ය්‍යයෙන් සකල ක්ලේශයන් කෙරෙන්) නික්මුනාහු ද;) නික්ලෙශවූවාහුදැයි සේයි;) අමතං විගය්හ, (අරමුණු කිරීම් හෙයින්) අමා මහ නිවණට බැස, මුධා; නොමිළයෙන්, ලද්ධා, ලදින්; නිබ්බුතිං භුඤ්ජමානා, ඵලසමවත් සුව අනුභව කරන්නාහු; පත්තිපත්තා, ප්‍රාප්තව්‍යවූ (අර්හත්) ඵලයට පැමිණියාහු වෙත්; සඞ්ඝෙ, සඞ්ඝරත්නයෙහි; ඉදම්පිරතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන් සුවත්ථි හොතු, සත් නට සුව වේවා.

21\. ඉන්දඛීලො, නගරද්වාරයාගේ ස්ථිරභාවය පිණිස (අටරියන් හෝ දශ රියන් හෝ බිම කැණ) හිඳුවනලද සාරදරු මයවූ ස්ථම්භයතෙම, පඨවිංසිතො, (ගම්භීර නිඛාත හෙයින් භූමිනිශ්‍රිත වූයේ ;) චතුබ්භිවාතෙහි, සතරදිගින් හමන (සැඩ) පවනින්, යථා, යම්සේ; අසම්පකම්පියො සියා, කම්පානොකට හැකි වේද; යො,

තප්පමං සප්පුරිසං වදාමි
යො අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

22. යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපිතෙ හොන්ති-
භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථිහොතු,

---

යම් ශ්‍රොතාපන්න පුද්ගලයෙක්, අරියසච්චානි, (දුඃඛාදි) චතුස්ස ත්‍යයන්; අවෙච්ච පස්සති, ප්‍රඥාවෙන් වැද තබා හෙයින් දක්නේද; තං සප්පුරිසං, ඒ සත්පුරුෂයා; තප්පමං ඉන්ද්‍රඛීලය හා සදෘශය යි; වදාමි, කියමි; සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන, මේ සත්‍ය යෙන්; සුවත්ථි හොතු; (සත්නට) සුව වේවා.

22. යෙ, යම් සෝවාන් කෙනෙක්; ගම්භීරපඤ්ඤෙන, ගැඹුරු පැණ (ඇති සර්වඥයා විසින්; සුදෙසිතානි, මනාකොට දෙසනලද; අරියසච්චානි, චතුරාර්‍ය්‍යසත්‍යයන්; විභාවයන්ති, තමන්ම පහල කෙරෙද්ද; තෙ ඔහු; කිඤ්චාපි, කිසිසේත්; භුසප්පමත්තා, අතිශ යින් පමාවූවාහු; අට්ඨමං භවං, (කාමභවයෙහි) අට වන පිළිසඳක්; න ආදියන්ති, නොගණිති; (සත්වන භවයෙහිම නිවන් දකිති) සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන්; සුවත්ථිහොතු, (සත්නට) සුව වේවා.

23. සහාවස්ස දස්සන සම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි 'යදත්ථි කිඤ්චි
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡචාභිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු,

24. කිඤ්චාපිසො කම්මං කරොති පාපකං
කායෙන වාචා උද චෙතසා වා

---

23. අස්ස, මේ සෝවාන්හුගේ; දස්සන සම්පදාය සහළුව, දශීනය යි කියනලද සෝවන් මාගීඥනය (තමාසනන්හි) පහළ වීම හා සමග; සක්කාය දිට්ඨි, විද්‍යමානවූ (උපාදනස්කන්ධ පඤ්ච කාඛ්‍යවූ) කයෙහි විංශති වස්තුකවූ මිථ්‍යාදෘෂ්ටියද; විචිකිච්ඡිතඤ්ච, (ක්ලෙශව්‍යාධි ශමනය කරන හෙයින් චිකිත්සිතාඛ්‍යවූ ප්‍රඥව කෙරෙන් අපගත හෙයින් විචිකිත්සිත නම්වූ බුද්ධාදීන් කෙරෙහි) ශඞ්කාවද, සීලබ්බතං වා පි යදත්ථි කිඤ්චි, යම් කිසි ශීල ව්‍රතාදියෙක් ඇද්ද; තයො ධම්මා, උක්තප්‍රකාරවූ ධර්මයෝ තුන් දෙනා; ජහිතා, භවන්ති, ප්‍රහීණ කරනලද්දාහු වෙද්ද; චතූහපායෙහිච, (විපාක වෘත්තිය ප්‍රහීණ හෙයින් නරකාදී) සතර අපා භූමියෙනුද; විප්පමුත්තො, මිදුනේ; ඡචාභිඨානානි, (මාතෘ ඝාතකාදිය හා අන්‍ය ශාස්තෘ උද්දෙශය යන) ෂඩ්විධ උදාරතර පාපයන්; කාතුං අභබ්බො, (භවාන්තරයෙහි තමා ආර්‍ය්‍ය ශ්‍රාවක බව නොදැන) කරන්නට අයොග්‍යය; සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන්; සුවත්ථි හොතු, (සත්නට) සුව වේවා.

24. සො, ඒ – දශීන සම්පන්න සෝවන් පුහුල්) තෙමේ; කිඤ්චාපි, කිසි; (සිහිමුළා බැවින් ප්‍රමාද විහාරිත්වයට පැමිණද)

අභබ්බො සො තස්ස පටිච්ඡාදය
අභබ්බතාදිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු,

25. වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්ම වරං අදෙසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු

---

යං පාපකං කම්මං, යම් අකුශල ධර්මයෙක් ඇද්ද?; තං, ඒ (උක්තප්‍රකාර) ධර්මය; කායෙන, කයින්ද, වාචා, වචනයෙන්ද; උද, නොහොත්; චෙතසා, සිතින්ද; කරොති, කෙරේද; සො, ඒ (සෝවාන් පුහුල්) තෙම; තස්ස, ඒ පාපයාගේ; පටිච්ඡාදය, සැඟවීමට; අභබ්බො, අයොග්‍යය; කුමක් හෙයින් දයත්? දිට්ඨපදස්ස, දක්නාලද නිර්වාණ පද ඇති සෝවාන්හුගේ; අභබ්බතා, (කරන ලද අකුසලයාගේ සැඟවීමෙහි) අයොග්‍ය බව; වුත්තා, වදාරනලදී; සඞ්ඝෙ, සඞ්ඝයා කෙරෙහි, ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන්; සුවත්ථිහොතු, (සත්නට) සුව වේවා.

25. වනප්පගුම්බෙ, වනලැහැබතෙම; ගිම්හානං, ග්‍රීෂ්මඍතුව සම්බන්ධ වූ; පඨමස්මිං ගිම්හෙ මාසෙ, ප්‍රථම ග්‍රීෂ්ම මාසයෙහි හෙවත් බක් මස; ඵුස්සිතග්ගෙ, සුපුෂ්පිතවූ අග්‍ර ඇත්තේ; යථා, යම්සේ (ශොභාමින්ද); තථූපමං, (ස්කන්ධායතන ධාතු ඉන්ද්‍රියබල බොධ්‍යඞ්ගාදි නානාප්‍රකාර අර්ථ කුසුමයෙන් සශ්‍රීකහෙයින්) ඒ හා සදෘශවූ; නිබ්බානගාමිං, නිවන් පමුණුවන; ධම්මවරං, පර්‍ය්‍යාප්ති ධර්ම රත්නය; පරමං හිතාය, පරම හිතාඛ්‍යවූ නිවන් පිණිස; අදෙසයි, (බුදුරජ) දෙසීය. බුද්ධෙ, බුදුන් කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්. එතෙනසච්චෙන, මේ සත්‍යයෙන්; සුවත්ථි හොතු, (සත්නට) සුව වේවා.

.26. වරොවරඤ්ඤූ වරදොවරාහරො
අනුත්තරො ධම්මවරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථිහොතු.

27. ඛීණං පුරාණං නවං නත්ථි-
සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථා යම්පදීපො
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

---

26. වරො, වරයයි කියතලද; වරඤ්ඤූ, වරඤ්ඤවූ, වරදෙ, (පස්වග මහණුන් ආදිකොට ඇති නොයෙක් දිව්‍ය මනුෂ්‍යයන්ට උතුම් නිවන් සුව දුන් හෙයින්) වරදයයි, කියතලද; වරාහරො, උතුම් ලොව්තුරා මග එලවූ; අනුත්තරො, නිරුත්තරවූ; වරං, උතුම්වූ; ධම්මං, ධර්මය; අදෙසයි, දෙශනා කළ සේක්ද; බුද්ධෙ, බුදුන් කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම්; එතෙන සච්චෙන, මේ සත්‍යයෙන්; සුවත්ථි හොතු' (සත්නට) සුව වේවා.

27. (යෙසං, යම් ක්ෂීණශ්‍රව කෙනකුන්ගේ,) පුරාණං, අතීත කාලිකවූ කුශලධර්මයනෙම; ඛීණං, ක්ෂය කරතලද්දේ; නවං, වර්තමාන කාලිකවූ කර්මයද; නත්ථි සම්භවං, උත්පත්තියෙක් නැද්ද: (යම් කෙනෙක්) ආයතිකෙ භවස්මිං; භාවිෂ්‍යත් ප්‍රතිසන්ධියෙහි; විරත්ත චිත්තා; (භවතෘෂ්ණා නැති හෙයින්) විරක්තවූ සිත් ඇත්තාහුද, තෙ, ඒ ක්ෂිණාශ්‍රව භික්ෂුහුද; ඛීණ බීජා, ක්ෂීණ බීජ ඇත්තාහුද; අවිරූළ්හිච්ඡන්දා, පුනර්භවාභිලාෂයක් නැත්තෝ; ධීරා, ධෘතිසංයුක්තවූ; තෙ, ඔහු; අයං පදීපො යථා, මේ ප්‍රදීපයමෙන්, නිබ්බන්ති,

**28. යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යා නිව අන්තලික්ඛෙ**
**තථාගතං දෙවමනුස්සපූජිතං**
**බුද්ධං නමස්සාම සුවත්ථි හොතු,**

**29. යානීධ භූතානි සමාගතානි**
**භුම්මානි වා යා නිව අන්තලික්ඛෙ**
**තථාගතං දෙවමනුස්සපූජිතං**
**ධම්මං නමස්සාම සුවත්ථි හොතු,**

---

නිරුඬ වත්තාහුය; සඞ්ඝ, සඞ්ඝයා කෙරෙහි; ඉදම්පි රතනං, මේ රත්නභාවයද; පණීතං, උතුම; එතෙන සච්චෙන, මේ සත්‍ය යෙන්; සුවත්ථි හොතු, (සත්නට) සුව වේවා.

28. ඉධ, මෙ තැන්හි; සමාගතානි, රැස්වූ; භුම්මානි වා, භූමි යෙහිවූ හෝ; යානි භූතානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද, අන්තලික්ඛෙ වා, අන්තරීක්ෂයෙහි වූහෝ; යානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද?; (තෙ මයං, ඒ අප හැමදෙනම); තථාගතං, තථා ගත නම්වූ; දෙවමනුස්ස පූජිතං, දිව්‍යමනුෂ්‍යයන් විසින් පුදන ලද; බුද්ධං, බුදුන්; නමස්සාම, වඳුම්හ; සුවත්ථි හොතු, (සත්නට) සුව වේවා.

29. ඉධ, මෙ තැන්හි; සමාගතානි, රැස්වූ, භුම්මානි, භූමි යෙහිවූ හෝ; යානි භූතානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; අන්තලික්ඛෙ වා, අන්තරීක්ෂයෙහිවූ හෝ; යානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; (ඒ මේ අප හැමදෙනම) තථාගතං, තථාගත නම්වූ; දෙවමනුස්ස පූජිතං, දෙව්මිනිසුන් විසින් පුදනලද; ධම්මං, නවලොවුතුරා ධර්මය; නමස්සාම, වඳිම්හ; සුවත්ථි හොතු (සත්නට) සුව වේවා.

30\. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යා නිවඅන්තලික්ඛෙ
තථාගතං දෙවමනුස්සපූජිතං
සඞ්ඝං නමස්සාම සුවත්ථි හොතු,

---

කරණීය මෙත්ත සුත්තං

1\. කරණීයමත්ථ කුසලෙන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කො උජූ ච සූජූ ච
සුවචො චස්ස මුදු අනතිමානී,

---

30\. ඉධ, මෙ තැන්හි; සමාගතානි, රැස්වූ; භුම්මානි වා, භූමියෙහිවූ හෝ; යානි භූතානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; අන්තලික්ඛෙ වා, අන්තරීක්ෂයෙහිවූ හෝ; යානි, යම් අමනුෂ්‍ය කෙනෙක් ඇද්ද; (තෙ මයං, ඒ අපි හැමදෙනම); තථාගතං, තථාගත නම්වූ; දෙවමනුස්ස පූජිතං, දෙවිමිනිසුන් විසින් පුදනලද; සඞ්ඝං, අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්ඝයා; නමස්සාම, වඳුම්හ; සුවත්ථිහොතු, (සත්නට) සුව වේවා.

---

කරණීය මෙත්ත සූත්‍රය

1\. සන්තං පදං, (ශාන්තපදයයි කියනලද) නිර්‍වාණ පදයට; අභිසමෙච්ච, (ප්‍රතිවෙධ වශයෙන්) පැමිණ (වසනු කැමැත්තහු විසින්); යං කරණීයං, යමක් කටයුතුද; අත්ථකුසලෙන, (තමහට) අභිවෘද්ධියෙහි දක්ෂයා විසින්; තං කරණීයං, ඒ කටයුතුයි; සක්කො අස්ස, දක්ෂ වේවා; උජූ අස්ස, ඍජු වේවා; සුඋජූ අස්ස, මනාව ඍජු වේවා; සුවචො චස්ස, කීකරු වේවා; මුදු අස්ස, මෘදුව යොග ක්ෂම වේවා; අනතිමානී අස්ස, නිහතමානී වේවා.

2. සන්තුස්සකො ච සුභරො ච
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියො ච නිපකො ච
අප්පගබ්භො කුලෙසු-
අනනුගිද්ධො,

3. න ච ඛුද්දං සමාචරෙ
කිඤ්චි යෙන විඤ්ඤූපරෙ-
උපවදෙය්‍යුං
සුඛිනො වා ඛෙමිනො හොන්තු
සබ්බෙ සත්තා භවන්තු
සුඛිතත්තා,

---

2. සන්තුස්සකො ච, (යථා ලාභ යථා බල යථා සාරුප්පවශයෙන් සිවුපසයට දෙළසකවූ ප්‍රභෙද ඇති සන්තොෂයෙන්) සතුටු වේවා; සුභරො ච, සුභර වේවා; අප්පකිච්චො ච, සවල්පවූ කෘත්‍ය ඇති වේවා; සල්ලහුකවුත්ති, අල්ප පරිෂ්කාරික වේවා; සන්තින්ද්‍රියො ච, සන්හුන් ඉඳුරන් ඇති වේවා; නිපකො ච, ප්‍රඥවත් වේවා; අප්පගබ්භො, (කායාදි තුන් දෙරින් සිදුවන) ප්‍රගල් භය නැති වේවා; කුලෙසු අනනුගිද්ධො, කුලයෙහි නො ඇලේවා.

3. යෙන, යම් ක්‍රියාවකින්; විඤ්ඤූපරෙ, නුවණැති අන් කෙනෙක්; උපවදෙය්‍යුං, නින්දා කෙරෙත්ද; න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි, එසේ සවල්පවූ කිසි කාය වාක් මනො දුශ්චරිතයක් නො කරන්නේයි; සබ්බෙ සත්තා, හැම සත්හු; සුඛිනො හොන්තු, කායික සුවයෙන් සුව ඇති වෙත් වා; ඛෙමිනො හොන්තු, භය උපද්‍රව නැතිවීමෙන් ක්ෂෙම වෙත්වා; සුඛිතත්තා භවන්තු, මානසික සුවයෙන් සුඛිත සිත් ඇති වෙත්වා.

**4\. යෙ කෙචි පාණභූතත්ථි**
**තසා වා ථාවරා වා අනවසෙසා**
**දීඝා වා යෙ මහන්තා වා**
**මජ්ඣිමා රස්සකාණුකථූලා,**
**5\. දිට්ඨා වා යෙව අදිට්ඨා**
**යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ**
**භූතා වා සම්භවෙසී වා**
**සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා,**
**6\. න පරො පරං නිකුබ්බෙථ,**
**නාතිමඤ්ඤෙථ කත්ථචි නං–**
**කඤ්චි,**

---

4\. තසා වා, කෙලෙස් ඇති සත්හුද; ථාවරා, නිකෙලෙස් සත්හුද; අනවසෙසා, සියලු; යෙ කෙචි, යම් කිසි; පාණභූතා, ප්‍රාණීහුය යි කියනලද කෙනෙක්; අත්‍ථි, ඇද්ද; දීඝා වා, නාග ගොධාදී යොදුන් ගණන් දිග ඇති සත්හුද; යෙ මහන්තා වා, රාහු අසුරෙන්ද්‍රාදි මහත් ආත්මභාව ඇත්තාහුද; මජ්ඣිමා, අශ්ව ගවාදී මධ්‍යම සත්හුද; රස්සකා, වාමනාදිහුද; අණුක, මසැසට නොපෙනෙනා ජලාදියෙහි උපදිනා සිහින් සත්හුද; ථූලා, වට වූ කැස්බු ආදි සත්හුද: සබ්බසත්තා, ඒ සියලු සත්හු; සුඛිතත්තා භවන්තු, සුඛිතවූ සිත් ඇති වෙත්වා.

5\. දිට්ඨා වා, චක්ෂුසට පෙනෙන සත්හුද; අදිට්ඨා වා, පර සක් වලාදියෙහි නොපෙනෙන සත්හුද; යෙ ච දූරෙ වසන්ති; යම් සත්ව කෙනෙක් (තමාගේ ශරීරයෙන්) පිටත් තන්හි වෙසෙද්ද; (උහුද); භූතා වා, උපන්නාවූ යම් සත්ව කෙනෙක් ඇද්ද; (උහුද); සම්භවෙසී වා, උපදිමින් සිටි යම් සත්වකෙනෙක් ඇද්ද; (උහුද); සබ්බ සත්තා, ඒ සියලු සත්හු; සුඛිතත්තා භවන්තු, සුඛිතවූ සිත් ඇත්තෝ වෙත්වා.

6\. කත්ථචි, කිසි තැනෙක්හි; පරො, අනෙකෙක්; පරං, අනෙකෙකු; න නිකුබ්බෙථ, වඤ්චා නොකෙරේවා; (නොපෙළේවා) නං කඤ්චි, ඒ කිසිවක්හට; නාතිමඤ්ඤෙථ, අවඥ නොකෙරේවා,

බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛ
මිච්ඡෙය්‍ය,

7. මාතා යථා නියංපුත්තං
ආයුසා එක පුත්තමනුරක්ඛෙ
එවම්පි සබ්බභූතෙසු
මානසං භාවයෙ අපරිමාණං,

8. මෙත්තං ච සබ්බලොකස්මිං
මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධොච තිරියඤ්ච
අසම්බාධං අවෙරං අසපත්තං,

---

බ්‍යාරොසනා, කාය වාග් විකාරයෙන් වූ රොෂණයෙන්ද; පටිඝසඤ්ඤා, මනො විකාරයෙන්වූ ප්‍රතිඝසංඥයෙන්ද; අඤ්ඤමඤ්ඤස්ස, ඔවුනොවුන්ට; දුක්ඛං න ඉච්ඡෙය්‍ය, දුක් නොකැමති වේවා.

7. මාතා යථා, මවු යම්සේ; ආයුසා, ආයුෂයෙන්ද; නියං පුත්තං, ඖරස පුත්‍රයා; අනුරක්ඛෙ, රකීද; එවම්පි සබ්බභූතෙසු, එසෙයින් හැම සතුන් කෙරෙහි; අපරිමාණං, අප්‍රමාණවූ; මානසං භාවයෙ, මෙත් වඩන්නේය.

8. අපරිමාණං, පමණ නැති; අසම්බාධං, සම්බාධ නැති; අවෙරං, වෛර චෙතනා නැති; අසපත්තං, සතුරන් නැති, මානසං, සිත්හිවූ; මෙත්තං ච, මෛත්‍රිය ද; උද්ධං, උඩ; අධො, යට, තිරියං, සරස; සබ්බලොකස්මිං, සියලු සත්වලොකයෙහි භාවයෙ, වඩන්නේය.

9. තිට්ඨං චරං නිසින්නො වා
සයානො වා යාවතස්ස–
විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු,

10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං
නහි ජාතු ගබ්භසෙය්‍යං–
පුනරෙතීති.

---

ඛන්ධ පරිත්තං.

11. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙත

---

9. තිට්ඨං, සිටින්නේද; චරං, යන්නේද; නිසින්නො වා, හුන්නේද; සයානො වා, හොත්තේද; යාවතස්ස විගතමිද්ධො, යම් තාක්කල් නොනිදද, (හෙවත්) පහවූ නිද්‍රා ඇත්තේද; එතං සතිං අධිට්ඨෙය්‍ය, මේ මෛත්‍රී සමෘතිය වඩන්නේ යි.

10. දිට්ඨිඤ්ච අනුපගම්ම, දෘෂ්ටියට නොපැමිණ; දස්සනෙන සම්පන්නො, (ප්‍රථම මාර්ගයෙන් සම්‍යග්දෘෂ්ටිය යි කියනලද) දර්ශන යෙන් සමන්විතවූයේය; කාමෙසු, වස්තුකාමයෙහි; ගෙධං, ක්ලේශ කාමය; විනෙය්‍ය, ප්‍රහීණ කොට; ජාතු, ඒකාන්තයෙන්; ගබ්භ සෙය්‍යං, මවුකුස පිළිසිඳගැන්මට; නහි පුනරෙතීති, නැවත නො එන්නේයි (ශුද්ධාවාසයෙහිම පිරිනිවන් පාන්නේ යයි සේයි.)

---

11. මෙ, මා විසින්; එවං සුතං, (මේ ඛන්ධපරිත්‍රාණය) මෙ සේහින් අසන ලද්දේය; එකං සමයං, එක් සමයෙක්හි; භගවා. භාග්‍යවත්වූ බුදුරජතෙම; සාවත්ථියං, ශ්‍රාවස්තිපුරප්‍රවරාසන්නයෙහි

## වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු, අහිනා දට්ඨො කාලකතො හොති-අථ ඛො සම්බ-හුලා භික්ඛු යෙන භගවා තෙනුප සංකමිංසු උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං; ඉධ භන්තෙ සාවත්ථියං අඤ්ඤ තරො භික්ඛු අහිනා දට්ඨො කාලකතොති.

---

ජෙතවනෙ, ජෙතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬු මහ සිටාණන් විසින් කරවා පිළිගන්වනලද මහාවිහාරයෙහි; විහරති, වැඩවාසය කර වදාරන සේක. තෙ න ඛො පන සමයෙන, එසමයෙහි වනාහි, සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහි; අඤ්ඤ තරො භික්ඛු, එක්තරා මහණනමක්; අහිනා දට්ඨො, සර්පයකු විසින් දෂ්ට කරන ලද්දේ; කාලකතො හොති, කළුරියකළ සේකි. අථ ඛො, එකල්හි වනාහි; සම්බහුලා භික්ඛු, බොහෝ භික්ෂූන් වහන්සේ; යෙන භගවා, භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ යම් තැනෙක්හිද; තෙන, එතන්හි; උපසංකමිංසු, එළඹි සේක්ලාය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං අභිවාදෙත්වා, බුදුන් වැඳ, එක මන්තං නිසීදිංසු, එකත්පසෙක්හි හුන්සේක්ලාය, එකමන්තං නිසින්නා ඛො, එකත්පසෙක්හි හුන්නාමවූ; තෙ භික්ඛු, ඒ භික්ෂූන් වහන්සේ; භගවන්තං, එතදවොචුං, බුදුරජාණන් වහන්සේට මෙසේ දැන්වූසේක්ලාය. භන්තෙ, ස්වාමීන් වහන්ස; ඉධ සාවත්ථියං, මේ සැවැත්නුවර සමීපයෙහි; අඤ්ඤතරො භික්ඛු, එක්තරා මහ ණෙක්, අහිනාදට්ඨො, සර්පයකු විසින් දෂ්ට කරන ලද්දේ; කාලකතොති, කාලක්‍රියා කෙළේ විය.

නහනූන සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජ කුලානි, මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය, සචෙ හි සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය, නහි සො භික්ඛවෙ භික්ඛු අහිනා දට්ඨො කාලං කරෙය්‍ය, කතමානි චත්තාරි අහිරාජකුලානි? විරූපක්ඛං අහිරාජකුලං, එරාපථං අහිරාජකුලං. ඡබ්‍යාපුත්තං අහිරාජ කුලං, කණ්හාගොතමකං අහිරාජ කුලං.

---

භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ මහණතෙම; චත්තාරි අහිරාජකුලානි, සතර අහිරාජකුලයන්; නූන ඒකාන්තයෙන්; මෙත්තෙන චිත්තෙන, මෛත්‍රී හිතින්, නහිඵරි, නො පහරන ලද්දේ විය. සචෙ හි, ඉදින් වනාහි; භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ මහණතෙම; චත්තාරි අහිරාජකුලානි, සතර නාරද කුලයන්; මෙත්තෙන චිත්තෙන, මෙත් සිතින්; ඵරෙය්‍ය, පහළේවී නම්; භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ මහණතෙම; අහිනා දට්ඨො, නාරද කෑයේ; නහි කාලංකරෙය්‍ය, තොම කළුරිය කරත්නේය, කතමානි චත්තාරි අහිරාජකුලානි, ඒ අහිරාජකුල යෝ සතර දෙන කව්රුදයත්? විරූපක්ඛං අහිරාජකුලං, විරූපාක්ෂ නම් අහිරාජකුලය; එරාපථං අහිරාජකුලං, ඒරාපථ නම් අහිරාජ කුලය; ඡබ්‍යාපුත්තං, අහිරාජකුලං ඡබ්‍යාපුත්ත නම් අහිරාජකුලය; කණ්හාගොතමකං අහිරාජකුලං; කණ්හාගොතමක නම් අහිරාජකුලය, (යන මේ සතර අහිරාජකුලයෝය.)

නහනූන සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි, මෙත්තෙන චිත්තෙන ඵරි, සචෙ හි සො භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය න හි සො භික්ඛවෙ භික්ඛු අහිනාදට්ඨො කාලං කරෙය්‍ය, අනුජානාමි භික්ඛවෙ ඉමානි චත්තාරි අහිරාජ කුලානි මෙත්තෙන චිත්තෙන ඵරිතුං, අත්තගුත්තියා අත්තරක්ඛාය අත්තපරිත්තායාති, ඉදමවොච

---

භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ මහණතෙම; ඉමානි චත්තාරි අහිරාජකුලානි, මේ සතර අහිරාජ කුලයන්; නූන, ඒකාන්තයෙන්; මෙත්තෙන චිත්තෙන, මෛත්‍රී සිතින්; න ඵරි, නොපහරණ ලද්දේ විය; සචෙ හි, ඉදින් වනාහි; භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ මහණතෙම; ඉමානි චත්තාරි අහිරාජ කුලානි, මේ සතර නාරද කුලයන්; මෙත්තෙන චිත්තෙන ඵරෙය්‍ය, මෙත් සිතින් පහළේ වී නම්; භික්ඛවෙ, මහණෙනි; සො භික්ඛු, ඒ මහණතෙම; අහිනාදට්ඨො, නාරද කෑයේ; නහි කාලංකරෙය්‍ය නොම කළුරිය කරන්නේය; භික්ඛවෙ, මහණෙනි; ඉමානි චත්තාරි අහිරාජකුලානි, මේ සතර නාරද කුලයන්; මෙත්තෙන චිත්තෙන ඵරිතුං, මෙත් සිතින් ඵරණ කරන්ට;. අනුජානාමි, අවසර දෙමි; (කුමක් හෙයින් දයත්? අත්තගුත්තියා, තමහට ගුප්තිය පිණිසය; අත්තරක්ඛාය, තමහට රැකවල් පිණිසය; අත්තපරිත්තායාති. තමහට මෙත් පිරිත් සඳහාය යි; භගවා, බුදු රජතෙම; ඉදමවොච, මේ (මෙසේ) වදාළසේක, ඉදං වත්වා, මේ

භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

1. විරූපක්ඛෙහි මෙ මෙත්තං
මෙත්තං එරාපථෙහි මෙ,
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං
මෙත්තං කණ්හාගොතමකෙහි ච.

2. අපාදකෙහි මෙ මෙත්තං
මෙත්තං ද්විපාදකෙහි මෙ,
චතුප්පදෙහි මෙ මෙත්තං
මෙත්තං බහුප්පදෙහි මෙ.

---

(මෙසේ) වදරා; සුගතො, සුගතනම්වූ; සත්ථා, ශාස්තෘවූ බුදුරජ තෙම; අථාපරං, නැවත මත්තෙහි, එතදවොච, (විරූපක්ඛෙහි මෙ යනාදි) මේ පිරිත වදාළ සේක.

1. මෙ මෙත්තං, මගේ මෛත්‍රිය; විරූපක්ඛෙහි, විරූපාක්‍ෂ නම් නාග කුලයන්හාය; මෙ මෙත්තං, මාගේ මෛත්‍රිය; එරාපථෙහි, එරාපථ නම් අහි රාජකුලයන්හාය; මෙ මෙත්තං, මාගේ මෛත්‍රිය, ඡබ්‍යාපුත්තෙහි, ඡබ්‍යාපුත්ත නම් නාගරාජ කුලයන්හාය; මෙ මෙත්තං, මාගේ මෛත්‍රිය; කණ්හාගොතමකෙහි ච, කණ්හාගොතමක නම් අහිරාජ කුලයන්හාය.

2. මෙ මෙත්තං, මාගේ මෛත්‍රිය; අපාදකෙහි, අපාදකවූ දීඝජාතීන්හාය; මෙ මෙත්තං, මාගේ මෛත්‍රිය; දිපාදකෙහි, දිපාදකවූ මනුෂ්‍යයන් හා පක්‍ෂීන්හාය; මෙ මෙත්තං, මාගේ මෛත්‍රිය; චතුප්පදෙහි, චතුප්පදිකවූ හස්ති අශ්වාදීන්හාය; මෙ මෙත්තං, මාගේ මෛත්‍රිය; බහුප්පදෙහි; ගෝනුසු ආදීවූ බොහෝ පාද ඇත්තවුන්හාය.

3. මා මං අපාදකො හිංසි
මා මං හිංසි දිපාදකො,
මා මං චතුප්පදො හිංසි
මා මං හිංසි බහුප්පදො.

4. සබ්බෙ සත්තා සබ්බෙ පාණා
සබ්බෙ භූතා ච කෙවලා,
සබ්බෙ භද්‍රානි පස්සන්තු
මාකඤ්චි පාපමාගමා.

අප්පමාණො බුද්ධො අප්පමාණො
ධම්මො අප්පමාණො සඞ්ඝො;
පමාණවන්තානි සිරිංසපානි අහි

---

3. අපාදකො, අපාදක සතෙක්; මං, මා; මාහිංසි, තහමක් පොළවා; දිපාදකො, දිපාදක සතෙක්; මං, මා; හිංසි, තහමක් පොළවා; චතුප්පදෙ, සිව් පා සතෙක්; මං, මා; හිංසි, තහමක් පොළවා, බහුප්පදෙ, බොහෝ පා ඇති සතෙක්; මං, මා; මාහිංසි, තහමක් පොළවා.

4. සබෙබසතතා, හැමසත්හුද; සබෙබ පාණා, හැම ප්‍රාණිහුද; සබෙබ භූතාච කෙවලා, සියලු භූතයෝද; සබෙබ, හැමදෙන; භද්‍රානි පසසනතු, කල්‍යාණත් දකිත්වයි; කිඤචි (මොවුන් කෙරෙන්) කිසි සතක්හුකරා; පාප, දුකෙක්; මා අගමා, තහමක් පැමිණේවා.

බුද්ධො, බුද්ධරත්නය; අප්පමාණො, ගුණයන්ගේ ප්‍රමාණයක් නැති හෙයින් අප්‍රමාණයි, ධම්මො, ධම්මරත්නයද; අප්පමාණො, ගුණයන්ගේ පමණ නොකටහැකි හෙයින් ප්‍රමාණයක් නැත්තේය. සඞ්ඝො, සඞ්ඝරත්නයද; අප්පමාණො, ධර්මසමායොගයෙන් අප්‍ර

විච්ඡිකා සතපදී උණ්ණානාභි, සරබූ මූසිකා කතා මෙ රක්ඛා කතා මෙ පරිත්තා, පටික්කමන්තු භූතානි සො'හං නමො භගවතො නමො සත්තන්නං සම්මා සම්බුද්ධානන්ති.

---

මෙත්තං සුත්තං

12. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි

---

මාණයි; සිරිංසපානි, දීඝිජාතිහු; පමාණවන්තානි, ප්‍රමාණකර කෙලශයොගයෙන්ද අප්‍රමාණ ගුණයන් නැති හෙයින්ද ප්‍රමාණ වත්හුයි; අහි, සර්පයහ, විච්ඡිකා, ගෝනුසුයහ, සතපදී; සතප දීයහ; උණ්ණානාභි, මකුළුවහ; සරබූ, සීකතලහ; මූසිකා, මූසික යහ; (යන මොහුයි) මේ, මා විසින්, රක්ඛා, රක්‍ෂාතොම; කතා, කරන ලදහ, භූතානි, සත්හු; පටික්කමන්තු, පහවෙත්වා; සො'හං, හේ මම; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; නමො, නමස්කාර කරමි; සත්තන්නං සම්මා සම්බුද්ධානං, විපස්සි ආදී සත් බුදුවර යන්ට, නමො, නමස්කාර කරමි.

---

මෙත්ත සූත්‍රය.

12. මෙ, මාගේ; සුතං, ඇසීම්; එවං, මෙසේයි. එකං සමයං එක් සමයෙක්හි; භගවා; භාග්‍යවත්තෙම; සාවත්ථියං, සැවත් අගී යස; ජෙතවනෙ, දෙතාඋයන්හි; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඩු මහ සිටුහු කරවූ ආරාමයෙහි; විහරති, වෙසෙයි; තත්‍ර ඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවත්තෙම; භික්ඛවො ඉති,

භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

මෙත්තාය භික්ඛවෙ චෙතො විමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය, යානීකතාය වත්ථු කතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, එකාදසානිසංසා පාටි-කඞ්ඛා, කතමෙ එකාදස?

සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති,

---

මහණෙනි කියා; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, ඇමතී; තෙ භික්ඛූ, ඒ මහණහු; භදන්ත ඉති, වහන්සැයි කියා; භගවතො පච්චස්සොසුං බුදුරජහු වදත් පිණිස ඇසූහ; භගවා එතදවොච, බුදුරජ මෙසේ වදාළේ.

භික්ඛවෙ, මහණෙනි; ආසෙවිතාය, ආදරයෙන් සෙවිතා ලද්දාවූ, භාවිතාය, එසේම භාවිතාව වඩනා ලද්දාවූ; බහුලීකතාය; නැවත නැවත වැඩීම් වශයෙන් බහුල කරන ලද්දාවූ; යානීකතාය, යොදා තුබූ යානාවක් මෙන් කරන ලද්දාවූ; වත්ථුකතාය, ප්‍රතිෂ්ඨාවන අර්ථයෙන් වස්තුවක් මෙන් කරන ලද්දාවූ; අනුට්ඨිතාය, අනුව සිටියාවූ; පරිචිතාය, පුරුදු කරන ලද්දාවූ; සුසමාරද්ධාය, මොනවට පටන්ගන්නා ලද්දාවූ; චෙතොවිමුත්තියා, චෙතොවිමුත්ති මෛත්‍රී වගේ; එකාදසානිසංසා පාටිකඞ්ඛා, එකොළොස් අනුසස් කෙනෙක් පැසැස්ස යුත්තාහ; කතමෙ එකාදස? කවර එකළොස් අනුසස් හයත්?

සුඛං සුපති, සුවසේ නිදයි; සුඛං පටිබුජ්ඣති, සුවසේ පුබුදී; නපාපකං සුපිනං පස්සති, දුස්වප්න නොදකී; මනුස්සානං පියො

මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගිවා විසං වා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණො විප්පසීදති, අසම්මූළ්හො කාලං කරොති; උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති. මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා, ආසෙවිතාය භාවිතාය බහුලීකතාය, යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, ඉමෙ එකාදසානිසංසා

---

හොති, මිනිස්නට ප්‍රිය වෙයි; අමනුස්සානං පියො හොති, අමනුෂ්‍යයන්ටද ප්‍රිය වෙයි;

දෙවතා රක්ඛන්ති, දෙවියෝ රකිති; අස්ස, මේ මෛත්‍රී විහරණයෙන් යුත් පුද්ගලයාගේ (ශරීරයෙහි); අග්ගි වා, ගිනී හෝ; විසං වා, විස හෝ; සත්ථං වා, සැත් හෝ; නකමති, නො වදියි; තුවටං, වහා; චිත්තං සමාධියති, සිත සමාහිත වෙයි; මුඛවණ්ණො විප්පසීදති, මුහුණ වණි ප්‍රසාද වෙයි, අසම්මූළ්හො කාලං කරොති, නුමුලාව කාලක්‍රියා කෙරෙයි; උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති, මෛත් සමවතට මතුයෙහි රහත් බවට පැමිණෙන්නට නොහැකිවී නම් මෙයින් සැව නිදු පිබිදියක්හු මෙන් බඹලොව උපදී; භික්ඛවෙ, මහණෙනි; ආසෙවිතාය, වඩ වඩා සිත වඩන ලද්දවූ; භාවිතාය, භාවිතකොට වඩන ලද්දවූ; බහුලීකතාය, පොහෝ කරන ලද්දවූ; යානීකතාය, යොදු තිබෙන යානාවක් මෙන් කරන ලද්දවූ; අනුට්ඨිතාය, අනුව සිටි යාවූ; පරිචිතාය, පුරුදු කරන ලද්දවූ; සුසමාරද්ධාය, මොනවට

පාටිකඞ්ඛාති, ඉදමවොච භගවා,
අත්තමනා තෙ භික්ඛූ භගවතො
භාසිතං අභිනන්දුන්ති.

1. මිත්තානිසංසං

1. පහූතභක්ඛො භවති
විප්පවුත්ථො සකාඝරා,
බහූනං උපජීවන්ති
යො මිත්තානං නදූභති.

2. යං යං ජනපදං යාති
නිගමෙ රාජධානියො,

---

පටන්ගන්නා ලද්දවූ; මෙත්තාය චෙතො විමුත්තියා, චෙතොවිමුත්තියයි කියන ලද මෛත්‍රාවගේ, ඉමෙ එකා දසානිසංසා, මේ එකලොස් අනුසස්හු; පාටිකඞ්ඛාති, පැසැස්ස යුත්තාහ, (කැමැතිවි ය යුත්තාහ; භගවා, භාග්‍යවත් බුදුරජ තෙම, ඉදමවොච, මේ මෛත්‍රසූත්‍රය වදාළේ; අත්තමනා, සතොෂවූ, තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො භාසිතං, භාග්‍යවත්හුගේ තෙපුල අසා; අභිනන්දුං, සතුටුවූහ.

**මිත්තානිසංස සූත්‍රය යි.**

---

1. යො, යම් පුද්ගලයෙක් තෙම; මිත්තානං නදූභති, මිත්‍රබිඳිකම් නොවී නම්; සො, හෙතෙම; සකාඝරා, තමාගේ ගෙන්, විප්පවුත්ථො, බැහැර යම් තැනෙක ගියේ, පහූතභක්ඛො භවති; බොහෝ කනු බොනු ලැබෙයි; (එහෙයින්) බහූනං උපජීවන්ති, ඒ මිත්‍ර පූජකයා ආශ්‍රය කොට බොහෝ දෙනෙක් ජීවත් වෙති.

2. යො, යමෙක්; මිත්තානං, සබඳහට; නදූභති, ද්‍රෝහ නොකෙරේනම්; සො, හෙතෙම; යං යං ජනපදං යාති, යම් යම් රටකට

සබ්බත්ථ පූජිතො හොති
යො මිත්තානං න දූභති.

3. නාස්ස චොරා පසහන්ති
නාතිමඤ්ඤෙති ඛත්තියො,
සබ්බෙ අමිත්තෙ තරති
යො මිත්තානං න දූභති.

4. අක්කුද්ධො සඝරං එති
සභාය පටිනන්දිතො,
ඤාතීනං උත්තමො හොති
යො මිත්තානං න දූභති.

---

ගියේද; නිගමෙ රාජධානියො, යම් යම්, නියම් ගමකට යම් යම් නුවරකට ගියේද; සබ්බත්ථ, ඒ හැමතන්හිම; පූජිතො හොති, පුදනු ලැබේ.

3. යො මිත්තානං න දූභති, යමෙක් සබඳහට සුව එළවීනම්; අස්ස, ඔහට; චොරා, සොරහු; නප්පසහන්ති, ලං නොවෙති; ඛත්තියො, රජතෙම; න අතිමඤ්ඤති, අවමන් නොකෙරෙයි. සබ්බෙ අමිත්තෙ තරති, හැම සතුරන් දුරු කෙරෙයි.

4. යො මිත්තානං න දූභති, යමෙක් මිත්‍රද්‍රොහී නොව මිතුරන්ට මනා වී නම්; සො, හෙතෙම; අක්කුද්ධො සඝරං එයි, නොදුහැවිගේ තමාගේ ගෙට එයි; සභාය, සභායෙහි; පටිනන්දිතො, සතුටුවූයේ, ඤාතීනං උත්තමො හොති, නෑයන්ට උතුම් වන්නේය.

5. සක්කත්වා සක්කතො හොති
ගරු හොති සගාරවො,
වණ්ණකිත්ති භතො හොති
යො මිත්තානං න දූහති.

6. පූජකො ලභතෙ පූජං
වන්දකො පටිවන්දනං,
යසො කිත්තිඤ්ච පප්පොති
යො මිත්තානං න දූහති.

7. අග්ගි යථා පජ්ජලති
දෙවතාව විරොචති,

---

5. යො මිත්තානං න දූහති, යමෙක් මිත්‍රද්‍රොහී නොවීනම්; (හෙතෙම) සක්කත්වා, අනුන්ට සත්කාර කොට; සක්කතො හොති, තෙමේ සත්කාර විඳිනු ලබන්නේ වෙයි; සගාරවො, අනුන් කෙරෙහි ගෞරව සහිත වූයේ; ගරු හොති, තෙමේද ගරු කට යුතු වෙයි; වණ්ණකිත්තිභතො හොති, වර්ණකීර්ති දෙක උසුලන්නේ යි.

6. පූජකො, මිත්‍රයන් පුදන්නේ; පූජං ලභතෙ, තෙමේද පුදනු ලැබෙයි; වන්දකො, බුඩාදී කල්‍යාණ මිත්‍රයන් වැන්දේ, පටිවන්දනං ලභතෙ, පුනර්භවයෙහි පිළිවැඳුම් ලබන්නේය; යසො, යසසට ද; කිත්තිඤ්ච, ගුණ කීර්තියටද; පප්පොති; පැමිණෙන්නේය; (මෙකී සියල්ල) කවරෙක් ලබන්නේද? යො මිත්තානං න දූහති, යමෙක් හිතයන්නට හිතවීනම හෙතෙමේයි.

7. අග්ගියථා, දිලිසෙන ගිනි සෙයින්; පජ්ජලති, ඉසුරෙන් දිලිසෙන්නේය; දෙවතාව, දෙවියක සෙයින්; විරොචති, බබලන්

සිරියා අජ්ඣිතො හොති
යො මිත්තානං න දූභති.

8. ගාවො තස්සපජායන්ති
ඛෙත්තෙ වුත්තං විරූහති,
පුත්තානං ඵලමස්නාති
යො මිත්තානං න දූභති.

9. දරිතො පබ්බතාතො වා
රුක්ඛාතො පතිතො නරො,
චුතො පතිට්ඨං ලභති
යො මිත්තානං න දූභති.

---

තේය; සිරියා, ශ්‍රිය විසින්; අජ්ඣිතො හොති, නොහරණ ලද වෙයි. (කවරෙක්ද?) යො මිත්තානං න දූභති, යමෙක් මිත්‍රයන්ට ද්‍රොහි නොවී නම් (හෙතෙමේයි.)

8. යො මිත්තානං න දූභති, යමෙක් සුහෘද් දනට සුහෘද්වී නම්, ගාවො තස්ස පජායන්ති, ගෙරිහු ඕහට පලදෙති; ඛෙත්තෙ, ක්ෂෙත්‍රයෙහි; වුත්තං වපුළතාක්; විරූහති, පැල අටගනී; පුත්තානං ඵලමස්නාති, දරුසැප වළඳයි·

9. දරිතො, දූදුරෙන් හෝ; පබ්බතාතො වා, පර්‍වතයෙන් හෝ රුක්ඛාතො, රුකින් හෝ, පතිතො, වැටුනාවූ; චුතො, යමකින් ගිලිහුනාවූ; නරො, සත්‍වතෙම, පතිට්ඨං ලභති, පිහිට ලබන්නේය; (කෙබඳු කෙනෙක්ද?) යො, යමෙක්, මිත්තානං, විස්වැසියනට; න දූභති, ද්‍රොහිනොව විස්වැසි නම් (හෙතෙමෙයි).

10. විරූළ්හ මූලසන්තානං
නිග්‍රොධම්ව මාලුතො,
අමිත්තා නප්පසහන්ති
යො මිත්තානං නදුහතීති.

---

## 14. මොරපරිත්තං

උදෙතයං චක්ඛුමා එකරාජා,
හරිස්සවණ්ණො පඨවිප්පභාසො,
තං තං නමස්සාමි හරිස්සවණ්ණං
පඨවිප්පභාසං,
තයජ්ජ ගුත්තා විහරෙමු දිවසං.

---

10. යො මිත්තානං නදූහති, යමෙක් හුදීත්ට හුදිවී නම්; විරූළ්හමූල සන්තානං, වැඩුනු මූල්පට අරටු ඇති; නිග්‍රොධම්ව මාලුතො, නුගරුක සොල්වා එලන්නට නොහැකි සුළඟ සෙයින්; අමිත්තා, සතුරෝ; නප්පසහන්ති, ඔහු මැඩපවත්නට නොහැකි වෙත්.

---

### මොර පිරිත.

14. චක්ඛුමා, ඇස් ඇති; එකරාජා, එකරාජවූ; හරිස්සවණ්ණො, රන්වන්වූ; පඨවිප්පභාසො, මහපොළොව බබුලුවන්නාවූ; අයං, මේ හිරුතෙම; උදෙති, නැගෙයි; තං, එහෙයින්; හරිස්සවණ්ණං, සවර්ණවර්ණවූ; පඨවිප්පභාසං, (මුළු පොළොව) බබුලුවන; තං, තා; නමස්සාමි, වඳිමි; තයා තාවිසින්; අජ්ජ, අද; ගුත්තා, ආරක්ෂාකරන ලද්දාවූ (අපි) දිවසං, මෙදවස්; විහරෙමු, (සුවසේ) වසමු.

යෙ බ්‍රාහමණා වෙදගු සබ්බධම්මෙ,
තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු,
නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා,
නමො විමුත්තානං නමො
විමුත්තියා.

ඉමං සො පරිත්තං කත්වා
මොරො චරති එසනා
අපෙතයං චක්ඛුමා එකරාජා,
හරිස්සවණ්ණො පඨවිප්පභාසො,
තං තං නමස්සාමි හරිස්සවණ්ණං
පඨවිප්පභාසං.

---

යෙ බ්‍රහමණා, යම් ක්ෂීණාශ්‍රව බ්‍රාහමණකෙනෙක්; සබ්බධම්මෙ, සියලු (ඥෙය) ධර්මයන්; වෙදගු, සම්‍යක් සම්බොධියට ගියෝ ද; තෙ, ඔවුන්ට, මෙ, මාගේ; නමො, නමස්කාරය වේවා; තෙ, ඒ භාග්‍යවත්හුද; මං, මා; පාලයන්තු, රක්‍ෂාකෙරෙත්වා; නමත්ථු බුද්ධානං, මාගේ නමස්කාරය අතීත බුදුන්ට වේවා, නමත්ථු බොධියා, (ඔවුන්ගේම සතර මාර්ගය සතර ඵලයයි කියන ලද) බොධියට; (මාගේ නමස්කාරය වේවා) නමො විමුත්තානං, අර්හත් ඵල විමුක්තීන් විමුක්තවූ (අතීත බුදුන්ට මාගේ නමස්කාරය වේවා; නමො විමුත්තියා, (ඔවුන්ගේම තදඞ්ග විමුක්ති ආදි පඤ්ච) විමුක්තියට මාගේ නමස්කාරය වේවා.

(මහණෙනි) සො මයූරො, ඒ මයූරතෙම; ඉමං පරිත්තං කත්වා, මේ පිරිත් කොට; එසනා චරති, (ඵල පල්ලවාදීන්ගේ) එෂණය කරමින් හැසිරෙන්නේය.

**තයජ්ජ ගුත්තා විහරේමු රත්තිං**
**යෙ බ්‍රහමණා වෙදගූ සබ්බධම්මෙ,**
**තෙමෙ නමො තෙච මං පාලයන්තු**
**නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා,**
**නමො විමුත්තානං නමො**
**විමුත්තියා**
**ඉමං සො පරිත්තං කත්වා**
**මොරො වාසමකප්පයීති.**

---

වත්තාහු; අයං, මේ හිරුතෙම අපෙති, පහවෙයි; තං, එහෙයින්; හරිස්සවණ්ණං, සවර්ණවර්ණ වූ; පඨවිප්පභාසං, (මුලු) පොළොව බබුලුවන; තං, තා; නමස්සාමි, වඳිමි; තයා, තා විසින්; අජ්ජ, අද; ගුත්තා රක්‍ෂා කරන ලද්දවූ; (අපි) රත්තිං, මේ සියලු රාත්‍රියෙහි විහරෙමු, සුවසේ වෙසෙමු.

යෙ බ්‍රහමණා, යම් ක්‍ෂීණාශ්‍රව බ්‍රහමණ කෙනෙක්; සබ්බධම්මෙ, සියලුධර්මයන්; වෙදගූ, (සියලු ආකාරයෙන් දත) සම්‍යක් සම්බෝධියට, පැමිණියේද; තෙ, ඔවුන්ට; මෙ, මාගේ, නමො. නමස්කාරය වේවා; තෙ ච, ඒ භගවත්හුද; මං, මා; පාලයන්තු, රක්‍ෂාකෙරෙත්වා; නමත්ථු බුද්ධානං (මාගේ මේ) නමස්කාරය අතීත බුදුන්ට වේවා; නමත්ථු බොධියා, (ඔවුන්ගේ) බොධියටද මාගේ නමස්කාරය වේවා; නමො විමුත්තානං, අර්හත් ඵල විමුක්තීන් විමුක්ත අතීත බුදුන්ටද (මාගේ නමස්කාරය වේවා; නමො. විමුත්තියා, (ඔවුන්ගේ පඤ්ච) විමුක්තියටද මාගේ නමස්කාරය වේවා.

සො, ඒ මයුරතෙම; ඉමං පරිත්තං කත්වා, මේ පිරිත කොට; වාසං විසීම; අකප්පයි, කෙළේයි.

## චන්‍දපරිත්තං

**15. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙත වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛො පන සමයෙන, චන්‍දිමා දෙවපුත්තො රාහුනා අසුරින්දෙන ගහිතො හොති, අථ ඛො චන්‍දිමා දෙවපුත්තො භගවන්තං අනුස්සර මානො, තායං වෙලායං ඉමං ගාථං අභාසි.**

---

### චන්‍ද පරිත්තං

15. මෙ, මාවිසින්; එවං සුතං, මෙසේ අසනලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවත්තෙම; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහිවූ; ජෙතවනෙ, ජෙතවන නම්වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬු මහසිටුහු විසින් කරවා පිළිගන්වන ලද අරම්හි; විහරති, වෙසෙයි; තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; චන්‍දිමා දෙවපුත්තො, සඳදෙව් පුත්තෙමේ; රාහුනා අසුරින්දෙන, රාහු අසුරේන්‍ද්‍රයා විසින්; ගහිතො හොති, ගන්නා ලද්දේ විය; අථ ඛො, ඉක්බිත්තෙන්; චන්‍දිමා දෙවපුත්තො, සඳ දෙව්පුත් තෙම; තායං වෙලායං, එවේලෙහි; භගවන්තං අනුස්සරමානො, බුදුන් සඳහන් කරන්නේ; ඉමං ගාථං අභාසි, මේ ගාථාව කිය.

බුඩවීර, බුඩවීරයාණනි, (නුඹ වහන්සේ) සබ්බධි, සියලු කෙලෙසුන් කෙරෙන්; විප්පමුත්තො අසි, විශෙෂයෙන් මිදුනු සේක; (එසේවූ) තෙ, නුඹවහන්සේට; නමො අත්ථු, නමස්කාර වේවා; සම්බාධපටිපන්නො අස්මි, සම්බාධස්ථානයකට පැමිණියෙමි; තස්ස මෙ, එසේවූ මට; සරණං භව, පිළිසරණවී වදාළ මැනව යනුයි.

**නමො තෙ බුද්ධවීරත්ථු,**
**විප්පමුත්තොසි සබ්බධි,**
**සම්බාධපටිපන්නොස්මි,**
**තස්ස මෙ සරණං භවාහි.**

**අථ ඛො භගවා චන්දිමං දෙව පුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාය අජ්ඣභාසි.**

**තථාගතං අරහන්තං**
**චන්දිමා සරණං ගතො**
**රාහු චන්දං පමුඤ්චස්සු**
**බුද්ධා ලොකානුකම්පකාති.**

---

අථ ඛො, එකල්හි; භගවා, බුදුරජතෙම; චන්දිමං දෙවපුත්තං ආරබ්භ, සඳදෙව්පුත් අරභයා; රාහුං අසුරින්දං, රාහු අසුරිඳුහට; ගාථාය, ගයකින්; අජ්ඣභාසි, මෙසේ වදාළසේක.

රාහු, රාහුඅසුරේන්ද්‍රය; චන්දිමා, චන්ද්‍ර දිව්‍ය රාජතෙම; තථාගතං අරහන්තං, නිකෙලෙශිවූ සර්වඥයන්; සරණං ගතො, සරණ ගියේය; බුද්ධා, සර්වඥවරයෝ; ලොකානුකම්පකා, ලොකානුකම්පකයහ; (එහෙයින්) චන්දං පමුඤ්චස්සු ඉති, සඳු අත්හරුවයි වදාළසේකි.

අථ ඛො, ඉක්බිත්තෙන්; රාහු අසුරින්දො, රාහු අසුරේන්ද්‍රතෙම; චන්දිමං දෙවපුත්තං මුඤ්චිත්වා, සඳදෙව්පුතු හැර; තර මානරූපො, වෙලෙවි වූයේ (හෙවත්) නොපමා වූයේ; වෙපචිත්ති අසුරින්දො, වෙපචිත්ති නම් අසුරේන්ද්‍රතෙම්; යෙන, යම් තැනෙක්හිද; තෙනුප සංකමි, එතන්හි එළඹියේය; උපසංකමිත්වා, එළඹ; සංවිග්ගො, බියපත් වූයේ; ලොමහට්ඨජාතො, වෙර ලොම් පිහිටියේ; එකමන්තං

අථ ඛො රාහු අසුරින්දො චන්දිමං දෙවපුත්තං මුඤ්චිත්වා තරමාන රූපො යෙන වෙපචිත්ති අසුරින්දො තෙනුපසංකමි, උපසංකමිත්වා සංවිග්ගො ලොමහට්ඨජාතො එකමන්තං අට්ඨාසි; එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි.

කින්නු සන්තරමානොව
රාහු චන්දං පමුඤ්චසි,
සංවිග්ගරූපො ආගම්ම
කින්නු භීතොව තිට්ඨසීති.

---

අට්ඨාසි, එකත්පස්ව සිටියේය, එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං, එකත්පස්ව සිටියාවූ රාහු අසුරිඳුහට වෙපචිත්ති අසුරින්දො, වෙපචිත්ති නම් අසුරේන්ද්‍ර තෙම; ගාථාය අජ්ඣභාසි, ගය කින් මෙසේ කීය.

රාහු, රාහු අසුරේන්ද්‍රය, සන්තරමානො, වෙලෙම්ට්ටුවකු මෙන්; කින්නු චන්දං පමුඤ්චසි, කුමක් පිණිස සඳු හැරියෙහිද, සංවිග්ග රූපො ආගම්ම, බියපත් ස්වරූප ඇතිවූයෙහි අවුත්; භීතොව, බා ගියාක්හු මෙන්; කින්නු තිට්ඨසි ඉති, කුමක් පිණිස සිටිතෙහිදැයි විචාළේය.

බුඬාගථාභි ගීතොමහි, බුදුන් විසින් සඳු හරුවයි ගාථාවක් කියන ලදින් ඇසුයෙමි; නොවෙ මුඤ්චෙය්‍ය චන්දිමං, ඉදින් සඳු

සත්තධා මෙ ඵලෙ මුද්ධා
ජීවන්තො න සුඛං ලභෙ,
බුද්ධගාථාභි ගීතොමහි
නොචෙ මුඤ්චෙය්‍ය චන්දිමන්ති.

චන්ද පරිත්තං.

---

සූරිය පරිත්තං.

16. එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙත-වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛො පන සමයෙන සූරියො දෙවපුත්තො රාහුනා අසුරින්දෙන

---

නොහැරියේවීම් නම්; සත්තධා මෙ ඵලෙ මුද්ධා, මාගේ මුදුන සත් කඩක්ව පැළෙයි; ජීවන්තො නසුඛං ලභෙ ඉති, දිවි තුබූවත් සුව නොලබම් යනුයි.

චන්ද්‍ර පරිත්‍රාණය යි.

---

සූරිය පරිත්තං.

16. මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන්වහන්සේ; සාවත්ථියං, සැවත්නුවර සමීපයෙහි; ජෙතවනෙ, ජේතවනයෙහි; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬු මහසිටාණන් කරවූ ආරාමයෙහි; විහරති, වසනසේක; තෙන ඛො පන සමයෙන, එසමයෙහි; සූරියො දෙවපුත්තො, හිරු දෙව්පුත් තෙමේ; රාහුනා අසුරින්දෙන ගහිතො හොති, රාහු අසුරිඳු විසින් ගන්නා ලද්දේ විය; අථ ඛො සූරියො දෙවපුත්තො, ඉක්බිත්තෙන් හිරු දෙව්පුත් තෙමේ; භගවන්තං අනුස්සරමානො, බුදුන් සඳහන් කරන්නේ; තායං වෙලායං, එවේලෙහි; ඉමං ගාථං අභාසි, මේ ගය කීය.

ගහිතො හොති, අථ ඛො සූරියො දෙවපුත්තො භගවන්තං අනුස්සරමානො තායං වෙලායං ඉමං ගාථං අභාසි.

නමො තෙ බුද්ධවීරත්ථු
විප්පමුත්තොසි සබ්බධි,
සම්බාධපටිපන්නොස්මි
තස්ස මෙ සරණං භවාති.

අථ ඛො භගවා සූරියං දෙවපුත්තං ආරබ්භ රාහුං අසුරින්දං ගාථාහි අජ්ඣභාසි.

---

බුද්ධවීර, බුද්ධවීරයාණනි; තෙ, නුඹවහන්සේට; නමො අත්ථු, නමස්කාර වේවා; සබ්බධි, හැමකල්හිම; විප්පමුත්තො අසි, කෙලශ සම්බාධයෙන් නුඹවහන්සේ) මිදුනුසේක; සම්බාධ පටිපන්නො අස්මි, (මම මේ රාහුගේ) සම්බාධස්ථානයට පැමිණියෙමි; තස්ස මෙ, එසේ වූ මට; සරණං භවාහි, පිළිසරණවී වදාළ මැනවයි සිහි කෙළේය.

අථ ඛො භගවා, එකල්හි බුදුරජතෙම; සූරියං දෙවපුත්තං ආරබ්භ, හිරුදෙව්පුත් අරභයා; රාහුං අසුරින්දං, රාහු අසුරිඳුහට; ගාථාහි අජ්ඣභාසි, ගාථාවලින් වදාළසේක

රාහු, එම්බල රාහු අසුරේන්ද්‍රය; සූරියො, හිරුදෙව්පුත්තෙමේ; තථාගතං අරහන්තං, නික්ලෙශිවූ සර්වඥයන්; සරණං ගතො, සරණ ගියේය, බුද්ධා ලොකානුකම්පකා, බුදුහු ලොවට කුළුණු ඇතියහ; (එහෙයින් සූරියං පමුඤ්චස්සු, හිරු අත්හරු.)

තථාගතං අරහන්තං
සූරියො සරණං ගතො,
රාහු සූරියං පමුඤ්චස්සු
බුද්ධා ලොකානු කම්පකාති.

යො අන්ධකාරෙ තමසි
පභංකරො
වෙරොචනො මණ්ඩලී
උග්ගතෙජො,
මා රාහු ගිලී චරං අන්තලික්ඛෙ
පජං මම රාහු පමුඤ්ච
සූරියන්ති.

---

යො, යම් සූර්‍ය්‍යයෙක්; අන්ධකාරෙ තමසි, බොල් ඇඳිරි රෑ; පභංකරො, පහන්කෙරේද; වෙරොචනො මණ්ඩලී, වෛරජනමඬුලු ඇති; උග්ගතෙජො, මහතෙද ඇත්තේද; රාහු, එම්බල රාහුව; අන්තලික්ඛෙ චරං පජං මාගිලී, අන්තරීක්ෂයෙහි ඇවිදිනා සත්හුය (එබැවින්) හිරු නොගල; රාහු, එම්බල රාහුව; මෙ සූරියං, මාගේ හිරු; පමුඤ්ච ඉති, හරුවයි වදාළසේක.

අථ ඛො, ඉක්බිත්තෙන්; රාහු අසුරින්දො, රාහු අසුරිඳුතෙම; සූරියං දෙවපුත්තං මුඤ්චිත්වා, සූර්‍ය්‍ය දිව්‍යපුත්‍රයා අත්හැර; තරමානරූපො, වෙලෙවිවූයේ; වෙපචිත්ති අසුරින්දො යෙන, වෙපචිත්ති අසුරෙන්ද්‍රතෙම යම් තැනෙක්හිද; තෙනුපසංකමි, එතනට එළඹියේය; උපසංකමිත්වා, කරා එළඹ; සංවිග්ගො ලොමහට්ඨජාතො, බියපත්වූයෙත් ලොමුදැහැගත්තා ලද්දේ; එකමන්තං අට්ඨාසි, එකත්පසෙක්හි සිටියේය; එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං, එකත්පසෙක සිටියාවූ රාහු අසුරෙන්ද්‍රයාහට; වෙපචිත්ති අසුරින්දො, වෙපචිත්ති අසුරෙන්ද්‍රතෙම; ගාථාය අජ්ඣභාසි, ගාථාවකින් මෙසේ කීය.

අථ ඛො රාහු අසුරින්දො සූරියං දෙවපුත්තං මුඤ්චිත්වා තරමානරූපො යෙන වෙපචිත්ති අසුරින්දො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා, සංවිග්ගො ලොමහට්ඨජාතො එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො රාහුං අසුරින්දං වෙපචිත්ති අසුරින්දො ගාථාය අජ්ඣභාසි.

කින්නු සන්තරමානොව
රාහු සූරියං පමුඤ්චසි,
සංවිග්ගරූපො ආගම්ම
කින්නු භීතොව තිට්ඨසීති.

---

රාහු, එම්බල රාහුව; කිනු, කිම; සන්තරමානොව, වෙලෙව් වූයෙහිම; සූරියං පමුඤ්චසි, හිරු අත්හැරියෙහි; සංවිග්ගරූපො ආගම්ම, බා ගොස් අවුත්; භීතොව, භය පත්වූයෙහි; කිනු තිට්ඨසි ඉති, කුමක් පිණිස සිටිතෙහිද; (එවිට රාහු අසුරිඳු) බුද්ධ ගාථාභි ගීතොමහි, සූර්‍ය්‍යයා හරුවයි යන ගාථා දෙකක් බුදුන් විසින් වදාළා ඇසීමි; (එසේ අසාත්) නොවෙ මුඤ්චෙය්‍ය සූරියං, ඉදින් හිරු අත්නොහරියෙම් නම්; සත්තධා මෙ ඵලෙ මුද්ධා, මා මුදුන සත්කඩක්කොට පැළෙනුඇ; ජීවනෙතා න සුඛං ලභෙ ඉති, දිවි තිබුනද සුව නොලබමි; (එහෙයින් සූර්‍ය්‍යයා අත්හැරියෙමි යි කීය.)

සූර්‍ය්‍ය පරිත්‍රාණය යි.

සතතාධා මෙ එලෙ මූඩා
ජීවනෙතා න සුඛං ලභෙ,
බුඩගාථාහි ගීතොම්හි
තොවෙ මුඤ්චෙය්‍ය සූරියනත්ථි.

---

ධජග්ග පරිත්තං | 6

**17.** එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙත-වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා

---

17. මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසනලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවත් තෙම; සාවත්ථියං, සැවැත් නුවර සමීපයෙහි වූ; ජෙතවනෙ, ජෙතනම්රාජකුමාරයාගේ උයනෙහි; අනාථපිණ්ඩිකස්ස ආරාමේ, අනේපිඩු මහ සිටුහුගේ විහාරයෙහි; විහරති, වැඩ වාසයකර වදාරණසේක්; තත්‍ර ඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවත්තෙම; භික්ඛවො ඉති, මහණෙනි යි; භික්ඛූ ආමන්තෙසි, භික්ෂූන්ට ආමන්ත්‍රණය කෙළේ; තෙ භික්ඛූ, ඒ මහණහු; භදන්තෙ ඉති, වහන්සැයි කියා; භගවතො, භාග්‍යවත්හට; පච්චස්සොසුං, පිළිවදන්දුන්හ; භගවා, භාග්‍යවත්තෙම; එතදවොච, මේ මතු කියන කාරණය වදාළසේක. භික්ඛවෙ, මහණෙනි; භූතපුබ්බං, පෙරවූ දෙයක් කියමි; හේ කවරයත්? දෙවාසුරසඞ්ගාමො, දෙවියන් හා අසුරයන්ගේ යුඩයෙක්; සමුපබ්බුළ්හො අහොසි, දෙසෙනග යුඩ සම්බන්ධ රැස් වී; භික්ඛවෙ, මහණෙනි; අථ ඛො, ඉක්බිත්තෙන්; සක්කො දෙවානමින්දො, සක්දෙව්රජතෙම; තාවතිංසෙ දෙවෙ, තවුතිසා වැසි දෙවියන්; ආමන්තෙසි, කැඳවීය; මාරිසා, නිදුකාණෙනි; සංගාමගතාතං, යුදඩයට ගිය; දෙවානං,

එතදවොච, භූතපුබ්බං භික්ඛවෙ දෙවාසුරසඞ්ගාමො සමුපබ්බූළ්හො අහොසි අථ ඛො භික්ඛවෙ සක්කො දෙවානමින්දො දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි, සචෙ මාරිසා දෙවානං සඞ්ගාමගතානං උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා මමෙව තස්මිං සමයෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ, මමං හි වො ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

---

දෙවියන්ට; භයං වා, භයෙක් හෝ; ඡම්භිතත්තං වා, තැතිගැන්මෙක් හෝ; ලොමහංසො වා, රොමොද්ගමනයෙක් හෝ; සචෙ උප්පජ්ජෙය්‍ය, ඉදින් උපන්නේවී නම්; තස්මිං සමයෙ, එසමයෙහි; මමෙව, මාගේම; ධජග්ගං, ධවජයාගේ අග්‍රය; උල්ලොකෙය්‍යාථ, බලව්; මමං හි, මාගේ; ධජග්ගං, ධවජාග්‍රය; උල්ලොකයතං වො, බලන්නාවූ තොපට; යං භයං වා, යම් බියෙක් හෝ, ඡම්භිතත්තං වා, යම් තැතිගැන්මෙක් හෝ; (යො) ලොමහංසො වා, යම් රොමොද්ගමනයෙක් හෝ; භවිස්සති, වේද; සො, හෙතෙම; පහීයිස්සති, පහවේ.

•

මෙ ධජග්ගං, මාගේ ධවජාග්‍රය; තොපෙ උල්ලොකෙය්‍යාථ; ඉදින් තොබලා නම්; අථ, ඉක්බිත්තෙන්; පජාපතිස්ස දෙවරාජස්ස, ප්‍රජාපති නම් දෙව්රජහුගේ; ධජග්ගං, ධවාජාග්‍රය; උල්ලොකෙය්‍යාථ, බලව්, පජාපතිස්සහි දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං වො,

නො චෙ මෙ ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, පජාපතිස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති, නොචෙ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, වරුණස්ස හි වො දෙව

---

ප්‍රජාපති නම් දෙව් රජහුගේ කොඩි අගබලන තොපට; යං භවිස්සති, යමෙක් වේද; භයං වා ඡම්භිතත්තං වා, බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ; ලොමහංසො වා, රොමොද්ගමනයෙක් හෝ වේද; සො, හෙතෙම; පහීයිස්සති, පහවේ; පජාපතිස්ස දෙවරාජස්ස, ප්‍රජාපති නම් දෙව් රජහුගේ; ධජග්ගං, කොඩි අග; නොචෙ උල්ලොකෙය්‍යාථ, ඉදින් නොබලා නම්, අථ, ඉක්බිත්තෙත්; වරුණස්ස දෙවරාජස්ස, වරුණ නම් දෙව්රජහුගේ; ධජග්ගං, කොඩි අග; උල්ලොකෙය්‍යාථ, බලව්; වරුණස්ස හි වො දෙවරාජස්ස, වරුණ නම් දෙව් රජහුගේ; ධජග්ගං, කොඩි අග; උල්ලොකයතං වො, බලන්නාවූ තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; (යං) ඡම්භිතත්තං වා, යම් තැතිගැන්මෙක් හෝ; (යො) ලොමහංසො වා, යම් රොමොද්ගමනයෙක් හෝ; භවිස්සති, වේද; සො, හෙතෙම; පහීයිස්සති, පහ වේ.

වරුණස්ස දෙවරාජස්ස, වරුණ නම් දෙව්රජහුගේ; ධජග්ගං නොචෙ උල්ලොකෙය්‍යාථ, කොඩිඅග ඉදින් නොබලව් නම්; අථ, නැවත; ඊසානස්ස දෙවරාජස්ස ධජග්ගං, ඊසාන නම් දෙව් රජහුගේ

රාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති.

නො චෙ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, අථ ඊසානස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ, ඊසානස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකය-තං, යං භවිස්සති භයංවා ඡම්භි-තත්තං ලොමහංසො වා පහීයිස්සති,

---

කොඩි අග; උල්ලොකෙය්‍යාථ, බලව්; ඊසානස්සහි දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං වො, ඊසාන නම් දෙවයාගේ කොඩි කෙළ-වර බලන තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; (යො) ලොමහංසො වා, යම් රොමොද්ගමනයෙක් හෝ; භවිස්සති, වේද; සො, හෙතෙම; පහීයිස්සති, පහ වේ.

භික්ඛවෙ මහණෙනි, සක්කස්ස වා දේවානමින්දස්ස, සක්දෙව් රජහුගේ හෝ; තං ඛො පන ධජග්ගං උල්ලොකයතං, ඒ ධවජාග්‍රය බලන්නවුන්ට; පජාපතිස්ස වා දෙවරාජස්ස, ප්‍රජාපති නම් දෙව්රජ හුගේ හෝ, තං ධජග්ගං උල්ලොකයතං, ඒ ධවජාග්‍රය බලන්නවුන්ට; වරුණස්ස වා දෙවරාජස්ස, වරුණ නම් දෙව් රජහුගේ හෝ; තං ධජග්ගං උල්ලොකයතං, ඒ ධවජාග්‍රය බලන්නවුන්ට; ඊසානස්ස වා දෙවරාජස්ස, ඊසාන නම් දෙව්රජහුගේ හෝ; තං ධජග්ගං උල්ලො-කයතං, ඒ ධවජාග්‍රහ බලන්නවුන්ට; යං භයං වා, යම් බියෙක් හෝ; (යං) ඡම්භිතත්තං වා, යම් තැතිගැන්මෙක් හෝ; (යො) ලොමහංසො වා, යම් රොමොද්ගමනයෙක් හෝ; භවිස්සති, වේද; සො, හෙතෙම; පහියෙථාපි, පහ වේ හෝයි; නො පහීයථෙ, නොපහ වේ හෝයි; තං කිස්සහෙතු? එයට කාරණ කිමයත්?

තං බො පන භික්ඛවෙ සක්කස්ස වා දෙවානමින්දස්ස ධජග්ගං උල්ලොකයතං, පජාපතිස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, වරුණස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, ඊසානස්ස වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයෙථාපි නොපි පහීයෙථ, තං කිස්ස හෙතු?

---

භික්ඛවෙ, මහණෙනි; සක්කො දෙවානමින්දො, සක්දෙව් රජ තෙම; අවීතරාගො, පහනොවූ රාග ඇත්තේය; අවීතදොසො, පහනොවූ ද්වෙෂ ඇත්තේය; අවීතමොහො, පහනොවූ මොහ ඇත්තේය; භීරු, බානසුලුය; ඡම්භි, තැතිගන්නාසුලුය; උත්‍රාසී, වෙසෙසින් බානසුලුය. පලායී, පලායන සුලුය; භික්ඛවෙ, මහණෙනි; අහඤ්ච බො, මමද වදාමි: එවං වදමි, මෙසේ කියමි; භික්ඛවෙ, මහණෙනි; අරඤ්ඤගතානං වා, වලට ගියාවූ හෝ; රුක්ඛමූලගතානං වා, රුක්මූලට ගියාවූ හෝ; සුඤ්ඤාගාරගතානං වා, ජනවිවික්ත ස්ථානයකට ගියාවූ හෝ; තුම්හාකං, තොපට; භයං වා, බියෙක්හෝ, ඡම්භිතත්තං වා, තැතිගැන්මෙක් හෝ; ලොමහංසො වා, රොමොද්ගමනයෙක් හෝ; සචෙ උප්පජ්ජෙය්‍ය, ඉදින් උපදනේවි නම්; තස්මිං සමයෙ, එසමයෙහි; මමෙව අනුස්සරෙය්‍යාථ මාම සඳහන් කරව්; (කෙසේද) සො භගවා, ඒ භාග්‍යවත්තෙම; ඉතිපි, මේ කාරණා යෙනුදු; අරහං, රහත; ඉතිපි සම්මාසම්බුද්ධො, සියලු ධර්මයන් මනා කොට දත; විජ්ජාචරණ සම්පන්නො, විද්‍යාචරණ සම්පන්නය, සුගතො, සුගතනම; ලොකවිදූ, ලොකවිදූනම; අනුත්තරො නිරුත්තරයහ; පුරිසධම්මසාරථි, පුරිසදම්‍යසාරථිය; සත්ථා, ශාස්තෘය; බුද්ධො, බුද්ධනම; භගවා භාග්‍යවත්නම; ඉති, මෙසේයි.

සක්කො භික්ඛවෙ දෙවානමින්දො අවීතරාගො අවීතදොසො අවීතමොහො භීරුඡම්භී උත්‍රාසී පලායීති. අහඤ්ච ඛො භික්ඛවෙ එවං වදාමි. සචෙ තුම්හාකං භික්ඛවෙ අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා සුඤ්ඤාගාරගතානං වා උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා මමෙව තස්මිං සමයෙ අනුස්සරෙය්‍යාථ, ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජා

---

භික්ඛවෙ, මහණෙනි; මමං හි අනුස්සරතං වො, මා සඳහන් කරන තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; (යං) ඡම්භිතත්තං වා, (යම්) තැතිගැන්මෙක් හෝ; (යො) ලොමහංසො වා, යම් රොමොද්ගමනයෙක් හෝ; භවිස්සති, වේද; සො, හෙතෙම; පහියිස්සති, දුරුවේ; නොවෙ මං අනුස්සරෙය්‍යාථ, ඉදින් මා සඳහන් නොකරා නම්; අථ, ඉක්බිත්තෙන්; ධම්මං අනුස්සරෙය්‍යාථ, ධර්මය සඳහන් කරව්; භගවතා, බුදුන් විසින්; ධම්මො, ධර්මයතෙමේ; ස්වාක්ඛාතො, මනාකොට කියනලදී; සන්දිට්ඨිකො, තමා විසින් ප්‍රත්‍යවෙක්ෂා ඥානයෙන් දක්ක යුතුය; අකාලිකො, තමාගේ ඉපදීමට අනතුරුවම ඵලදෙනුයේය; එහිපස්සිකො, අවුත් මේ බලව යන විධියට සුදුසුය; ඔපනයිකො, එළඹීමට සුදුසුය; විඤ්ඤූහි, නුවණැත්තන් විසින්; පච්චත්තං, තම තමූන් කෙරෙහිලා; වෙදිතබ්බො, දතයුත්තේය; ඉති මෙසේයි.

භික්ඛවෙ, මහණෙනි; ධම්මං අනුස්සරතං වො, ධර්මය සිහිකරන්නාවූ තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; (යං) ඡම්භිතත්තං වා, යම් තැතිගැන්මෙක් හෝ; (යො) ලොමහංසො වා, යම්

චරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

මමං හි වො භික්ඛවෙ අනුස්සරතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති, නො චෙ මං අනුස්සරෙය්‍යාථ, අථ ධම්මං අනුස්සරෙය්‍යාථ, ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො

---

රොමෝද්ගමනයෙක් හෝ; භවිස්සති, වේද; සො, හෙතෙම; පහී-යිස්සති, පහවේ; ධම්මං, ධර්මය; නොචෙ අනුස්සරෙය්‍යාථ, ඉදින් සඳහන් නොකරා නම්; අථ, ඉක්බිත්තෙන්; සඞ්ඝං, (උතුම්වූ) සඟහු; අනුස්සරෙය්‍යාථ, සිහිකරව්; කෙසේදයත්? භගවතො, බුදුන්ගේ; සාවකසඞ්ඝො, ශ්‍රාවක සඞ්ඝතෙම; සුපටිපන්නො, මනාව පිළිපන් නේය; භගවතො, බුදුන්ගේ; සාවකසඞ්ඝො, ශ්‍රාවකසඞ්ඝතෙමේ; උජුපටිපන්නො, ඉදිව වැදුම් පිළිවෙතින් පිළිපන්නේය; භගවතො, බුදුන්ගේ; සාවකසඞ්ඝො, ශ්‍රාවකසඞ්ඝතෙමේ; ඤායපටිපන්නො, නිවන් සඳහා පිළිපන්නේය; භගවතො, බුදුන්ගේ; සාවකසඞ්ඝො, ශ්‍රාවකසඞ්ඝතෙමේ; සාමීචිපටිපන්නො, නිවනට අනුකූලවූ පිළිවෙත පිළිපන්නේය; (ඔහු කවරහයත්?) යදිදං චත්තාරි පුරිසයුගානි, (සෝවාන්මඟ පිහිටියෝද සෝවාන්පෙළෙහි පිහිටියෝද එක් සඟ ළෙක) යනාදී මේ සතර පිරිමින් සඟළෙක් ඇද්ද; අට්ඨපුරිසපුග්ගලා ඒ අට පුහුල්වූ; එසභගවතො සාවකසඞ්ඝො, බුදුන්ගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ; ආහුනෙය්‍යො, දුරිනුදු ගෙනහැර දියයුතු ප්‍රත්‍යයට සුදුසුය; පාහුනෙය්‍යො, අමුතු පඬුරු පිළිගන්නට සුදුසුය; අඤ්ජලිකරණීයො

**අකාලිකො ඒහිපස්සිකො ඔපනයි-
කො පච්චත්තං වෙදිතබ්බො
විඤ්ඤූහීති.**

**ධම්මං හි වො භික්ඛවෙ අනුස්සර
තං, යං භවිස්සති භයං වා ඡම්භි-
තත්තං වා ලොමහංසො වා සො
පහීයිස්සති. නොචෙ ධම්මං අනුස්-
සරෙය්‍යාථ, අථ සංඝං අනුස්ස
රෙය්‍යාථ, සුපටිපන්නො භගවතො
සාවක සංඝො, උජුපටිපන්නො**

---

සියලු ලෝවැස්සන් විසින් දෙහොත් මුදුනෙහි තබා කරන නමස්කාරයට සුදුසුය; ලොකස්ස, සියලු ලෝවැස්සාගේ; අනුත්තරං, උතුම්වූ; පුඤ්ඤක්ඛෙත්තං, පින් හටගන්නා කෙතෙකැයි; ඉති, මෙසෙයින්; සඞ්ඝං හි අනුස්සරතං වො, සඟහු සඳහන් කරන තොපට; යං භයං වා, යම් බියෙක් හෝ; (යං) ඡම්භිතත්තං වා, යම් තැතිගැන්මෙක් හෝ; (සො) ලොමහංසො වා, යම් රොමොද්ගමන යෙක් හෝ; භවිස්සති, වේද; සො, හෙතෙම; පහීයිස්සති, පහ වේ; තං කිස්සහෙතු? එයට කාරණා කිමයත්? භික්ඛවෙ, මහණෙනි; අරහං, රහත්වූ; සම්මා සම්බුද්ධො, සම්‍යක් සම්බුද්ධවූ; තථාගතො, තථාගතතෙම; වීතරාගො, නසනලද රාග ඇත්තේය; විතදෙසො, නසනලද වෙෂ ඇත්තේය; වීතමොහො, නසනලද මොහ ඇත්-තේය; අභීරු, භය නැත්තේය; අච්ඡම්භි, තැතිගැනීම් නැත්තේය; අනුත්‍රාසි, චිත්තත්‍රාසයක් නැත්තේය; අපලායි ඉති, භයින් නොපලායන්නේය.

භගවා, භාග්‍යවත් තෙම; ඉදමවොච, මේ ධජග්ග පරිත්තය වදාළේ; සුගතො, ඉෂ්ටස්ථානයට ගියාවූ; සත්ථා, ශාස්තෘතෙමේ; ඉදං

භගවතො සාවක සංඝො, ඤායපටිපන්නො භගවතො සාවක සංඝො, සාමීචිපටිපන්නො භගවතො සාවක සංඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා, එස භගවතො සාවක සංඝො, ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති, සංඝං හි වො භික්ඛවෙ අනුස්සරතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති, තං කිස්ස–

---

වත්වා මෙසේ වදරා; අථ, නැවත; අපරං, අන්‍යවූ; එතං මේ කාරණය; අවොච, වදාළේය.

භික්ඛවෙ, මහණෙනි; අරඤ්ඤෙ, වල්හි හෝ; රුක්ඛමූලෙ වා, රුක්මුල්හි හෝ; සුඤ්ඤාගාරෙ වා, ජනවිවික්ත ස්ථානයන්හි හෝ; සම්බුද්ධං, සම්බුදුන්; අනුස්සරෙථ, සිහිකරව්; (එසේකල්හි) තුම්හාකං, තොපට; භයං නොසියා, භයෙක් නො වන්නේ යි.

ලොකජෙට්ඨං, ලොක ප්‍රධානවූ; නරාසභං, සත්‍වයන්ට උතුම්වූ; බුද්ධං බුදුන්; නොවෙ සරෙය්‍යාථ, ඉදින් සිහිනොකරා නම්; අථ, ඉක්බිත්තෙන්; නිය්‍යානිකං, සියලු දුක් ඉක්මීමට කාරණවූ; සුදෙ-සිතං, මනාකොට දෙසනලද ධම්මං, ධර්මයද; නොවෙ සරෙය්‍යාථ, ඉදින් සිහිනොකරා නම්; අථ, ඉක්බිත්තෙන්, අනුත්තරං, උතුම්වූ;

හෙතු? තථාගතො භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො වීතරාගො වීතදො-සො වීතමොහො අභීරු අච්ඡම්භී අනුත්‍රාසී අපලායීති.

ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා.

අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා
සුඤ්ඤාගාරෙව භික්ඛවො,
අනුස්සරෙථ සම්බුද්ධං
භයං තුම්හාකනොසියා.

නොචෙ බුද්ධං සරෙය්‍යාථ
ලොකජෙට්ඨං නරාසභං,
අථ ධම්මං සරෙය්‍යාථ
නිය්‍යානිකං සුදෙසිතං.

නොචෙ ධම්මං සරෙය්‍යාථ
නිය්‍යානිකං සුදෙසිතං,
අථ සංඝං සරෙය්‍යාථ
පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං.

උතුම්වූ, පුඤ්ඤක්ඛෙත්තං, පින්කෙත්වූ; සඞ්ඝං, ආර්‍ය්‍යසඞ්ඝයා; සරෙය්‍යාථ, සිහිකරව්; භික්ඛවෙ, මහණෙනි; බුද්ධං, බුදුන්ද; ධම්මං, ධර්මයද; සඞ්ඝං ච, ආර්‍ය්‍ය සඞ්ඝයාද; එවං, මෙසේ; සරනනා

එවං බුද්ධං සරන්තානං
ධම්මං සංඝඤ්ච භික්ඛවො,
භයං වා ඡම්භිතත්තං වා
ලොමහංසො න හෙස්සති.

පඨමක භාණවාරං.

---

මහාකස්සපත්ථෙර බොජ්ඣඞ්ගං.

18. එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ, තෙන ඛො පන සමයෙන ආයස්මා මහාකස්සපො පිප්ඵලිගුහායං විහරති ආබාධිකො

---

තං, සිහිකරන්නවුන්ට, භයං වා, බියෙක් හෝ; ඡම්භිතත්තං වා, තැති ගැන්මෙක් හෝ; ලොමහංසො වා, රොමොද්ගමනයෙක් හෝ; න හෙස්සති, නොවේ.

ධජග්ග පරිත්‍රාණයයි.
පළමුවන බණවරය යි.

---

මහාකස්සපත්ථෙර බොජ්ඣඞ්ගය.

18 මෙ, මා විසින්; එවං සුතං, මෙසෙයින් අසනලදී; එකං සමයං, එක්සමයෙක්හි; භගවා, බුදුරජතෙම; රාජගහෙ, රජගහ නුවර; කලන්දකනිවාපෙ, ලෙහෙනුන්ට දෙනලද නිවාප ඇති හෙයින් කලන්දකනිවාප නම්වූ; වෙළුවනෙ, හුණවෙනෙන් පරික්ෂිප්ත හෙයින් වෙළුවන නම්වූ; වෙහෙරෙහි; විහරති, වසනසේක; තෙන ඛො පන සමයෙන, එසමයෙහි; ආයස්මා මහාකස්සපො, ආයු බොහෝවූ මහකසුප්; ආබාධිකො, උපන් ලෙඩ ඇත්තේ; දුක්ඛිතො

දුක්ඛිතො බාළ්හගිලානො, අථ ඛො භගවා සායණ්හසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාකස්සපො තෙනුපසංකමි උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං මහාකස්සපං එතදවොච.

කච්චි? තෙ කස්සප! ඛමණීයං කච්චි යාපනීයං. කච්චි? දුක්ඛා වෙදනා, පටික්කමන්ති නො අභික්කමන්ති පටික්කමොසානං පඤ්ඤායති

---

බාළ්හගිලානො, දුක්පත් ගිලන්වූයේ; පිප්ඵලිගුහායං විහරති, පිප්ඵලිගුහායෙහි වෙසෙයි; අථ ඛො, එකල්හි; භගවා, භාග්‍යවත් තෙම; සායණ්හසමයං, සවස්වේලෙහි; පතිසල්ලානා වුට්ඨිතො, සමවතින් නැගිසේක්; යෙනායස්මා මහාකස්සපො, යම් තැනක ඇවැත් මහකසුප් ද; තෙනුපසඞ්කමි, එතනට වැඩිසේක; උපසඞ්කමිත්වා, වැඩ; පඤ්ඤත්තෙ ආසනෙ, පැණවූ අස්නෙහි; නිසීදි, වැඩ හුන්සේකි; නිසජ්ජ ඛො භගවා, එසේ වැඩහුන් බුදුරජතෙම; ආයස්මන්තං මහාකස්සපං එතදවොච, ඇවැත්වූ මහකසුප්හට මෙසේ වදාළසේක.

කස්සප, කාශ්‍යපය; තෙ, තෝපට; කච්චි? කිමෙක්ද, ඛමනීයං සහනයට හැකිද; කච්චි යාපනීයං, කිම යැපේද? හෙවත් තොපගේ ශරීරය පවත්වන්නට හැකිද; කච්චි, කිමෙක; දුක්ඛා වෙදනා,* දුක්ඛවෙදනාවෝ; පටික්කමන්ති, පිරිහෙද්ද; නො අභික්කමන්ති, නොපිරිහෙද්ද; පටික්කමොසානං පඤ්ඤායති, කිම

නො අභික්කමොති, න මෙ භන්තෙ, ඛමණීයං න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

සත්තිමෙ කස්සප! බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති, කතමෙ සත්ත? සතිසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප!

---

ප්‍රතික්‍රමණාවසානය පෙනේද; නො අභික්කමොති, කිම වැඩුම් නොපෙනේදැයි අසා වදාළසේක; (ඒ අසා මහකසුප් තෙරහු) භන්තෙ, ස්වාමින්වහන්ස; මෙ, මට; න ඛමණීයං, ඉවසන්ට නොහැකිය; න යාපනීයං, සතර ඉරියව්වෙහි ශරීරය පවත්වන්නට නොහැක්ක, බාළ්හා මෙ දුක්ඛාවෙදනා, මට දුක්වෙදනාවෝ බලවත්හ; අභික්කමන්ති, දුක්ඛවෙදනාවෝ වැඩෙන්නාහ; නො පටික්කමන්ති, ප්‍රතික්‍රමණය නොවෙත්; (හොඳ නොවෙති) අභික්කමොසානං, දුක්ඛවෙදනාවන්ගේ වැඩීම; පඤ්ඤායති, පෙනෙයි; නො. පටික්කමොති අඩුවක් නො පෙනෙයි යනුයි·

කස්සප, කාශ්‍යපය; සත්තිමෙ බොජ්ඣංගා, මේ සත්වැදෑරුම් බොධ්‍යංග ධර්මයෝ; මයා සම්මදක්ඛාතා, මා විසින් (අවිපරීත වශයෙන්) මොනවට ප්‍රකාශ කරන ලද්දහ; භාවිතා, භාවිත කරන ලදහ; බහුලීකතා, බොහෝ කරන ලදහ; අභිඤ්ඤාය සත්‍යප්‍රතිවේධය පිණිස; සම්බොධාය, ඔහුගේම අවබෝධය පිණිස; නිබ්බානාය නිර්වාණය පිණිස; සංවත්තන්ති, පවතිත්; කතමෙසත්ත, කවර, සප්තබොධ්‍යංගහයත්? කස්සප, කාශ්‍යපය; සතිසම්බොජ්ඣංගො ඛො, සතිසම්බොධ්‍යංගය; මයා සම්මදක්ඛාතො, මා විසින් මොනවට

මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, විරියසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

පීති සම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො

---

කියනලද්දේය; භාවිතො, භාවිත කරන ලද්දේය; බහුලීකතො; බොහෝ කරන ලද්දේය; අභිඤ්ඤාය, සත්‍යප්‍රතිවේධය පිණිස; සම්බොධාය, ඔහුගේම අවබොධය පිණිස; නිබ්බානාය, නිර්වාණයට; සංවත්තති, වැටේ; කස්සප, කාශ්‍යපය; ධම්මවිචය සම්බොජ්ඣංගො ඛො, ධම්මවිචය සම්බොධ්‍යංගය; මයා, මා විසින්; සම්මදක්ඛාතො, මොනවට කියන ලදී; අභිඤ්ඤාය, අභිඥෙය ධර්මයන් විශෙෂයෙන් දක්නා පිණිස; සම්බොධාය, එවුන්ගේම අවබෝධය පිණිස, නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, වැටේ; විරියසම්බොජ්ඣංගො ඛො කස්සප, කාශ්‍යපය වීර්‍යසම්බොධ්‍යංගය; මයා සම්මදක්ඛාතො, මා විසින් මනාකොට කියන ලද්දේය; අභිඤ්ඤාය, සත්‍යප්‍රතිවේධය පිණිස; සම්බොධාය, ඔවුන්ගේ අවබෝධය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, පවත්නේය.

කස්සප, කාශ්‍යපය; පීතිසම්බොජ්ඣංගො ඛො, ප්‍රීතිසම්බොධ්‍යංගය; මයා, මා විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන

භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො බො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, සමාධි සම්බොජ්ඣඞ්ගො බො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො බො

---

දේය; භාවිතො, භාවිත කරන ලද්දේය; බහුලීකතො, බොහෝ කරන ලද්දේය; අභිඤ්ඤාය, සත්‍යප්‍රත්‍යවෙධය පිණිස; සම්බොධාය, ඔහුගේම අවබොධය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස· සං-වත්තති, පවතියි; කස්සප, කාශ්‍යපය; පස්සද්ධිසම්බොජ්ඣංගො බො ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යංගය; මයා, මාවිසින්; සම්මදක්ඛාතො, මොනවට කියන ලද්දේය; භාවිතො, භාවිත කරන ලද්දේය; බහුලීකතො, බහුලීකෘත කරන ලද්දේය; අභිඤ්ඤාය; සත්‍යප්‍රතිවෙධය පිණිස සම්බොධාය, ඔහුගේම අවබොධය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, පවතියි; කස්සප, කාශ්‍යපය; සමාධිසම්-බොජ්ඣඞ්ගො බො, සමාධිසම්බොධ්‍යඞ්ගය; මයා, මා විසින්; සම්ම දක්ඛාතො, මොනවට කියන ලද්දේය; භාවිතො, භාවිත කරන ලද්දේය; බහුලීකතො, බහුලීකෘත කරන ලද්දේය; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවෙධය පිණිස; සම්බොධාය ඔහුගේම අවබොධය පිණිස, නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, පවතියි, කස්සප; කාශපය; උපෙක්ඛා, සම්බොජ්ඣංගො බො, උපෙක්‍ෂා සම්බො

කස්සප! මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති,

ඉමෙ ඛො කස්සප, සත්ත බොජ්ඣඞ්ගා, මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. තග්ඝ භගව බොජ්ඣඞ්ගා තග්ඝ සුගත බොජ්ඣඞ්ගාති, ඉදමවොච භගවා අත්තමනො ආයස්මා මහා

---

ධ්‍යංගය; මයා, මා විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලද්දේය; භාවිතො, භාවිත කරන ලද්දේය; බහුලීකතො, බහුලීකෘත කරන ලද්දේය; අභිඤ්ඤාය, සත්‍යප්‍රතිවෙධය පිණිස; සම්බොධාය, ඔහුගේම අවබොධය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, පවතියි.

කස්සප, කාශ්‍යපය; ඉමෙ ඛො සත්තබොජ්ඣඞ්ගා, මේ බොධ්‍යඞ්ගයෝ සත්දෙන; මයා, මා විසින්, සම්මදක්ඛාතා, මොනවට කියන ලදහ; භාවිතා, භාවිත කරන ලදහ; බහුලීකතා, බොහෝ කරන ලදහ; අභිඤ්ඤාය, සත්‍යප්‍රතිවෙධය පිණිස; සම්බොධාය, ඔවුන්ගේම අවබොධය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තන්ති, පවතිත් (යයි වදාළසේක.) (ඊට අනතුරුව මහකසුප් තෙරහු) භගවා, භාග්‍යවතුන්වහන්ස; බොජ්ඣංගා, වදාළ සප්ත බොධ්‍යඞ්ගයෝ; තග්ඝ, ඒකාන්තයහ; සුගත, සුගතවූ සර්වඥයන් වහන්ස; බොජ්ඣඞ්ගා, බොධ්‍යඞ්ගයෝ; තග්ඝ ඉති, මැනවයි දූන් වූහ; භගවා, භාග්‍යවත් තෙම; ඉදං අවොච, මෙසේ වදාළසේක; අත්තමනො, සතුටුවූ; ආයස්මා මහාකස්සපො, ආයුෂ්මත්වූ මහා

කස්සපො භගවතො භාසිතං අභි නන්දි, උට්ඨාහි චායස්මා මහාකස්ස පො තම්හා ආබාධා, තථාපහීනො චායස්මතො මහාකස්සපස්ස සො ආබාධො අහොසිති.

මහාකස්සපත්ථෙර බොජ්ඣඞ්ගා.

---

මහාමොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ගං

19. එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්ද කනිවාපෙ, තෙන ඛො පන සමයෙන ආයස්මා මහාමොග්ගල්ලානො

---

කාශ්‍යප ස්ථවිර තෙම්; තම්හා ආබාධා, ඒ ලෙඩින්; උට්ඨාහි ච, නැගිසේක්මය; පහීනොච, එසේම පහව ගියේමය; ආයස්මතො මහාකස්සපස්ස, ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේට; සො ආබාධො, ඒ ආබාධය තෙම්; තථා අහොසි ඉති, (යම්සේ නූප දීද) එලෙසින් වූයේය.

මහාකාශ්‍යපස්ථවිර බොධ්‍යඞ්ගය යි.

---

මහාමොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ග ය.

19 මෙ, මා විසින්; එවං සුතං, මෙසේ අසනලදී; එකං සමයං, එක්සමයෙක්හි, භගවා, භාග්‍යවතුන් වහන්සේ; රාජගහෙ, රජ ගහානුවර; කලන්දකනිවාපෙ, කලන්දකනිවාප නම්වූ; වෙළුවනෙ වෙළුවනාරාමයෙහි; විහරති, වැඩ වාසයකරවදාරනසේක,' තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; ආයස්මා මහාමොග්ගල්ලා

ගිජ්ඣකූටෙ පබ්බතෙ විහරති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, අථ ඛො භගවා සායණ්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච.

කච්චි? තෙ මොග්ගල්ලාන, ඛමනීයං කච්චි? යාපනීයං කච්චි? දුක්ඛා වෙදනා, පටික්කමන්ති නො

---

තො, ආයුෂ්මත් මුගලන් මහ තෙරුන්වහන්සේ; ආබාධිකො, ආබාධ ඇතිවූයේ; දුක්ඛිතො බාළ්හගිලානො, බලවත්වූ දුක්ඛයෙන් ගිලන්වූයේ; ගිජ්ඣකූටෙ පබ්බතෙ, ගිජුකුළුපව්වෙහි; විහරති, වැඩ වාසය කරනසේක; අථ ඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවත් තෙම; සායණ්හසමයං, සවස් වේලෙහි; පතිසල්ලානා වුට්ඨිතො, සමවතින් නැගිසේක්, යෙන, යම්තැනෙක්හි; මහාමොග්ගල්ලානො, මුගලන් මහාස්ථිරද; තෙනුපසඞ්කමි, එතනට එළඹිසේක. උපසඞ්කමිත්වා, එළඹ; පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, පැනවූ අස්නෙහි වැඩහුන්සේකි; නිසජ්ජ ඛො, එසේ වැඩහුන්නාවූ; භගවා, භාග්‍යවත්තෙම; ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච, ඇයුෂ්මත් වූ මුගලන් මහ තෙරුන් වහන්සේට මෙසේ වදාළසේක.

මෝග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; තෙ තට; කච්චි? කිම? ඛමනීයං, සුවද; කච්චි? යාපනීයං කිම? ඉරියව් පවතිද; කච්චි?

අභික්කමන්ති? පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති, න මෙ භන්තෙ, ඛමනීයං න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති, සත්තිමෙ මොග්ගල්ලාන බොජ්ඣංගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති, කතමෙ සත්ත?

---

කිම? දුක්ඛාවෙදනා; දුක්ඛවෙදනාවෝ; පටික්කමන්ති, නොබසිද්ද; නො අභික්කමන්ති, නොනැඟෙද්ද; පටික්කමොසානං; ප්‍රතික්‍රමන මාර්ගය, පඤ්ඤායති, පැනේද? නො අභික්කමොති, නැඟෙන මාර්ගය නොපෙනේද? භන්තෙ, වහන්ස; න මෙ ඛමනීයං, මට ඉවසිය නොහැක්කේය; න යාපනීයං, යැපීමට නො හැක්කේය; මෙ, මාගේ බාළ්හා දුක්ඛාවෙදනා, බලවත් දුක්වේදනාවෝ; අභික්කමන්ති, වැඩෙන්නාහ; නො පටික්කමන්ති, නොබසිත්; අභික්කමොසානං පඤ්ඤායති, ඔහු වඩනා මඟ පැනෙයි; නො පටික්කමොති, බස්නා මඟ නො පෙනෙයි; මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා, මෙ සප්තබොධ්‍යඞ්ග ධර්මයෝ; මයා, මා විසින්; සම්මදක්ඛාතා, මොනවට කියන ලදහ, භාවිතා, භාවිත කරනලදහ; බහුලීකතා, බොහෝ කරන ලදහ; අභිඤ්ඤාය සම්බොධාය, විශිෂ්ට ඥානයෙන් දැන, නිබ්බානාය, නිවන්පසක් කරනු පිණිස; සංවත්තන්ති, පවතිත්; කතමෙසත්ත? ඔහු කවර සප්තබොධ්‍යඞ්ග හයත්?

සති සම්බොජ්ඣඞෙගා බො මොගගලලාන, මයා සමම දකඛාතො භාවිතො බහුලීකතො අභිඤඤාය සමෙබාධාය නිබබානාය සංවතතති, ධමමවිචය සමෙබාජඣ-ඞෙගා බො මොගගලලාන මයා සමමදකඛාතො භාවිතො බහුලී කතො අභිඤඤාය සමෙබාධාය නිබබානාය සංවතතති, විරිය සමෙබාජඣඞෙගා බො මොගග-ලලාන, මයා සමමදකඛාතො භාවිතො බහුලීකතො අභිඤඤාය සමෙබාධාය නිබබානාය සංවතතති.

---

මොගගලලාන, මෞදගල්‍යායනය; සතිසමෙබාජඣඞෙගා බො, සතිස මෙබාධ්‍යඞගය; මයා, මා විසින්; සමමදකඛාතො, මොනවට කියන ලදහ; භාවිතො, භාවිතයහ; බහුලීකතො, බහුලීකෘතය; අභිඤඤාය සමෙබාධාය, විශිෂට ඤාණයෙන්දැන; නිබබානාය සංවතතති, නිවන්පසක් කිරීම පිණිස පවතී; මොගගලලාන, මෞදගල්‍යායනය; ධමමවිචයසමෙබාජඣඞෙගා බො, ධර්මවිචය සමෙබාධ්‍යඞගය; මයා, මා විසින්; සමමදකඛාතො, මොනවට; කියන ලදහ; භාවිතො, භාවිත යහ; බහුලීකතො, බහුලීකෘතයහ; අභිඤඤාය සමෙබාධාය, විශිෂට ඤාණයෙන් දැන; නිබබානාය සංවතතති, නිවන්පසක් කිරීම පිණිස පවතී; මොගගලලාන, මෞද්ගල්‍යායනය; විරිය සමෙබාජඣඞෙගා බො, වීර්‍ය සමෙබාධ්‍යඞගය; මයා, මා විසින්; සමමදකඛාතො, මනාකොට කියන ලද්දේය; භාවිතො, භාවිතයහ; බහුලීකතො, බහුලීකෘතයහ; අභිඤඤාය සමෙබාධාය, විශිෂට ඤාණයෙන් දැන; නිබබානාය, නිවන්පසක් කිරීම පිණිස; සංවතතති, පවතී.

පීති සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. සමාධි සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන! මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

---

මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; පීතිසම්බොජ්ඣඞ්ගො ඛො, ප්‍රීති සම්බොධ්‍යඞ්ගය; මයා, මා විසින්; සම්මදක්ඛාතො, මොනවට කියන ලදහ; භාවිතො, භාවිත කරන ලදහ; බහුලීකතො, බහුලී කෘත කරන ලදහ; අභිඤ්ඤාය සම්බොධාය, විශිෂ්ට ඥානයෙන් දැන; නිබ්බානාය, නිවන්පසක් කිරිම පිණිස; සංවත්තති, පවතී. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ඛො, -පෙ- සමාධි -පෙ- උපෙක්ඛා-පෙ.

ඉමෙ බො මොග්ගල්ලාන සත්ත බොජ්ඣංගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති, තග්ඝ භගව, බොජ්ඣංගා තග්ඝ සුගත, බොජ්ඣංගාති, ඉද-මවොච භගවා අත්තමනො ආයස්මා මහා මොග්ගල්ලානො භගවතො භාසිතං අභිනන්දි, වුට්ඨාහි චායස්මා මහා මොග්ගල්ලානො තම්හා

---

මොග්ගල්ලාන, මෞද්ගල්‍යායනය; ඉමෙ සත්තසම්බොජ්ඣඞ්ගා, මේ සප්ත බොධ්‍යඞ්ග ධර්මයෝ; මයා, මා විසින්; සම්මදක්ඛාතා, මොනවට කියන ලදහ; භාවිතා, වඩන ලදහ; බහුලීකතා, බහුල කරන ලදහ; අභිඤ්ඤාය, අභිඥාලාභය පිණිස; සම්බොධාය, සම්‍යක් සම්බොධිය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තන්ති, පවතිත්; භගවා, භාග්‍යවතුන්වහන්ස; බොජ්ඣඞ්ගා, බොධ්‍යඞ්ග ධර්මයෝ; තග්ඝ, එසේය, සුගත, සුගතයන් වහන්ස; බොජ්ඣඞ්ගා, බොධ්‍යඞ්ග ධර්මයෝ; තග්ඝ ඉති, එසේය; භගවා, භාග්‍යවත් තෙම; ඉදං අවොච, මෙය වදාළසේක; අත්තමනො, සතුටුවූ; ආයස්මා මහාමොග්ගල්ලානො, ආයුෂ්මත්වූ මුගලන් මහාස්ථවිරයන්වහන්සේ; භගවතො, බුදුරජාණන් වහන්සේගේ; භාසිතං, දෙශනාවට; අභිනන්දි, විශෙෂයෙන් සතුටු විය; ආයස්මා මහා මොග්ගල්ලානො, ඇවැත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරතෙම; තම්හා ආබාධා, ඒ ලෙඩින්, වුට්ඨාහි ච, නැගිට්ටේය; තථා පහීණො ච, එසේම පහව

ආබාධා තම්හා පහීනොචායස්මතො මහා මොග්ගල්ලානස්ස සො ආබාධො අහොසීති.

මහාමොග්ගල්ලායන ස්ථවිර බොජ්ඣඞ්ගා.

---

මහාචුන්දත්ථෙර බොජ්ඣඞ්ගො

**20.** එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ, තෙන ඛො පන සමයෙන, භගවා ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො, අථ ඛො ආයස්මා මහාචුන්දො, සායණ්හ සමයං පටිසල්ලානා වුට්ඨිතො,

---

ගියේ, ආයස්මතො මහා මොග්ගල්ලානස්ස, ආයුෂ්මත් මුගලන් මහ තෙරුන් වහන්සේට; සො ආබාධො අහොසීති, ඒ ආබාධය නැවත නූපදිනා සේ වූයේය.

මහාමෞද්ගල්‍යායන ස්ථවිර බොධ්‍යඞ්ගය යි.

---

මහාචුන්දත්ථෙර බොජ්ඣඞ්ග ය.

20. මෙ, මා විසින්; එවං, මෙසේ; සුතං, අසන ලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවත් තෙම; රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ, රජගහ නුවර නිසා කලන්දක නිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වෙසෙයි; තෙන ඛො පන සමයෙන; එකල්හි වනාහි; භගවා, භාග්‍යවත් තෙම; ආබාධිකො හොති ගිලන්විය; දුක්ඛිතො, බාළ්හගිලානො, දුක්ඛිතවූ බලවත් ගිලන්කමට පැමිණියේය; අථ ඛො ආයස්මාමහාචුන්දො, ඉක්බිති ආයුස්මත් වූ මහාචුන්ද ස්ථවිරතෙම; සායණ්හසමයං, සවස් වේලෙහි, පටිසල්ලානා වුට්ඨිතො, සමවතින්නැංගේ; භගවා, භාග්‍ය

යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහාචුන්දං භගවා එතදවොච.

පටිභන්තු තං චුන්ද බොජ්ඣංගාති, සත්තිමෙ භන්තෙ බොජ්ඣංගා, භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති, කතමෙ සත්ත? සතිසම්බොජ්ඣංගො ඛො

---

වත තෙමේ; යෙන, යම්තැනෙක්හිද; තෙන, එතැනට; උපසංකමි, එළඹියේය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං ;අභිවාදෙත්වා, බුදුරජාණන් වහන්සේ වැඳ; එකමන්තං නිසීදි, එකත්පසෙක්හි හුන්නේය; එකමන්තං නිසින්නං ඛො, එකත්පස්ව හුන්නාවූ; ආයස්මන්තං මහාචුන්දං, ආයුෂ්මත් මහාචුන්ද සප්විරයන් වහන්සේට, භගවා, භාග්‍යවත්තෙම; එතදවොච, මෙසේ වදළෝ.

පටිභන්තු තං චුන්ද බොජ්ඣඞ්ගාති, චුන්දය බොධ්‍යඞ්ග ධර්මයෝ තොපට වැටහෙත්වා; භන්තෙ, වහන්ස; ඉමෙ සත්තබොජ්ඣංගා, මේ සත් බොජ්ඣඟු; භගවතා සම්මදක්ඛාතා, බුදුරජහු විසින් මොනවට කියන ලදහ; භාවිතා, භාවිත කරන ලදහ; බහුලීකතා, බොහෝ කරන ලදහ; අභිඤ්ඤාය, සම්බොධාය, සම්‍යක් සම්බොධිය පිණිස විශිෂ්ඨ ඥානයෙන් දැන ගැනීම පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තන්ති, පවතිත්; කතමෙ සත්ත? (ඒ) කවර සත් බොජ්ඣඟයන්? භන්තෙ, වහන්ස; සතිසම්බොජ්ඣංගො ඛො, සතිසම්බොධ්‍යංගය; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්;

භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, ධම්මවිචය සම්බොජ්ඣංගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, විරිය සම්බොජ්ඣංගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති,

පීතිසම්බොජ්ඣංගො ඛො භන්තෙ භගවතා සම්මදක්ඛාතො

---

සම්මදක්ඛාතො මොනවට කියන ලදහ; භාවිතො, භාවිතයහ; බහුලීකතො, බහුලව කරන ලදහ; අභිඤ්ඤාය, විශිෂ්ට ඥනයෙන් දැනගැනීම පිණිස; සම්බොධාය, සම්බොධිය පිණිස; නිබ්බානාය, නිවන් පසක් කිරීම පිණිස; සංවත්තති, පවතී; භන්තෙ, වහන්ස; ධම්මවිචයසම්බොජ්ඣංගො ඛො, ධර්මවිචය සම්බොධ්‍යංගය; භගවතා, බුදුන් විසින්; සම්මදක්ඛාතො, මොනවට කියන ලදහ; භාවිතො; භාවිතයහ; බහුලීකතො, බහුල කරන ලදහ; අභිඤ්ඤාය, විශිෂ්ට ඥනයෙන් දැනගැනීම පිණිස; සම්බොධාය; සම්බොධිය පිණිස, නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, පවතී.

භන්තෙ, වහන්ස; පීතිසම්බොජ්ඣංගො ඛො, ප්‍රීතිසම්බොධ්‍යංගය; භගවතා, බුදුරජහු විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන

භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය
සම්බොධාය නිබ්බානාය සංවත්තති,
පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො බො
භන්තෙ, භගවතා සම්මදක්ඛාතො
භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය
සම්බොධාය නිබ්බානාය සංවත්තති,
සමාධි සම්බොජ්ඣඞ්ගො බො
භන්තෙ, භගවතා සම්මදක්ඛාතො
භාවිතො බහුලීකතො, අභිඤ්ඤාය
සම්බොධාය නිබ්බානාය සංවත්තති.

---

ලද්දේය; භාවිතො, භාවිත කරන ලද්දේය; බහුලීකතො, බහුල කරන ලද්දේය; අභිඤ්ඤාය, විශිෂ්ට ඥානයෙන් දැනගැන්ම පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, පවතී; භන්තෙ, වහන්ස; පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො බො, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යංගය; භගවතා, බුදුරජහු විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලද්දේය; භාවිතො, භාවිත කරන ලද්දේය; බහුලීකතො, බහුලව කරන ලද්දේය; අභිඤ්ඤාය, විශිෂ්ට ඥානයෙන් දැනගැන්ම පිණිස; සම්බොධාය, සම්‍යක් සම්බෝධිය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, පවතී; භන්තෙ, වහන්ස සමාධිසම්බොජ්ඣඞ්ගො බො, සමාධිසම්බොධ්‍යංගය; භගවතා, භාග්‍යවත්හු විසින්; සම්මදක්ඛාතො, මනාකොට කියන ලද්දේය; භාවිතො, භාවිත කරන ලද්දේය; බහුලීකතො, බහුලව කරන ලද්දේය; අභිඤ්ඤාය; විශිෂ්ට ඥානයෙන් දැනගැන්ම පිණිස; සම්බොධාය, සම්බෝධිය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තති, පවතී.

# උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, ඉමෙ ඛො භන්තෙ, සත්තබොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. තග්ඝ චුන්ද, බොජ්ඣඞ්ගා තග්ඝ චුන්ද, බොජ්ඣඞ්ගාති, ඉදමවොචායස්මා මහාචුන්දෙ සමනුඤ්ඤො

---

භන්තෙ, වහන්ස, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඛො, උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතො, මනාකොට දෙශනා කරන ලද්දේය; භාවිතො, වඩන ලද්දේය; බහුලීකතො, බහුල කරන ලද්දේය; අභිඤ්ඤාය, විශිෂ්ට ඥනයෙන් දැනගැනීම පිණිස; සම්බොධාය, සම්බොධිය පිණිස; නිබ්බානාය, නිවන් පිණිස; සංවත්තති, පවතී; භන්තෙ, වහන්ස; ඉමෙ ඛො සත්තබොජ්ඣඞ්ගා, මේ සප්තබොධ්‍යඞ්ග ධර්මයෝ; භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; සම්මදක්ඛාතා, මනාකොට වදාරන ලද්දාහුය; භාවිතා, වඩනා ලද්දාහුය, බහුලීකතා, බහුල කරන ලද්දාහුය; අභිඤ්ඤාය, විශිෂ්ට ඥනයෙන් දැනගැන්ම පිණිස; සම්බොධාය, සම්‍යක් සම්බොධිය පිණිස; නිබ්බානාය, නිර්වාණය පිණිස; සංවත්තන්ති, පවතිත්; චුන්ද, චුන්දය; බොජ්ඣඞ්ගා, බොධ්‍යඞ්ග ධර්මයෝ; තග්ඝ, ඒකාන්තයෙහ; චුන්ද, චුන්දය; බොජ්ඣඞ්ගා, බොධ්‍යඞ්ග ධර්මයෝ; තග්ඝ; ඉති මැනවයි; ආයස්මා මහාචුන්දෙ, ආයුෂ්මත් මහාචුන්ද ස්ථවිරයන් වහන්සේ; ඉදං, මේ ධර්මය; අවොච, වදාළේය; සත්ථා, ශාස්තෲන් වහන්සේ; සමනුඤ්ඤො අහොසි,

සත්ථා අහොසි, වුට්ඨාහි ච භගවා තම්හා ආබාධා, තථා පහීනො ච භගවතො සො ආබාධො අහොසීති.

මහාචුන්දසත්ථවිර බොජ්ඣඞ්ගය යි.

---

### ගිරිමානන්ද සුත්තං

21. එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙත-වනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තෙන ඛො පන සමයෙන, ආයස්මා ගිරිමානන්දො, ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො, අථඛො

---

මනාකොට අනුදන වදාළහ; (නොහොත්) ශිව්ස වදාළෝය, භගවා, භාග්‍යවතුන් වහන්සේ; තම්හා ආබාධා, ඒ ආබාධයෙන් වුට්ඨාහිච, නැගී සිටි සේක්මය; භගවතො, භාග්‍යවතුන් වහන් සේගේ; සො ආබාධො, ඒ ආබාධය; තථා පහිනො ච අහොසි, නැවත නුපදනා පරිද්දෙන් ප්‍රහීණ වූයේමය.

මහාචුන්ද සථවිර බොධ්‍යඞ්ගය යි.

---

### ගිරිමානන්ද සූත්‍රය.

21 මෙ, මා විසින්; එවං සුතං, මෙ සූත්‍රය මෙසේ අසන ලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවත්තෙම; සාවත්ථියං, සැවැත්නුවර සමීපයෙහි වූ; ජේතවනෙ, ජෙතවන නම් ලද; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬු මහ සිටුහුගේ විහාරයෙහි; විහරති, වැඩ වාසය කරනසේක; තෙන ඛො පන සමයෙන, එ සමයෙහි වනාහි; ආයස්මා ගිරිමානන්දො, ආයුෂ්මත් ගිරිමානන්ද සථවිරතෙම; ආබාධිකො, ආබාධ ඇත්තේ; දුක්ඛිතො, දුකට පත් වූයේ; බාළ්හගිලානො හොති, දැඩි ගිලන් ඇත්තේද වෙයි; අථඛො,

ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච. ආයස්මා භන්තෙ ගිරිමානන්දො ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සාධු භන්තෙ භගවා යෙනායස්මා ගිරිමානන්දො තෙනුපසංකමතු අනුකම්පං උපාදායාති, සචෙ ඛො ත්වං ආනන්ද ගිරිමානං

---

ඉක්බිත්තෙත්, ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම; භගවා, බුදුරජාණන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතන්හි; උපසංකමි, එළඹියෝය; උපසංකමිත්වා, එළැඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ;. අභිවාදෙත්වා, මනාකොට වැඳ, එකමන්තං නිසීදි, එකත් පසෙක හුන්නෝය.

එකමන්තං නිසින්නො ඛො, එකත්පසෙක හුන්නාම වූ; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම; භගවන්තං, බුදුරජාණන් වහන්සේට; එතදවොච, මේ කාරණය මෙසේ සැළකෙළේය; භන්තෙ, ස්වාමීන් වහන්ස; ආයස්මා ගිරිමානන්දො, ඇවැත් ගිරිමානන්දතෙම; ආබාධිකො —පෙ— දුඃඛි ගිලන්වූයේ වෙයි; භන්තෙ, ස්වාමීනි! භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙනායස්මා ගිරිමානන්දො, ඇවැත් ගිරිමානන්ද තෙම යම් තැනෙක් හිද; තෙන, එතැනට; අනුකම්පං උපාදාය, අනුකම්පා පිණිස; උපසංකමතු, එළඹෙන සේක්වා; සාධු මැනවි; ආනන්ද, ආනන්දය; සචෙ ඛො, ඉදින් වනාහි; ත්වං, තෝ, ගිරිමානන්දස්ස

දස්ස භික්ඛුනො උපසංකමිත්වා දස සඤ්ඤා භාසෙය්‍යාසි, ඨානං ඛො පනෙතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනො දසසඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භෙය්‍ය.

කතමා දස? අනිච්චසඤ්ඤා අනත්ත සඤ්ඤා අසුභ සඤ්ඤා ආදීනවසඤ්ඤා පහාන සඤ්ඤා විරාග සඤ්ඤා නිරොධ සඤ්ඤා සබ්බලොකෙ අනභිරත සඤ්ඤා සබ්බසංඛාරෙසු අනිච්චසඤ්ඤා ආනාපාන සති, කතමාචානන්ද අනිච්ච

---

භික්ඛුනො, ගිරිමානන්ද භික්ෂුහුගේ සමීපයට; උපසංකමිත්වා, එළැඹ, දස සඤ්ඤා භාසෙය්‍යාසි, දශසංඥාවන් කියන්නෙහි වී නම්, දස සඤ්ඤා සුත්වා, ඒ දශ සංඥාවන් අසා; සෝ ආබාධො, ඒ ආබාධය; ඨානසො පටිප්පස්සම්භෙය්‍ය, වහා සන්සිඳෙන්නේය යන; යං, යමක් වේද; ඨානං ඛො පනෙතං විජ්ජති, මේ කාරණය වෙයි.

කතමා දස? කවර දශ සංඥාවෝදයත්? අනිච්චසඤ්ඤා, අනිත්‍ය සංඥාය, අනත්තසඤ්ඤා; අනාත්ම සංඥාය; අසුභසඤ්ඤා, අසුභ සංඥාය; ආදීනවසඤ්ඤා, ආදීනව සංඥාය; පහානසඤ්ඤා, ප්‍රහාණ සංඥාය; විරාගසඤ්ඤා, විරාග සංඥාය; නිරොධසඤ්ඤා, නිරොධ සංඥාය; සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, සියලු ලොව නො ඇලීම වූ අනභිරත සංඥාය; සබ්බසඞ්ඛාරෙසු අනිච්ච සඤ්ඤා, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය සංඥාය; ආනාපානසති, ආනාපාණස්මෘතිය යන මොහුයි; ආනන්ද, ආනන්දය; අනිච්චසඤ්ඤා, (උපාදානස්කන්ධයන් පස් දෙනාගේ පහලවීමය;

සඤ්ඤා? ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉතිපටිසංචික්ඛති, රූපං අනිච්චං වෙදනා අනිච්චා සඤ්ඤා අනිච්චා සංඛාරා අනිච්චා විඤ්ඤාණං අනිච්චන්ති, ඉති ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු අනිච්චානුපස්සී විහරති, අයංවුච්චතානන්ද අනිච්චසඤ්ඤා.

2 කතමාචානන්ද අනත්තසඤ්ඤා? ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා

---

විනාශය විපරීත භාවය යනුවෙන් උපදනා) අනිත්‍ය සංඥාව කවරේද? ආනන්ද, ආනන්දය; ඉධ, මාගේ මේ සස්නෙහි; භික්ඛු, මහණතෙම අරඤ්ඤගතො වා, අරණ්‍යයකට ගියේ හෝ; රුක්ඛමූලගතො වා, රුක්මූලකට ගියේ හෝ, සුඤ්ඤාගාර ගතො වා, ශූන්‍යාගාරයකට ගියේ හෝ; ඉති පටිසංචික්ඛති, මෙසේ නුවණින් සලකාද? රූපං අනිච්චං, රූපස්කන්ධය අනිත්‍යය; වෙදනා අනිච්චා, වෙදනා-ස්කන්ධය අනිත්‍යය; සඤ්ඤා අනිච්චා, සංඥාස්කන්ධය අනිත්‍යය; සඞ්ඛාරා අනිච්චා, සංස්කාරස්කන්ධය අනිත්‍යය; විඤ්ඤාණං අනිච්චන්ති, විඥානස්කන්ධය අනිත්‍යම කියා යි; ඉති, මෙසේ; ඉමෙසු පඤ්චසු පාදානක්ඛන්ධෙසු, මේ උපාදානස්කන්ධ පඤ්චකයෙහි; අනිච්චානුපස්සී විහරති, අනිත්‍යලක්ෂණය නැවත නැවත දකිමින් වාසය කෙරේද; අයං වුච්චති ආනන්ද අනිච්ච සඤ්ඤා, ආනන්දය මේ අනිත්‍යසංඥායයි කියනු ලැබේ.

ආනන්ද, ආනන්දය; අනත්තසඤ්ඤා, අනාත්ම සංඥාව; කතමා ච, කවරීද? ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණ

රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉතිපටිසංචික්ඛති, චක්ඛුං අනත්තා රූපං අනත්තා සොතං අනත්තා සද්දා අනත්තා, ඝාණං අනත්තා ගන්ධා අනත්තා ජිව්හා අනත්තා රසා අනත්තා, කායො අනත්තා ඵොට්ඨබ්බා අනත්තා මනො අනත්තා ධම්මා අනත්තාති.

ඉති ඉමෙසු ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු අනත්තානුපස්සී විහරති, අයං වුච්චතානන්ද අනත්තසඤ්ඤා, ෬ කතමා චානන්ද

---

...තෙම; අරඤ්ඤගතො ව, අරණ්‍යයකට ගියේ හෝ; රුක්ඛමූලගතො වා, රුක්මූලකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, හිස් ගෙයකට ගියේ හෝ; ඉතිපටිසංචික්ඛති, මෙසෙසිත්තිතාද, චක්ඛුං අනත්තා, ඇස අනාත්මය; රූපං අනත්තා, රූපය අනාත්මය; සොතං අනත්තා, ශ්‍රොත්‍රය අනාත්මය, සද්දා අනත්තා, ශබ්දය අනාත්මය ඝාණං අනත්තා, නාසය අනාත්මය; ගන්ධා අනත්තා, ගන්ධයෝ අනාත්මය; ජිව්හා අනත්තා, දිව අනාත්මය; රසා අනත්තා, රසයෝ අනාත්මයහ; කායො අනත්තා, කය අනාත්මය; ඵොට්ඨබ්බා අනත්තා, පහස්හු අනාත්මයහ; මනො අනත්තා, මනස අනාත්මය; ධම්මා අනත්තාති, ධර්මයෝ අනාත්මයහ යි.

ඉති, මෙසේ; අජ්ඣත්තික බාහිරෙසු, අධ්‍යාත්මිකවූද බාහිරවූ ද; ඡසු ආයතනෙසු, වාදසායතනයන් කෙරෙහි; අනත්තානුපස්සී විහරති," අනාත්මලක්‍ෂණ නැවත නැවත බලමින් වාසයකෙරේද; ආනන්ද, ආනන්දය; අයංවුච්චති අනත්තසඤ්ඤා, මේ අනාත්මසංඥය යි

අසුභසඤ්ඤා? ඉධානන්ද භික්ඛු ඉමමෙව කායං උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති.

අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො, මංසං නහාරූ අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො,

---

කියනු ලැබේ; ආනන්ද, ආනන්දය, අසුභසඤ්ඤා, අසුභසංඥව; කතමාච, කවරීද? ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; උද්ධං පාදතලා, පත්ලෙන් උඩ; අධොකෙසමත්ථකා, කෙස් මතුයෙන් යට; තචපරියන්තං, සම කෙළවර කොට ඇති; ඉමමෙව කායං, මේ ශරීරයම, නානප්පකාරස්ස, නානාප්‍රකාරවූ; අසුචිනො පූරං, අසුචියෙන් පිරුනේයයි; පච්චවෙක්ඛති, ප්‍රත්‍යවෙක්‍ෂාකෙරේද.

ඉමස්මිංකායෙ, මෙ ශරීරයෙහි; කෙසා, කෙසයෝය; ලොමා, ලොමයෝය, නඛා, නියය; දන්තා දන්තයෝ ය; තචො, සමය, මංසං, මස්ය; නහාරූ, නහරය; අට්ඨි, ඇටය; අට්ඨිමිඤ්ජා, ඇටමිදුලුය; වක්කං, වකුගඩුය; හදයං, හෘදයමාංසය; යකනං, අක්මාවය; කිලොමකං, දලබුවය; පිහකං, බඩදිවය; පප්ඵාසං, පපුවය; අන්තං, බඩවැලය; අන්තගුණං, අතුණුබහනය; උදරියං, උදරය; කරීසං, මලය; පිත්තං, පිතය; සෙම්හං, සෙමය; පුබ්බො, පූයාය; ලොහිතං,

අස්සුවසාඛෙළො සිංඝාණිකා ලසිකා මුත්තන්ති, ඉති ඉමස්මිං කායෙ අසුභානුපස්සී විහරති, අයං වුච්චතානන්ද අසුභසඤ්ඤා.

4 කතමාචානන්ද ආදීනවසඤ්ඤා? ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉතිපටිසංචික්ඛති, බහුදුක්ඛො ඛො අයං කායො බහු ආදීනවො, ඉති ඉමස්මිං කායෙ විවිධා ආබාධා උප්පජ්ජන්ති, සෙය්‍යථීදං

---

ලේය; සෙදො, ඩහදියය; මෙදො, මේදතෙලය; අස්සු, කඳුලුය; වසා, වුරුණුතෙලය; ඛෙළො, කෙළය; සිංඝාණිකා, මූකුණුය, ලසිකා, සඳමිදුලුය; මුත්තං ඉති, මූත්‍රය යන මොවුහු; අත්‍ථි, ඇත්තාහුයයි; ඉති, මෙසේ; ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; අසුභානුපස්සි, අසුභ ලක්‍ෂණ අනුව බලමින්, විහරති, වාසය කෙරේද; ආනන්ද, ආනන්දය; අයං වුච්චති අසුභ සඤ්ඤා, මේ අසුභසංඥයයි කියනු ලැබේ.

ආනන්ද, ආනන්දය; ආදීනවසඤ්ඤා, ආදිනවසංඥව; කතමාච, කවරිද යත්? ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතො වා, අරණ්‍යයකට ගියේ හෝ; රුක්ඛමූල ගතොවා, රුක්මූලකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, ශූන්‍යාගාර යකට ගියේ හෝ; ඉති පටිසංචික්ඛති, මෙසේ ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙයි; අයං කායො, මේ ශරීරයතෙම; බහු දුක්ඛො ඛො, බොහෝ දුක් ඇත්තේ වේ; බහු ආදීනවො, බොහෝ ආදීනව ඇත්තේ වේ; ඉති, මෙසේ; ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; විවිධා ආබාධා, අනෙක ප්‍රකාරවූ ආබාධයෝ; උප්පජ්ජන්ති, උපදිත්; සෙය්‍යථිදං, ඒ කවර

චක්ඛුරොගො සොතරොගො ඝාණ
රොගො ජිව්හාරොගො කාය
රොගො සීසරොගො කණ්ණ
රොගො මුඛරොගො දන්තරොගො
කාසො සාසො පිනාසො ඩහො
ජරො කුච්ඡිරොගො මුච්ඡා
පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං
ගණ්ඩා කිලාසො සොසො අපමා
රො දද්දු කණ්ඩු කච්ඡු රඛසා
විතච්ඡිකා ලොහිතපිත්තං මධු
මෙහො අංසා පිලකා භගන්දලා. 34

---

හුද; චක්ඛුරොගො, ඇසෙහි උපදනා රොගය; සොතරොගො, කණෙහි උපදනා රොගය; ඝාණරොගො, නාසයෙහි උපදනා රොගය; ජිව්හා රොගො, දිවෙහි උපදනා රොගය; කායරොගො, කයෙහි උපදනා රොගය; සීසරොගො, හිසෙහි උපදනා රොගය; කණ්ණරොගො, කම්මුල කණෙහි උපදනා රොගය; මුඛරොගො, මුඛයෙහි උපදනා රොගය; දන්තරොගො, දන්ත රොගය; කාසො, කාසය; සාසො, ශ්වාසය; පිනාසො, පීනසය; ඩහො, දාහය; ජරො, හුණය; කුච්ඡිරොගො, කුසෙහි උපදනා රොගය; මුච්ඡා, මූසය; පක්ඛන්දිකා, රක්තාතිසාරය; සූලා, ශූලය; විසූචිකා, විසූචිකාය; කුට්ඨං, කුෂ්ඨය; ගණ්ඩො, ගඬුය; කිලාසො, කිලාසය; සොසො, සොසය; අපමාරො, අපස්මාරය; දද්දු දදය; කණ්ඩු, කණ්ඩුතිය, කච්ඡු, මහුකසය; රඛසා, නියෙන්කැපු තැන වන රොගය; විතච්ඡිකා, විචර්චිකාවය; ලොහිතපිත්තං, රත්පිතය; මධුමෙහො, මුත්‍රවැති මෙහෙය; අංසා, අර්ශසාය; පිලකා; පිලකාය; භගන්දලා, භගන්දරාය.

පිත්තසමුට්ඨානා ආබාධා, සෙම්හසමුට්ඨානා ආබාධා, වාතසමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිණාමජා ආබාධා, විසමපරිහාරජා ආබාධා, ඔපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවොති, ඉති ඉමස්මිං කායෙ ආදීනවානුපස්සී විහරති, අයං වුච්චතානන්ද ආදීනවසඤ්ඤා.

5 කතමාචානන්ද පහානසඤ්ඤා? ඉධානන්ද භික්ඛු උප්පන්නං කාම

---

පිත්තසමුට්ඨානා ආබාධා, පිතින් වන රෝගය; සෙම්හසමුට්ඨානා ආබාධා, සෙමින් වන රෝගය; වාතසමුට්ඨානා ආබාධා, වාතයෙන් වන රෝගය; සන්නිපාතිකා ආබාධා, තුන් දෙසින් වන රෝගය; උතුපරිනාමජා ආබාධා, ඍතු පෙරළීමෙන් වන රෝගය; විසමපරිහාරජා ආබාධා, විෂම පරිහාරයෙන් වන රෝගය; ඔපක්කමිකා ආබාධා, උපක්‍රමයෙන් වන රෝගය; කම්මවිපාකජා ආබාධා, කර්ම විපාකයෙන් වන රෝගය; සීතං, සීතය; උණ්හං, උෂ්ණය; ජිඝච්ඡා, ක්ෂුධාය; පිපාසා, පිපාසය; උච්චාරො, අහර මලය; පස්සාවො, මූත්‍රයයි; ඉති, මෙසේ; ඉමස්මිං කායෙ, මේ ශරීරයෙහි; ආදීනවානුපස්සි විහරති, ආදීනවයන් නුවණින් අනුව බලමින් වාසය කෙරේ ද? ආනන්ද, ආනන්දය; අයං, මේ; ආදීනවසඤ්ඤා වුච්චති, ආදීනව සංඥයයි කියනු ලැබේ.

ආනන්ද, ආනන්දය; පහාණසඤ්ඤා, පස්වැදෑරුම් ප්‍රහාණය අරමුණු කොට උපදනා සංඥව; කතමාච, කවරිද? ආනන්ද, ආනන්දය;

විතකකං නාධිවාසේති පජහති,
විනොදෙති බ්‍යනතිං කරොති අන-
භාවං ගමෙති, උපපනනං ව්‍යාපාද
විතකකං නාධිවාසෙති පජහති,
විනොදෙති බ්‍යනතිකරොති අන-
භාවං ගමෙති, උපපනනං විහිංසා
විතකකං නාධිවාසෙති පජහති,
විනොදෙති බ්‍යනතිකරොති අනභා
වං ගමෙති, උපපනනුපපනෙන
පාපකෙ අකුසලෙ ධමෙම නාධිවා
සෙති පජහති, විනොදෙති බ්‍යනති

---

ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණෙක් තෙමේ; උපපන්නං කාම විතක්කං, උපන් කාමවිතර්කය; නාධිවාසෙති, නො ඉවසාද; (නො-හොත් කාමවිතර්කාදියෙහි සිත නගනා ස්වභාව හරිද) පජහති, අත් හරිද; විනොදෙති, දුරුකෙරේද; බ්‍යන්තිකරොති, ගෙවීම කෙරේද; හෙවත් නැතිකෙරේද; අනභාවංගමෙති, අභාවයට පමුණුවාද; උපපන්නං, උපන්නාවූ; ව්‍යාපාද විතක්කං, ව්‍යාපාද විතර්කය; නාධිවාසෙති, නො ඉවසාද; පජහති, අත්හරිද; විනොදෙති, දුරුකෙරේද; බ්‍යන්තීකරොති, නැතිකෙරේද; අනභාවං ගමෙති, අභාවයට පමුණුවාද; උපපන්නං, උපන්නාවූ; විහිංසාවිතක්කං, විහිංසා විතර්කය; නාධිවාසෙති, නොඉවසාද; පජහති, අත්හරිද; විනොදෙති, දුරුකෙරේද; බ්‍යන්තිකරොති, නැතිකෙරේද; අනභාවං ගමෙති, අභාවයට පමුණුවාද; උපපන්නුපපන්නෙ, උපනුපන්; පාපකෙ අකුසලෙ ධම්මෙ, ලාමක අකුශල ධර්මයන්; නාධිවාසෙති, නො ඉවසාද; පජහති, අත්හරිද; විනොදෙති, දුරුකෙරේද; බ්‍යන්තී

කරොති අනභාවං ගමෙති, අයං වුච්චතානන්ද පහාණසඤ්ඤා.

6 කතමාචානන්ද විරාගසඤ්ඤා? ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසංචික්ඛති. එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාර සමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිබ්බානන්ති අයං වුච්චතානන්ද විරාගසඤ්ඤා.

---

කරොති, නැතිකෙරේද; අනභාවං ගමෙති, අභාවයට පමුණුවාද; ආනන්ද, ආනන්දය; අයං, මේ; පහානසඤ්ඤා වුච්චති, ප්‍රහාණසංඥා යයි කියනු ලැබේ.

ආනන්ද, ආනන්දය; විරාගසඤ්ඤා, විරාග සංඥාව; කතමාච, කවරීද; ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණ තෙම; අරඤ්ඤගතො වා, අරණ්‍යකට ගියේ හෝ; රුක්ඛමූලගතො වා, වෘක්ෂමූලයකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, සූන්‍යාගාරය කට ගියේ හෝ; ඉති, මෙසේ; පටිසංචික්ඛති, ප්‍රත්‍යවෙක්ෂා කෙරේද? එතං, මෙය; සන්තං, සාන්තය; එතං, මෙය; පණීතං, ප්‍රණීතය; යදිදං, යම් මේ; සබ්බසංඛාර සමථො, සියළු සංස්කාරයන්ගේ; සන්සිඳීමය; සබ්බූපධිපටිනිස්සග්ගො, කාමාදි සියලු උපධින්ගේ හැරීමය; තණ්හක්ඛයො තෘෂ්ණාහුගේ ගෙවීමය; විරාගො, නො ඇලීමය; නිබ්බානන්ති, නිර්වාණය යන මේ යමක් ඇද්ද; ආනන්ද, ආනන්දය; අයං, මේ; විරාගසඤ්ඤා වුච්චති, විරාගසංඥාව යයි කියනු ලැබේ.

7 කතමාචානන්ද නිරොධසඤ්ඤා? ඉධානන්ද භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා ඉති පටිසංචික්ඛති, එතං සන්තං එතං පණීතං යදිදං සබ්බ සඞ්ඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො නිරොධො නිබ්බානන්ති අයං වුච්චතානන්ද නිරොධ සඤ්ඤා. කතමාචානන්ද සබ්බලොකෙ අනභිරතසඤ්ඤා? ඉධානන්ද භික්ඛු

ආනන්ද, ආනන්දය; නිරොධසඤ්ඤා, නිරොධය අරමුණුකොට උපදනා සංඥාව; කතමාචා, කවරීද; ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; අරඤ්ඤගතො වා, අරණ්‍යයකට ගියේ හෝ; රුක්ඛමූලගතො වා, වෘක්ෂමූලයකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, සුන්‍යාගාරයකට ගියේ හෝ; ඉති, මෙසේ; පටිසංචික්ඛති, ප්‍රත්‍යවෙක්ෂා කෙරේද; එතං, මෙය; සන්තං, සාන්තය; එතං, මෙය; පණීතං, ප්‍රණීතය; යදිදං, යම් මේ; සබ්බසඞ්ඛාරසමථො, සියලු සංස්කාරයන්ගේ සංසිඳීමය; සබ්බූපධිපටිනිස්සග්ගො, කාමාදී සියලු උපදීන්ගේ හැරීමය; තණ්හක්ඛයො, තෘෂ්ණාවගේ ක්ෂයවීමය; නිරොධො, නිරොධය; නිබ්බානන්ති, නිර්වාණය යන මේ යමක් ඇද්ද; ආනන්දය; අයං, මේ; නිරොධසඤ්ඤා වුච්චති, නිරොධ සංඥාවයයි කියනු ලැබේ. ආනන්ද, ආනන්දය; සබ්බලොකෙ අනභිරතසඤ්ඤා, මුළුලොව; නො ඇලීමේ සංඥාව; කතමාච, කවරීද; ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම

යෙ ලොකෙ උපායූපාදනා චෙත
සො අධිට්ඨානාභිනිවෙසානුසයා
තෙ පජහන්තො විරමති, න
උපාදියන්තො. අයං වුච්චතානන්ද
සබ්බලොකෙ අනභිරතසඤ්ඤා.
9 කතමාචානන්ද සබ්බසඞ්ඛාරෙසු
අනිච්චසඤ්ඤා? ඉධානන්ද භික්ඛු,
සබ්බසඞ්ඛාරෙහි අට්ටීයති හරායති
ජිගුච්ඡති, අයං වුච්චතානන්ද සබ්බ
සඞ්ඛාරෙසු අනිච්චසඤ්ඤා. කතමා 10
චානන්ද ආනාපානසති? ඉධ

---

ලොකෙ, ත්‍රෛධාතුක ලොකයෙහි; උපායා, තෘෂ්ණා දෘෂ්ටියයි කියන ලද යම් උපායයෝ වෙද්ද; යෙ උපාදනා, යම් සිව්වැදෑරුම් උපාදන කෙනෙක් වෙද්ද; චෙතසො අධිට්ඨානා, සිත පිළිබඳ පිහිටියාවූ ශාස්වත නම් ලද; අභිනිවෙසා, යම් අභිනිවෙසයෝ වෙද්ද; අනුසයා, සත්වැදෑරුම්වූ අනුසය නම් ලද යම් වැදහෙව පැවති කෙලෙස් වෙද්ද; තෙ පජහන්තො විරමති, ඔවුන් පහ කරමින් නො ඇලේද; න උපාදියන්තො, නොගනිමින් දුරු කෙරේද; ආනන්ද, ආනන්දය; අයං, මේ; සබ්බලොකෙ අනභිරතසඤ්ඤා වුච්චති, සියලු ලොකයෙහි අනභිරතසංඥය යි කියනු ලැබේ, ආනන්ද, ආනන්දය; සබ්බසඞ්ඛාරෙසු, සියලු සංස්කාරයන් කෙරෙහි අනිච්චසඤ්ඤා, අනිත්‍ය සංඥව; කතමාච, කවරීද; ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු මහණතෙම; සබ්බසඞ්ඛාරෙහි, නාමරූපයන් කෙරෙන්, අට්ටීයති, පීඩා කරනු ලැබේද; හරායති, ලජ්ජා කරනු ලැබේද; ජිගුච්ඡති, පිළිකුල් කෙරේද; ආනන්ද, ආනන්දය; අයං, මේ; සබ්බසඞ්ඛාරෙසු, සියලු සංස්කාරයන් කෙරෙහි; අනිච්චසඤ්ඤා වුච්චති, අනිත්‍යසංඥවය යි කියනු

නන්ද භික්ඛු, අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා,

සො සතොව අස්සසති සතො පස්සසති දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති, රස්සං වා අස්සසන්තො

---

ලැබේ; ආනන්ද; ආනන්දය; ආනාපාණසති, ආනාපාණස්මෘතිය; කතමාච. කවරීද? ආනන්ද, ආනන්දය; ඉධ, මේ ශාසනයෙහි, භික්ඛු, මහණතෙම, අරඤ්ඤගතොවා, අරණ්‍යයකට ගියේ හෝ; රුක්ඛමූලගතො වා, වෘක්ෂමූලයකට ගියේ හෝ; සුඤ්ඤාගාරගතො වා, සුන්‍යාගාරයකට ගියේ හෝ; පල්ලඞ්කං ආභුජිත්වා, පලක් බැඳ; උජුංකායං පණිධාය, උඩුකය ඇද නැතිකොට පිහිටුවා; පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සිහිය කම්ස්ථානයට අභිමූඛ කොට එළඹ සිටුවා; නිසීදති හිඳීද.

සො, ඒ සිහිඑළවා තැබූ මහණතෙම; සතොව, සිහි ඇත්තේම, අස්සසති, ආශ්වාස කෙරේද, සතො, සිහි ඇත්තේම; පස්සසති, ප්‍රාශ්වාස කෙරේද; දීඝං, දීඝීකොට, අස්සසන්තොවා, ආශ්වාස කරන්නේ හෝ, දීඝං අස්සසාමීති පජානාති, දීඝීකොට ආශ්වාස කෙරමියි දන්නේය; දීඝං, දිඝීකොට; පස්සසන්තොවා, ප්‍රශ්වාස කරන්නේ හෝ; දීඝං පස්සසාමිති, දීඝීකොට ප්‍රශ්වාස කෙරෙමියි; පජානාති දන්නේය; රස්සං, ලුහුඬුකොට; අස්සසන්තොවා, ආශ්වාස කරන්නේ හෝ; රස්සං අස්සසාමීති, ලුහුඬුකොට ආශ්වාස කෙරෙමියි,

රස්සං අස්සසාමීති පජානාති, රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති,

පස්සම්භයං කායසඞ්ඛාරං අස්ස-සිස්සාමීති සික්ඛති, පස්සම්භයං කාය සඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති, සුඛපටිසංවෙදී අස්සසිස්සා

---

පජානාති, දන්නේය; රස්සං, ලුහුඬුකොට; පස්සසන්තොවා, ප්‍රශ්වාස කරන්නේ හෝ; රස්සං, ලුහුඬු කොට; පස්සසාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; පජානාති, දන්නේය; සබ්බකාය පටිසංවෙදී, සියළු ආශ්වාසකය දන්නෙමි; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි සික්ඛති, හික්මෙන්නේය, සබ්බකාය පටිසංවෙදී, සියලු ප්‍රශ්වාස කය දන්නෙමි; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය.

කායසඞ්ඛාරං, මහත්වූ කායසංස්කාරය; පස්සම්භයං, සන්සිඳු වන්නේය; (එසේ සන්සිඳුවන තැනැත්තේ) අස්සසිස්සාමීති ආශ්වාස කරමියි දැන; සික්ඛති, හික්මෙන්නේය; කායසඞ්ඛාරං, මහත්වූ කායසංස්කාරය; පස්සම්භයං, සන්සිදීමෙන් වසන තැනැත් තේ; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි දැන; සික්ඛති, හික් මෙන්නේය; පීතිපටිසංවෙදී, ප්‍රීති විඳිමින්; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; (දැන) සික්ඛති, හික්මෙන්නේය; පීතිපටිසංවෙදී, ප්‍රීති විඳිමින්; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; (දැන) සික්ඛති, හික්මෙන්නේය; සුඛපටිසංවෙදී, සුවවිඳිමින්; අස්සසිස්සාමීති,

මීති සික්ඛති, සුඛපටිසංවෙදී පස්ස-සිස්සාමීති සික්ඛති, චිත්තසඞ්ඛාර පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, චිත්තසඞ්ඛාර පටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති.

පස්සම්භයං චිත්තසඞ්ඛාරං අස්සසිස්සාමීති සික්ඛති පස්සම්භයං චිත්තසඞ්ඛාරං පස්සසිස්සාමීති සික්ඛති, චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති, චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති අභිප්පමෝදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති,

---

ආශ්වාස කරන්නෙමියි; (දැන) සික්ඛති, හික්මෙන්නේය; සුඛපටිසංවෙදී, සුව විඳිමින්; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; (දැන) සික්ඛති, හික්මෙන්නේය; චිත්තසඞ්ඛාර පටිසංවෙදී, චිත්තසංස්කාරය විඳිමින්; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; චිත්තසඞ්ඛාර පටිසංවෙදී, චිත්තසංස්කාරය විඳිමින්; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය.

චිත්තසඞ්ඛාරං, ඖදරික චිත්තසංස්කාරය, පස්සම්භයං, සන්සිඳුවමින්; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; චිත්තසඞ්ඛාරං, ඖදරික චිත්තසංස්කාරය; පස්සම්භයං, සන්සිඳුවමින්, පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; චිත්තපටිසංවෙදී, (චතුර්විධ ධ්‍යානයන්ගේ වශයෙන්) සිත් පහළ කරමින්; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි); සික්ඛති, හික්මෙන්නේය; චිත්තපටිසංවෙදී, (චතුර්විධ ධ්‍යානයන්ගේ වශයෙන්) සිත් පහළකරමින්; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; අභිප්ප-

අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.

විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති, විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති, අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, විරාගානුපස්සී අස්සසිස්සාමීති

---

මොදයං චිත්තං, සමාධි විදර්ශනා දෙකින්ම සිත අතිශයින් සතුටු කෙරෙමින්; අස්සසිස්සාමීති, අශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; අභිප්පමොදයං චිත්තං, සමාධි විදර්ශනා දෙකින් සිත අතිශයින් සතුටු කෙරෙමින්; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති හික්මෙන්නේය; සමාදහං චිත්තං, ධ්‍යානාදීන්ගේ; වශයෙන් අරමුණෙහි සිත පිහිටුවමින්, අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; සමාදහං චිත්තං, ධ්‍යානාදීන්ගේ වශයෙන් අරමුණෙහි සිත පිහිටුවමින්; පස්සසිස්සාමීති; ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය.

විමොචයං චිත්තං, (ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන්කෙරෙන්) සිත මුදමින්; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; විමොචයං චිත්තං, (ප්‍රථම ධ්‍යානයෙන් නීවරණයන් කෙරෙන්) සිත මුදමින්; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; අනිච්චානුපස්සී; (රූපාදියෙහි) අනිත්‍යලක්ෂණ නැවත නැවත දකින ස්වභාව ඇත්තෙක්ව; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; අනිච්චානුපස්සී, (රූපාදියෙහි) අනිත්‍යලක්ෂණ නැවත නැවත

**සික්ඛති, විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.**

**පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති, පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති, අයං වුච්චතානන්ද ආනාපාණසති. සචෙ බො**

---

දකිත ස්වභාව ඇක්තෙක්ව; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; විරාගානුපස්සී, දෙවැදෑරුම් විරාගය නැවත නැවත දක්නා ස්වභාව ඇත්තෙක්ව; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; විරාගානුපස්සී, (දෙවැදෑරුම් වූ) විරාගය නැවත නැවත දක්නා ස්වභාව ඇත්තෙක්ව; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; නිරොධානුපස්සී; (දෙවැදෑරුම්) නිරොධය නැවත නැවත දක්නා ස්වභාව ඇත්තෙක්ව; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; නිරොධානුපස්සී, (දෙවැදෑරුම්) නිරොධය නැවත නැවත දක්නා ස්වභාව ඇත්තෙක්ව; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය.

පටිනිස්සග්ගානුපස්සී, (විදර්ශනා මාර්ග දෙකින්) නැවත නැවත ක්ලෙශයන් හැරීම දක්නා ස්වභාව ඇත්තෙක්ව; අස්සසිස්සාමීති, ආශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; පටිනිස්සග්ගානුපස්සී, (විදර්ශනා මාර්ග දෙකින්) නැවත නැවත ක්ලෙශයන් හැරීම දක්නා ස්වභාව ඇත්තෙක්ව; පස්සසිස්සාමීති, ප්‍රශ්වාස කරන්නෙමියි; සික්ඛති, හික්මෙන්නේය; ආනන්ද, ආනන්දය; අයං, මේ තෙමේ; ආනාපාණසති, ආනාපාණ ස්මෘතියයි; වුච්චති, කියනු ලැබේ; ආනන්ද, ආනන්දය; සචෙ බො, ඉදින් වනාහි; ත්වං, තෝ;

ත්වං ආනන්ද ගිරිමානන්දස්ස භික්ඛුනො උපසංකමිත්වා ඉමා දස සඤ්ඤා භාසෙය්‍යාසි, ඨානං ඛො පනෙතං විජ්ජති යං ගිරිමානන්දස්ස භික්ඛුනො ඉමා දසසඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භෙය්‍යාති. අථ ඛො අයස්මා ආනන්දො භගවතො සන්තිකෙ ඉමා දසසඤ්ඤා උග්ගහෙත්වා යෙනායස්මා ගිරිමානන්දො තෙනුපසංකමි, උපසංකමිත්වා ආයස්මතො ගිරිමානන්දස්ස ඉමා දසසඤ්ඤා අභාසි, අථ ඛො ආයස්මතො ගිරිමානන්දස්ස

---

ගිරිමානන්දස්ස භික්ඛුනො, ගිරිමානන්ද භික්ෂුහු වෙතට; උපසඞ්කමිත්වා, එළඹ; ඉමා දසසඤ්ඤා, මේ දස සංඥාවන්; භාසෙය්‍යාසි, කියන්නෙහි නම්; ඨානං ඛො පනෙතං විජ්ජති, මේ කරුණ ඇති; යං ගිරිමානන්දස්ස භික්ඛුනො, යම් මේ ගිරිමානන්ද නම් මහණහට; ඉමා දසසඤ්ඤා සුත්වා, මේ දසසංඥාවන් අසා; සො ආබාධො, ඒ ආබාධය තෙමේ; ඨානසො පටිප්පස්සම්භෙය්‍ය ඉති, තැනින් මැඩලන්නේ (හෙවත්) සන්සිඳෙන්නේය; අථ ඛො, ඉක්බිත්තෙන්; ආයස්මා ආනන්දො, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම; භගවතො සන්තිකෙ, බුදුන්ගේ සමීපයෙහි; ඉමා දසසඤ්ඤා, මේ දසසංඥාවන්; උග්ගහෙත්වා, ඉගෙන; යෙනායස්මා ගිරිමානන්දො, යම් තැනක ඇවැත් ගිරිමානන්ද මහණද; තෙනුපසංකමි, එතැනට එළඹියේය; උපසංකමිත්වා, එළඹ; ආයස්මතො ගිරිමානන්දස්ස, ආයුෂ්මත් ගිරිමානන්ද මහණහට; ඉමා දසසඤ්ඤා, මේ දසසංඥාවන්; අභාසි, වදාළේය; අථ ඛො,

ඉමා දසසඤ්ඤා සුත්වා සො ආබාධො ඨානසො පටිප්පස්සම්භි, වුට්ඨාහි චායස්මා ගිරිමානන්දො තම්හා ආබාධා, තථා පහීනො ච පනායස්මතො ගිරිමානන්දස්ස සො ආබාධො අහොසීති.

ගිරිමානන්ද සූත්‍රය යි.

---

ඉසිගිලි සුත්තං

22 එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ඉසිගිලිස්මිං පබ්බතෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ

---

ඉක්බිත්තෙන්, ආයස්මතො ගිරිමානන්දස්ස, ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේගේ; ඉමා දසසඤ්ඤා, මේ දසසංඥාවන්; සුත්වා, අසා; සො ආබාධො, ඒ ආබාධය; ඨානසො පටිප්පස්සම්භි, තැනින් වහා ඉගිල සන්සිඳුනේය; ආයස්මා ගිරිමානන්දො ච, ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරතෙමේද; තම්හා ආබාධා, ඒ ආබාධයෙන්; වුට්ඨාහි, නැගී සිටි සේක, තථා පහීනො ච, ඒ ආබාධය එසේම පහව ගියේය; ආයස්මතො ගිරිමානන්දස්ස පන, ආයුෂ්මත් ගිරිමානන්ද ස්ථවිරයන් වහන්සේගේ වනාහි; සො ආබාධො, ඒ ආබාධය තෙම; අහොසි ඉති, නැවත නූපදීද එසේම ප්‍රහීණ විය.

ගිරිමානන්ද සූත්‍රය යි.

---

ඉසිගිලි සූත්‍රය.

22 මෙ, මා විසින් එවං, මෙසේ; සුතං, අසනලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, බුදුරජාණන් වහන්සේ; රාජගහෙ, රජගහ නුවර; ඉසිගිලිස්මිං පබ්බතෙ, ඉසිගිලි නම් පර්වතයෙහි; විහරති, වැඩ වාසය කරන සේක; තත්‍ර ඛො, එකල්හි වනාහි; භගවා

ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙ ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච. පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං වෙභාරං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්සපි ඛො භික්ඛවෙ වෙභාරස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං පණ්ඩවං පබ්බතන්ති? එවං භන්තෙ එතස්සපි ඛො භික්ඛවෙ

---

භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවොති, මහණෙනි කියා; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, ආමන්ත්‍රණය කළ සේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භදන්තෙ ඉති, පින්වතුන් වහන්සේයි කිය; භගවතො, බුදුරජාණන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් දුන්හ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතදවොච, මතු ප්‍රකාශවන ධර්මය වදාළ සේක; භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; එතං වෙභාරං පබ්බතං, මේ වෙභාර පර්වතය; පස්සථනො, දක්නාහුද; භන්තෙ, වහන්ස; එවං, එසේය; භික්ඛවෙ, මහණෙනි; එතස්සපි ඛො වෙභාරස්ස පබ්බතස්ස, මේ වෙභාර පර්වතයටද; අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අනෙක් නමෙක් විය; අඤ්ඤා පඤ්ඤත්ති, අනෙක් පණතෙක්ම විය.

භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; එතං පණ්ඩවං පබ්බතං, මේ පාණ්ඩව පර්වතය; පස්සථනො ඉති, දකිව්ද? භන්තෙ, වහන්ස; එවං, එසේය; භික්ඛවෙ, මහණෙනි, එතස්සපි ඛො පණ්ඩවස්ස පබ්බතස්ස; මේ පාණ්ඩව පර්වතයටද; අඤ්ඤාව සමඤ්ඤා අහොසි,

පණ්ඩවස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා පඤ්ඤත්ති, පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං වෙපුල්ලං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්සපි ඛො භික්ඛවෙ වෙපුල්ලස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අඤ්ඤා පඤ්ඤත්ති.

පස්සථ නො තුම්හෙ භික්ඛවෙ එතං ගිජ්ඣකූටං පබ්බතන්ති? එවං භන්තෙ, එතස්සපි ඛො භික්ඛවෙ ගිජ්ඣකූටස්ස පබ්බතස්ස අඤ්ඤාව සමඤ්ඤා අහොසි අඤ්ඤා

---

අනෙක්ම නමෙක් විය; අඤ්ඤා පඤ්ඤත්ති අහොසි, අනෙක් පණතෙක්ම විය; භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; එතං වෙපුල්ලං පබ්බතං, මේ වෙපුල්ල පර්වතය; පස්සථ නො ඉති, දකිව්ද? භන්තෙ, වහන්ස; එවං එසේය; භික්ඛවෙ, මහණෙනි; එතස්සපි අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අනෙක්ම නමෙක් විය; අඤ්ඤා පඤ්ඤත්ති අහොසි, අනෙක් පණතෙක්ම විය.

භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; එතං ගිජ්ඣකූටං පබ්බතං, මේ ගිජ්ඣකූට පර්වතය; පස්සථ නො ඉති, දකිව්ද? භන්තෙ, වහන්ස; එවං, එසේය; භික්ඛවෙ, මහණෙනි; එතස්සපි ඛො ගිජ්ඣකූටස්ස පබ්බතස්ස, මේ ගිජ්ඣකූට පර්වතයටද; අඤ්ඤාව සමඤ්ඤා අහොසි, අනෙක්ම නමෙක් විය; අඤ්ඤා පඤ්ඤත්ති, අනෙක් පණ-

**පඤ්ඤායන්ති, පස්සථ නො තුම්හෙ භික්ඛවෙ ඉමං ඉසිගිලිං පබ්බතන්ති? එවං භන්තෙ, ඉමස්සපි ඛො භික්ඛවෙ ඉසිගිලිස්ස පබ්බතස්ස එසාව සමඤ්ඤා අහොසි එසා පඤ්ඤත්ති. භූතපුබ්බං භික්ඛවෙ පඤ්චපච්චෙකබුද්ධසතානි ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසිනො අහෙසුං, තෙ ඉමං පබ්බතං පවිසන්තා දිස්සන්ති පවිට්ඨා න දිස්සන්ති.**

**තමෙනං මනුස්සා දිස්වා එවමාහංසු, අයං පබ්බතො ඉමෙ ඉසී ගිල**

---

තෙක්ම විය; භික්ඛවෙ, මහණෙනි; තුම්හෙ, තෙපි; ඉමං ඉසිගිලිං පබ්බතං, මේ ඉසිගිලි පර්වතය, පස්සථ නො, දකිව්ද? භන්තෙ, වහන්ස; එවං, එසේය; භික්ඛවෙ, මහණෙනි; ඉමස්සපි ඛො ඉසිගිලිස්ස පබ්බතස්ස, මේ ඉසිගිලි පර්වතයට වූකලී; එසාව සමඤ්ඤා අහොසි, මේ නාමයම විය; එසාපඤ්ඤත්ති, මේ ප්‍රඥප්තියම විය; භික්ඛවෙ, මහණෙනි; භූතපුබ්බං, පෙර වූ කාරණයක් කියමි; පඤ්චපච්චෙකබුද්ධසතානි, පන්සියයක් පසේබුදුවරයෝ; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසිනො අහෙසුං, බොහෝකල් වාසය කළෝ වූහ; තෙ, උන්වහන්සේලා; ඉමං පබ්බතං, මේ පර්වතයට; පවිසන්තා, ප්‍රවෙශ වන්නාහු; දිස්සන්ති, දක්නා ලැබෙත්; පවිට්ඨා, ප්‍රවෙශ වූවාහු; න දිස්සන්ති, දක්නා නො ලැබෙත්.

තං, එතං, ඒ කාරණය; මනුස්සා, මනුෂ්‍යයෝ; දිස්වා, දැක; එවමාහංසු, මෙසේ කීවාහුය; අයං පබ්බතො; මේ පර්වතය තෙමේ;

තිති ඉසිගිලි ඉසිගිලිත්වෙව සමඤ්ඤා උදපාදි. ආචික්ඛිස්සාමි භික්ඛවෙ පච්චෙක බුද්ධානං නාමානි, කිත්තයිස්සාමි භික්ඛවෙ පච්චෙක බුද්ධානං නාමානි, දෙසිස්සාමි භික්ඛවෙ පච්චෙක බුද්ධානං නාමානි, තං සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

---

ඉමෙ ඉසිගිලිතිති, මේ සෘෂින් ගිලෙයි; (එහෙයින්) ඉසිගිලි ඉසිගිලිත්වෙව සමඤ්ඤා උදපාදි, ඉසිගිලි ඉසිගිලි යන නම පහළ විය; භික්ඛවෙ, මහණෙනි; පච්චෙකබුද්ධානං, පසේබුදුන්ගේ; නාමානි, නාමයන්; ආචික්ඛිස්සාමි, කියන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; පච්චෙකබුද්ධානං, පසේබුදුන්ගේ; නාමානි, නාමයන්; කිත්තයිස්සාමි, පහළ කරන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; පච්චෙකබුද්ධානං, පසේබුදුන්ගේ; නාමානි, නාමයන්; දෙසිස්සාමි, දෙශනා කරන්නෙමි; තං, එය; සුණාථ, අසව්, සාධුකං, මනාකොට; මනසිකරොථ, මෙනෙහි කරව්; භාසිස්සාමි ඉති, කියන්නෙමියි වදාළෝ; භන්තෙ ඉති, වහන්ස; එවං ඛො, එසේයයි; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, පිළිවදන් ඇස්වූහ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං, මේ කාරණය; අවොච, වදාළසේක; භික්ඛවෙ, මහණෙනි; අරිට්ඨො නාම පච්චෙකසම්බුද්ධො, අරිට්ඨ නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

අරිට්ඨො නාම භික්ඛවෙ පච්චෙක
සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං
පබ්බතෙ චිරනිවාසී අහොසි, උප
රිට්ඨො නාම භික්ඛවෙ පච්චෙක
සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං
පබ්බතෙ චිරනිවාසී අහොසි, තගර
සිඛී නාම භික්ඛවෙ පච්චෙක
සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං
පබ්බතෙ චිරනිවාසී අහොසි, යසස්සී
නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිර
නිවාසී අහොසි සුදස්සනො නාම
භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො
ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිර

---

භික්ඛවෙ, මහණෙනි; උපරිට්ඨොනාම පච්චෙකසම්බුද්ධො, උපරිට්ඨ නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය; භික්ඛවෙ, මහණෙනි; තගරසිඛීනාම පච්චෙකසම්බුද්ධො, තගර සිඛී නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය; භික්ඛවෙ, මහණෙනි; යසස්සීනාම පච්චෙකසම්බුද්ධො, යසස්සී නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය. භික්ඛවෙ, මහණෙනි; සුදස්සනො නාම පච්චෙකසම්බුද්ධො, සුදර්ශන නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි

නිවාසී අහොසි. පියදස්සී නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිර නිවාසී අහොසි, ගන්ධාරො නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිර නිවාසී අහොසි.

පිණ්ඩොලො නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො ඉමස්මිං ඉසි-ගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි, උපාසභො නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං

---

පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය, භික්ඛවෙ, මහණෙනි, පියදස්සීනාම පච්චෙකසම්බුද්ධො, ප්‍රියදර්ශී නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය; භික්ඛවෙ, මහණෙනි; ගන්ධාරො නාම පච්චෙකසම්බුද්ධො, ගන්ධාර නම් පසේ බුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

භික්ඛවෙ, මහණෙනි; පිණ්ඩොලොනාම පච්චෙකසම්බුද්ධො; පිණ්ඩොල නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය; භික්ඛවෙ, මහණෙනි; උපාසභොනාම පච්චෙකසම්බුද්ධො, උපාසභ නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ

පබ්බතෙ චිරනිවාසී අහොසි, නීථො නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි, තථො නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසි, සුතවා නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො චිරනිවාසී අහොසි, භාවිතත්තො නාම භික්ඛවෙ පච්චෙක සම්බුද්ධො ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසී අහොසීති.

---

විය; භික්ඛවෙ, මහණෙනි; නීථොනාම පච්චෙකසම්බුද්ධො, නීථ නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය; භික්ඛවෙ, මහණෙනි; තථොනාම පච්චෙකසම්බුද්ධො, තථ නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය; භික්ඛවෙ, මහණෙනි; සුතවාතාම පච්චෙකසම්බුද්ධො, සුතවනතු නම් පසේබුදු කෙණෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය; භික්ඛවෙ, මහණෙනි; භාවිතත්තොනාම පච්චෙකසම්බුද්ධො, භාවිතත්ත නම් පසේබුදු කෙනෙක්; ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ, මේ ඉසිගිලි පර්වතයෙහි; චිරනිවාසී අහොසි, බොහෝ කල් විසූයේ විය.

1 යෙසත්තසාරා අනීඝා නිරාසා
පච්චෙකමෙවජ්ඣගමුං සුබොධිං
තෙසං විසල්ලානං නරුත්තමානං
නාමානි මෙ කිත්තයතො සුණාථ

2 අරිට්ඨො උපරිට්ඨො තගරසිඛී යසස්සී
සුදස්සනො පියදස්සීච බුද්ධො
ගන්ධාරො පිණ්ඩොලො උපාසභො ච
නීථො තථො සුතවා භාවිතත්තො

3 සුම්භො සුභො මෙථුලො අට්ඨමොච
අථස්සුමෙඝො අනීඝො සුදාඨො

---

(1) අනීඝා, දුක් නැත්තාවූ (එහෙයින්ම) නිරාසා, ආශා නැත්තාවූ; යෙ සත්තසාරා, යම් සත්වොත්තම කෙනෙක්; පච්චෙකමෙව, වෙන් වශයෙන්ම; සුබොධිං, සම්‍යක් සම්බොධිය; අජ්ඣගමුං, අවබොධ කළාහුද හෙවත් නිවන් පැමිණියෝද; විසල්ලානං, කෙලෙස් උල් උදුලාවූ; තෙසං නරුත්තමානං, ඒ නරොත්තමයන්ගේ; නාමානි, නම්; කිත්තයතො, ප්‍රකාශ කරන; මෙ, මාගේ තෙපුල්; සුණාථ, අසව්.

(2) අරිට්ඨො. අරිට්ඨය, උපරිට්ඨො, උපරිට්ඨය, තගරසිඛී, තගරසිඛීය; යසස්සී, යසස්සීය; සුදස්සනො, සුදස්සනය; පියදස්සී, ප්‍රියදර්ශීය; ගන්ධාරො ච බුද්ධො, ගන්ධාර නම් බුද්ධය; පිණ්ඩොලො, පිණ්ඩොලය; උපාසභො, උපාසභය; නීථො, නීථය; තථො, තථය; සුතවා, සුතවාය; භාවිතත්තො, භාවිතත්තය.

පච්චෙකබුද්ධා භවනෙත්තිඛීණා
හිංගූච හිංගොච මහානුභාවා.

4 වෙජාලිනොමුනිනොඅට්ඨකොච
අත්ථකොසලොබුද්ධොඅථොසුබාහු
උපනෙමිසො නෙමිසො සන්ත-
චිත්තා
සච්චො තථො විරජො පණ්ඩි-
තො ච.

5 කාළූපකාලා විජිතො ජිතො ච
අඞ්ගොචපඞ්ගොචගුත්තිජ්ජි-තොච

(3) සුමෙධො, සුමේධය; සුභො, සුභය; මෙධුලො, මේධුලය; අට්ඨමොච, අට්ඨමය; අථස්සු, තවද; මෙඝො, මේඝය; අනීඝො, අනීඝය; සුදාඨො, සුදාඨය යන; භවනෙත්තිඛිණා, භවතෘෂ්ණාක්ෂය කළාවූ; පච්චෙකබුද්ධා, මේ කියූ පසේබුදුහුද; මහානුභාවා, මහත් ආනුභාව ඇති; හිඞ්ගුච, හිඞ්ගුය; හිඞ්ගො ච, හිඞ්ගය.

(4) වෙජාලිනො, චූලලජාලිය, මහාජාලීය යන; මුනිනො, බුදු වරයෝ දෙනමද; අට්ඨකොච, අට්ඨක බුද්ධය ;අථ, තවද; කොසලොබුද්ධො, කොසල බුදුය; අථො, තවද; සුබාහු. සුබාහුය; උපනෙමිසො, උපනෙමිසය; නෙමිසො, නෙමිසය; සන්තචිත්තො, සන්තචිත්තය; සච්චො, සච්චය; තථො, තථය; විරජො, විරාජය; පණ්ඩිතො, පණ්ඩිතය.

(5) කාළූපකාලා, කාලය; උපකාලය; විජිතො, විජිතය; ජිතොච, ජිතය; අඞ්ගොච, අඞ්ගය; පඞ්ගොච, පඞ්ගය; ගුත්තිජ්ජිතොච, ගුත්තිජ්ජිතය; දුක්ඛමූලං, දුකට මුල්වූ; උපධිං, උපධි නම් ලද කෙලෙස් කඳ; ජහී, හැරියාවූ; පස්සී, පස්සිය; මාරබලං අජෙසි, මාරබල දිනූ; අපරාජිතො, අපරාජිතය.

පස්සි ජහී උපධිං දුක්ඛමූලං
අපරාජිතො මාරබලං අජෙසි.

6 සච්චා පවත්තා සරභඞ්ගො ලොම
හංසො
උච්චඞ්ගමායො අසිතො
අනාසවො
මනොමයො මානච්ඡිදෙව-
බන්ධුමා
තදධිමුත්තො විමලොච කෙතුමා.

7 කෙතුම්භරාගො ච මාතඞ්ගො-
අරියො
අථච්චුතො අච්චුතගාමබ්‍යාමකො
සුමඞ්ගලො දබ්බිලො සුප්ප-
තිට්ඨිතො
අසය්හො ඛෙමාභිරතො ච
සොරතො.

---

(6) සච්චා, සච්චාය; පවත්තා, පවත්තාය; සරභඞ්ගො, සරභඞ්ගය; ලොමහංසො, ලොමහංසය; උච්චඞ්ගමායො, උච්චඞ්ගමායය; අසිතො, අසිතය; අනාසවො, අනාසවය; මනොමයො, මනොමයය; මානච්ඡිදෙව, මානච්ඡෙදනය කළාවූ; තදධිමුත්තො, තදධිමුත්තය; විමලොච, විමලය; කෙතුමා, කෙතුමාය.

(7) කෙතුම්භරාගො ච, කෙතුම්භරාගය; මාතඞ්ගො, මාතඞ්ගය; අරියො, අරියය; අථ, තවද; අච්චුතො, අච්චුතය, අච්චුතගාමබ්‍යා

8 දූරන්නයෝ සංඝො අථොපි
උච්චයො
අපරො මුනී සය්හො අනොම
නික්කමො,
ආනන්ද නන්දෙ උපනන්දෙ වාදස
භාරවාජො අනන්තිමදෙහධාරී.

9 බොධී මහානාමො අථොපි
උත්තරො
කෙසී සිබී සුන්දරො භාරවාජො,
තිස්සූපතිස්සා භවබන්ධනච්ඡිදා
උපසීදරී තණ්හච්ඡිදෙව සීදරී.

---

මකො, අච්චුතගාමබ්‍යාමකය; සුමඞ්ගලො, සුමඞ්ගලය; දබ්බිලො, දබ්බිලය; සුප්පතිට්ඨිතො, සුප්පතිට්ඨිතය; අසය්හො, අසය්හය; ඛෙමාභිරතො ච, ඛෙමාභිරතය; සොරතො, සොරතය.

(8) දූරන්නයො, දූරන්නයය; සඞ්ඝො, සඞ්ඝය; අථො අපි, නැවත; උච්චයො, උච්චයය; අපරොමුනී,* අපරමුනිවූ; අනොම නික්කමො, අලාමකවීර්‍ය්‍යී ඇති; සය්හො, සය්හය; ආනන්ද, ආනන්දය; නන්දෙ, නන්දය; උපනන්දෙ, උපනන්ද යන සතර නම බැගින්වූ; වාදස, දෙළොස් බුදුහුද; අනන්තිමදෙහධාරී, අවසාන පඤ්චස්කන්ධධාරීවූ; භාරවාජො, භාරවජය.

(9) බොධී, බොධිය; මහානාමො, මහානාමය; අථො අපි, නැවතද; උත්තරො, උත්තරය; කෙසී, කෙසීය; සිබී, සිබීය; සුන්දරො, සුන්දරය; භාරද්වාජො, භාරද්වාජය; තිස්ස, තිස්සය; උපතිස්ස, උපතිස්සය; භවබන්ධනච්ඡිදා, භවබන්ධන කැපූ; උපසීදරී, උපසීදරිය; තණ්හච්ඡිදෙව, තෘෂ්ණාච්ඡේදනය කළාවූ; සීදරී, සීදරීය.

10 බුද්ධො අහු මංගලො වීතරාගො
උසභවජ්ජිද ජාලිනි දුක්ඛමූලං,
සන්තං පදං අජ්ඣගමූපනීතො
උපොසථො සුන්දරො සච්ච-
නාමො.

11 ජෙතො ජයන්තො පදුමො-
උප්පලො ච
පදුමුත්තරො රක්ඛිතො
පබ්බතො ච,
මානත්ථද්ධො සොභිතො
වීතරාගො
කණ්හො ච බුද්ධො සුවිමුත්ත-
චිත්තො.

---

(10) වීතරාගො, පහකරන ලද කෙලෙස් ඇති; මඞගලො බුද්ධො අහු, මඞගල නම් බුදුකෙනෙක් විය; අවජ්ජිද දුක්ඛමූලං ජාලිනීං, ජාලිනී නම් ලද දුක් මුල කැපූ; උසභ, උසභ නම් බුද්ධය; සන්තං පදං අජ්ඣගමූ, සාන්ත පද නම් ලද නිවන් පැමිණි; උපනීතො, උපනීතය; උපොසථො, උපොසථය; සුන්දරො, සුන්දරය; සච්චනාමො, සච්චනාමය.

(11) ජෙතො, ජෙතය; ජයන්තො, ජයන්තය; පදුමො, පදුමය;උප්පලො ච, උප්පලය; පදුමුත්තරො, පියුමතුරාය; රක්ඛිතො, රක්ඛිතය; පබ්බතො ච, පබ්බතය; මානත්ථද්ධො, මානත්ථද්ධය; සොභිතො, සොභිතය; සුවිමුත්තචිත්තො, මොනවට කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇති; කණ්හාව බුද්ධො, කණ්හ නම් බුද්ධය.

12 එතෙ ච අඤ්ඤෙ ච මහානුභාවා
පච්චෙකබුද්ධා භවනෙත්තිඛීණා,
තෙ සබ්බසංගාතිගතෙ මහෙසී
පරිනිබ්බුතෙ වන්දථ අප්පමෙය්‍යෙ'ති.

ඉසිගිලි සුත්තං.

---

### ධම්මචක්කප්පවත්තන සුත්තං.

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

23 එවං මෙ සුතං එකං සමයං භගවා, බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ, තත්‍ර ඛො භගවා

---

(12) එතෙච, මෙකී පසේබුදුහුද; අඤ්ඤෙච මහානුභාවා, මෙහි නොකී මහානුභාව ඇති අන්‍යවූ; පච්චෙක බුද්ධා, පසේ බුදුවරයෝද; භවනෙත්තිඛීණා, ක්‍ෂය කරණ ලද භවතෘෂ්ණා ඇති; මහෙසී, මහර්ෂිවූ; සබ්බසඞ්ගාතිගතෙ, ශීලසමාධි ප්‍රඥස්කන්ධයන් සොයන්නා වූ; අප්පමෙය්‍යෙ, අපමණ ගුණවත්වූ; පරිනිබ්බුතෙ, පිරිනිවි පසේ බුදුවරුන්; වන්දථ ඉති, වඳිව්.

ඉසිගිලි සූත්‍රය යි.

---

### ධම්මචක්කප්පවත්තන සූත්‍රය.

23. මෙ, මා විසින්; එවං සුතං, මේ දම්සක් පැවතුම් සූත්‍රධර්මය මෙසේ අසන ලදී; එකං සමයං, එක් කාලයෙක්හි; භගවා, භාග්‍ය වතුන් වහන්සේ; බාරාණසියං, බාරාණසි පුරයෙහි; මිගදායෙ; මෘග යන්ට අභයදානය කළ හෙයින් මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසි පතනාරාමයෙහි; විහරති, වැඩවාසය කර වදාරණ සේක; තත්‍ර ඛො,

පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි. ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන නසෙවිතබ්බා, යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො, හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො, යො චායං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො, එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති,

---

එකල්හිදී; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පඤ්චවග්ගියෙ භික්ඛූ, පස්වග මහණුන්; ආමන්තෙසි, ඇමතූසේක; භික්ඛවෙ, මහණෙනි; හීනො, ලාමකවූ; ගම්මො ගම් වැස්සන්ගේ සවභාව ධර්‍මයවූ; පොථුජ්ජනිකො, පෘථග්ජනයන්ට අයිතිවූ; අනරියො, අනාර්‍ය්‍යවූ; අනත්ථ සංහිතො, අවැඩම ආශ්‍රය කළාවූ; කාමෙසු, වස්තුකාමයන්හි; යොචායං, යම් යම්; කාමසුඛල්ලිකානුයොගො, ක්ලෙශකාම සැපයාගේ නැවත නැවත යෙදීමෙක් ඇද්ද (හෙද); දුක්ඛො, දුඃඛයට කාරණවූ; අනරියො, ආර්‍ය්‍යයන්ගේ සතු නොවූ; අනත්ථ සංහිතො; අවැඩටම හිතවූ; යොචායං, යම් මේ; අත්තකිලමථානුයොගො, ආත්මක්ලමථයෙහි යෙදීමෙක් ඇද්ද; (යත) ඉමෙ ද්වෙ අන්තා, මේ කරුණු දෙක; පබ්බජිතෙන, පැවිද්දහු විසින්; නසෙවිතබ්බා, නොසෙවිය යුත්තාහ.

කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං, සම්මා දිට්ඨි සම්මාසංකප්පො, සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා ආජීවො සම්මාවායාමො සම්මාසති, සම්මා

---

භික්ඛවෙ, මහණෙනි; තෙ එතෙ උභො අන්තෙ, ඒ මේ අන්ත වයට; අනුපගම්ම, නොපැමිණ; චක්ඛුකරණී, ප්‍රඥාචක්ෂුෂ විශුද්ධ කරන්නාවූද; ඤාණකරණී, නුවණැස ඇති කරන්නාවූද; උපසමාය, (කෙලශපරිදාහ) ප්‍රශ්‍රබ්ධිව්‍යපසමය පිණිස; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවෙධය පිණිස; සම්බොධාය, (ඔවුන්ගේම) අවබොධය පිණිස; නිබ්බාණාය, නිර්වාණය පසක් කරනු පිණිස; සංවත්තති, පවත්නාවූ; මජ්ඣිමාපටිපදා, මධ්‍යම ප්‍රතිපදාතොමෝ; තථාගතෙන, සර්වඥයන් වහන්සේ විසින්; අභිසම්බුද්ධා, ප්‍රත්‍යක්ෂ කරන ලදී.

භික්ඛවෙ, මහණෙනි; චක්ඛුකරණී, ප්‍රඥාචක්ෂුස විශුද්ධ කරන්නාවූද; ඤාණකරණී, නුවණැස ඇතිකරන්නාවූද; උපසමාය, (කෙලශ පරිදාහ) ප්‍රශ්‍රබ්ධිව්‍යපසමය පිණිස; අභිඤ්ඤාය, සත්‍ය ප්‍රතිවෙධය පිණිස; සම්බොධාය, (ඔවුන්ගේම) අවබොධය පිණිස. නිබ්බාණාය, නිර්වාණය පසක් කරනු පිණිස; සංවත්තති, පවත්නාවූ; සා මජ්ඣිමා පටිපදා, ඒ මධ්‍යම ප්‍රතිපදාතොමෝ; කතමා ච, කවරීද? අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො එව, මේ ආර්ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයමැ යි. සෙය්‍යථිදං, ඒ අරිඅටගි මඟ කවරේද? සම්මාදිට්ඨි, මිථ්‍යාදෘෂ්ටියෙන් පහවූ සම්‍යග් දෘෂ්ටිය; සම්මාසංකප්පො, මිථ්‍යාසංකල්පනාවෙන් වෙන්වූ සම්‍යක්සංකල්පනාවය; සම්මාවාචා, මිථ්‍යාවචනයෙන් වෙන් වූ සම්‍යග් වචනය; සම්මාකම්මන්තො, මිථ්‍යාකර්මාන්තයෙන්

සමාධි. අයං ඛො සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී, උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තති.

ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං, ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පංචුපාදානක්

---

වෙන්වූ සම්‍යග් කර්මාන්තය; සම්මා ආජීවො, මිථ්‍යා ආජීවයෙන් වෙන්වූ සම්‍යග් ආජීවය; සම්මාවායාමො, මිථ්‍යාව්‍යායාමයෙන් වෙන්වූ සම්‍යග් ව්‍යායාමය; සම්මාසති, මිථ්‍යාස්මෘතියෙන් වෙන්වූ සම්‍යග් ස්මෘතිය; සම්මාසමාධි, මිථ්‍යාසමාධියෙන් වෙන්වූ සම්‍යග් සමාධිය යන මේයි; භික්ඛවෙ, මහණෙනි; චක්ඛුකරණී, ප්‍රඥාචක්ෂුස විශුද්ධ කරන්නාවූද; ඤාණකරණී, නුවණැස ඇති කරන්නාවූද; උපසමාය, කෙලශයන්ගේ ව්‍යුපසමය පිණිස; අභිඤ්ඤාය චතුස්සත්‍යය ප්‍රතිවේධය පිණිස; සම්බොධාය, උපාදිශෙෂ නිර්වාණ ධාතු දක්නා පිණිස; සංවත්තති, පවත්නාවූ; අයං ඛො සා මජ්ඣිමා පටිපදා, ඒ මේ මධ්‍යම ප්‍රතිපදාතොම; තථාගතෙන, සර්වඥයන් වහන්සේ විසින්; අභිසම්බුද්ධා, ප්‍රත්‍යක්ෂ කරණ ලද්දීය; එහෙයින් ආය්‍ර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය පිරිය යුතුයයි වදාළ සේක යනු මෙහි අර්ථයි.)

ඛන්ධා දුක්ඛා, ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛසමුදයං අරියසච්චං, යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං, කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛ නිරොධං අරියසච්චං, යො තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධ

---

භික්ඛවෙ, මහණෙනි; ජාතිපි දුක්ඛා, ඒ ඒ තත්හි සත්ත්ව යන්ගේ පහළවීම යයි කියන ලද ජාතියද දුක්වන්නේය; ජරාපි දුක්ඛා, අඞ්ග ප්‍රත්‍යඞ්ගයන්ගේ සිථිල භාවය හා යෞවන විනාශ කිරීම යයි කියන ලද ජරාවද දුක; ව්‍යාධිපි දුක්ඛො, ජීවිතයාගේ විනාශ කිරීමට සුදුසුවූ අනෙකප්‍රකාර ව්‍යාධීන්ගේ පහළ වීමද දුක් වන්නේය; මරණම්පි දුක්ඛං, ජීවිතයාගේ විච්ඡේදයයි කියන ලද මරණයද දුක් වන්නේය; අප්පියෙහි සම්පයොගො දුක්ඛො, අප්‍රියවූ සත්ත්වයන් හා සමග විසීමද දුක් වන්නේය; පියෙහි විප්පයොගො දුක්ඛො, ප්‍රියවූවන් කෙරෙන් වෙන්වීමද දුක; යම්පිච්ඡං න ලභති, අභිමතවූ යම් කිසිවක් නොලැබේද; තම්පි දුක්ඛං, හෙද දුක් වන්නේයි; සංඛිත්තෙන, සංක්ෂෙප වශයෙන්; පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා, පඤ්ච උපාදානස්කන්ධයන්ගේ උත්පත්තිය දුක් වන්නේය යන; ඉදං ඛො පන, මේ යථොක්ත දුක්ඛය වනාහි; දුක්ඛං අරියසච්චං, දුක්ඛාර්‍ය්‍යසත්‍යය නම් වන්නේයයි වදාළ සේක. භික්ඛවෙ, මහණෙනි; යායං තණ්හා, යම් මේ තෘෂ්ණාවක් තොමෝ; පොනොභවිකා, පුනර්භවය කෙරේද; නන්දිරාගසහගතා, නන්දිරාග

ගාමිනී පටිපදා අරියසච්චං, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං, සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි, ඉදං දුක්ඛං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි,

---

සම්ප්‍රයුක්ත වන්නීද; තත්‍ර තත්‍රාභිනන්දිනී, ඒ ඒ භවයෙහි ආලය පිපාසාව තොෂය කරන්නීද.

සෙය්‍යථීදං, ඒ තෘෂ්ණාව නම් කවරිද? කාමතණ්හා, කාමාස්වාදයෙන් පැවති තෘෂ්ණාවය; භවතණ්හා, සාස්වත දෘෂ්ටිය හා එක්ව පැවති තෘෂ්ණාවය; විභවතණ්හා, උච්ඡේද දෘෂ්ටිය හා එක්ව පැවති තෘෂ්ණාවය; (යත) ඉදං ඛො පන, මේ තෘෂ්ණාත්‍රය වනාහි; දුක්ඛසමුදයං අරියසච්චං, දුක්ඛසමුදයාර්‍යසත්‍යය නම් වන්නේයයි වදළසේක.

භික්ඛවෙ, මහණෙනි; තස්සා එව තණ්හාය, සමුදයසත්‍යයෙහි ලා දක්වන ලද කාම භව විභව වශයෙන් තුන්වැදෑරුම්වූ ඒ තෘෂ්ණාවගේම; යො අසෙසවිරාගනිරොධො, යම් නිශ්ශෙෂයෙන් මාර්ගයෙන් නොඇලී නැසීමෙක් ඇද්ද; චාගො, ඇරීමෙක් ඇද්ද; පටිනිස්සග්ගො, නිශ්ශෙෂයෙන් හැරීමක් ඇද්ද; මුත්ති, මිදීමෙක් ඇද්ද; අනාලයො, ආලය නොකිරීමක් ඇද්ද; (යත) ඉදං ඛො පන, මේ තෘෂ්ණාවගේ හැරීම වනාහි; දුක්ඛ නිරොධං අරියසච්චං, දුඃඛනිරොධාර්‍යසත්‍යය නම් වන්නේයයි වදළසේක. භික්ඛවෙ, මහණෙනි; අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, මෙම ආර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වන්නේය; සෙය්‍යථීදං? ඒ කවරේද? සම්මාදිට්ඨි, මිථ්‍යාදෘෂ්ටියෙන් පහවූ සම්‍යග්දෘෂ්ටිය; සම්මාසංකප්පො,

පඤ්ඤා උදප්පාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. තංඛොපනිදං දුක්ඛං අරියසච්චං, පරිඤ්ඤෙය්‍යන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජාඋදපාදි, ආලොකො

---

මිථ්‍යාසංකල්පනාවෙන් පහවූ සම්‍යග්සංකල්පනාවය; සම්මාවාචා, මිථ්‍යාවචනයෙන් පහවූ සම්‍යග්වචනය; සම්මාකම්මන්තො, මිථ්‍යා කර්මාන්තයෙන් පහවූ සම්‍යක්කර්මාන්තය; සම්මා ආජීවො, මිථ්‍යා ආජීවයෙන් පහවූ සම්‍යග්ආජීවය; සම්මාවායාමො, මිථ්‍යාව්‍යායාම යෙන් පහවූ සම්‍යග්ව්‍යායාමය; සම්මාසති, මිථ්‍යාසතියෙන් පහවූ සම්‍යග් සතිය; සම්මාසමාධි, මිථ්‍යාසමාධියෙන් පහවූ සම්‍යග් සමාධිය; (යත) ඉදං ඛො පන, මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වනාහි; දුක්ඛනිරොධගාමිනී පටිපදා අරිසච්චං, දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යයයි කියා; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්ත කොට ගෙන; චක්ඛුං උදපාදී, සත්‍ය ඥානචක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාවබෝධඥානයවූ ප්‍රඥාව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජනානාවූ ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ භේදය කරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍යප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලෝකය පහළ වියයි වදාළසේක; භික්ඛවෙ, මහණෙනි, මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන; (චතුස්සත්‍ය ධර්මයෙහි) තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං, ඒ මේ දුක්ඛාර්‍ය්‍යසත්‍යය; පරිඤ්ඤෙය්‍යන්ති, පිරිසඳ දතයුත්තේ යයි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥානයවූ චක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාවබෝධඥානයවූ ප්‍රඥාව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාවූ ප්‍රඥාව පහළ විය; විජ්ජා

උදපාදි. තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං, පරිඤ්ඤාතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, ඉදං දුක්ඛසමුදයං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා

---

උදපාදි, කෙලශ භෙදකරණ විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ප්‍රඥ නමැති ආලොකය පහළ වියයි වදාළ සේක.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්ත කොට ගෙන (චතුස්සත්‍ය ධර්මයෙහි); තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං, හේ මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යය; පරිඤ්ඤාතන්ති, පිරිසිඳ දන්නාලද්දයි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥනයවූ චක්‍ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාර්ථඥනයවූ ප්‍රඥව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථවූ ප්‍රඥව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ භෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළ වියයි වදාළසේක. භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; ඉදං දුක්ඛසමුදයං අරියසච්චං ඉති, මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යයයි කියා; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්ත කොට ගෙන (චතුස්සත්‍ය ධර්මයෙහි); චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥනයවූ චක්‍ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාර්ථඥනයවූ ප්‍රඥව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථවූ ප්‍රඥව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ

උදපාදි, ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛසමුදයං අරිය–සච්චං, පහාතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං, පහීනන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි, ඤාණං

---

හෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළවි යයි වදාළ සේක; භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන (චතුස්සත්‍ය ධර්මයෙහි) තං ඛො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං, ඒ මේ දුක්ඛසමුදයාර්‍ය්‍ය සත්‍යය; පහාතබ්බන්ති, ප්‍රහීණ කටයුතු යයි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥනයවූ චක්‍ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාර්ථඥනයවූ ප්‍රඥව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථවූ ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ හෙද කරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළවියයි වදාළ සේක.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන (චතුස්සත්‍ය ධර්මයෙහි); තං ඛො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං, ඒ මේ දුක්ඛසමුදයාර්‍ය්‍යසත්‍යය; පහීනන්ති, ප්‍රහීණයයි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥනයවූ චක්‍ෂුස පහළ විය; ඤාණං උදපාදි,

උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

ඉදං දුක්ඛනිරොධං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං, සච්ඡිකාතබ්බන්ති මෙ

තත්වාවබෝධඥානයවූ ප්‍රඥාව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාවූ ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ භෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළ වියයි වදාළ සේක.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට නොහොත් මා විසින්; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මේසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන චතුස්සත්‍ය ධර්මයෙහි); ඉදං දුක්ඛනිරොධං අරියසච්චන්ති, මේ දුක්ඛනිරොධාය්‍ය සත්‍යය යි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥානයවූ චක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාවබෝධඥානයවූ ප්‍රඥාව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාවූ ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ භෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළ වියයි වදාළ සේක.

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන (චතුස්සත්‍ය ධර්මයෙහි); තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං, ඒ මේ දුක්ඛනිරොධාය්‍ය සත්‍යය සච්ඡිකාතබ්බන්ති, සාක්ෂාත්

භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං, සච්ඡිකතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ

---

කටයුතු යයි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍යය දැනයවූ චක්ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාඞ්ඥනයවූ ප්‍රඥව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාඞ්වූ ප්‍රඥව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ භෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළ වියයි වදාළ සේක; භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන (චතුස්සත්‍ය ධර්මයෙහි); තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං, ඒ මේ දුක්ඛනිරොධාය්‍යී සත්‍යය; සච්ඡිකතන්ති, සාක්ෂාත් කෘත යයි; චක්ඛුං උදපාදි, චක්ෂුස පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රඥව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ භෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළ වියයි වදාළ සේක.

භික්ඛවේ, මහණෙනි;... මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන

අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි. පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, තං ඛො පනිදං දුක්ඛ නිරොධගාමිනී පටිපදා අරියසච්චං, භාවෙතබ්බන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි ආලොකො උදපාදි.

---

(චතුස්සත්‍ය ධර්මයෙහි) ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරිය සච්චන්ති, මේ දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යයි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය දැනයවූ චක්‍ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාර්ථඥනයවූ ප්‍රඥව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථවූ ප්‍රඥව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ හෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළ වීයයි වදාළ සේක. භික්ඛවෙ, මහණෙනි; මෙ, මට, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන (චතුස්සත්‍ය ධර්මයෙහි); තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං, ඒ මේ දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය; භාවෙතබ්බන්ති, භාවිත කටයුතු යයි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥනයවූ චක්‍ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාර්ථඥනයවූ ප්‍රඥව පහළ විය; විජ්ජා උදපාදි, කෙලශ හෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, සත්‍ය ප්‍රතිච්ඡාදක මොහාන්ධකාරය විධ්වංශනය කරන ආලොකය පහළ වීයයි වදාළ සේක.

තං ඛො පනිදං දුක්ඛනිරොධ ගාමිනී පටිපදා අරියසච්චං භාවිතන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි යාව කීවඤ්චව මෙ භික්ඛවෙ ඉමෙසු චතූසු අරියසච්චෙසු, එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙන (චතුස්සත්‍ය ධර්මයෙහි) තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං, ඒ මේ දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය; භාවිතන්ති, භාවිතා කරන ලදැයි; චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥානයවූ චක්‍ෂුස පහළ විය; ඤාණං උදපාදි, තත්වාවබොධඥානයවූ ප්‍රඥාව පහළ විය; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාඊවූ ප්‍රඥාව පහළ විය; විජ්ජා උදපාදි, ක්ලෙශ භෙදකරන විද්‍යාව පහළ විය; ආලොකො උදපාදි, ප්‍රඥා නමැති ආලොකය පහළ වීයයි වදාළ සේක; භික්ඛවෙ, මහණෙනි; යාවකීවඤ්ච, යම්තාක් කල්; එවං තිපරිවට්ටං මෙසේ සත්‍යඥාන, කෘත්‍යඥාන, කෘතඥාන සඞ්ඛ්‍යාත වූ ත්‍රිපරි වෘත්තයක් ඇති; ද්වාදසාකාරං, එකි එකි සත්‍යය තුන් තුන් ආකාරයන්ගේ වශයෙන් දොළොස් ආකාරයක් ඇති; ඉමෙසු චතුසු අරියසච්චෙසු, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් කෙරෙහි; යථා භූතං ඤාණදස්සනං, යථාභූත ඥාන දර්‍ශනය; මෙ, මට; න සුවිසුද්ධං, අහොසි අති පරිසුද්ධ නොවීද,

ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. යතො ච ඛො මෙ භික්ඛවෙ ඉමෙසු චතුසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි.

අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව

---

භික්ඛවෙ, මහණෙනි; තාව, ඒතාක්කල්; සදෙවකෙ, දෙවියන් සහිත වූ; සමාරකෙ, මරුන් සහිත වූ; සබ්‍රහ්මකෙ, බඹුන් සහිත වූ; ලොකෙ, සත්ව ලොකයෙහිද; සස්සමණබ්‍රාහ්මණියා, මහණ බමුණන් සහිත වූ; සදෙව මනුස්සාය, දෙවි මිනිසුන් සහිත වූ; පජාය, ප්‍රජාවෙහිද; අහං, මම; අනුත්තරං සම්මාසම්බොධිං, අනුත්තරවූ සම්‍යග් සම්බොධිය; අභිසම්බුද්ධො, ප්‍රත්‍යක්ෂ කෙළෙමි යි වදළ සේක; භික්ඛවෙ, මහණෙනි; යතොච ඛො, යම් තැනක පටන්; එවං තිපරිවට්ටං, මෙසේ ත්‍රිපරිවෘත්තයක් ඇති; ද්වාදසාකාරං, ද්වාදසාකාරයක් ඇති; ඉමෙසු චතුසු අරියසච්චෙසු, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් කෙරෙහි: යථාභූතං ඤාණදස්සනං, යථාභූත ඥාන දර්‍ශනය (යත අභීත් ඵලවූ පහිද්ද; මෙ, මට; සුවිසුද්ධං අහොසි, අති පරිශුද්ධ වීද.

භික්ඛවෙ, මහණෙනි; අථ, එකල්හි; සදෙවකෙ, දෙවියන් සහිත වූ; සමාරකෙ, මරුන් සහිත වූ, සබ්‍රහ්මකෙ, බඹුන් සහිත වූ; ලොකෙ, ලොකයෙහිද; සස්සමණබ්‍රාහ්මණියා, මහණ බමුණන්

මනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං, ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි අකුප්පා මෙ චෙතො විමුත්ති, අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භ-වොති, ඉදමවොච භගවා අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති,

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම

---

සහිත වූ; සදෙමනුස්සාය, දෙවි මිනිසුන් සහිත වූ; පජාය, ප්‍රජාවෙහිද; අහං, මම; අනුත්තරං සම්මාසම්බොධිං, නිරුත්තරවූ සම්‍යග් සම්බොධිය; අභිසම්බුද්ධො, පසක් කෙළෙමි; පච්චඤ්ඤාසිං, දනිමි; මෙ, මට; දස්සනඤ්ච ඤාණං පන, ප්‍රත්‍යවෙක්ෂා ඥානය වනාහි; උදපාදි, පහළ විය; මෙ, මගේ; චෙතො විමුත්ති, අර්හත් ඵලය, අකුප්පා, අකොප්‍යය; අයමන්තිමාජාති, මේතොමේ පශ්චිම ජාතිය වන්නීය; ඉදානි, දැන්; පුනබ්භවො, පුනර්භවයක් හෙවත් නැවත භවොත්පත්තියක්; නත්ථි ඉති, නැත්තේ යයි වදාළ සේක. භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ සූත්‍ර ධර්මය; අවොච, වදාළ සේක; අත්තමනා, සතුටු සිත් ඇති; පඤ්චවග්ගියා භික්ඛූ, පඤ්ච වර්ගික භික්ෂූහු; භගවතො භාසිතං, බුදුරජාණන් වහන්සේගේ දෙශනාවට, අභිනන්දුන්ති, අභිනන්දනය කළාහුය.

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ, මේ ගාථා රහිත වෙය්‍යාකරණ ධර්මය හෙවත් සූත්‍රධර්මය වදාළ කල්හි; ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස, ආයුෂ්මත්වූ කෞණ්ඩන්‍ය ස්ථවිරයන්

චක්ඛුං උදපාදි, යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මන්ති.

පවත්තිතෙ ච පන භගවතා ධම්ම චක්කෙ භුම්මා දෙවා සද්දමනුස්සා වෙසුං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පති වත්තියං, සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙනවා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති,

---

වහන්සේට; විරජං, රාගාදි රජස් රහිතවූ; වීතමලං, පහවූ මල ඇති; ධම්මචක්ඛුං උදපාදි, සත්‍ය ඥානචක්ෂුස පහළ විය; (හෙවත්) සෝවාන් මාර්ගඥානය පහළ විය; කෙසේද? යං කිඤ්චි සමුදය ධම්මං, යම් කිසිවක් සමුදය සවභාව ඇත්තේද; සබ්බංතං නිරොධ ධම්මන්ති, ඒ සියල්ල නිරොධ සවභාව ඇත්තේ යයි කියායි; භගවතා, භාග්‍ය වතුන් වහන්සේ විසින්; ධම්මචක්කෙ, මේ ධර්මචක්‍රය; පවත්තිතෙ ච පන, පවත්වන ලද කල්හි, භුම්මා දෙවා, භූමාටු දෙවියෝ; සද්ද මනුස්සාවෙසුං, ශබ්දනුශ්‍රාවනය කළාහුය හෙවත් සාධුකාර ශබ්ද පැවැත්වූහ; කෙසේද? භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බාරාණසී පුරයෙහි; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහිදී; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහමණෙන වා, බ්‍රාහමණයකු විසින් හෝ; දෙවෙන වා, දෙවි යකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ, බ්‍රහමුණා වා, බ්‍රහමයකු විසින් හෝ; ලොකස්මිං, ලොකයෙහි; කෙනචි වා, අන් කිසිවකු විසින්; අප්පතිවත්තියං, නොපැවැත්විය හැකිවූ; එතං අනුත්තරං ධම්මචක්කං, නිරුත්තරවූ මේ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේයයි කියායි.

භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දෙවා සද්දමනුස්සාවෙසුං, ඒතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙණ වා කෙනචි වා ලොකස්මින්ති,

චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා, තාවතිංසා දෙවා සද්දමනුස්සාවෙසුං, ඒතං භගවතා

---

භුම්මානං දෙවානං, බූමාටු දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; චාතුම්මහාරාජිකා දෙවා, චාතුර්මහාරාජික දෙවතාවෝ; සද්දමනුස්සාවෙසුං, ශබ්දනුශ්‍රාවනය කළාහුය; කෙසේද? භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බාරාණසී පුරයෙහි; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහිදී, සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බ්‍රාහ්මණයෙකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ලොකයෙහි; කෙනචි වා, අන් කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නොපැවැත්විය හැකිවූ; එතං අනුත්තරං ධම්මචක්කං, නිරුත්තරවූ මේ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ යයි කියා යි.

චාතුම්මහාරාජිකානං, චාතුර්මහාරාජික දිව්‍යලොක වාසිවූ; දෙවානං; දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; තාවතිංසා දෙවා, තව්තිසාවැසි දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, ශබ්දනුශ්‍රාවණය කළාහුය; කෙසේද? භගවතා, භාග්‍යවතුන් වහන්සේ

**බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං, සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.**

**තාවතිංසානං දෙවානං සද්දං සුත්වා, යාමා දෙවා සද්දමනුස්සාවෙසුං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං, සමණෙන වා බ්‍රාහ්මණෙන වා**

විසින්; බාරාණසියං, බාරාණසීපුරයෙහි; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහිදී; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහමණෙන වා; බ්‍රාහමණයකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුනා වා, බ්‍රහමයකු විසින් හෝ; ලොකස්මිං, ලොකයෙහි; කෙනචි වා, අන් කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නොපැවැත්විය හැකිවූ; එතං අනුත්තරං ධම්මචක්කං, නිරුත්තර වූ මේ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ යයි කියා සී.

තාවතිංසානං දෙවානං, තව්තිසාවැසි දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; යාමා දෙවා, යාම දෙව්ලොව දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දනුශ්‍රාවනය කළාහුය; කෙසේද? භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං, බාරාණසීපුරයෙහි; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහිදී; සමණෙන වා, ශාරිපුත්‍රාදී ශ්‍රමණයකු විසින්

දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති.

යාමානං දෙවානං සද්දං සුත්වා, තුසිතා දෙවා සද්ද මනුස්සාවෙසුං -පෙ- තුසිතානං දෙවානං සද්දං සුත්වා නිම්මාණරතී දෙවා සද්ද මනුස්සාවෙසුං-පෙ- නිම්මාණරතීනං දෙවානං සද්දං සුත්වා, පරනිම්මිතවස වත්තිනො දෙවා සද්දමනුස්සා වෙ

---

බ්‍රාහ්මණේ වා, ජානුසෝණි, සෝණදණ්ඩාදී බ්‍රාහ්මණයකු විසින් හෝ; දෙවෙනවා, ශක්‍රාදි දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුනා වා, සහම්පතී ආදී බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ලොකයෙහි; කෙනචි වා, සෙසු කිසිවකු විසින් හෝ; අප්පතිවත්තියං, නොපැවැත්විය හැකිවූ; එතං අනුත්තරං ධම්ම චක්කං, නිරුත්තරවූ මේ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේ යයි කියායි.

යාමානං දෙවානං, යාම දෙව්ලොව දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; තුසිතා දෙවා, තුසිත දෙව්ලොව් දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය; -පෙ-තුසිතානං, තුසිත දෙව්ලොව දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; නිම්මාණරතී දෙවා, නිර්මාණරතී දෙව්ලොව දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය-පෙ-

නිම්මාණරතීනං දෙවානං, නිර්මාණරතී දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; පරනිම්මිතවසවත්තිනො දෙවා, පර නිම්මිත වසවත්ති දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය-පෙ-පරනිම්මිතවසවත්තීනං දෙවානං, පර නිර්මිත වසවර්තී දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා;

ස්සුං–පෙ–පරනිම්මිත වසවත්තීනං දෙවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දෙවා සද්දමනුස්සාවෙසුං –පෙ–බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සද්දං සුත්වා, බ්‍රහ්මපුරොහිතා දෙවා සද්දමනුස්සාවෙසුං–පෙ–බ්‍රහ්මපුරොහිතානං දෙවානං සද්දං සුත්වා, මහාබ්‍රහ්මා දෙවා සද්දමනුස්සාවෙසුං –පෙ–මහාබ්‍රහ්මානං දෙවානං සද්දං සුත්වා, පරිත්තාභාදෙවා සද්දං මනුස්සාවෙසුං –පෙ– පරිත්තාභානං දෙවානං සද්දං සුත්වා, අප්පමාණාභා

---

බ්‍රහ්මපාරිසජ්ජා දෙවා, බ්‍රහ්මපාරිසජ්ජ නම් බඹලෝවැසි දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය –පෙ–බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං, බ්‍රහ්මපාරිසජ්ජ නම් බඹලෝවැසි දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්ද අසා; බ්‍රහ්මපුරොහිතා දෙවා, බ්‍රහ්මපුරොහිත දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය–පෙ-බ්‍රහ්මපුරොහිතානං දෙවානං, බ්‍රහ්මපුරොහිත දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; මහා බ්‍රහ්මා දෙවා, මහාබ්‍රහ්ම දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය–පෙ–

මහාබ්‍රහ්මානං දෙවානං, මහාබ්‍රහ්ම දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; පරිත්තාභා දෙවා, පරිත්තාභ දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය –පෙ–පරිත්තාභානං දෙවානං, පරිත්තාභ දෙවියන්ගේ; සද්දං සුත්වා සාධුකාර ශබ්දය අසා; අප්පමාණාභාදෙවා, අප්පමාණාභ බඹලෝ

දෙවා සද්දමනුස්සාවෙසුං-පෙ-අප්පමාණාභානං දෙවානං සද්දං සුත්වා, ආභස්සරා දෙවා සද්දමනුස්සාවෙසුං-පෙ-ආභස්සරානං දෙවානං සද්දං සුත්වා, පරිත්තසුභා දෙවා සද්දමනුස්සාවෙසුං-පෙ-පරිත්තසුභානං දෙවානං සද්දං සුත්වා, අප්පමාණසුභා දෙවා සද්දමනුස්සාවෙසුං-පෙ-අප්පමාණසුභානං දෙවානං සද්දං සුත්වා, සුභකිණ්හකා දෙවා සද්දමනුස්සාවෙසුං-පෙ-සුභකිණ්හකානං

---

වැසි දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දනුශ්‍රාවණය කළාහුය-පෙ-අප්පමාණාභානං දෙවානං, අප්පමාණාභ බඹලෝවැසි දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; ආභස්සරා දෙවා, ආභස්සර දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දනුශ්‍රාවණය කළාහුය-පෙ-ආභස්සරානං දෙවානං, ආභස්සර දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; පරිත්තසුභා දෙවා, පරිත්තසුභ දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දනුශ්‍රාවණය කළාහුය-පෙ-පරිත්තසුභානං, පරිත්තසුභ දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අප්පමාණසුභා දෙවා, අප්පමාණසුභ දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දනුශ්‍රාවණය කළාහුය-පෙ-අප්පමාණසුභානං දෙවානං, අප්පමාණසුභ දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; සුභකිණ්හකා දෙවා, සුභකිණ්හක දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දනුශ්‍රාවණය කළාහුය-පෙ-

සුභකිණ්හකානං දෙවානං, සුභකිණ්හක දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; වෙහප්ඵලා දෙවා, වෙහප්ඵල දෙවියෝ

දෙවානං සද්දං සුත්වා වෙහප්ඵලා දෙවා සද්දමනුස්සාවෙසුං -පෙ- වෙහප්ඵලානං දෙවානං සද්දං සුත්වා, අවිහා දෙවා සද්දමනුස්සාවෙසුං -පෙ- අවිහානං දෙවානං සද්දං සුත්වා, අතප්පා දෙවා සද්දමනුස්සාවෙසුං -පෙ- අතප්පානං දෙවානං සද්දං සුත්වා සුදස්සා දෙවා සද්දමනුස්සාවෙසුං -පෙ- සුදස්සානං දෙවානං සද්දං සුත්වා සුදස්සී දෙවා සද්දමනුස්සාවෙසුං -පෙ- සුදස්සීනං දෙවා

---

සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය -පෙ- වෙහප්ඵලානං, දෙවානං, වෙහප්ඵල දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අවිහා දෙවා, අවිහ බඹලෝ දෙවියෝ; සද්ද මනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය -පෙ- අවිහානං දෙවානං, අවිහ දෙවියන්ගේ සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අතප්පා දෙවා, අතප්ප නම් බඹලෝ දෙවියෝ; සද්ද මනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය -පෙ- අතප්පානං දෙවානං, අතප්පදෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; සුදස්සා දෙවා, සුදස්ස බඹලෝ දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය -පෙ- සුදස්සානං දෙවානං, සුදස්ස දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; සුදස්සී දෙවා, සුදස්සී බඹලෝ දෙවියෝ; සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දානුශ්‍රාවණය කළාහුය -පෙ-

සුදස්සීනං දෙවානං, සුදස්සී දෙවියන්ගේ; සද්දං සුත්වා, සාධුකාර ශබ්දය අසා; අකණිට්ඨකා දෙවා, අකණිට්ඨක දෙවියෝ;

නං සද්දං සුත්වා, අකණිට්ඨකා දෙවා සද්දමනුස්සාවෙසුං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති. ඉතිහ තෙන ඛණෙන තෙන මුහුත්තෙන, යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගඤ්ඡි. අයඤ්ච දසසහස්සී ලොකධාතු සඞ්කම්පි සම්පකම්පි සම්පවෙධි.

---

සද්දමනුස්සාවෙසුං, සාධුකාර දෙමින් ශබ්දනුශ්‍රාවණය කළාහුය; කෙසේද? භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; බාරාණසියං බාරාණසී පුරයෙහි; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහිදී; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බ්‍රාහ්මණයකු විසින් හෝ, දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයෙකු විසින් හෝ; ලොකස්මිං, ලොකයෙහි; කෙනචි වා, අන් කිසිවකු විසින් හෝ අප්පතිවත්තියං, නො පැවැත්විය හැකිවූ; එතං අනුත්තරං ධම්මචක්කං, නිරුත්තරවූ මේ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේයයි කියායි; ඉති මෙසේ; භතෙන, මේ ප්‍රකාරයෙන් ඛණෙන, එකෙණෙහි; තෙන මුහුත්තෙන, ඒ මොහොතෙහි; යාව බ්‍රහ්මලොකා, බඹලොව දක්වා; සද්දො "වෙ මෙ භික්ඛවෙ අනත්තා" යනාදි ශබ්දය; අබ්භුග්ගඤ්ඡි, ඉතා උස්ව පැතිර නැංගේය; අයඤ්ච දසසහස්සී ලොකධාතු; මේ දශ සහශ්‍රී ලොකධාතුවද; සංකම්පි,

**අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුරහොසි, අතික්කම්ම දෙවානං දෙවානුභාවන්ති. අථ ඛො භගවා උදානං උදානෙසි. අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤොති. ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස, අඤ්ඤාකොණ්ඩඤ්ඤොත්වෙව නාමං අහොසි'ති.**

ධම්මචක්කප්පවත්තන සුත්තං නිට්ඨිතං

---

බොහෝ සෙයින් කම්පා විය; සම්පකම්පි; අතිශයින්ම කම්පා විය; සම්පවෙධි, විශෙෂයෙන්ම (වැඩියක්ම) කම්පිත විය.

දෙවානං, දෙවියන්ගේ; දෙවානුභාවං, දිව්‍යානුභාවය, අතික්කම්ම, ඉක්මවා, අප්පමාණො ච, අප්‍රමාණවූ; උළාරො, මහත්වූ; ඔභාසො, ආලොකය; ලොකෙ, ලොකයෙහි; පාතුරහොසි, පහළ විය; අථ ඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භො කොණ්ඩඤ්ඤ, භවත් කෞණ්ඩිණ්‍ය තෙමේ; වත, ඒකාන්තයෙන්; අඤ්ඤාසි, චතුස්සත්‍යය දත්තේය, භො කොණ්ඩඤ්ඤ, භවත් කෞණ්ඩිණ්‍ය තෙමේ, වත, ඒකාන්තයෙන්; අඤ්ඤාසි ඉති; චතුස්සත්‍යය අවබොධ කෙළේ යයි; උදානං, ප්‍රීති වාක්‍යයක්; උදානෙසි, පැවැත්වූ සේක; ඉතිහිදං, මෙසේ මේ කාරණයෙහිදී, ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස, කෞණ්ඩිණ්‍ය ආයුෂ්මතුන් වහන්සේට; අඤ්ඤාකොණ්ඩඤ්ඤොත්වෙව, අඤ්ඤාකොණ්ඩඤ්ඤය ,යන; නාමං, අහොසි ඉති, නම විය.

ධර්මචක්‍ර ප්‍රවර්තන සූත්‍රයයි.

## මහාසමය සුත්තං

24 එවං මෙ සුතං එකං සමයං භගවා, සක්කෙසු විහරති කපිල වත්ථුස්මිං මහාවනෙ, මහතා භික්ඛු සඞ්ඝෙන සද්ධිං, පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි, දසහි ච ලොකධාතූහි දෙවතා යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති, භගවන්තං දස්සනාය භික්ඛු සඞ්ඝඤ්ච. අථ ඛො චතුන්නං සුද්ධාවාසකායිකානං දෙවානං එතද හොසි,

---

## මහාසමය සූත්‍රය

24 එවං මෙ සුතං, මා විසින් මේ සූත්‍රධර්මය මෙසේ අසන ලදී; කෙසේද? එකං සමයං, එක් කාලයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සක්කෙසු, ශාක්‍යයන්ගේ දනව්වෙහි; කපිල වත්ථුස්මිං කිඹුල්වත්පුරය සමීපයෙහි වූ; මහාවනෙ, මහ වනයෙහි; සබ්බෙහි අරහන්තෙහි, සියලු දෙනා වහන්සේම අර්හත්වයට පැමිණියාවූ; පඤ්ච මත්තෙහි භික්ඛුසතෙහි, පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්තවූ; මහතා භික්ඛු සඞ්ඝෙන සද්ධිං, මහත් භික්ෂු සඞ්ඝයා සමග; විහරති, වැඩ වාසය කර වදාරන සේක; දසහිච ලොකධාතූහි, දශ දහසක් ලොක ධාතූ වලින්ද; දෙවතා, දෙවියෝ; භගවන්තං; භාග්‍යවතුන් වහන්සේද; භික්ඛු සඞ්ඝඤ්ච, භික්ෂු සඞ්ඝයාද; දස්සනාය, දක්ම පිණිස; යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති, බොහෝ සෙයින් රැස් වූවෝ වෙත්; අථ ඛො, ඉක්බිත්තෙන්; චතුන්නං සුද්ධාවාසකායිකානං, ශුද්ධාවාස බ්‍රහ්ම නිකායට අයත්වූ බ්‍රහ්මරාජයන් සතර දෙනකුට; එතදහොසි, මෙබඳු අදහසෙක් විය.

අයං ඛො භගවා, සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං මහාවනෙ, මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සබ්බෙහෙව අරහන්තෙහි, දසහි ච ලොකධාතූහි දෙවතා, යෙභුය්‍යෙන සන්නිපතිතා හොන්ති, භගවන්තං දස්සනාය භික්ඛුසඞ්ඝඤ්ච යන්නූන මයම්පි යෙන භගවා තෙනු පසංකමෙය්‍යාම උපසංකමිත්වා, භගවතො සන්තිකෙ පච්චෙක ගාථං භාසෙය්‍යාමාති, අථ ඛො තා

---

කෙසේද? අයං ඛො භගවා, මේ භාග්‍යවතුන් වහන්සේ; කපිලවත්ථුස්මිං, ශාක්‍යයන්ගේ කිඹුල්වත් පුරය සමීපයෙහි වූ; මහාවනෙ, මහවනයෙහි; සබ්බෙහෙව අරහන්තෙහි, සියලු දෙනා වහන්සේම රහත්වූ; පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි, පන්සියයක් භික්ෂූන්ගෙන් යුක්තවූ; මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං, මහත් භික්ෂුසඞ්ඝයා සමග; විහරති, වැඩ වාසය කර වදාරන සේක; දසහිච ලොකධාතූහි දෙවතා, දශ දහසක් ලොකධාතු වලින්ද දෙවියෝ; භගවන්තං බුදුරජාණන් වහන්සේද, භික්ඛුසඞ්ඝඤ්ච, භික්ෂුසඞ්ඝයාද, දස්සනාය, දැකීම පිණිස; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; සන්නිපතිතා හොන්ති, රැස්වූවෝ වෙත්.

යන්නූන, යම් හෙයකින්; මයම්පි, අපිද; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතනට; උපසංකමෙය්‍යාම; එලඹෙන්නෙමු නම්; උපසඞ්කමිත්වා, එලඹ; භගවතො සන්තිකෙ, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි; පච්චෙකගාථං, එක එක ගාථාවක්; භාසෙය්‍යාමාති; කියන්නෙමු නම් ඉතා

දෙවතා සෙය්‍යථාපි නාම බලවා පුරිසො, සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං සුද්ධාවාසෙසු දෙවෙසු අන්තරහිතා, භගවතො පුරතො පාතුරහංසු, අථ ඛො තා දෙවතා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු, එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවතො සන්තිකෙ ඉමං ගාථං අභාසි

යෙහෙකැයි සිතුහ; අථ ඛො, ඉක්බිත්තෙන්; තා දෙවතා, ඒ දෙවතාවෝ; බලවා පුරිසො, බලවත්, පුරුෂයෙක්; සම්මිඤ්ජිතං වා බාහං, හකුළුවන ලද අතක්; පසාරෙය්‍ය, දිග්ගු කරන්නේ යම්සේද; පසාරිතං වා බාහං, දිගු කරන ලද අතක්; සම්මිඤ්ජෙය්‍ය, හකුළු වන්නේ යම්සේද; එවමෙවං, එපරිද්දෙන්ම; සුද්ධාවාසෙසු, සුද්ධාවාස දෙවියන් කෙරෙහි, අන්තරහිතා, අතුරුදන් වූවෝ; භගවතො පුරතො, බුදුන්ගේ ඉදිරියෙහි; පාතුරහංසු, පහළ වූහ; අථ ඛො, ඉක්බිති; තා දෙවතා, ඒ දෙවතාවෝ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, මනාකොට වැඳ, එකමන්තං අට්ඨංසු, එකත් පසෙක සිටියාහුය; එකමන්තං ඨිතා ඛො, එකත් පසෙක සිටියාම වූ, එකා දෙවතා, එක් දෙවතාවෙක්; භගවතො සන්තිකෙ, භාග්‍ය වතුන් වහන්සේගේ සමීපයෙහි; ඉමං ගාථං අභාසි, මේ ගාථාව කීයේය.

1 මහාසමයො පවනස්මිං
දෙවකායා සමාගතා,
ආගතම්හ ඉමං ධම්මසමයං
දක්ඛිතායෙ අපරාජිත සංඝන්ති.

අථ ඛො අපරා දෙවතා, භග-
වතො සන්තිකෙ ඉමං ගාථං අභාසි,

2 තත්‍ර භික්ඛවො සමාදහංසු
චිත්තං අත්තනො උජුමකංසු,
සාරථීව නෙත්තානි ගහෙත්වා
ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතාති.

අථ ඛො අපරා දෙවතා භග-
වතො සන්තිකෙ ඉමං ගාථං අභාසි,

---

1. පවනස්මිං; මහවනයෙහි; මහාසමයො, මහත් සමාගමයෙකි; දෙවකායා, දිව්‍ය සමූහයෝ; සමාගතා, එක්රැස් වූහ; අපරාජිත සංඝං, නොපරදවන ලද ආර්‍ය්‍ය සංඝයා; දක්ඛිතායෙ, දක්නා පිණිස; ඉමං ධම්ම සමයං; මේ ධර්‍ම සමාගමයට; ආගතම්හ ඉති, ආවෝ වෙමු;

අථ ඛො, ඉක්බිත්තෙන්; අපරාදෙවතා, අන්‍ය දෙවතාවෙක්; භගවතො සන්තිකෙ, බුදුරජාණන් වහන්සේගේ සමීපයෙහි, ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීයේය.

2. තත්‍ර, ඒ ධර්‍ම සමාගයෙහි; භික්ඛවො, භික්ෂූහු; අත්තනො චිත්තං, තමන්ගේ සිත; සමාදහංසු, එකඟ කළාහුය; උජුකමකංසු, ඍජු කළාහුය; නෙත්තානි ගහෙත්වා, රැහැන් ගෙන; සාරථි ඉව, රථාචාර්‍ය්‍යකු මෙන්; පණ්ඩිතා, නුවනැත්තෝ; ඉන්ද්‍රියානි, ඉඳුරන්; රක්ඛන්ති, රකිත්.

3 ඡෙත්වා ඛීලං ඡෙත්වා පලිඝං
ඉන්දඛීලං ඌහච්ච මනෙජා,
තෙ චරන්ති සුද්ධා විමලා
චක්ඛුමතා සුදන්තා සුසූ නාගාති.

අථ ඛො අපරා දෙවතා භග–
වතො සන්තිකෙ ඉමං ගාථං අභාසි,

4 යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ
න තෙ ගමිස්සන්ති අපායං,
පහාය මානුසං දෙහං
දෙවකායං පරිපූරෙස්සන්තීති.

---

අථ ඛො, ඉක්බිත්තෙන්; අපරා දෙවතා, අනෙක් දෙවතා කෙනෙක්; භගවතො සන්තිකෙ, බුදුන්ගේ සමීපයෙහි; ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කියේය.

3. ඛීලං, රාගාදී කෙලෙස් නැමති උල; ඡෙත්වා, සිඳ පලිඝං, කෙලෙස් නැමති කනයම; (අයොමය හුල) ඡෙත්වා, සිඳ; ඉන්දඛීලං, ඉන්ද්‍රකීලය, ඌහච්ච, උදුරා; අනෙජා, එජාය යි කියන ලද තෘෂ්ණා රහිත වූ; සුද්ධා, එහෙයින්ම පිරිසුදු වූ; විමලා, නිර්මල වූ; චක්ඛුමතා, පසැස් ඇත්තා වූ බුදුන් විසින්; සුදන්තා, මොනවට දමනය කරන ලද්දවූ; තෙ සුසු නාගා, ඒ තරුණ රහත්හු; චරන්ති, සිව්දිගින් හැසිරෙත්.

අථ ඛො, ඉක්බිත්තෙන්; අපරා දෙවතා, අනෙක් දෙවතාවෙක්; භගවතො සන්තිකෙ, බුදුන්ගේ සමීපයෙහි, ඉමං ගාථං, මේ ගාථාව; අභාසි, කීයේය.

4. යෙ කෙචි, යම් කිසි කෙනෙක්; බුද්ධං සරණං, බුදුන් සරණ; ගතාඅසි, ගියාහුද; තෙ, ඔව්හු; අපායං, අපායට; නගමිස්සන්ති, නොයෙත්; මානුසං දෙහං, මනුෂ්‍ය ශරීරය; පහාය, හැර; දෙවකායං, දිව්‍ය කය හෙවත් දිව්‍යසමූහයා; පරිපූරෙස්සන්ති, සම්පූර්ණ කරන්නාහුය.

අථ ඛො භගවා භික්ඛූ ආම-න්තෙසි, යෙභුය්‍යෙන භික්ඛවෙ දසසු ලොකධාතුසු දෙවතා සන්නිපතිතා තථාගතං දස්සනාය භික්ඛුසංඝඤ්ච යෙපි තෙ භික්ඛවෙ අහෙසුං, අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමායෙව දෙවතා සන්නිපතිතා අහෙසුං සෙය්‍යථාපි මය්හං එතරහි.

යෙපි තෙ භික්ඛවෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං

---

අථ ඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි; ආමන්ත්‍රණය කළ සේක; භික්ඛවෙ, මහණෙනි; දසසු ලොකධාතුසු දෙවතා, දශදහසක් සක්වල දෙවතාවෝ; තථාගතං, තථාගතයන් වහන්සේද; භික්ඛුසංඝං ච, භික්ෂු සංඝයාද; දස්සනාය, දැකීම පිණිස; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; සන්නිපතිතා, රැස්වූහ; භික්ඛවෙ, මහණෙනි; අතීතමද්ධානං, අතීත කාලයෙහි; අරහන්තො, අභීත්වූ; යෙපි තෙ සම්මාසම්බුද්ධා, යම් ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා; අහෙසුං, වූවාහුද, තෙසම්පි භගවන්තානං, ඒ භාග්‍යවතුන් වහන්සේලාටද; එත පරමා යෙව දෙවතා, මෙපමණ දෙවතාවෝ; සන්නිපතිතා අහෙසුං, රැස්වූහ; සෙය්‍යථාපි මය්හං එතරහි, දැන් මාගේ දැක්මට යම්සේ රැස්වූද ඒ පරිද්දෙනි.

භික්ඛවෙ, මහණෙනි; අනාගතමද්ධානං, අනාගත කාලයෙහි; අරහන්තො, අභීත්වූ; යෙ තෙ සම්මාසම්බුද්ධා, යම් ඒ සම්‍යක් සම්බුදුවරයෝ; භවිස්සන්ති, වන්නාහුද; තෙසම්පි භගවන්තානං, ඒ

එතපරමායෙව දෙවතා සන්නිපාති
තා භවිස්සන්ති සෙය්‍යථාපි මය්හං
එතරහි, ආචික්ඛිස්සාමි භික්ඛවෙ
දෙවකායානං නාමානි, කිත්තයිස්සා
මි භික්ඛවෙ දෙවකායානං නාමානි,
දෙසිස්සාමි භික්ඛවෙ දෙවකායානං
නාමානි, තං සුණාථ සාධුකං මනසි
කරොථ භාසිස්සාමීති, එවම්භන්තෙති
ඛො තෙ භික්ඛූ භගවතො
පච්චස්සොසුං භගවා එතදවොච,

1 සිලොකමනුකස්සාමි
යත්ථ භුම්මා තදස්සිතා,

---

භාග්‍යවතුන් වහන්සේලාටද; එතපරමායෙව, මෙපමණම; දෙවතා, දෙවතාවෝ; සන්නිපතිතා භවිස්සන්ති, රැස්වන්නාහුය; මය්හං සෙය්‍යථාපි එතරහි, මට දැන් යම්සේද එපරිද්දෙනි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං නාමානි, දිව්‍ය සමූහයන්ගේ නාමයන්; ආචික්ඛිස්සාමි, ප්‍රකාශ කරන්නෙමි, භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං නාමානි, දිව්‍ය සමූහයන්ගේ නාමයන්; කිත්තයිස්සාමි, පහළ කරන්නෙමි (හෙවත්) සලකුණු කරන්නෙමි; භික්ඛවෙ, මහණෙනි; දෙවකායානං නාමානි, දිව්‍ය සමූහයන්ගේ නාමයන්; දෙසිස්සාමි; දෙශනා කරන්නෙමි; තං, එය; සුණාථ, අසව්; සාධුකං, මනාකොට; මනසිකරොථ, මෙනෙහි කරව්; භාසිස්සාමි ඉති, කියන්නෙමියි වදාළ සේක; තෙ, භික්ඛු, ඒ භික්ෂූහු, එවම්භන්තෙති ඛො, ස්වාමීන් වහන්ස එසේ යයි කියා; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචන ඇස්වූහ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං, මේ අක්‍ෂපද නියමිත ධර්මය; අවොච, වදාළ සේක.

යෙ සිතා ගිරිගබ්භාරං
පහිතත්තා සමාහිතා.

2 පුථුසීහාව සල්ලීණා
ලොමහංසාභිසම්භුනො,
ඔදාතමනසා සුද්ධා
විප්පසන්නමනාවිලා.

3 භීයෝ පඤ්චසතෙ ඤත්වා
වනෙ කාපිලවත්ථවෙ,
තතො ආමන්තයී සත්ථා
සාවකෙ සාසනෙ රතෙ.

---

1–2 සිලොකමනුකස්සාමි, දෙවතා සන්නිපාත වර්ණනයක් කරමි; යත්ථ, යම් තැනෙක්හි; භුම්මා, භූම්‍යස්ථ දෙවියෝ වෙද්ද; (ඔව්හු) තදස්සිතා, ඒ ඒ ස්ථාන නිශ්‍රිත වූවාහුය; පහිතත්තා, භාවනාවට යවන ලද සිත් ඇත්තාවූ; සමාහිතා, එකඟවූ සිත් ඇත්තාවූ; ලොමහංසාභි සම්භූතො, ලොමුදැහැගැන්ම අභිභවනය කළාවූ; ඔදාතමනසා, පිරිසුදු සිත් ඇත්තාවූ; සුද්ධා, එහෙයින්ම පිරිසුදු වූ; විප්පසන්න මනාවිලා, රාගාදීන් අමිශ්‍ර සිත් ඇත්තාවූ; පුථුසීහාව සල්ලීණා, කෙසර සිංහරාජයන් මෙන් සැඟවුනාවූ; යෙ, යම් බොහෝ රහත්හු; ගිරිගබ්භාරං සිතා, පර්වත ගුහා ඇසුරු කළාහුද?

3. තතො, ඉක්බිත්තෙන්; සත්ථා, ශාස්තෘන් වහන්සේ; කාපිලවත්ථවෙ, කිඹුල්වත් පුරයට සමීප වූ; වනෙ, මහ වනයෙහි; සාසනෙ රතෙ, බුදුසස්නෙහි ඇලුනාවූ; භීයෝ පඤ්චසතෙ, භාග්‍යවතුන් වහන්සේ සමග පන්සියයකින් වැඩිවූ; සාවකෙ, ශ්‍රාවකයන්; ඤත්වා, දැන; ආමන්තයී, ආමන්ත්‍රණය කළ සේක.

4 දෙවකායා අභික්කන්තා
තෙ විජානාථ භික්ඛවො
තෙච ආතප්පමකරුං
සුත්වා බුද්ධස්ස සාසනං.

5 තෙසං පාතුරහු ඤාණං
අමනුස්සානදස්සනං,
අප්පෙකෙ සතමද්දක්ඛුං
සහස්සං අථ සත්තතිං.

6 සතං එකෙ සහස්සානං
අමනුස්සානමද්දසුං
අප්පෙකෙ නන්තමද්දක්ඛුං
දිසා සබ්බා ඵුටා අහු.

---

4. භික්ඛවෙ, මහණෙනි; දෙවකායා අභික්කන්තා, දිව්‍ය සමූහයා රැස්වූවාහුය; තෙ විජානාථ, ඒ දිව්‍ය සමූහයා මනාකොට දනිව්; තෙ, ඒ භික්ෂූහු; බුද්ධස්ස සාසනං, බුදුන්ගේ හස්න; සුත්වා, අසා; ආතප්පමකරුං, වියඞ් කළාහුය.

5. තෙසං, ඒ භික්ෂූන්ට; අමනුස්සානදස්සනං, දෙවාදී අමනුෂ්‍ය යන්ගේ දැකීම ඇති; ඤාණං, දිව්‍ය ඥානය; පාතුරහු, පහළ විය; අප්පෙකෙ, ඇතැම් රහත්හු; සතමද්දක්ඛුං, අමනුෂ්‍යයන් සියයක් දුටහ, සහස්සං, ඇතැම් රහත්හු දහසක්ද; අථ, නැවත; සත්තතිං සහස්සං, ඇතැම් රහත්හු හැත්තෑ දහසක්ද දුටහ.

6. එකෙ, ඇතැම් රහත්හු; අමනුස්සානං, දෙවාදී අමනුෂ්‍යයන්; සතං සහස්සානං අද්දසුං, ලක්ෂයක්ද දුටහ; අප්පෙකෙ, සමහර රහත්හු; අනන්තමද්දක්ඛුං, අප්‍රමාණ දිව්‍ය බ්‍රහ්මයන් දුටහ; කෙසේද? සබ්බා දිසා, සියලු දිසාවෝ; ඵුටා අහු, අවකාශ රහිත වූද එහෙයිනි.

7 තඤ්ච සබ්බං අභිඤ්ඤාය
වවක්ඛිත්වාන චක්ඛුමා,
තතො ආමන්තයී සත්ථා.
සාවකෙ සාසනෙ රතෙ.

8 දෙවකායා අභික්කන්තා
තෙ විජානාථ භික්ඛවො,
යෙ වො 'හං කිත්තයිස්සාමි
ගිරාහි අනුපුබ්බසො.

9 සත්තසහස්සා යක්ඛා
භුම්මා කාපිලවත්ථවා
ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො.

---

7. චක්ඛුමා, පසැස් ඇත්තාවූ ශාස්තෲන් වහන්සේ; තඤ්ච සබ්බං, ඒ සියල්ලම; අභිඤ්ඤාය, විශිෂ්ට ඥානයෙන් දැන; වවක්ඛිත්වාන, වෙන් කොට; තතො, නැවත; සාසනෙ රතෙ, සස්නෙහි ඇලුනාවූ; සාවකෙ, ශ්‍රාවකයන්; ආමන්තයී, ඇමතූ සේක.

8. භික්ඛවෙ, මහණෙනි; දෙවකායා, දිව්‍ය සමූහයා; අභික්කන්තා, රැස්වූහ; අහං, මම; වො, තොපට; යෙ, යම් ඒ දිව්‍ය බ්‍රහ්මාදීන්ගේ සංඛ්‍යා වශයෙන්; ගිරාහි, වචනවලින්; අනුපුබ්බසො, පිළිවෙළින්; කිත්තයිස්සාමි, ප්‍රකාශ කරන්නෙම්ද; තෙ, ඒ දෙවියන්; විජානාථ, දනිව්.

9. කාපිලවත්ථවා, කිඹුල්වත් පුරවාසිවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, බැබලීම ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇත්තාවූ; යසස්සිනො, යසස් ඇත්තාවූ; සත්තසහස්සා, සත්

මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

10 ඡසහස්සා හෙමවතා
යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො
වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

11 සාතාගිරා තිසහස්සා
යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො
වණ්ණවන්තො යසස්සිනො,

---

දහසක්; භුම්මායක්ඛා, භූමිනිශ්‍රිත දෙවියෝ; මෝදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අර්හත් භික්ෂු සමූහයා දකිමට; වනං, මහ වනයට; අභික්කාමුං, පැමිණියාහුය.

10. හෙමවතා, හිමාලය පර්වතයෙහි වාසය කරන්නාවූ; නානත්තවණ්ණිනො, නානාවිධ ප්‍රභා ඇත්තාවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතීමන්තො, ආනුභාවසම්පන්නාවූ; වණ්ණවන්තො, දිව්‍යමය ශරීර වර්ණයෙන් යුක්තවූ; යසස්සිනො, යස පිරිවර සම්පත් ඇත්තාවූ; ඡසහස්සා යක්ඛා, සදහසක් යක්ෂයෝ; මෝදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අර්හත් භික්ෂූන්ගේ දර්ශනය පිණිස; වනං, මහවනයට; අභික්කාමුං, පැමිණියාහුය.

11. සාතාගිරා, සාතාගිරි නම් පර්වත වාසීවූ; නානත්තවණ්ණිනො, නොයෙක් ප්‍රභා ඇති; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ. ජුතීමන්තො, කාන්ති ඇත්තාවූ; වණ්ණවන්තො, දිව්‍යමය ශරීර වර්ණ

මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

12 ඉච්චෙතෙ සොළසසහස්සා
යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

13 වෙස්සාමිත්තා පඤ්චසතා
යක්ඛා නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො,

---

ඇත්තාවූ; යසස්සිනො, යස පිරිවර ඇත්තාවූ; තිසහස්සා යක්ඛා, තුන්දහසක් යක්ෂයෝ; මොදමානා; සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්ෂූන්ගේ දශීනයට; වනං, මහ වනයට; අභික්කාමුං පැමිණියාහුය.

12. ඉති, මෙසේ; නානත්තවණ්ණිනො, නානාවිධ ප්‍රභා ඇත්තාවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, කාන්ති හෝ ආනුභාව ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීර වර්‍ණ ඇත්තාවූ; යසස්සිනො, යසස් ඇත්තාවූ; එතෙ සොළසසහස්සා යක්ඛා, මේ සොළොස් දහසක් යක්ෂයෝ; මෝදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්ෂු සමූහයා දක්නට; වනං, මහවනයට; අභික්කාමුං, පැමිණියාහුය.

13. වෙස්සාමිත්තා, වෙස්සාමිත්ත නම් පර්‍වත වාසීවූ; නානත්තවණ්ණිනො, නානාවිධ ප්‍රභා ඇත්තාවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තා

මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

14 කුම්භීරො රාජගහිකො
වෙපුල්ලස්ස නිවෙසනං,
භිය්‍යො නං සතසහස්සං
යක්ඛානං පයිරුපාසති,
කුම්භීරො රාජගහිකො
සොපාග සමිතිං වනං.

15 පුරිමඤ්ච දිසං රාජා
ධතරට්ඨො තං පසාසති,
ගන්ධබ්බානං ආධිපති
මහාරාජා යසස්සිසො.

---

වූ; ජුතීමන්තො, කාන්ති හෝ ආනුභාව ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇත්තාවූ; යසස්සිනො, යසස් ඇත්තාවූ; පඤ්චසතා යක්ඛා, පන්සියයක් යක්ෂයෝ, මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අහිත් සමූහයා දක්නට; වනං, මහ වනයට; අභික්කාමුං, පැමිණියාහ.

14. රාජගහිකො, රජගහනුවර උපන්නාවූ; කුම්භීරො, කුම්භීර නම් යක් සෙනෙවිරත් කෙනෙක් විය; නිවෙසනං, ඔහුගේ නිවෙස, ස්ථානය; වෙපුල්ලස්ස, වෙපුල්ල පර්වතයයි; නං, ඔහු; භිය්‍යො, වැඩියක් සහිත, සතසහස්සං යක්ඛානං පයිරුපාසති, යක්ෂයන් ලක්ෂයක් ඇසුරු කෙරේ; රාජගහිකො, රජගහනුවර උපන්; සො කුම්භීරො, ඒ කුම්භීර තෙමේද; සමිතිං, අභිත් භික්ෂු සමූහයා දක්නට; මහාවනං, මහ වනයට; උපාග, ආයේය.

15. පුරිමඤ්ච දිසං රාජා, පෙරදිග රජවූ; ධතරට්ඨො, ධෘත රාෂ්ට්‍ර වරම්රජ තෙමේ; තං පසාසති, ඒ පෙරදිග අනුශාසනා

16 පුත්තාපි තස්ස බහවො
ඉන්දනාමා මහබ්බලා,
ඉද්ධිමන්තො ජුතීමන්තො
වණ්ණවන්තො යසස්සිනො.
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

17 දක්ඛිණඤ්ච දිසං රාජා
විරූළ්හො තංපසාසති,
කුම්භණ්ඩානං ආධිපති
මහාරාජා යසස්සි සො.

18 පුත්තාපි තස්ස බහවො
ඉන්දනාමා මහබ්බලා,

---

කෙරේ; ගන්ධබ්බානං අධිපති, ගන්ධර්වයන්ට අධිපතිවූ; යසස්සි, යසස් ඇත්තාවූ; සො මහා රාජා, ඒ ධෘතරාෂ්ට්‍ර රජ තෙමේද.

16. තස්ස, ඔහුගේ; ඉන්දනාමා, ඉන්ද්‍ර යන නම් ඇති, මහබ්බලා, මහත් ශක්ති ඇත්තාවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතීමන්තො, කාන්ති ඇත්තාවූ; වණ්ණවන්තො, නොයෙක් පැහැ ඇති; යසස්සිනො, යසපිරිවර ඇත්තාවූ; පුත්තාපි, බොහෝ දිව්‍ය පුත්‍රයෝද; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අහීත් භික්ෂු සමූහයා දක්නට; වනං, මහ වනයට; අභික්කාමුං, පැමිණියාහ.

17. දක්ඛිණඤ්ච දිසං රාජා, දකුණු දිග රජවූ; විරූළ්හො, විරූඪ නම් වරම්රජ තෙමේද; තම්පසාසති, ඒ දිග අනුශාසනා කෙරේ; කුම්භණ්ඩානං, කුම්භාණ්ඩයන්ට; අධිපති, අධිපතිවූ; යසස්සි, යසස් ඇත්තාවූ; සො මහා රාජ, ඒ විරූඪ රජ තෙමේද.

ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

19 පච්ඡිමඤ්ච දිසං රාජා
විරූපක්ඛො තං පසාසති,
නාගානං ආධිපති
මහාරාජා යසස්සිසො.

20 පුත්තාපි තස්ස බහවො
ඉන්දනාමා මහබ්බලා

---

18. ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, කාන්ති හෝ ආනුභාව ඇති; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇති; යසස්සිනො, යසස් ඇත්තාවූ; මහබ්බලා, මහත් බල ඇති; ඉන්දනාමා, ඉන්ද්‍ර යන නම් ඇති; තස්ස, ඔහුගේ; පුත්තාපි බහවො, බොහෝ පුත්‍රයෝද; මොද මානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්‍ෂු සමූහය දක්නට; වනං, මහ වනයට; අභික්කාමුං, පැමිණියාහ.

19-20. පච්ඡිමඤ්ච දිසං රාජා, පශ්චිමදිසාවෙහි රජවූ; විරූපක්ඛො, විරූපාක්‍ෂ තෙමේද; තම්පසාසති, ඒ දිග අනුශාසනා කෙරේ; නාගානං ආධිපති, නාගයින්ට අධිපති වූ; යසස්සී, යසස් ඇති; සො මහාරාජා, ඒ වරම් මහරජ තෙමේද; තස්ස, ඒ වරම් මහරජහුගේ; ඉන්දනාමා, ඉන්ද්‍ර යන නම් ඇති; මහබ්බලා, මහත් බල ඇත්තාවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇති, ජුතිමන්තො, කාන්ති ඇති; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇති; යසස්සිනො, යසස් ඇත්තාවූ; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝද; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්‍ෂූන් දශීනයට; වනං, මහවනයට; අභික්කාමුං, පැමිණියාහ.

ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

21 උත්තරඤ්ච දිසං රාජා
කුවෙරො තං පසාසති
යක්ඛානං ආධිපති
මහාරාජා යසස්සිසො,

22 පුත්තාපි තස්ස බහවො
ඉන්දනාමා මහබ්බලා
ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

---

21–22 උත්තරඤ්ච දිසං රාජා, උතුරු දිසාවට අධිපතිවූ; කුවෙරො, කුවෙර නම්වූ වෙසවුණු රජ තෙමේද; තම්පසාසති, ඒ දිග අනුශාසනා කෙරේ; යක්ඛානං ආධිපති, යක්‍ෂයන්ට අධිපති වූ; යසස්සී, යසස් ඇත්තාවූ; සො මහාරාජා, ඒ මහරජ තෙමේද; ඉන්දනාමා, ඉන්ද්‍ර යන නම් ඇති; මහබ්බලා, මහත් බල ඇත්තාවූ; ඉද්ධිමන්තො, සෘඩි ඇත්තාවූ; ජුතිමන්තො, කාන්ති ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇත්තාවූ; යසස්සිනො, යසස් ඇත්තාවූ; තස්ස ඔහුගේ, බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝද; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්‍ෂූන් දශීනයට; වනං, වනටය; අභික්කාමුං, පැමිණියාහ.

23 පුරිමං දිසං ධතරට්ඨො
දක්ඛිණෙන විරූළ්හකො,
පච්ඡිමෙන විරූපක්ඛො
කුවෙරො උත්තරං දිසං.

24 චත්තාරො තෙ මහාරාජා
සමන්තා චතුරො දිසා,
දද්දල්ලමානා අට්ඨංසු
වනෙ කාපිලවත්ථවෙ.

25 තෙසං මායාවිනො දාසා
ආගු වඤ්චනිකා සඨා,
මායා කුටෙණ්ඩු වෙටෙණ්ඩු
විටූච්ච විටූචො සහ.

---

23. පුරිමං දිසං, පෙරදිග; ධතරට්ඨො, ධෘතරාෂ්ට්‍ර නම් වරම් රජද; දක්ඛිණෙන, දකුණු දිග; විරූළ්හකො, විරූඪ නම් වරම් රජද; පච්ඡිමෙන, පැසුලුදිග; විරූපක්ඛො, විරූපාක්ෂ නම් වරම් රජද; උත්තරං දිසං, උතුරුදිග; කුවෙරො, කුවෙර නම් වෛශ්‍රවණ මහරජද.

24. තෙ චත්තාරො මහාරාජා, මේ සතරවරම් මහරජ දරුවෝ සමන්තා, හාත්පසින්; චතුරො දිසා, සිව්දිග; කපිලවත්ථවෙ, කිඹුල්වත් පුරයට සමීපවූ; වනෙ, මහ වනයෙහි; දද්දල්ලමානා; දල්වන ලද ගිනි ජලාවක් සේ; අට්ඨංසු, මහත්වූ ආලොක පතුරුව මින් රැස්ව සිටියාහුය.

25. තෙසං මායාවිනො, ඒ වරම් මහරජුන්ගේ මායා ඇත්තාවූ; වඤ්චනිකා, වංචාකරන්නාවූ; සඨා, කෛරාටිකවූ; දාසා,

26 චන්‍දනො කාමසෙට්ඨො ච,
කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච
පනාදො ඔපමඤ්ඤො ච
දෙවසූතො ච මාතලි.

27 චිත්තසෙනො ච ගන්‍ධබ්බො
නළො රාජා ජනෙසභො,
ආගු පඤ්චසිඛො චෙව
තිම්බරු සූරියවච්චසා.

28 එතෙචඤ්ඤෙ ච රාජානො
ගන්‍ධබ්බා සහ රාජුභි,

---

දසයෝද; මායා, මායාකාරවූ; කුටෙණ්ඩු; කුටෙණ්ඩුය; වෙටෙණ්ඩු, වෙටෙණ්ඩුය; විටුච්ච, විටුය යන මොව්හුද; විටූඩො සහ ආගු, විටූඩ තෙමේද සමග ආවාහුය.

26-27 චන්‍දනො, චන්‍දනය; කාමසෙට්ඨො ච, කාමසෙට්ඨය, කින්නුඝණ්ඩු, කින්නුඝණ්ඩුය; නිඝණ්ඩු ච, නිඝණ්ඩුය යන නම් ඇති දසයෝද ආවාහුය; පනාදො, පනාදය; ඔපමඤ්ඤො ච, ඔපමඤ්ඤය, දෙවසූතො ච, දිව්‍යරථාචායඹීවූ; මාතලි, මාතලි නම් දිව්‍ය පුත්‍රය; ගන්‍ධබ්බො, ගන්‍ධර්වූ; චිත්තසෙනො ච, චිත්තය සෙනය යන දෙදෙනද; නළො රාජා, නළකාර නම් දිව්‍යරාජ තෙමේද; ජනෙසභො, ජනෙසභ දිව්‍යපුත්‍ර තෙමේද ආවාහුය; පඤ්චසිඛො චෙව, පඤ්චසිඛ දිව්‍යපුත්‍ර තෙමේද; තිම්බරු, තිම්බරු ගන්‍ධර්ව දිව්‍ය පුත්‍රද; සූරියවච්චසා, සූරියවච්චසා නම් දෙවතාදූවද ආවාහුය.

28. එතෙච රාජානො, මේ ගන්‍ධර්ව රජහුද; අඤ්ඤෙච ගන්‍ධබ්බා, අන්‍ය ගන්‍ධර්වයෝද, රාජුභි සහ, රජුන් සමග; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්ෂූන්ගේ සමිතිය වූ; වනං, මහා වනයට අභික්කාමුං පැමිණියාහ.

මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

29 අථාගු නාභසා නාගා
වෙසාලා සහ තච්ඡකා,
කම්බලස්සතරා ආගු
පායාගා සහ ඤාතිභි.

30 යාමුනා ධතරට්ඨා ච
ආගු නාගා යසස්සිනො,
එරාවණො මහානාගො
සොපාග සමිතිං වනං.

31 යෙ නාගරාජෙ සහසා හරන්ති
දිබ්බා දිජා පක්ඛි විසුද්ධචක්ඛූ

---

29–30 අථ, ඉක්බිති; නාභසා නාගා, නාභස නම් නාගයෝද; වෙසාලා, විශාලී නාලෝවැසි නාගයෝද; තච්ඡකා සහ ආගු; තච්ඡක නම් නා පිරිස සමග ආවෝය; කම්බලස්සතරා, කම්බල අස්සතර කුල දෙක්හි නාගයෝද; පායාගා, පායාග නම් නාලෝවැසි නාගයෝද; ඤාතිභි සහ ආගු, නෑයන් සමග ආවෝය; යාමුනා, යමුනා නාගයෝද; යසස්සිනො නාගා ආගු, යසස් ඇත්තාවූ නාගයෝද ආවෝය; සො එරාවණො මහානාගො, එරාවණ නම් ඒ මහානාග තෙමේද; සමිතිං, අභීත් භික්ෂු සමාගමය වූ; වනං, මහවනයට; උපාග, ආයේය.

31. දිබ්බා දිජා පක්ඛි විසිඬවක්ඛු, දිව්‍යානුභාව ඇති විජනම් වූ පියාපත් හා පිරිසුදු ඇස් ඇති; යෙ නාගරාජෙ සහසා හරන්ති, නාරජුන් වහා ගෙන යම් ගරුඬ පක්ෂීහු වෙද්ද; තෙ, ඒ පක්ෂීහුද

වෙහාසයා තෙ වනමජ්ඣ-
පත්තා
චිත්‍රා සුපණ්ණා ඉති තෙසං-
නාමානි.

32 අභයං තදා නාගරාජානමාසි
සුපණ්ණතො ඛෙමමකාසි
බුද්ධො,
සණ්හාහි වාචාහි උපව්හයන්තා
නාගාසුපණ්ණා සරණමගංසු-
බුද්ධං
ජිතා වජිරහත්ථෙන
සමුද්දං අසුරාසිතා,

---

වෙහාසයා, අහසින්; වනමජ්ඣපත්තා, මහවනයට පැමිණියාහුය; චිත්‍රා සුපණ්ණා ඉති, චිත්‍රය සුපණ්ණය යනු; තෙසං නාමානි, ඒ ගරුඩ පක්ෂීන්ගේ නාමයෝයි.

32. තදා, එකල්හි; නාගරාජානං, නාරජුන්ට; අභයං ආසි, අභය වූයේය; බුද්ධො, සර්වඥතෙම; සුපණ්ණතො, ගුරුළන් කෙරෙන්; ඛෙමමකාසි, නිර්භය කෙළේය; නාගා, නාගයෝද; සුපණ්ණා, ගුරුළෝද; සණ්හාහි වාචාහි, මොළොක් වචන වලින්; උපව්හයන්තා, කැඳවනු ලබන්නෝ; බුද්ධං සරණං අගංසු, බුදුන් සරණ ගියෝය; වජිරහත්ථෙන, විදුරත් නම් ලද සක්දේවිදරජහු විසින්; ජිතා, ජයගන්නා ලද; සමුද්දං සිතා, මුහුද ඇසුරු කරන්නා වූ; වාසවස්ස භාතරො, සක්දෙව් රජුහුගේ සහෝදර වූ; ඉද්ධිමන්තො, ඍද්ධි ඇති; යසස්සිනො, යසස් ඇති; එතෙ, අසුරා, මේ අසුරයෝද.

භාතරො වාසවස්සෙතෙ
ඉද්ධිමන්තො යසස්සිනො.

33 කාලකඤ්ජා මහාභිංසා
අසුරා දාන වෙඝසා,
වෙපචිත්ති සුචිත්තිච
පහාරාදො නමුචී සහ.

35 සතඤ්ච බලිපුත්තානං
සබ්බෙ වෙරොච නාමකා,
සන්නය්හිත්වා බලිං සෙන
රාහුභද්දමුපාගමුං,
සමයො'දානි භද්දන්තෙ
භික්ඛූනං සමිතිං වනං.

---

33. මහාභිංසා, මහත් බියකරුවූ; කාලකඤ්ජා, කාලකඤ්ජ නම් අසුරයෝද; දාන වෙඝසා අසුරා, දාන වෙඝස නම් අසුරයෝද; වෙපචිත්ති, වෙපචිත්තිය; සුචිත්ති ච, සුචිත්තිය; පහාරාදො, පහාරාදය යන අසුරෙන්ද්‍රයෝද; නමුචී සහ, වසවත්මරු සමග ආවෝය.

34. සබ්බෙ, සියල්ලෝ; වෙරොච නාමකා, වෙරොචය යන නම් ඇති; බලිපුත්තානං, බලි නම් අසුරයාගේ පුත්‍රයෝ; සතඤ්ච, සියයක්ද; බලිංසෙනං, බලසෙනඟ ගෙන; සන්නය්හිත්වා, සැරසී; රාහුභද්දමුපාගමුං, රාහු අසුරෙන්ද්‍රයා කරා පැමිණියෝය; භද්දන්තෙ, ඔබවහන්සේට යහපතක් වේවා; ඉදානි, දැන්; භික්ඛූනං සමිතිං, අභීත් භික්ෂූන් දක්නට; වනං, මහවනයට යාමට; සමයො, සුදුසු කාලය වේ.

35 ආපො ච දෙවා පඨවී ච
තෙජො වායො තදාගමුං,
වරුණා වාරුණා දෙවා
සොමො ච යසසා සහ.

36 මෙත්තා කරුණා කායිකා
ආගු දෙවා යසස්සිනො,
දසෙතෙ දසධා කායා
සබ්බෙ නානත්තවණ්ණිනො

37 ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

---

35. ආපො ච දෙවා, ආපො දෙවතාවෝද; පඨවී ච, පෘථිවි දෙවතාවෝද; තෙජෝ, තෙජෝ දෙවතාවෝද; වායො, වායෝදෙවතා වෝද; වරුණා, වරුණය; වාරුණා දෙවා, වාරුණය යන දෙවියෝද; සොමො ච, සොම නම් දෙවිතෙමේද; යසසා සහ, යස නම් දෙවියන් සමග; තදාගමුං, ආවාහ.

36-37 යසස්සිනො, යසස් ඇත්තාවූ; මෙත්තාකායිකා, මෙත්තා කායිකය; කරුණා කායිකා, කරුණා කායිකය යන දෙවා, දෙවියෝද; ආගු, ආවාහුය; සබ්බෙ, සියල්ලෝම; නානත්ත වණ්ණිනො, නානා වර්ණවත්වූ; දසධා කායා, දශවිධ කොට්ඨාශයක් වූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, කාන්ති හෝ ආනුභාව ඇත්තාවූ; වණ්ණවන්තො, වර්ණවත්වූ; යසස්සිනො, යස පිරිවර ඇත්තාවූ; එතෙ දස; මේ දශප්‍රකාර දිව්‍ය සමූහයා; මොද මානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, මේ අඟීත් භික්ෂු සමූහයා දක්නට; වනං, මහ වනයට; අභික්කාමුං, ආවාහුය.

38 වෙණ්හු ච දෙවාසහලි ච
අසමා ච ද්වෙ යමා,
චන්දස්සූපනිසා දෙවා
චන්දමාගු පුරක්ඛත්වා.

39 සූරියස්සූපනිසා දෙවා
සූරියමාගු පුරක්ඛත්වා,
නක්ඛත්තානි පුරක්ඛත්වා
ආගු මන්ද වලාහකා.

40 වසූනං වාසවො සෙට්ඨො
සක්කොපාග පුරින්දදෙ,
දසෙතෙ දසධා කායා
සබ්බෙ නානත්තවණ්ණිනො.

---

38. වෙණ්හු ච දෙවා, වෙණ්හු නම් දෙවියෝද; සහලි ච දෙවා, සහලි නම් දෙවියෝද; අසමා ච දෙවා, අසම නම් දෙවියෝද; ද්වෙයමා දෙවා, වෙයමක නම් දෙවියෝද; චන්දස්සූපනිසා දෙවා, චන්ද්‍ර දිව්‍යරාජයා පිරිවරා වාසය කරන්නාවූ සියලු දෙවියෝද; චන්දං පුරක්ඛත්වා ආගු, චන්ද්‍ර දිව්‍යරාජයා ඉදිරිකොට රැස්වූවාහුය.

39. සුරියස්සූපනිසා දෙවා, හිරු ඇසුරු කරන දෙවියෝද; සුරියමාගු පුරක්ඛත්වා, සූර්‍ය්‍යදිව්‍යරාජයා පෙරට කොට ආවාහුය. නක්ඛත්තානි පුරක්ඛත්වා, නැකැත් තරු ඇසුරු කරන දෙවියෝද නක්ෂත්‍රයන් පෙරටු කොට ආවාහුය; මන්දවලාහකා ආගු, මන්ද වලාහක නම් දෙවියෝද ආවාහුය.

40-41 වසූනං, වසු දෙවියන්ට; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨ; වාසවො, වාසව නම් වූ ද; පුරින්දදෙ; පුරින්දද නම් වූ ද; සක්කොපාග, සක්දෙව් රජ තෙමෙත් ආයේය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො,

41 ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

42 අථාගු සහභූ දෙවා
ජලමග්ගි සිඛාරිව,
අරිට්ඨකා ච රොජා ච
උම්මාපුප්ඵනිභාසිනො.

43 වරුණා සහධම්මා ච
අච්චුතා ච අනෙජකා,
සූලෙය්‍ය රුචිරා ආගු
ආගු වාසවනෙසිනො.

---

නානා වණ්ණ ඇත්තාවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, කාන්ති ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇත්තාවූ; යසස්සිනො, යස පිරිවර ඇත්තාවූ; එතෙ දස, මේ දසදෙන; දසධා කායා, දශපරිද්දක්ව; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අභීත් භික්ෂු සමූහය දක්නට; වනං, මහවනයට; අභික්කාමුං, ආවාහුය.

42. අථ, නැවත; සහභූ දෙවා, සහභූ නම් දෙවියෝ; ජලමග්ගි සිඛාරිව, ගිනිසිළු මෙන් දිලිසෙමින්; ආගු, ආවෝය; අරිට්ඨකා ච, අරිට්ඨක නම් දෙවියෝද; රොජා ච, රොජ නම් දෙවියෝද; උම්මාපුප්ඵනිභාසිනො, දියබෙරලිය මල් පැහැයෙන් බබලන උම්මාපුප්ඵ නම් දෙවියෝද රැස්වූවාහුය.

43-44 වරුණා, වරුණය; සහධම්මා ච, සහධම්මය; අච්චුතා ච අච්චුතය; අනෙජකා, අනෙජය; සූලෙය්‍ය, සූලෙය්‍යය; රුචිරා, රුචිරය යන දෙවියෝද; ආගු, ආවාහුය; වාසවනෙසිනො, වාස

44 දසෙතෙ දසධා කායා
සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො
වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

45 සමානා මහාසමානා
මානුසා මානුසුත්තමා,
ඛිඩ්ඩාපදූසිකා ආගු
ආගු මනොපදූසිකා.

46 අථාගු හරයො දෙවා
යෙ ච ලොහිතවාසිනො,

---

වනෙසි නම් දෙවියෝද; ආගු; ආවෝය; සබ්බෙ, සියල්ලෝම, නානත්තවණ්ණිනො, නානා වර්‍ණවත්වූ; දසධා කායා, දශපරිච්ඡෙදකින්; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතීමන්තො, සොභාව ඇත්තාවූ; වණ්ණවන්තො, වර්‍ණ ඇත්තාවූ; යසස්සිනො, යසස් ඇත්තාවූ; එතෙ දස, ඒ දිව්‍ය සමූහයෝ දශදෙන; මොදමානා, සතුටු වෙමින්; වනං, මහවනයට; අභික්කාමුං, ආවාහුය.

45. සමානා, සමානය; මහාසමානා, මහාසමානය; මානුසා, මානුසය; මානුසුත්තමා, මානුසුත්තමය යන දෙවියෝ; ආගු‘ ආවෝය; ඛිඩ්ඩාපදූසිකා, ඛිඩ්ඩාපදූසිකාය; මනොපදූසිකා, මනොපදූසිකාය යන දෙවියෝද; ආගු, ආවෝය.

46. අථ, නැවත; හරයො දෙවා, හරි නම් ඇති දෙවියෝද; යෙ ච ලොහිතවාසිනො, ලොහිතවාසී නම් වූ ද දෙවියෝ; ආගු, රැස්

පාරගා මහාපාරගා
ආගු දෙවා යසස්සිනො.

47 දසෙතෙ දසධා කායා
සබ්බෙ නානත්තවණ්ණිනො
ඉද්ධිමන්තො ජුතීමන්තො
වණ්ණවන්තො යසස්සිනො
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

48 සුක්කා කරුමහා අරුණා
ආගු වෙඝනසා සහ,
ඔදාතගය්හා පාමොක්ඛා
ආගු දෙවා විචක්ඛණා.

---

වූවෝය; පාරගා, පාරග නම් වූ ද; මහාපාරගා, මහාපාරග නම් වූ ද; යසස්සිනො දෙවා, යසස් ඇත්තාවූ දෙවියෝද, ආගු, රැස්වූවෝය.

47-48 සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, නානා ප්‍රභාවත්වූ; දසධා කායා, දශ පරිදිවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතීමන්තො, කාන්ති ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇත්තාවූ; යසස්සිනො, යස පිරිවර ඇත්තාවූ; එතෙදස, මේ දශප්‍රකාර දිව්‍ය සමූහයෝ; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අගීත් භික්ෂූන් දැකීමට; වනං, මහවනයට; අභික්කාමුං, පැමිණියාහුය; සුක්කා, සුක්කාය; කරුමහා, කරුමහාය; අරුණා සහ, අරුණය යන දෙවියන් සමග; වෙඝනසා, වෙඝනස නම් දෙවියෝද; ආගු, ආවාහුය; පාමොක්ඛා, ප්‍රධානවූ; විචක්ඛණා, නුවණැති; ඔදාතගය්හා දෙවා, ඔදාතගය්හ නම්වූ දෙවියෝද; ආගු, ආවාහුය.

49 සදාමත්තා හාරගජා
මිස්සකා ච යසස්සිනො,
ථනයං ආගපජ්ජුන්නො
යො දිසා අභිවස්සති.

50 දසෙතෙ දසධා කායා
සබ්බෙ නානත්තවණ්ණිනො,
ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං.

51 ඛෙමියා තුසිතා යාමා
කට්ඨකා ච යසස්සිනො,

---

49. සදාමත්තා, සදාමත්ත නම් දෙවියෝද; හාරගජා, හාරගජ නම් දෙවියෝද; යසස්සිනො, යසස් ඇත්තාවූ; මිස්සකාච, මිස්සක නම් දෙවියෝද ආවාහුය; යො දිසා අභිවස්සති, යම් දෙවිකෙනෙක් දිගුම්හි වැසි කෙරේද; ථනයං ආගපජ්ජුන්නො, ඒ ප්‍රද්‍යුන්න නම් දෙවි තෙමේද මෙඝනාද කෙරෙමින් ආයේය.

50. සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, නානා ප්‍රභාවත්වූ; දසධා කායා, දශ පරිදිවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, කාන්ති ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇත්තාවූ; යසස්සිනො, යස පිරිවර ඇත්තාවූ; එතෙ දස, මේ දශප්‍රකාර දිව්‍ය සමූහයෝ; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අර්හත් භික්ෂූන්ගේ දශීනයට; වනං, මහවනයට; අභික්කාමුං, පැමිණියාහුය.

ලම්බීතකා ලාමසෙට්ඨා
ජෝතිනාමා ච ආසවා.

52 නිම්මාණරතිනො ආගු
අථාගු පරනිම්මිතා,
දසෙතෙ දසධා කායා
සබ්බෙනානත්තවණ්ණිනො.

53 ඉද්ධිමන්තො ජුතිමන්තො
වණ්ණවන්තො යසස්සිනො,
මොදමානා අභික්කාමුං
භික්ඛූනං සමිතිං වනං

---

51. බෙම්යා, බෙම්ය නම් දෙවියෝය; තුසිතා, තුසිත දෙවියෝය; යාමා, යාම දෙවියෝය; යසස්සිනො, යසස් ඇත්තාවූ; කට්ඨකා ච, කට්ඨක නම් දෙවියෝය; ලම්බීතකා, ලබ්බිතක නම් දෙවියෝය; ලාම සෙට්ඨා, ලාමසෙට්ඨ නම් දෙවියෝය; ජෝතිනාමා ච, ජෝතිනාම නම් දෙවියෝය; ආසවා, ආසව නම් දෙවියෝය; යන මේ දෙවියෝ ආවාහුය.

52–53 නිම්මානරතිනො, නිම්මානරති නම් දෙවියෝද; ආගූ, ආවාහුය; අථ, නැවත; පරනිම්මිතා, පරනිම්මිත වසවර්ති දෙවියෝද; ආගු, ආවාහුය; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, නොයෙක් ප්‍රභාවත්වූ; දසධා කායා, දශප්‍රකාරවූ; ඉද්ධිමන්තො, සෘද්ධි ඇත්තාවූ; ජුතිමන්තො, කාන්ති ඇත්තාවූ; වණ්ණවන්තො, ශරීර වර්ණ ඇත්තාවූ; යසස්සිනො, යස පිරිවර ඇත්තාවූ; එතෙදස, මේ දශප්‍රකාර දිව්‍ය සමූහයෝ; මොදමානා, සතුටු වෙමින්; භික්ඛූනං සමිතිං, අර්හත් භික්ෂූන්ගේ දශීතයට; මහාවනං, මහවනයට; අභික්කාමුං, පැමිණියාහුය.

54 සට්ඨෙත දෙව නිකායා
සබ්බේ නානත්තවණ්ණිනො
නාමන්වයෙන ආගඤ්ජුං
යෙචඤ්ඤෙ සදිසා සහ.

55 පවුත්ථජාතිං අඛිලං
ඔඝතිණ්ණමනාසවං,
දක්ඛෙමොඝතරං නාගං
චන්දංව අසිතාතිගං.

56 සුබ්‍රහ්මා පරමත්තො ච
පුත්තා ඉද්ධිමතො සහ,

---

54. සට්ඨෙත දෙවනිකායා, මේ සැටක් දිව්‍ය සමූහයෝ; සබ්බෙ, සියල්ලෝම; නානත්තවණ්ණිනො, නොයෙක් ප්‍රභාමත් වූවෝම; නාමන්වයෙන, අනුගත නාම වශයෙන් හෙවත් තමන්ගේ නම් ගොත් වශයෙන්ද; ආගඤ්ජුං, ආවාහුය; යෙ චඤ්ඤෙ, යම් අනෙක් දෙවතාවෝත්; සදිසා සහ, නම් ආදියෙන් සමාන වෙත් නම් ඔවුන් සමග ආවාහුය.

55. පවුත්ථ ජාතිං, වැස නිමවන ලද ජාති ඇත්තාවූ; අඛිලං, කෙලෙස් උල් රහිත වූ; ඔඝතිණ්ණං, චතුරොඝ තරණය කළාවූ; අනාසවං, ආශ්‍රව රහිත වූ ආය්‍ය්‍ය සඞ්ඝයාද; ඔඝතරං, ඔඝයන් තරණය කළාවූ; නාගං, ඡන්දාදියෙන් අගතියට නොයන හෙයින් නාග නම්වූ; චන්දංව අසිතාතිගං, ඉක්ම ගිය කෘෂ්ණභාවය ඇති පුන්සඳ වැනිවූ බුදුන්ද; දක්ඛෙම, දක්නෙමු.

56. ඉද්ධිමතො, ඍද්ධි ඇත්තාවූ; පුත්තා, බුදුන්ගේ (ආය්‍ය්‍ය) පුත්‍රවූ; සුබ්‍රහ්මා, සුබ්‍රහ්මය; පරමත්තො ච, පරමත්තය යන බ්‍රහ්මයෝ සහ, බඹ පිරිස් සමගම ආවාහුය; සනං කුමාරො, සනං කුමාර

සනංකුමාරො තිස්සො ච
සොපාග සමිතිං වනං.

57 සහස්සං බ්‍රහ්මලොකානං
මහාබ්‍රහ්මාභිතිට්ඨති,
උපපන්නො ජුතිමන්තො
භිස්මාකායො යසස්සිසො,

58 දසෙත්ථ ඉස්සරා ආගු
පච්චෙක වසවත්තිනො,
තෙසඤ්ච මජ්ඣතො ආග
හාරිතො පරිවාරිතො.

59 තෙ ච සබ්බෙ අභික්කන්තෙ
ස ඉන්දෙ දෙවෙ සබ්‍රහ්මකෙ

---

නම් බඹ පුත්ද; සො තිස්සො ච, ප්‍රසිද්ධ වූ තිස්ස නම් මහබඹුද; සමිතිං, ඒ අර්හත් භික්ෂු සමූහයා දක්නට; වනං, මහවනයට, උපාග, ආයේය.

57. බ්‍රහ්මලොකානං සහස්සං, බඹලෝ දහසකින්; මහාබ්‍රහ්මාභිතිට්ඨති, මහබඹුන් දහසක්ද ආයේය; උපපන්නො, බඹලොව උපන්නාවූ; ජුතිමන්තො, ශොභාමත්වූ; භිස්මාකායො, බිහිසුණු කයක් ඇත්තාවූ; යසස්සිසො, යසස් ඇත්තාවූ බ්‍රහ්මරාජයෙක් ආයේය.

58. පච්චෙක වසවත්තිනො, මේ බඹ පිරිසෙහි වෙන් වශයෙන් තම තමන්ගේ පිරිස වසඟයට පමුණුවා වාසය කරන්නාවූ; ඉස්සරා; අධිපති වූ; දසෙත්ථ, බ්‍රහ්මරාජයෝ දශදෙනෙක්; ආගු, ආවෝය; තෙසඤ්ච මජ්ඣතො, ඔවුන් මැද; පරිවාරිතො, බඹුන් විසින් පිරිවරන ලද; හාරිතො, හාරිත නම් බ්‍රහ්මරාජ තෙමේ; ආග, ආයේය.

මාරසෙනා අභික්කාමි
පස්ස කණ්හස්ස මන්දියං.

60 එථ ගණ්හථ බන්ධථ
රාගෙන බද්ධමත්ථු වෙ,
සමන්තා පරිවාරෙථ
මා වො මුඤ්චිත්ථ කොචිකං.

61 ඉති තත්ථ මහාසෙනො
කණ්හසෙනං අපෙසයි,
පාණිනා ථලමාහච්ච
සරං කත්වාන භෙරවං.

---

59. අභික්කන්තෙ, මනොඥවූ හෙවත් මහවතයට පැමිණියාවූ; ස ඉන්දෙ, සක්දෙව්රජ සහිතවූ හෝ ප්‍රධාන කොට ඇත්තාවූ; සබ්‍රහ්මකෙ, හාරිත බ්‍රහ්මරාජයා ප්‍රධාන කොට ඇත්තාවූ; තෙච සබ්බෙ දෙවෙ, ඒ සියලු දෙවියන් වෙතට; මාරසෙනා, මාරසේනාව; අභික්කාමි, පැමිණියාය; කණ්හස්ස මන්දියං, මාරයාගේ මූඪතාවය; පස්ස, බලව.

60. එථ, එවු; ගණ්හථ, අල්වා ගනිව්; රාගෙන, රාග නමැති පාසයෙන්; බද්ධමත්ථු වෙ, මේ සියලු දෙව්මඩල බඳනා ලද්දේ වේවා, සමන්තා, හාත්පස; පරිවාරෙථ, පිරිවරා සිටිව්; වො, තොප විසින්; කොචිකං, ඒ දෙව් පිරිස අතුරෙන් කිසිවෙක්; මා මුඤ්චිත්ථ, මුදා නොහරිව්.

61-62 ඉති, මෙසේ; මහාසෙනො; ඒ වසවත් තෙමේ; පාණිනා, අත්ලෙන්; ථලං ආහච්ච, පොළෝතලයට ගසා; ස විජ්ජුකො, විදුලි සහිත වූ; පාවුස්සකො, වර්‍ෂා කාලයෙහි; ථනයන්තො මෙඝො යථා, යම්සේ මේඝශබ්දය කෙරේද එපරිද්දෙන්; භෙරවං සරං කත්වාන, බිහිසුණු ශබ්ද කොට; කණ්හසෙනං, මාරසෙනහ, තත්ථ, ඒ දෙව්

62 යථාපාවුස්සකෝ මෙඝො
ථනයන්තො සවිජ්ජුකො,
තදා සො පච්චුදාවත්ති
සංකුද්ධො අසයං වසී.

63 තඤ්ච සබ්බං අභිඤ්ඤාය
වවත්ථිත්වාන චක්ඛුමා,
තතො ආමන්තයී සත්ථා
සාවකෙ සාසනෙ රතෙ,

64 මාරසෙනා අභික්කන්තා
තෙ විජානාථ භික්ඛවො.
තෙ ච ආතප්පමකරුං
සුත්වා බුද්ධස්ස සාසනං.

---

පිරිස මැද; අපෙසයි, යැවීය; තදා, එකල්හි; සො, ඒ වසවත් තෙමේ; අසයං වසි, දෙව්පිරිස තමා වසඟ කොට ගත නොහැක්කේ; සංකුද්ධො, අතිශයින් කිපියේ; පච්චුදාවත්ති, ආපසු ගියේය.

63. තතො, ඉක්බිත්තෙන්; චක්ඛුමා, පැණැස් ඇත්තාවූ; සත්ථා, ශාස්තෲන් වහන්සේ; තඤ්ච සබ්බං, ඒ සියල්ල; අභිඤ්ඤාය, මනාසේ දැන; වවත්ථිත්වාන, වෙන්කොට; සාසනෙ රතෙ, සස්නෙහි ඇලුනාවූ; සාවකෙ, ශ්‍රාවකයන්; ආමන්තයී, ඇමතූ සේක.

64. භික්ඛවො, මහණෙනි; මාරසෙනා, මරසෙන්හු; අභික්කන්තා, පැමිණියාහුය; තෙ, ඔවුන්; විජානාථ, දනිව්; තෙච, ඒ භික්ෂූහුද; බුද්ධස්සසාසනං, බුදුන්ගේ පයඹාපති ශාසනයයි කියන ලද ධම් වචනය; සුත්වා, අසා; ආතප්පමකරුං, කෙලෙස් තැවීමට වීයඹී කළෝ.

65 වීතරාගෙ හ'පක්කාමූං
තසං ලොමම්පි ඉඤ්ජයුං,
සබ්බෙ විජිතසඞ්ගාමා
භයාතීතා යසස්සිනො,
මොදන්ති සහ භූතෙහි
සාවකා තෙ ජනෙ සුතාති.

ආලවක සුත්තං

25 එවං මෙ සුතං එකං සමයං භගවා, ආලවියං විහරති ආලවකස්ස යක්ඛස්ස භවනෙ, අථ ඛො ආලවකො යක්ඛො යෙන භගවා තෙනු පසඞ්කමි උපසඞ්කමිත්වා, භගවන්තං

---

65. වීතරාගෙහි අපක්කාමූං, පහවූ රාග ඇති බ්‍රහ්මාදීන් කෙරෙන් මාරසේනාවෝ පහව ගියෝ; තසං ලොමම්පිඉඤ්ජයුං, ඒ වීතරාගීන්ගේ ලොමයකුදු කම්පා නොකළාහුය; සබ්බෙ විජිත සංගාමා, ජය ගත් මාරයුඬ ඇති; භයාතීතා, ඉක්මවන ලද බිය ඇති; යසස්සිනො, යසස් ඇත්තාවූ; ජනෙසුතා, ජනයන් අතුරෙහි ප්‍රකටවූ; තෙ සවාකා, ඒ සියලු බුදුසව්වෝ; භූතෙහි සහ, දිව්‍ය බ්‍රහ්මාදි ආය්‍ර්‍ය ශ්‍රාවකයන් සමග; මොදන්ති, සතුටු වෙත්.

### ආලවක සූත්‍රය.

මෙ, මා විසින්; එවං සුතං, මේ සූත්‍රය මෙසේ අසන ලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආලවියං, අලව් නුවර සමීපයෙහි වූ; ආලවකස්ස යක්ඛස්ස භවනෙ, ආලවක නම් යක්ෂයාගේ භවනයෙහි; විහරති, වැඩ වාසය කර වදුරන සේක; අථ ඛො, ඉක්බිත්තෙන්; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද;

# එතදවොච, නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි, පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි, දුතියම්පි ඛො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච, නික්ඛම සමණාති, සාධාවුසොති භගවා නික්ඛමි, පවිස සමණාති සාධාවුසොති භගවා පාවිසි, තතියම්පි ඛො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච නික්ඛම සමණාති,සාධාවුසොති භගවා නික්ඛමි

---

තෙන, එතනට; උපසංකමි, එළඹියේය; උපසංකමිත්වා, එළඹ; භගවන්තං, බුදුරජාණන් වහන්සේට; එතං, මෙය; අවොච, කීයේය; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, (මාගේ විමනින් පිටත) නික්මෙව; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ආවුසො, ආයුෂ්මත් යක්ෂය; සාධු ඉති, යහපතැයි; නික්ඛමි, නික්මුණුසේක; සමණ, ශ්‍රමණය, පවිස, මාගේ විමනට ඇතුල්වෙව යි කීයේය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අවුසො, ආයුෂ්මත් යක්ෂය; සාධු ඉති, මැනවයි; පාවිසි, (විමනට) ප්‍රවිෂ්ට වූ සේක.

දුතියම්පි ඛො, දෙවෙනි වරත්; ආළවකො, යක්ඛො, ආළවක යක්ෂ තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතං, මෙය; ආවොච; කීයේය; සමණ ශ්‍රමණය; නික්ඛම ඉති, නික්මෙව, ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, මැනවයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; නික්ඛමි, නික්මුණු සේක; සමණ ශ්‍රමණය; පවිස ඉති, ප්‍රවේශවව යි (කී කල්හි); ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, මැනවයි, භගවා, භාග්‍යවතුන් වහන්සේ, පාවිසි, ප්‍රවිෂ්ට වූ සේක; තතියම්පි ඛො,

# පවිස සමණාති, සාධාවුසොති භගවා පාවිසි, චතුත්ථම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච නික්ඛම සමණාති, නඛ්වාහං ආවුසො නික්ඛමිස්සාමි, යන්තෙ කරණීයං තං කරොහීති.

# පඤ්හන්තං සමණ පුච්ඡිස්සාමි සචෙ මෙ නව්‍යාකරිස්සසි, චිත්තං වා තෙ ඛිපිස්සාමි, හදයං වා තෙ ඵාලෙස්සාමි, පාදෙසු වා ගහෙත්වා

---

තුන්වෙනි වරත්; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවන්තං, බුදුරජාණන් වහන්සේට; එතං, මෙය; ආවොච, කීයේය; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, නික්මෙව; ආවුසො; ඇවැත් යක්ෂය; සාධු ඉති, මැනවයි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; නික්ඛමි, නික්මුණු සේක; සමණ, ශ්‍රමණය; පවිස ඉති, ප්‍රවේශවෙව යි (කී කල්හි); ආවුසො, ඇවැත් යක්ෂය; සාධු ඉති, මැනවයි; පාවිසි, ප්‍රවේශ වූ සේක; චතුත්ථම්පි ඛො, සතර" වෙනුවත්; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවන්තං, බුදුරජාණන් වහන් සේට, එතං, මෙය; ආවොච, කීයේය; සමණ, ශ්‍රමණය; නික්ඛම ඉති, නික්මෙව; ආවුසො. ඇවැත් යක්ෂය; අහං, මම; නඛො නික්ඛමිස්සාමි, නො නික්මෙමි; යන්තෙ කරණීයං, යමක් තට කරන්ට පිළිවන් නම්; තං, එය; කරොහි ඉති, කරවයි වදාළෝ.

සමණ, ශ්‍රමණය; තං, තා අතින්; පඤ්හං, ප්‍රශ්න; පුච්ඡිස්සාමි, විචාරන්නෙමි; සචෙ, ඉදින්; මෙ, මට (මාගේ ප්‍රශ්න); නව්‍යාකරිස්සසි, නො විසඳන්නෙහි නම්; තෙ, තාගේ; චිත්තං වා, සිත හෝ; ඛිපිස්සාමි, පෙරළන්නෙමි; තෙ, තාගේ; හදයං වා, ළය හෝ; ඵාලෙස්සාමි, පලන්නෙමි; පාදෙසු ගහෙත්වා, දෙපා ගෙන; පාර

පාර ගඞ්ගායං ඛිපිස්සාමීති, නඛ්වා–
හන්තං ආවුසො පස්සාමි, සදෙවකෙ
ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ,
සස්සමණ බ්‍රාහ්මණියා පජාය
සදෙව මනුස්සාය යො මෙ චිත්තං වා
ඛිපෙය්‍ය හදයං වා ඵාලෙය්‍ය, පාදෙසු
වා ගහෙත්වා පාර ගඞ්ගාය ඛිපෙය්‍ය,
අපිච ත්වං ආවුසො පුච්ඡ යදාකඞ්ඛ
සීති, අථ ඛො ආලවකො යක්ඛො
භගවන්තං ගාථාය අජ්ඣභාසි,

---

ගඞ්ගායං වා, මුහුදු පරතෙර හෝ; ඛිපිස්සාමි ඉති, දමන්නෙමි කියා; ආවුසො, ඇවැත් යක්ෂය; සදෙවකෙ, දෙවියන් සහිතවූ; සමාරකෙ, මරුන් සහිත වූ; සබ්‍රහමකෙ, බ්‍රහමයන් සහිත වූ; ලොකෙ, ලොක යෙහි; සස්සමණ බ්‍රාහමණියා, ශ්‍රමණ බ්‍රාහමණයන් සහිත වූ; සදෙව මනුස්සාය, දෙවියන් හා මිනිසුන් සහිත වූ; පජාය, සත්ව වර්ගයා කෙරෙහිද; යො, යමෙක්; මෙ, මාගේ; චිත්තං, සිත; ඛිපෙය්‍ය වා, පෙළෙන්නේ හෝ වේද; හදයං, හෘදයවස්තුව හෝ; ඵාලෙය්‍ය වා, පළන්නේ හෝ වේද; පාදෙසු වා ගහෙත්වා, දෙපා ගෙන;පාරගඞ්ගාය වා, ඛිපෙය්‍ය, මුහුදු පරතෙර දමන්නේ හෝ වේද; තං, එබන්දෙකු; අහං, මම; නඛො පස්සාමි, නොදකිමි; අපිච, නවද; ආවුසො, ඇවැත් යක්ෂය, ත්වං, තෝ; යදාකඞ්ඛසීති, යමක් කැමැත්තෙහි නම් එය; පුච්ඡ ඉති; අසවයි වදාළෝ; අථ ඛො, ඉක්බිත්තෙන්; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට, ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, ප්‍රකාශ කෙළේය.

1 කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං
කිංසු සුචිණ්ණං සුඛමාවහාති,
කිංසු හවෙ සාධුතරං රසානං,
කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති.

2 සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
සච්චං හවෙ සාධුතරං රසානං
පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨන්ති.

---

1. ඉධ, මේ ලොකයෙහි; පුරිසස්ස, පුරුෂයා හට; කිංසු විත්තං, කවර නම් වස්තුවක්; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨ වේද; සුචිණ්ණං, මනාකොට පුරුදු කරන ලද හෙවත් රැස් කරන ලද; කිංසු, කවර නම් ධර්මයක්; සුඛං ආවහාති, සැප එලවාද? හවෙ, එකාන්තයෙන්; රසානං, රසයන් අතුරෙන්; කිංසු, කවර නම් රසයක්; සාධුතරං, අතිශයින් මනොඥ වේද? කථං ජීවිං, කෙසේ දිවි පවත්වන්නහුගේ; ජීවිතං, ජීවිතය; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨයයි; ආහු, කියද්ද?

2. ඉධ, මේ ලොකයෙහි; සද්ධා, ශ්‍රද්ධා තොමෝ; පුරිසස්ස, පුරුෂයා හට; සෙට්ඨං, ශ්‍රෙෂ්ඨ වූ; විත්තං, ධනය වේ; සුචිණ්ණො, මනාකොට පුරුදු කරණ ලද; ධම්මො, කුශල ධර්මය තෙම; සුඛං ආවහති, සැප එලවයි; රසානං, රසයන් අතුරෙන්; සච්චං, සත්‍ය වචන රසය; හවෙ, ඒකාන්තයෙන්; සාධුතරං, අතිශය මනොඥ වේ; පඤ්ඤා ජීවිං, ප්‍රඥාවෙන් ජිවත්වන්නහුගේ; ජීවිතං, ජීවිතය; සෙට්ඨං ආහු, ශ්‍රෙෂ්ඨයයි කියත්.

3 කථංසු තරති ඔඝං
කථංසු තරති අණ්ණවං,
කථංසු දුක්ඛං අච්චෙති
කථංසු පරිසුජ්ඣති.

4 සද්ධාය තරති ඔඝං
අප්පමාදෙන අණ්ණවං,
විරියෙන දුක්ඛං අච්චෙති
පඤ්ඤාය පරිසුජ්ඣති.

5 කථංසු ලභතෙ පඤ්ඤං
කථංසු වින්දතෙ ධනං,
කථංසු කිත්තිං පප්පොති
කථං මිත්තානි ගන්ථති.

---

ඔඝං, චතුර්විධ ඔඝය; කථංසු, කෙසේ නම්; තරති, එතර කෙරේද? අණ්ණවං, සංසාර සාගරය; කථංසු, කෙසේ නම්; අච්චෙති, ඉක්මවාද හෙවත් පහ කෙරේද; කථංසු, කෙසේ නම්; පරිසුජ්ඣති, පිරිසුදු වේද.

4. සද්ධාය, ශ්‍රද්ධාවෙන්; ඔඝං, චතුර්විධ ඔඝය; තරති, තරණය කෙරේ; අප්පමාදෙන, අප්‍රමාදයෙන්; අණ්ණවං, භවසාගරය තරණය කෙරේ; විරියෙන, වීර්‍ය්‍යයෙන්; දුක්ඛං, දුක්; අච්චෙති, පහකෙරේ; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; පරිසුජ්ඣති, පිරිසුදු වේ.

5. කථංසු, කෙසේ නම්; පඤ්ඤං, ලෞකික ලොකොත්තර ප්‍රඥාව; ලභතෙ, ලබාද? කථංසු, කෙසේ නම්; ධනං, ධනය; වින්දතෙ, ලබාද? කථංසු, කෙසේ නම්; කිත්තිං, කීර්තියට; පප්පොති,

අස්මා ලොකා පරං ලොකං
කථං පෙච්ච න සොචති.

6 සද්දහානො අරහතං
ධම්මං නිබ්බාණපත්තියා,
සුස්සූසං ලභතෙ පඤ්ඤං
අප්පමත්තො විචක්ඛණො.

7 පතිරූපකාරී ධුරවා
උට්ඨාතා වින්දතෙ ධනං,
සච්චෙන කිත්තිං පප්පොති
දදං මිත්තානි ගන්ථති.

---

පැමිණේද? කථං, කෙසේ නම්; මිත්තානි, මිත්‍රයන්; ගන්ථති, ලබාද? කථං, කෙසේ නම්; අස්මා ලොකා, මෙලොවින්; පරං ලොකා, පර ලොවට; පෙච්ච, ප්‍රතිසන්ධි වශයෙන් පැමිණ, න සොචති, ශොක නො කෙරේද?

6. විචක්ඛණො, නුවණැත්තාවූ; අප්පමත්තො (දානාදි කුසල්හි) අප්‍රමත්තවූ ජනතෙම, අරහතං, රහතුන්ගේ; ධම්මං, සද්ධර්මය; සද්දහානො, අදහන්නේ; සුස්සූසං, සුශ්‍රෑෂාව (නුවනැත්තන් කරා එළඹ අසනු කැමැත්ත) හේතුකොට ගෙන; නිබ්බාණපත්තියා; නිර්වාණ ප්‍රාප්තිය පිණිස; පඤ්ඤං, ලෞකික ලොකොත්තර ප්‍රඥාව, ලභතෙ, ලබයි.

7. පතිරූපකාරී, ලෞකික ලොකොත්තර ධනයාගේ අධිගමොපකාරීවූ; ධුරවා, බහා නොතැබූ චෛතසික වීර්‍ය්‍ය ඇති; උට්ඨාතා, කායික වීර්‍ය්‍ය සම්පන්න අසිථිල පරාක්‍රමාන්විත ජනතෙම; ධනං වින්දතෙ, ලෞකික ධනය ලොකොත්තර ධනයද ලබයි; සච්චෙන, වාක්සත්‍යය කරණකොට ගෙන; කිත්තිං, කීර්තියට; පප්පොති, පැමිණෙයි; දදං, දෙන ජනතෙම; මිත්තානි, මිත්‍රයන්; ගන්ථති, සම්පාදනය කෙරේ.

8 යස්සෙතෙ චතුරො ධම්මා
සද්ධස්ස ඝරමෙසිනො,
සච්චං ධම්මො ධිති චාගො
ස වෙ පෙච්ච න සොචති.

9 ඉඞ්ඝ අඤ්ඤෙපි පුච්ඡස්සු
පුථූසමණ බ්‍රහ්මණෙ,
යදි සච්චා දමා චාගා
ඛන්ත්‍යා භීයො න විජ්ජති.

10 කථංනුදානි පුච්ඡෙය්‍යං
පුථූ සමණ බ්‍රහ්මණො,

---

8. ඝරමේසිනො, ගිහිගෙයි වසන්නාවූ; සද්ධස්ස, ශ්‍රද්ධා ඇති; යස්ස, යම් ගිහියෙක් හට; සච්චං, සත්‍යයත්; ධම්මො, ධර්මයත්; ධිති, ධෘතියත්; චාගො, ත්‍යාගයත් යන; එතෙ චතුරො ධම්මා, මේ ධර්ම සතර වෙත් නම්; සො, ඒ ගෘහස්ථ ජනතෙම; පෙච්ච, මෙලොවින් පරලොව ගොස්; වෙ, ඒකාන්තයෙන්; න සොචති, ශොක නො කෙරෙයි.

9. සච්චා, උක්තප්‍රකාර සත්‍යයට වඩා කීර්ති ලාභ කාරණයකුත්; දමා, ප්‍රඥ ප්‍රදෙශයෙන් කපිත ඉන්ද්‍රිය දමන ධර්මයට වඩා ලෞකික ලොකොත්තර ප්‍රඥ ලාභ කාරණයකුත්; චාගා, වස්තු පරිත්‍යාගයට වඩා මිත්‍රයන් ඇති කරන කාරණයකුත්; ඛන්ත්‍යා භියො, අධිවාශන ක්‍ෂාන්තියට වඩා ලෞකික ලොකොත්තර ධන වින්දන කාරණයකුත්; න, නැත්තේය; යදි විජ්ජති, ඉදින් ඇතැයි හඟනෙහිද; ඉඞ්ඝ, එසේ නම්; අඤ්ඤෙ, ඒ අනෙක් කාරණයන්; පුථූ, බොහෝ වූ; අඤ්ඤෙ සමණ බ්‍රාහමණෙ, පූරණ කාශ්‍යපාදි සෙසු මහණ බමුණන්, පුච්ඡස්සු; විචාරවයි කියා චොදනා වශයෙන් මෙහෙයා වදාළ සේක.

සොහං අජ්ජ පජානාමි
යො අත්ථො සම්පරායිකො.

11 අත්ථාය වත මෙ බුද්ධො
වාසාය 'ලවිමාගමා
යො හං අජ්ජ පජානාමි
යත්ථ දින්නං මහප්ඵලං.

12 සො අහං විචරිස්සාමි
ගාමා ගාමං පුරාපුරං,
නමස්සමානො සම්බුද්ධං
ධම්මස්ස ච සුධම්මත'න්ති.

---

10. යො අත්ථො, ප්‍රඥ ලාභාදියට හෙතුවූ යම් දෘෂ්ට ධාර්මික කාරණයකුත් වේනම් හෙද; සම්පරායික ශොකාභාවාදියට කරුණු වූ නොහොත් ස්වර්ගාපවර්ග සම්පත් දෘතය කරන්නාවූ; යො අත්ථො, යම් කාරණයකුත් ඇත්තේ නම් හෙද; යො අහං, යම් බඳු මම; අජ්ජ, අද පටන්; පජානාමි, දනිම්ද; (එහෙයින්) ඉදනි, දූන්; සො අහං, ඒ මම; පුථු සමණ බ්‍රාහමණෙ, ඒ බොහෝවූ මහණ බමුණන්; කථනනු, කුමකට; පුච්ඡෙය්‍යං, විචාරම්ද;

11. යත්ථ, යමෙක් හට නොහොත් යමෙක් විෂයෙහි; දින්නං, දෙන ලද දන වස්තුව; මහප්ඵලං, විපුල ඵල සඞ්ඛ්‍යාත මහත් අනුසස් ඇත්තේද; (ඒ අග්‍ර දක්ෂිණාර්හවූ බුදුන්) සො අහං, යම් බඳු මම; අජ්ජ, අද පටන්; පජානාමි, දනිම්ද; මෙ වත, ඒ මටම; අත්ථාය, හිත වැඩ පිණිස; බුද්ධො, ඒ සර්වඥයන් වහන්සේ, වාසාය, විසීම පිණිස; ආලවිං, මේ අලව් නුවරට; ආගමා, වැඩ වදාළ සේක.

12. සො අහං, ඒ මම; සම්බුද්ධං, බුදුන්ද; ධම්මස්ස, ධර්මයාගේ; සුධම්මතං ච, ස්වාක්ඛාතතාදීන් සුධර්මත්වය කියා ධර්මයද සඞ්ඝයාද; නමස්සමානො, වඳිමින්; ගාමා ගාමං, ගමින් ගමද; පුරා පුරං, නුවරින් නුවරද; විචරිස්සාමි, හැසිරෙන්නෙමියි.

එවං වත්වා ආලවකො යක්ඛො භගවන්තං එතදවොච, අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවං මෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භගවන්තං ගොතමං

එවං වත්වා, මෙසේ කියා; ආලවකො යක්ඛො, ආලවක යක්ෂ තෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මෙසේ සැල කෙළේය; භො ගොතම, ගෞතම ගොත්‍රොද්භූත පින්වතුන් වහන්ස; අභික්කන්තං, දහම් දෙසුම ඉතා යහපත; භො ගොතම, පින්වත් ගෞතමයන් වහන්ස! අභික්කන්තං, දහම් දෙසුම ඉතා යහපත; භො ගොතම; භගවත් ගෞතමයන් වහන්ස! නික්කුජ්ජිතං, මූනින් තබන ලද භාජනයක්; උක්කුජ්ජෙය්‍ය වා, උඩුකුරු කොට තබන්නේ හෝ; සෙය්‍යථාපි, යම්සේද.

පටිච්ඡන්නං, වැසී තිබුණ යමක්, විවරෙය්‍ය වා, විවෘත කොට දක්වන්නේ හෝ යම්සේද? මූළ්හස්ස, මං මුළා වූවකුට; මග්ගං ආචික්ඛෙය්‍ය වා, මඟ කියන්නේ යම්සේද? චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති ඉති, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි; අන්ධකාරෙ; අඳුරෙහි; තෙලපජ්ජොතං ධාරෙය්‍ය වා, තෙල් පහණක් දරන්නේ හෝ යම්සේද? එවං එව, එපරිද්දෙන්ම; භොතා ගොතමෙන, භවත් ගෞතම ගොත්‍රොද්භූත පින්වතුන් වහන්සේ විසින්; අනෙක පරියායෙන, නොයෙක් පරිද්දෙන්; ධම්මො පකාසිතො, දහම්

සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛු සඞ්ඝඤ්ච, උපාසකං මං භවං ගොතමො ධාරෙතු, අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති

### කසිභාරද්වාජ සුත්තං.

26 එවං මෙ සුතං එකං සමයං භගවා, මගධෙසු විහරති දක්ඛිණා ගිරිස්මිං එකනාලායං බ්‍රාහ්මණ ගාමෙ, තෙන ඛො පන සමයෙන කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පඤ්චමත්තානි නඞ්ගලසතානි පයුත්තානි

---

දෙසන ලද්දේය; එසාහං, මේ මම; භගවන්තං ගොතමං, භවත් ගෞතමයන් වහන්සේද; ධම්මඤ්ච, ධර්මයද; භික්ඛු සඞ්ඝඤ්ච, සඞ්ඝයාද, සරණං ගච්ඡාමි, පිහිට කොට යමි, භවං ගොතමො, පින්වත් ගෞතමයන් වහන්සේ! අජ්ජතග්ගෙ, අද පටන්; පාණුපෙතං, දිවිහිමි කොට; සරණං ගතං, සරණ ගියාවූ; උපාසකං, උපාසකයෙකැයි; මං, මා; ධාරෙතු ඉති, දරාගන්නා සේක්වා.

### කසිභාරද්වාජ සූත්‍රය.

26. මෙ, මා විසින්; එවං සුතං, මේ සූත්‍රධර්මය මෙසේ අසන ලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ, මගධෙසු, මගධදනව්වෙහි; එකනාලායං බ්‍රාහ්මණගාමෙ, ඒකනාලා නම් බමුණුගම; දක්ඛිණාගිරිස්මිං, දක්ෂිණාගිරි නම් විහාරයෙහි; විහරති, වැඩ වාසය කරණ සේක; තෙන ඛො පන සමයෙන, ඒ සමයෙහි වනාහි; කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ; වප්පකාලෙ, වප් කල්හි; පඤ්චමත්තානි, පන්

හොන්ති වප්පකාලෙ, අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තො තෙනුපසංකමි, තෙන ඛො පන සමයෙන කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පරිවෙසනා වත්තති.

අථ ඛො භගවා යෙන පරිවෙසනා තෙනුපසංකමි, උපසංකමිත්වා එකමන්තං අට්ඨාසි. අද්දසා ඛො කසිභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං පිණ්ඩාය ඨිතං. දිස්වාන

---

සියයක් නගුල්; පයුත්තානි හොන්ති, යොදන ලද්දහු වෙත්; අථ ඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පුබ්බණ්හ සමයං, පෙරවරු කාලයෙහි; නිවාසෙත්වා, හැඳ පෙරව; පත්තචීවරං ආදාය, අතින් පාත්‍රය හා කයින් සිවුර ගෙන; කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ; කම්මන්තො, කර්මාන්ත ස්ථානය; යෙන වත්තති, යම් තැනෙක්හි වේද; තෙන, එතනට; උපසංකමි, එළඹි සේක; තෙන ඛො පන සමයෙන, එකල්හි වනාහි; කසීභාරවාජස්ස බ්‍රාහ්මණස්ස, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ; පරිවෙසනා වත්තති, අනුභව කරවීම පවතී.

අථ ඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන පරිවෙසනා, අනුභව කරවන තැන යම් තැනෙක්හිද; තෙන එතැන්හි; උපසංකමි, එළඹි සේක; උපසංකමිත්වා, එළඹ; එකමන්තං, එකත්පසෙක; අට්ඨාසි, වැඩ සිටි සේක. කසීභාර ද්වාජො බ්‍රාහ්මණො, එනම් බ්‍රාහ්මණතෙමේ; පිණ්ඩාය ඨිතං, පිඬු පිණිස වැඩ සිටියාවූ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අද්දසාඛො;

භගවන්තං එතදවොච, අහං ඛො සමණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමි, ත්වම්පි සමණ කසස්සු ච වපස්සු ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජස්සූති, අහම්පි ඛො බ්‍රාහ්මණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමීති, න ඛො පන මයං පස්සාම භොතො ගොතමස්ස යුගං වා නඞ්ගලං වා ඵාලං වා පාචනං වා බලිවද්දෙ වා, අථ ච පන භවං ගොතමො එවමාහ, අහම්පි

---

දුටුයේය; දිස්වාන, දැක; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, (බ්‍රාහ්මණ තෙමේ මෙසේ) කීයේය; සමණ, ශ්‍රමණය; අහං ඛො, මම වූකලී; කසාමි ච, සාන්තෙම් ද වෙමි; වපාමි ච, වපුරන්තෙම් ද වෙමි; කසිත්වා ච, සා ද; වපිත්වා ච, වපුරා ද; භුඤ්ජාමි, අනුභව කරමි; සමණ, ශ්‍රමණය; ත්වම්පි, නුඹවහන්දෑ ද; කසස්සු ච, සෑම ද කරව; වපස්සු ච, වැපිරීම ද කරවු; කසිත්වා ච, වැපිරීම ද; කසිත්වා ච, සාද; වපිත්වා ච, වපුරාද; භුඤ්ජස්සු ඉති, අනුභව කරව (යන මේ කාරණය සැළකෙළේය;) බ්‍රාහ්මණ, බමුණ; අහම්පි ඛො, මම ද; කසාමි ච, සාන්තෙම් ද වෙමි; වපාමි ච, වැපිරීම ද කරමි; කසිත්වා ච, සාද; වපිත්වා ච, වපුරාද; භුඤ්ජාමි ඉති, අනුභව කරමියි වදළේය.

මයං, අපි; භොතො ගොතමස්ස, භවත් ගෞතමයන්ගේ; යුගං වා, වියදණ්ඩක් හෝ; නඞ්ගලං වා, නගුලක් හෝ; ඵාලං වා, සීවැලක් හෝ; පාචනං වා, කැවිටක් හෝ; බලිවද්දෙ වා, ගොනුන් හෝ; න ඛො පන පස්සාම, නොම දකුම්හ; අථච පන, එතකුදු වුවත්; භවං ගොතමො, පින්වත් ගෞතම තෙමේ; බ්‍රාහ්මණ, බමුණ;

බො බ්‍රාහමණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමීති, අථ බො කසීභාරද්වාජො බ්‍රාහමණො භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1 කස්සකො පටිජානාසි
නච පස්සාම තෙ කසිං,
කසිං නො පුච්ඡිතො බ්‍රෑහි
යථා ජානෙමු තෙ කසිං.

2 සද්ධා බීජං තපො වුට්ඨි
පඤ්ඤා මෙ යුගනඞ්ගලං,
හිරී ඊසා මනො යොත්තං
සති මෙ ඵාලපාචනං.

---

අහම්පි බො, මම වනාහි; කසාමි ච, සෑම ද කරමි; වපාමි ච, වැපිරීම ද කරමි; කසිත්වා ච, සාද; වපිත්වා ච, වපුරා ද; භුඤ්ජාමි ඉති, අනුභව කරමියි; එවමාහ, මෙසේ කියන සේක; අථ බො, ඉක්බිත්තෙන්; කසීභාරද්වාජො බ්‍රාහමණො, කසීභාරද්වාජ නම් බ්‍රාහමණතෙම; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, මෙසේ සැළ කෙළේය.

1. කස්සකො, සාත්තෙකැයි; පටිජානාසි, ප්‍රතිඥ කෙරෙහිය; තෙ, නුඹවහන්සේගේ; කසිං, නඟුල් ආදි සෑමෙහි උපකරණ; නච පස්සාම, නො දකුම්හ; නො, අප විසින්; පුච්ඡිතො, විචාරණ ලද්දේය; තෙ, ඔබගේ; කසිං, කෘෂිභාණ්ඩ; යථා, යම් පරිද්දෙකින්; ජානෙමු, දැනගන්නෙමු ද; කසිං, එසේ වූ උපකරණ; බ්‍රෑහි, දෙශනා කළ මැනව.

3 කායගුත්තො වචී ගුත්තො
ආහාරෙ උදරෙ යතො,
සච්චං කරොමි නිද්දානං
සොරච්චං මෙ පමොචනං.

4 විරියමෙම ධුරධොරයහං
යොගක්ඛෙමාධිවාහනං,
ගච්ඡති අනිවත්තන්තං
යත්ථ ගන්ත්වා න සොචති.

5 එවමෙසා කසී කට්ඨා
සා හොති අමතප්ඵලා,

---

2. සද්ධා, ශ්‍රද්ධාතොමෝ; බීජං, බිජුවට වේ; තපො, තපස; වුට්ඨි, වර්‍ෂාව වේ; මෙ පඤ්ඤා, මාගේ ප්‍රඥතොමෝ; යුගනඞ්ගලං; විය හා නගුල වෙති; හිරි, ලජ්ජාතොමෝ; ඊසා, නගුලිස වේ; මනො, සිත හෙවත් චිත්තසමාධිය; යොත්තං, යොත වේ; සති, සමෘති තොමෝ; මෙ, මාගේ; ඵාල පාචනං, සිවෑල හා කෑවිට වේ.

3. කායගුත්තො, රක්‍ෂාකරන ලද කායසුචරිතය ඇත්තෙක්මි; වචී ගුත්තො, රක්‍ෂා කරන ලද වාග්සුචරිතය ඇත්තෙක්මි; ආහාරෙ, ආහාරයයි කියන ලද සිව්පසයෙහි; උදරෙ, උදරයෙහි; යතො, සංයතවූ; සච්චං, සත්‍යයෙන්; නිද්දානං කරොමි, තෘෂ්ණා ඡේදනය කරමි; සොරච්චං, සොරච්ච නම්වූ අර්හත්ඵල විමුක්තිය; මෙ, මාගේ; පමොචනං, මිදීමයි.

4. ධුරධොරයහං, ධුරවහනක්‍ෂමවූ; මෙ, මාගේ; තං විරියං, ඒ කායිකවාචසික විරියාරම්භය; යොගක්ඛෙමාධිවාහනං, නිර්වාණාභිමුඛව පමුණුවනු ලබන්නේ; අනිවත්තන්තං, නොනවත්වමින්; ගච්ඡති, යෙයි; යත්ථ, යම් ස්ථානයකට; ගන්ත්වා, ගොස්; න සොචති; ශොක නො කෙරේ ද; (ඒ නිවණට යන්නේය)

එතං කසිං කසිත්වාන
සබ්බදුක්ඛා පමුච්චතීති.

අථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො මහතියා කංසපාතියා පායාසං වඩ්ඪෙත්වා භගවතො උපනාමෙසි, භුඤ්ජතු භවං ගොතමො පායාසං කස්සකො භවං යං හි භවං ගොතමො අමතප්ඵලං කසිං කසතීති,

6 ගාථාභිගීතං මෙ අභො-
ජනෙය්‍යං
සම්පස්සතං බ්‍රාහ්මණ නෙස
ධම්මො,

---

5. එවං, මෙසේ; එසා කසී, මේ සීය; කට්ඨා, මා විසින් සාන ලදී; සා, ඒ සීය; අමතප්ඵලා හොති, අමෘතඵල ඇති වේ; එතං කසිං, මේ සීය; කසිත්වාන, සා; සබ්බ දුක්ඛා, සියලු වෘත්ත දුක්ඛයෙන්; පමුච්චති, මිදේ.

අථ ඛො, ඉක්බිත්තෙන්; කසීභාරද්වාජෝ බ්‍රාහ්මණෝ, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම; මහතියා කංසපාතියා, මහත්වූ රන්තලියෙක්හි; පායාසං වඩ්ඪෙත්වා, කිරිබත වඩා (බහා) යංහි භවං යම් හෙයකින් ගෞතම තෙමේ; අමතප්ඵලං, අමෘත ඵල ඇති; කසිං, සීයක්; කසතීති, සාන සේක්ද? එහෙයින්; භවං කස්සකො, පින්වතුන් වහන්සේ කෂීක සේක; භවං ගොතමො, එසේ සානාවූ භවත් ගෞතමයන් වහන්සේ; පායාසං භුඤ්ජතු, කිරිබත වළඳන සේක්වායි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; උපනාමෙසි, එළවූයේය.

6. බ්‍රාහ්මණ, බමුණ; මෙ, මා විසින්; ගාථාභිගීතං, ගාථා කියා ලබන ලද මේ පායාසය; අභොජනෙය්‍යං, වැළඳිය යුතු නොවේ;

ගාථාභිගීතං පනුදන්ති බුද්ධා
ධම්මෙ සති බ්‍රාහ්මණ
වුත්තිරෙසා,

7 අඤ්ඤෙන ච කෙවලිනං–
මහෙසිං
ඛීණාසවං කුක්කුච්ච
වූපසන්තං,
අන්නෙන පානෙන
උපට්ඨහස්සු
ඛෙත්තං හි තං පුඤ්ඤ
පෙඛස්ස හොති'ති.

---

(සුදුසු නොවේ) සම්පස්සතං, අර්ථ ධර්මයන් දක්නාවූ නොහොත් අජීව ශුද්ධිය දක්නා (සම්‍යක් වරයාගේ); එසො ධම්මො න, මේ ගාථා කියා ලද දේ වැළඳීම චාරිත්‍ර ධර්මයක් නොවේ; බුද්ධා, සම්‍යක් වරයෝ; ගාථාභිගීතං, ගාථා කියා ලැබූ භොජනය; පනුදන්ති, බැහැර කෙරෙත්; බ්‍රාහමණ, බමුණ; ධම්මෙ, ආයඝ්‍යයන්ගේ ආජීව පාරිශුද්ධි ධර්මය හෝ ආචාර ධර්මය; සති, ඇති කල්හි; එසා වුත්ති, මේ ආයඝ්‍ය වූ ජීවිකාවෘත්තියයි; (මෙබඳු අකැප දේ බැහැරලා දැහැමින් ලද දේම වැළඳිය යුතුය යනුයි.)

7. කෙවලිනං, සියලු ගුණයෙන් යුක්තවූ; මහෙසිං, මහත්වූ ශීලස්කන්ධාදි ගුණයන් එෂණය කරණ හෙයින් මහර්ෂිවූ;ඛීණාසවං, ක්ෂය කළ සර්‍වාශ්‍රව ඇති; කුක්කුච්ච වූපසන්තං, සංසුන් හස්තපාදාදී සියලු කුකුස් ඇති රහතුන්); අඤ්ඤෙන, මේ පායාසයෙන් අන්‍ය වූ; අන්නෙන, ඛාද්‍යාද්‍යාදී ත්‍රිවිධාහාරයෙන්ද; පානෙන, අෂ්ටවිධ පානයෙන්ද; උපට්ඨහස්සු, උපස්ථාන කර (පුද); තංහි, (යථොක්ත ගුණයෙන් යුක්තවූ) ඒ ක්ෂීණාශ්‍රව ගණයා වනාහි; පුඤ්ඤපෙඛස්ස, පුණ්‍යාර්ථී පුද්ගලයා හට; ඛෙත්තං හොති, පින් බිජු වැපිරීමට ක්ෂෙත්‍රය වේ.

අථ කස්ස චාහං භො ගොතම ඉමං පායාසං දම්මීති, නඛ්වාහං තං බ්‍රාහ්මණ පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ, සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය, යස්ස සො පායාසො භුත්තො සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය, අඤ්ඤත්‍ර තථාගතස්ස වා තථාගතසාවකස්ස වා, තෙනහි ත්වං බ්‍රාහ්මණ තං පායාසං අප්පහරිතෙ වා ඡඩ්ඩෙහි අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙහීති, අථ ඛො කසීභාරද්වාජො

---

අථ, එසේ නම්; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; ඉමං පායාසං, මේ කිරිබත; අහං, මම; කස්සව, කවරෙක් හට හෝ; දම්මීති, දෙම්දැයි විචාළේය; බ්‍රාහමණ, බමුණ; සදෙවකෙ, දෙවියන් සහිතවූ; සමාරකෙ, මාරයා සහිතවූ; සබ්‍රහමකෙ, බ්‍රහමයන් සහිතවූ; ලොකෙ, අවකාශ ලොකයෙහිද; සස්සමණ බ්‍රාහමණියා, ශ්‍රමණ බ්‍රාහමණයන් සහිතවූ; පජාය, සත්ව ලොකයෙහිද; තථාගතස්ස වා, තථාගතයන් වහන්සේ විසින් හෝ; තථාගත සාවකස්ස වා, තථාගත ශ්‍රාවකයකු විසින් හෝ; අඤ්ඤත්‍ර, මෙසින් පිටත්; යස්ස, යමෙකු විසින් හෝ; සො පායාසො, ඒ කිරිබත; භුත්තො, වළඳන ලද්දේ; සම්මා පරිනාමං, ගච්ඡෙය්‍ය, මනාකොට පිරි නැමීමට යන්නේද; තං, එබන්දෙකු; අහං, මම; න ඛො පස්සාමි, නොම දක්නෙමි; බ්‍රාහමණ, බමුණ; තෙනහි, එසේ වීනම්; ත්වං, තෝ; තං පායාසං, ඒ කිරිබත; අප්පහරිතෙ වා ඡඩ්ඩෙහි, තිල් තණ රහිතවූ තැනෙක්හි හෝ දමව; අප්පාණකෙ වා උදකෙ, එයින් මරණයට පැමිණෙන ප්‍රාණීන් රහිත වූ ජලයෙහි හෝ; ඔපිලාපෙහි ඉති,

බ්‍රාහ්මණො තං පායාසං අප්පාණකෙ උදකෙ ඔපිලාපෙසි, අථ ඛො සො පායාසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිච්චිටායති සන්ධූපායති සම්පධූපායති, සෙය්‍යථාපි නාම ඵාලො දිවසසන්තත්තො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිච්චිටායති සන්ධූපායති සම්පධූපායති, එවමෙව සො පායාසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිච්චිටායති සන්ධූපායති සම්පධූපායති, අථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො සංවිග්ගො

උපුල්වා හරුවයි වදාළෝ; අථ ඛො, ඉක්බිත්තෙන්; කසීභාරද්වාජො බ්‍රාහ්මණො, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම; තං පායාසං, ඒ පායාසය; අප්පාණකෙ උදකෙ, එයින් මියයන ප්‍රාණීන් රහිත වූ ජලයෙක්හි; ඔපිලාපෙසි, උපුල්වා හැරියේය.

අථ ඛො, ඉක්බිත්තෙන්; සො පායාසො, ඒ පායාසය; උදකෙ පක්ඛිත්තො, ජලයෙහි බහන ලද්දේ; චිච්චිටායති, චිච්චිට යන ශබ්ද කෙරේ; චිටිච්චිටායති, චිටිච්චිට යන ශබ්ද කෙරේ; සන්ධූපායති, හාත්පසින් දුමයි; සම්පධූපායති, වැඩියක් දුමයි; කෙසේ ද; දිවසසන්තත්තො, දිවාභාගය මුලුල්ලෙහි රත්කරන ලද; ඵාලො, සීවැල; උදකෙ, ජලයෙහි; පක්ඛිත්තො, බහන ලද්දේ; සෙය්‍යථාපි නාම; යම්සේ; චිච්චිටායති, චිච්චිට යන ශබ්ද කෙරේ ද; චිටිච්චිටායති, චිටිච්චිට යන ශබ්ද කෙරේ ද; සන්ධූපායති, හාත්පසින් දුමා ද; සම්පධූපායති, වැඩියක්ම දුමා ද; එවමෙව ඛො, එපරිද්දෙන්ම; සො පායාසො, ඒ පායාසය; උදකෙපක්ඛිත්තො, ජලයෙහි බහන ලද්දේ, චිච්චිටායති, චිච්චිට යන ශබ්දය කෙරේ; චිටිච්චිටායති, චිටිච්චිට යන ශබ්ද කෙරේ; සන්ධූපායති, හාත්පසින් දුමයි; සම්පධූපායති,

**ලොමහට්ඨජාතො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච.**

**අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං**

---

හාත්පසින් වැඩිගත් දුමයි; අථ ඛො, ඉක්බිත්තෙන්; කසීභාරද්වාජො බ්‍රාහ්මණො, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම; සංවිග්ගො, සංවෙගයට පැමිණි සිත් ඇත්තේ; ලොමහට්ඨජාතො, ලොමුදැහැගැනීම ඇත්තේ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; උපසඞ්කමි, එළඹියේය; උපසඞ්කමිත්වා, එළඹ; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; පාදෙසු, පාදයන්හි; සිරසා නිපතිත්වා, හිසින් වැටී; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතද වොච, මෙසේ සැලකෙළේය.

භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, දම් දෙසුම් ඉතා යෙහෙක; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, දම් දෙසුම ඉතා යෙහෙක; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; නික්කුජ්ජිතං, යටිකුරු කොට තබන ලද්දක් සෙය්‍යථාපි උක්කුජ්ජෙය්‍ය වා, උඩුකුරු කරන්නේ හෝ යම්සේද; පටිච්ඡන්නං, ප්‍රතිච්ඡන්න වූවක්; විවරෙය්‍ය වා, විවෘත කරන්නේ හෝ යම්සේද; මූළ්හස්ස, මං මුළා වූවකුට; මග්ගං ආචික්ඛෙය්‍ය වා, මඟ කියන්නේ හෝ යම්සේද; චක්ඛුමන්තො, ඇස් ඇත්තෝ; රූපානි දක්ඛින්ති ඉති, නීලපීතාදි රූපයන් දකිත්වායි; අන්ධකාරෙ

භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, ලභෙය්‍යාම'හං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

අලත්ථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථ උපසම්පදං, අචිරූපසම්පන්නො ඛො පනායස්මා

---

අඳුරෙහි; තෙලපජ්ජොතං ධාරෙය්‍ය වා, තෙල් පහණක් දල්වන්නේ හෝ යම්සේද; එවමෙවං, එපරිද්දෙන්ම; භොතා ගොතමෙන, භවත් ගෞතමයන් වහන්සේ විසින්; අනෙකපරියායෙන, නොයෙක් කාරණයෙන්; ධම්මො පකාසිතො, ධර්මය ප්‍රකාශ කරන ලද්දේය, එසාහං ඒ, මම; භගවන්තං ගොතමං, භවත් ගෞතමයන් වහන්සේද; ධම්මඤ්ච, ධර්මයද; භික්ඛුසඞ්ඝඤ්ච, භික්ෂුසඞ්ඝයාද; සරණං ගච්ඡාමි, සරණ කොට යෙමි; භොතො, ගොතමස්ස සන්තිකෙ, භවත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි; අහං, මම පබ්බජ්ජං ලභෙය්‍යං, පැවිද්ද ද ලබන්නෙමි; උපසම්පදං, උපසම්පදාවද; ලභෙය්‍යං, ලබන්නෙමි.

අථ ඛො, ඉක්බිත්තෙන්; කසීභාරද්වාජො බ්‍රාහ්මණො, කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම; භගවතො සන්තිකෙ, භාග්‍ය වතුන් වහන්සේගේ සමීපයෙහි; පබ්බජ්ජං අලත්ථ, ප්‍රව්‍රජ්‍යාව ලැබූයේය; උපසම්පදං අලත්ථ, උපසම්පදාවද ලැබූයේය; අචිරූපසම්පන්නො ඛො පන, උපසම්පදා වූ නොබෝ කල් ඇති; ආයස්මා

භාරද්වාජො, එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපි පහිතත්තො විහරන්තො නචිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියං පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි,

---

භාරද්වාජො, භාරද්වාජ ආයුෂ්මතුන් වහන්සේ; එකො, හුදකලා වූයේ; වූපකට්ඨො, වෙන්වූයේ, අප්පමත්තො, ප්‍රමාද නොවූයේ; ආතාපි, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇත්තේ; පහිතත්තො, නිවණට මෙහෙයන ලද සිත් ඇතිව; විහරන්තො, වාසය කරණ සේක්; න චිරස්සෙව, නොබෝ කලකින්ම; යස්සත්ථාය කුලපුත්තා, යම් අර්හත් ඵලයක් පිණිස කුලපුත්‍රයෝ; සම්මදෙව, මනාකොටම; අගාරස්මා, ගිහිගෙන් නික්ම; අනගාරියං පබ්බජන්ති, ශාසනයෙහි පැවිදි වෙද්ද.

තදනන්තරං, ඒ උතුම් කොට ඇති; බ්‍රහ්මචරිය පරියොසානං, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවර කොට ඇති අර්හත් ඵලය; දිට්ඨෙව ධම්මෙ, ඉහාත්ම භාවයෙහිම; සයං, තෙමේ; අභිඤ්ඤා සච්ඡිකත්වා, විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට; උපසම්පජ්ජ, ඊට පැමිණ; විහාසි, වාසය කළ සේක; ජාති, ජාතිය; ඛීණා, ක්ෂය කරන ලද්දීය; බ්‍රහ්මචරියං, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව; වුසිතං වැස නිමවන ලද්දේය; කතං කරණීයං, සතර මාර්ග කටයුතු කොට නිමවන ලද්දේය; නාපරං ඉත්ථත්තායාති, මේ කෙලශක්ෂය භාවය පිණිස අන්‍ය මාර්ග භාවනාවක් නැත්තේයයි; අබ්භඤ්ඤාසි, ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන්

අඤ්ඤතරො ච බො පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

කසීභාරද්වාජ සුත්තං

---

පරාභව සුත්තං

27 එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, අථ බො අඤ්ඤතරා දෙවතා, අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා, කෙවලකප්පං ජෙතවනං ඔභා–

---

දූතගත්තේය; ආයස්මා භාරද්වාජෝ, ආයුෂ්මත් භාරවාජ ස්ථවිරයන් වහන්සේ; අඤ්ඤතරො ච බො පන අරහතං අහොසීති, රහතුන් වහන්සේලා අතුරෙන් එක්තරා කෙනෙක් වූ සේක.

කසීභාරවාජ සූත්‍රයයි.

---

පරාභව සූත්‍රය

මෙ, මා විසින්; එවං සුතං, (මේ සූත්‍රධර්මය) ~~මෙසේ අසන ලදී~~; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; සාවත්ථියං, සැවැත් නුවර සමීපයෙහි වූ; ජෙතවනෙ, ජේතවන නම් වූ; අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬු මහ සිටුහු විසින් කරවා පිළිගන්වන ලද විහාරයෙහි; විහරති, වැඩ වාසය කර වදාරන සේක; අථ බො, ඉක්බිත්තෙන්; අඤ්ඤතරා දෙවතා, එක්තරා දෙවතාවෙක්; අභික්කන්තාය රත්තියා, රාත්‍රිය සම්බන්ධ ප්‍රථම යාමය ඉක්මුණු කල්හි; අභික්කන්තවණ්ණා, අතිශයින් මනොඥ වූ ඡවි වර්ණයෙන්; කෙවලකප්පං ජෙතවනං, ජේතවන විහාරය මුලුල්ල;

සෙත්වා, යෙන භගවා තෙනුපසංකමි උපසංකමිත්වා, භගවන්තං අභිවා-දෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1 පරාභවන්තං පුරිසං
මයං පුච්ඡාම ගොතමං,
භගවන්තං පුට්ඨුමාගම්ම
කිං පරාභවතො මුඛං.

2 සුවිජානො භවං හොති
සුවිජානො පරාභවො,

---

ඔභාසෙත්වා, බබුලුවා; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතනට; උපසංකමි, එළඹියේය; උපසංකමිත්වා, එළැඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං, එක් පසෙක්හි; අට්ඨාසි, සිටියේය; එකමන්තං ඨිතා ඛො, එකත් පසෙක සිටියාම් වූ; සා දෙවතා, ඒ දෙවතා තෝමෝ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; ගාථාය, ගාථාවකින්; අජ්ඣභාසි, අභිභාසනය කළාය.

1. මයං, අපි හැමදෙනම; පරාභවන්තං, පිරිහෙන්නාවූ; පුරිසං පුරුෂයා; (හෙවත් සතෙකු) ගොතමං, ගෞතමයන්; පුච්ඡාම, අසා දැනගන්නා පිණිස විචාරමහ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; පුට්ඨුං, විචාරන පිණිස; ආගම්ම, ආම්හ; පරාභවතො, පිරිහෙන්නා වූ සත්වයාට; මුඛං, ද්වාරය; කිං කවරේදැයි විචාළේය.

2. භවං, වැඩෙන්නා වූ පුරුෂ තෙම; සුවිජානො හොති, ධර්මකාමී ප්‍රතිපත්ති දර්ශනයෙන් හා ශ්‍රවණයෙන් සුවසේ දත හැකි

ධම්මකාමො භවං හොති
ධම්මදෙස්සී පරාභවො.

3 ඉති හෙතං විජානාම
පඨමො සො පරාභවො,
දුතියං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

4 අසන්තස්ස පියා හොන්ති
සන්තෙ න කුරුතෙ පියං,
අසතං ධම්මං රොචෙති
තං පරාභවතො මුඛං.

---

වන්නේය; පරාභවො, පිරිහෙන්නා වූ පුරුෂතෙම; සුවිජානො හොති, ධර්මද්වේෂී ප්‍රතිපත්ති දර්ශනයෙන් හා ශ්‍රවණයෙන් සුවසේ දත හැකි වන්නේය; ධම්මකාමො, දශ කුසල කර්මපථ ධර්ම්ය අසා පිළිපදනේ; භවං හොති, ලෞකිය ලෝකොත්තර සැපතින් වැඩෙන්නේ වෙයි; ධම්මදෙස්සී, ඒ දශකුශල ධර්මයට වෛෂිව නො කැමතිව අසා, පිළිනොපදනේ; පරාභවො හොති, මිනිස් හා තිවන් සැපෙන් පිරිහී සතර අපායෙහි වැටී නස්නේය.

3. එතං, මෙ පරිහානිකාරණය; ඉති හි, වදාළ පරිද්දෙන්ම; විජානාම, දනුම්හ; සො පඨමො පරාභවො, හේ පළමුවෙනි පරිහානි කාරණය වන්නේය; භගවා, භාග්‍යවතුන් වහන්ස; දුතියං, දෙවෙනි පිරිහෙන කාරණය; බ්‍රෑහි, වදාළ මැනවි; පරාභවතො, පිරිහීමට; මුඛං, කාරණය; කිං, කවරේ ද?

4. අසස, සද්ධර්මයට කැමති නොවීමෙන් පිරිහීමට පැමිණෙන පුරුෂයා හට; අසන්තො, පූරණකාශ්‍යපාදි මිසදිටු ගත් අසත් පුරුෂයෝ; පියා හොන්ති, ප්‍රිය වෙති; සො, ඒ පිරිහීමට පැමිණෙන පුරුෂතෙම; සන්තෙ, බුද්ධාදී සත්පුරුෂයන්; පියං න කුරුතෙ,

5 ඉති හෙතං විජානාම
දුතියො සො පරාභවො,
තතියං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

6 නිද්දාසීලී සභාසීලී
අනුට්ඨාතා ච යො නරො,
අලසො කොධපඤ්ඤාණො
තං පරාභවතො මුඛං.

7 ඉති හෙතං විජානාම
තතියො සො පරාභවො

---

ප්‍රිය නො කරන්නේය; අසතං ධම්මං, යට කියන ලද නිවටුන්ගේ අසත්පුරුෂ ධර්මයන්; රොචෙති, රුචි කරන්නේය; (ඔහට) තං, යථොක්ත අසත්පුරුෂයන් කෙරෙහි ප්‍රීතිය සත්පුරුෂයන් කෙරෙහි අප්‍රිය අසද්ධර්මයට කැමති වීමය යන මේ තුන; පරාභවතො මුඛං, පිරිහීමට කාරණයයි වදාළ සේක.

5. එතං, මේ දෙවෙනි පරිහානි කාරණය; ඉති හි, වදාළ පරිද්දෙන්ම; විජානාම, දනුම්හ; සො දුතියො පරාභවො, ඒ දෙවෙනි පරිහානි කාරණය වන්නේය; භගවා, භාග්‍යවතුන්වහන්ස; තතියං පරාභවතො මුඛං, තුන්වෙනි පරිහානි කාරණය; බ්‍රෑහි, වදාළ මැනව; කිං, පිරිහීමට කාරණා කවරේදැයි විචාළේය.

6. යො නරො, යම් කිසි සත්ත්වයෙක් තෙම; නිද්දාසීලී, නිද්‍රා කරණ සුලු වේද; සභාසීලී, බොහෝ දෙන රැස්ව කථාකරණ තැනට එළඹ තත් නිශ්‍රිත කථාවෙහි ඇලුනේ වේද; අනුට්ඨාතා ච, වීර්‍ය්‍ය තෙජස් නැත්තේ ද; අලසො, අලසද; කොධපඤ්ඤාණො, ක්‍රොධයම ලකුණු කොට ඇත්තේ ද; තං, නිදන සුලු බව දොඩන සුලු බව වීර්‍ය්‍ය නැති බව කුසිත බව කිපෙන සුලු බව යන මේ පස; පරාභවතො මුඛං, පිරිහීමට කාරණයයි වදාළ සේක.

චතුත්ථං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

8 යො මාතරං වා පිතරං වා
ජිණ්ණකං ගතයොබ්බනං,
පහූසන්තො න භරති
තං පරාභවතො මුඛං.

9 ඉති හෙතං විජානාම
චතුත්ථො සො පරාභවො,
පඤ්චමං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

---

7. එතං, මේ විවිධ පරිහානි කාරණය; ඉති හි, වදාළ පරිද්දෙන්ම; විජානාම, දැනගතුම්හ; සො තතියො පරාභවො, ඒ තුන්වෙනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍යවතුන් වහන්ස; චතුත්ථං, සතරවෙනි පරිහානි කාරණය; බ්‍රෑහි, වදාරණ සේක්වා; පරාභවතො මුඛං, සත්වයා පිරිහීමට කාරණය; කිං, කවරේදැයි විචාළේය.

8. යො, යම් කිසිවෙක්; ජිණ්ණකං, දිරූණු; ගතයොබ්බනං, ගිය යොවුන් ඇති; මාතරං වා, වැදූ මෑණියන් හෝ; පිතරං වා, පියාණන් හෝ; පහූසන්තො, පොහොසත් වූයේ; (සුවසේ ජීවත් වන්නාවූ තමා විසින්); න භරති, පොෂණය නො කෙරේද; (ඔහට) තං, ඒ මව්පියන් පොෂණය නො කිරීම; පරාභවතො මුඛං, දෙලොවින්ම පිරිහීමට කාරණයයි වදාළ සේක.

9. එතං, මෙ සිවුවෙනි පරිහානි කාරණය; ඉති හි, වදාළ පරිද්දෙන්ම; විජානාම, දැන ගතුම්හ; සො චතුත්ථො පරාභවො, ඒ සතරවෙනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍යවතුන් වහන්ස; පඤ්චමං පරාභවතො මුඛං, පස්වෙනි වූ පරිහානි කාරණය; බ්‍රෑහි, වදාළ මැනව; කිං, කවරේදැයි විචාළේය..

10 යො බ්‍රාහමණං වා සමණං වා
අඤ්ඤං වාපි වණිබ්බකං,
මුසාවාදෙන වඤ්චෙති
තං පරභවතො මුඛං.

11 ඉති හෙතං විජානාම
පඤ්චමො සො පරාභවො,
ඡට්ඨමං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

12 පහූතවිත්තො පුරිසො
සහිරඤ්ඤො සභොජනො,

---

10. යො, ක්‍ෂත්‍රියාදී යම් කිසිවෙක්; බ්‍රාහමණං වා, බැහැර කරන ලද පව් ඇති එබඳු ක්‍ෂීණාශ්‍රවවූ බ්‍රාහ්මණයකු හෝ; සමණං වා, සන්සිඳුවන ලද පව් ඇති එබඳු ශ්‍රමණයකු හෝ; අපි, නැවත; අඤ්ඤං වණිබ්බකං වා, අන් කිසිවක් ඉල්වන යාචකයෙකු හෝ; මුසාවාදෙන, බොරු කීඹමින්; වඤ්චෙති, වඤ්චා කෙරේ ද; තං, එය; පරාභවතො මුඛං, දෙලොවින්ම පිරිහීමට කාරණයයි වදාළ සේක.

11. එතං, මේ පස්වැනි පරිහානි කාරණය; ඉති හි, වදාළ පරිද්දෙන්ම; විජානාම, දැන ගනුම්හ; සො පඤ්චමො පරාභවො, ඒ පස්වැනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍යවතුන් වහන්ස; ඡට්ඨමං පරාභවතො මුඛං, සවෙනි පරිහානි කාරණය, බ්‍රෑහි, වදාළ මැනව; කිං, කවරේදැයි විචාළේය.

12. පහූතවිත්තො, තුෂ්ටිජනනාර්ථයෙන් විත්ත නම්වූ බොහෝ රන් රිදී මිණිරුවන් ඇත්තේ, සහිරඤ්ඤො, බොහෝ කහවනු සහිත වූ; සභොජනො, නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත බොජුන් ඇති; පුරිසො, පුරුෂයෙක් තෙම; සාධුති, මිහිරු රස

එකො භුඤ්ජති සාධූනි
තං පරාභවතො මුඛං.

13 ඉති හෙතං විජානාම
ඡට්ඨමො සො පරාභවො,
සත්තමං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

14 ජාතිත්ථද්ධො ධනත්ථද්ධො
ගොත්තත්ථද්ධො ච යොනරො
සඤ්ඤාතිං අතිමඤ්ඤෙති
තං පරාභවතො මුඛං.

---

ඇති භොජන; එකො, නොපෙණෙන ස්ථානයක හුදකලාවම හිඳ; භුඤ්ජති, තම අඹුදරුවන්ටත් නොදී තනිවම අනුභව කෙරේ ද; (බිහට) තං, ඒ යථොක්ත ගිජු බව මසුරු බව; පරාභවතො මුඛං, මෙලෝ නින්‍දාවට හා පරලෝ අපාදුකට පැමිණෙන හෙයින් පරිහානි කාරණයයි වදාළ සේක.

13. එතං, මේ සවැනි පරිහානි කාරණය; ඉති හි, වදාළ පරිද්දෙන්ම; විජනාම, දැන ගනුම්හ; සො ඡට්ඨමො පරාභවො, ඒ සවෙනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍යවතුන් වහන්ස; සත්තමං පරාභවතො මුඛං, සත්වෙනි පරිහානි කාරණය; බ්‍රෑහි වදාළ මැනව; කිං, කවරේදැයි විචාළේය.

14. යො නරො, යම් සත්වයෙක්; ජාතිත්ථද්ධො, ජාතිය කරණ කොට ගෙන තද මත් ඇත්තේ වේද; ධනත්ථද්ධො; ධනය හෙතු කොට ගෙන තද මත් ඇත්තේ වේද; ගොත්තත්ථද්ධො, ගොත්‍රය හෙතු කොට ගෙන මානයෙන් තද ද; සඤ්ඤාතිං, තමාගේ අවශෙෂ නෑයන්; අතිමඤ්ඤෙති, ජාති ධන ගොත්‍ර වශයෙන් තද හෙයින් යටත් කොට සිතාද; තං, ඒ සිය නෑයන් යටත් කොට දැකීම; පරාභවතො මුඛං, ඒ සත්වයා හට පිරිහීමට කාරණයයි වදාළ සේක.

15 ඉති හෙතං විජානාම
සත්තමො සො පරාභවො,
අට්ඨමං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

16 ඉත්ථිධුත්තො සුරාධුත්තො
අක්ඛධුත්තො ච යො නරො
ලද්ධං ලද්ධං විනාසෙති
තං පරාභවතො මුඛං.

17 ඉති හෙතං විජානාම
අට්ඨමො සො පරාභවො
නවමං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

---

15. එතං, මේ සත්වැනි පරිහානි කාරණය; ඉති හි, වදළ පරිද්දෙන්ම; විජානාම, දැන ගතුම්හ; සො සත්තමො පරාභවො, ඒ සත්වැනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍යවතුන් වහන්ස; අට්ඨමං පරාභවතො මුඛං, අටවෙනි පරිහානි කාරණය; බ්‍රෑහි, වදාළ මැනව; කිං කවරේදැයි විචාළේය.

16. යො නරො, යම් සත්‍වයෙක් තෙම; ඉත්ථිධුත්තො, පර ස්ත්‍රීන් සෙවනය කෙරේ ද; සුරාධුත්තො, සුරා බීමෙහි ලොල්වූයේද; අක්ඛධුත්තො ච, දූකෙළියෙහි ලොල්වූයේද; ලද්ධං ලද්ධං, ලද ලද යම් වස්තුවක්; විනාසෙති, නසාද; තං, ඒ ස්ත්‍රීධූර්තී සුරාධූර්තී අක්ෂධූර්තී යන කාරණත්‍රය; පරාභවතො මුඛං, පිරිහීමට කාරණයයි වදාළ සේක.

17. එතං, මේ අටවැනි පරිහානි කාරණයයි; ඉතිහි, වදාළ පරිද්දෙන්ම; විජනාම, දැන ගතුම්හ; සො අට්ඨමො පරාභවො, ඒ අටවෙනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍යවතුන් වහන්ස; නවමං පරාභවතො මුඛං, නවවැනි පරිහානි කාරණය; බ්‍රෑහි, වදාළ මැනව; කිං, කවරේදැයි විචාළේය.

18 සෙහි දාරෙහි සන්තුට්ඨො
වෙසියාසු පදිස්සති,
දිස්සති පරදාරෙසු
තං පරාභවතො මුඛං.

19 ඉති හෙතං විජානාම
නවමො සො පරාභවො,
දසමං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

20 අතීතයොබ්බනො පොසො
ආනෙති තිම්බරුත්ථනිං,
තස්සා ඉස්සා න සුපති
තං පරාභවතො මුඛං.

---

18. සෙහි දාරෙහි, තමාගේ, භාර්‍ය්‍යාවන් හෙතු කොට ගෙන; අසන්තුට්ඨො, නො සතුටු වූ යමෙක්; වෙසියාසු, වෙශ්‍යාවන් කෙරෙහි; පදිස්සති, දක්නා ලැබෙයි ද; පරදාරෙසු, පර ස්ත්‍රීන් කෙරෙහි; දිස්සති, දක්නා ලැබේද; තං, ඒ වෙශ්‍යාවන් කෙරෙහිද පරදාරාවන් කෙරෙහි ද දෑකිම සඞ්ඛ්‍යාත විප්‍රකාරය; පරාභවතො මුඛං, පිරිහීමට කාරණයයි වදාළ සේක.

19. එතං, මේ නවවැනි පරිහානි කාරණය; ඉතිහි, වදාළ පරිද්දෙන්ම; විජානාම, දැන ගනුම්හ; සො නවමො පරාභවො, හේ නවවැනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍යවතුන් වහන්ස; දසමං පරාභවතො මුඛං, දශවෙනි පරිහානි කාරණයයි; බ්‍රෑහි, වදාළ මැනව; කිං, කවරේද?

20.* අතීතයොබ්බනො, ඉක්මගිය යෞවන වයස් ඇති; පොසො, පුරුෂයෙක් තෙම; තිම්බරුත්ථනිං, තිඹිරි ඵල වැනි

21 ඉති හෙතං විජානාම
දසමො සො පරාභවො,
එකාදසමං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

22 ඉත්ථිං සොණ්ඩිං විකිරණිං
පුරිසං වාපි තාදිසං,
ඉස්සරියස්මිං ඨපාපෙති
තං පරාභවතො මුඛං.

23 ඉති හෙතං විජානාම
එකාදසමො සො පරාභවො,

---

නත ඇති ළඳුරියක්; ආනෙති, සරණ පාවාගෙන ඒ ද; (ඒ තෙම) තස්සා, ඇට; ඉස්සා, තරුණ පුරුෂයෙක් පතාද්‍යෙ යන ඊර්ෂ්‍යාවෙන්; න සුපති, රාත්‍රියෙහි නො නිඳා ද; තං, ඒ කාරණය; පරාභවතො මුඛං පිරිහීමට කාරණයයි වදාළ සේක.

21. එතං, මේ දශවැනි පරිහානි කාරණයයි; ඉතිහි, වදාළ පරිද්දෙන්ම; විජානාම, දැන ගතුම්හ; සො දසමො පරාභවො, හේ දශවැනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍යවතුන් වහන්ස; එකාදසමං පරාභවතො මුඛං, එකොළොස්වැනි පරිහානි කාරණය; බ්‍රෑහි, වදාළ මැනව; කිං, කවරේද?

22. සොණ්ඩිං, මත්ස්‍යමාංස සුරාවෙහි ලොල්වූ තෘෂ්ණා ඇති; විකිරණිං, ඒ මාංසාදිය නිසා සම්පත් පස් මෙන් විසුරුවන සුලු වූ; ඉත්ථිං වා, ස්ත්‍රියක හෝ; අපි, තව්ද; තාදිසං, එබඳුවූ හෙවත් ස්ත්‍රිය වැනිවූ; පුරිසං වා, පුරුෂයකු හෝ; ඉස්සරියස්මිං, භාණ්ඩාගාරාදිය බාරදීමෙන් ඉසුරු බවෙහි; ඨපාපෙති, තබාද හෙවත් එකී දෙයෙහි නියුක්ත කෙරේද; තං, එබන්දහු; පරාභවතො මුඛං, (ඕහට ඔහුගේ වශයෙන් ධන හානිවන හෙයින්) පිරිහීමට කාරණයයි වදාළ සේක.

ද්වාදසමං භගවා බ්‍රෑහි
කිං පරාභවතො මුඛං.

24 අප්පභොගො මහාතණ්හො
ඛත්තියෙ ජායතෙ කුලෙ,
සො'ධ රජ්ජං පත්ථයති
තං පරාභවතො මුඛං.

25 එතෙ පරාභවෙ ලොකෙ
පණ්ඩිතො සමවෙක්ඛිය,

---

23. මිතං, මේ එකොළොස්වැනි පරිහානි කාරණය,ඉ තිකි මේ වදාළ පරිද්දෙන්ම; විජානාම, දැන ගනුම්හ; සො එකාදසමො පරාභවො, ඒ එකොළොස්වැනි පරිහානි කාරණයයි; භගවා, භාග්‍ය වතුන් වහන්ස; ද්වාදසමං, දොළොස්වැනි පරිහානි කාරණය; බ්‍රෑහි, වදාළ මැනව; පරාභවතො, මෙලොව පිරිහෙන්නාවූ පුරුෂයාට; මුඛං, වාරය; කිං, කවරේදැයි විචාළේය.

24. අප්පභොගො, (රැස්කොට තබන ලද භොග කෙනෙකුන් ගේද අයැඹුවයක් නැති හෙයින්) මදවූ උපභොග පරිභොග වස්තු වක් ඇති; මහාතණ්හො, මහත් භොග තෘෂ්ණා ඇත්තෙක් (ලද දෙයකින් සතුටු නොවන); ඛත්තියෙ කුලෙ, ක්‍ෂත්‍රිය කුලයෙහි; ජායතෙ, උපදීද; සො ච, ඒ ක්‍ෂත්‍රිය ජාති ඇති අල්ප භොග මහා තෘෂ්ණා ඇත්තේ වනාහි; රජ්ජං, තමා සතුවූ හෝ තමාට නො ලැබෙන අනුන් සතුවූ හෝ රාජ්‍යය; පත්ථයති, ප්‍රාර්ථනා කෙරේද; තං, ඒ (අයොග්‍ය රාජ්‍යය පැතීම); පරාභවතො මුඛං, (ඒ අල්ප භොගියා ස්වල්ප වූ ධනයත් සහිතවම නස්නා හෙයින්) පිරිහීමට කාරණයයි වදාළ සේක.

25. පණ්ඩිතො, (විමසන නුවණින් යුක්තවූ) ප්‍රඥ ඇති පුද්ගල තෙම; ලොකෙ, මේ සත්වලොකයෙහිවූ; එතෙ පරාභවෙ, යථොක්තවූ තෙවිසි පිරිහානි කාරණයන්; සමවෙක්ඛිය; නුවණැසින් පරීක්ෂා කොට දැන; අරියො, ආර්‍ය්‍ය වූ; දස්සන සම්පන්නො, දර්ශන ඥානයෙන්

අරියො දස්සන් සම්පන්නො
සලොකං භජතෙ සිවන්ති.

පරාභව සුත්තං

---

### වසල සුත්තං

28 එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්ත චීවරමාදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි. තෙන ඛො පන සමයෙන අග්ගිකභාරද්වා

---

සුසන්තවූ; සො, ඒ ප්‍රඥාවන්ත වූ පුද්ගල තෙම; සිවං, ක්ෂෙම වූ, (උතුම් වූ උපද්‍රව දුරුවූ) ලොකං, ලොකය; භජතෙ, සෙවනය කරන්නේ යයි වදාළ සේක.

පරාභව සූත්‍රය යි.

---

### වසල සූත්‍රය

මෙ, මා විසින්; එවං සුතං, මේ සූත්‍රධර්මය මෙසේ අසන ලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; සාවත්ථියං, සැවැත් නුවර සමීපයෙහි වූ; ජෙතවනෙ, ජෙතවන නම්වූ; අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, අනේපිඬු මහ සිටුහු විසින් කරවා පිළිගන්වන ලද අනාථ පිණ්ඩික නම් වූ විහාරයෙහි; විහරති, වැඩ වාසය කර වදාරණ සේක; අථ ඛො, එකල්හි වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; පුබ්බණ්හසමයං, පෙරවරු වේලෙහි; නිවාසෙත්වා, හැඳ පෙරවැ; පත්තචීවරං ආදාය, පාසිවුරු ගෙන, සාවත්ථියං, සැවැත් නුවරට; පිණ්ඩාය; පිඬු පිණිස; පාවිසි, වැඩි සේක; තෙන ඛො පන සමයෙන, එසමයෙහි වනාහි; අග්ගික

ජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගි පජ්ජලිතො හොති ආහුති පග්ගහිතා, අථ ඛො භගවා සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො, යෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි.

අද්දසා ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච, තත්‍රෙ'ව සමණක තත්‍රෙ'ව වසලක තිට්ඨාහීති, එවං

---

භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ, අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ ගෙයි; අග්ගිපජ්ජලිතො හොති, ගිනි දල්වන ලද්දේ බැබලුනේ වේ; ආහුති පග්ගහිතා, අග්නිහෝමය පටන් ගන්නා ලද්දේය; අථ ඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවතුන් වහන්සේ සාවත්ථියං, සැවැත් නුවර; සපදානං පිණ්ඩාය චරමානො, ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන සේක්; අග්ගිකභාරද්වාජස්ස නිවෙසනං, අග්ගිකභාරද්වාජ බ්‍රාහ්මණයාගේ ගෙය; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැනට; උපසඞ්කමි, වැඩි සේක.

අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො, අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම; ආගච්ඡන්තං, වැඩමවන්නා වූ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; දූරතොව, දුරදීම; අද්දසාඛො, දුටුයේමය; දිස්වාන, දැක; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මේ වචනය කීයේය; මුණ්ඩක, මුණ්ඩකය; තත්‍රෙව තිට්ඨාහි, එහිම සිටුව; සමණක, නින්දිත මහණ; තත්‍රෙව තිට්ඨාහි, එහිම සිටුව; වසලක, නින්දිත සැඬොල; තත්‍රෙව තිට්ඨාහි; එහිම සිටුවයි; එවං වුත්තෙ

**වුත්තෙ භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච, ජානාසි පන ත්වං බ්‍රාහ්මණ වසලං වා වසලකරණෙ වා ධම්මෙ, නඛ්වාහං භො ගොතම ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මෙ, සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු, යථාහං ජානෙය්‍යං වසලං වා වසලකරණෙ වා ධම්මෙති.**

**තෙන හි බ්‍රාහ්මණ සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති,**

---

මෙසේ කී කල්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං, අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණයා හට; එතදවොච, මෙසේ වදාළ සේක; බ්‍රාහ්මණ, බමුණ; ත්වං, තෝ; වසලං වා, සැඩොලා හෝ; වසලකරණෙ වා ධම්මෙ, සැඩොල් බවට පමුණුවන කාරණයන් හෝ; ජානාසි පන ඉති, කිමෙක දන්නෙහි ද? භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අහං, මම වූකලි; වසලං වා, වසලයා හෝ; වසලකරණෙ වා ධම්මෙ, වසල බවට පමුණුවන ධර්මය හෝ; න ඛො ජානාමි ඉති, නොදනිමි; භවං ගොතමො, භවත් ගෞතම තෙම; වසලං වා, වසලයා හෝ; වසලකරණෙ වා ධම්මෙ, වසල බවට පමුණුවන කාරණයන්; යථා අහං ජානෙය්‍යං, යම්සේ මම දැන ගනිම් ද, මෙ, මට; තථා ධම්මං දෙසෙතු, එසේ දහම් දෙසන සේක්වා; සාධු ඉති, මැනවයි සැළ කෙළේය.

බ්‍රාහ්මණ, බමුණ; තෙන හි, එසේ වීනම්; සුණාහි, අසව; සාධුකං, මනාකොට; මනසිකරොහි, මෙනෙහි කරව; භාසිස්සාමීති, කියන්නෙමියි වදාළ සේක; භො, පින්වත; එවං ඛො, එසේ

**එවමෙහොති ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි, භගවා එතදවොච.**

**1 කොධනො උපනාහී ච**
**පාපමක්ඛී ච යො නරො,**
**විපන්නදිට්ඨී මායාවී**
**තං ජඤ්ඤා වසලො ඉති.**

**2 එකජං වා ද්විජං වාපි**
**යොධ පාණානි හිංසති,**
**යස්ස පාණෙ දයා නත්ථි**
**තං ජඤ්ඤා වසලො ඉති.**

---

යයි කීයා; අග්ගිකභාරද්වාජො, බ්‍රාහ්මණො, අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම; භගවතො, භාග්‍යවතුන් වහන්සේට, පච්චස්සොසි, ප්‍රතිවචන දුන්නේය; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතදවොච, මේ ධර්මය වදාළ සේක.

1. යො නරො, යම් මනුෂ්‍යයෙක්; කොධනො, ක්‍රිපෙන ස්වභාව ඇත්තේ වේද; උපනාහි ච, බද්ධවෛර ඇත්තේ වේද; පාපමක්ඛි ච, අනුන් ගුණ නසන පව්වූ ස්වභාව ඇත්තේ වේද; විපන්නදිට්ඨි, විපයර්‍යාස වූ දෘෂ්ටි ඇත්තේ ද හෙවත් සම්‍යග්දෘෂ්ටියෙන් තොරවූයේ ද; මායාවී, ප්‍රයොග ඇත්තේ වේද; තං ජඤ්ඤා වසලො ඉති, ඔහු වසලයයි දැනගත යුතුයි.

2. ඉධ, මේ ලෝකයෙහි; යො, යම් කෙනෙක්; එකජං වා, එක් වරක් උපන්නාවූ හෝ; ද්විජං වාපි, දෙවරක් උපන්නාවූ හෝ පාණානි, ප්‍රාණීන්; හිංසති, හිංසා කෙරේ ද; හෙවත් දිවි තොර කෙරේ ද; යස්ස, යමෙක් හට; පාණෙ, සත්වයා කෙරෙහි; දයානත්ථි, දයාවක් නැත්තේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයායි; ජඤ්ඤා, දත යුතුයි.

3 යො හන්ති පරිරුන්ධති
ගාමානි නිගමානි ච,
නිග්ගාහකො සමඤ්ඤාතො
තං ජඤ්ඤා වසලො ඉති.

4 ගාමෙ වා යදිවාරඤ්ඤෙ
යං පරෙසං මමායිතං,
ථෙය්‍යා අදින්නං ආදියති
තං ජඤ්ඤා වසලො ඉති.

4 යො හවෙ ඉණමාදය
චුජ්ජමානො පලායති,
නහි තෙ ඉණමත්ථීති
තං ජඤ්ඤා වසලො ඉති.

---

3. යෙ, යමෙක් තෙම; ගාමානි, ගම් හා; නිගමානි ච, නියම් ගම් ද; හන්ති, විනාශ කෙරේද; පරිරුන්ධති, සේනාව ලවා වටලාද; නිග්ගාහකො සමඤ්ඤාතො, නිග්‍රහ කරන්නෙකැයි ප්‍රසිද්ධ වේද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දැනගත යුතුයි.

4. ගාමෙ වා, ගමෙහි හෝ; යදි අරඤ්ඤෙ වා, ඉදින් වනයෙහි හෝ; පරෙසං මාමයිතං, අනුන්ගේ මමත්වය ඇති; අදින්නං, නො දෙන ලද; යං, යම් වස්තුවක්; ථෙය්‍යා, සොර සිතින්; ආදියති, ගනීද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

5. යො, යමෙක් තෙම; හවෙ, ඒකාන්තයෙන්; ඉණ මාදාය, ණය රැගෙන; චුජ්ජමානො, චෝදනා කරනු ලබන්නේ; නහි තෙ ඉණං අත්ථීති, තට ණයක් නැත්තේයයි; පලායති, බැහැර යාද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි,

6 යො වෙ කිඤ්චික්ඛකම්‍යතා
පන්ථස්මිං වජතං ජනං,
හන්ත්වා කිඤ්චික්ඛමාදෙති
තං ජඤ්ඤා වසලො ඉති.

7 යො අත්තහෙතු පරහෙතු
ධනහෙතු ච යොනරො,
සක්ඛිපුට්ඨො මුසා බ්‍රෑති
තං ජඤ්ඤා වසලො ඉති.

8 යො ඤාතීනං සඛීනං වා
දාරෙසු පතිදිස්සති,
සහසා සම්පියෙන වා
තං ජඤ්ඤා වසලො ඉති.

---

6. යො, යමෙක්; වෙ, එකාන්තයෙන්; කිඤ්චික්ඛකම්‍යතා, කිසි වස්තුවක් කැමැත්තේ; පන්ථස්මිං වජතං ජනං, මාර්ගයෙහි යන්නාවූ ජනයා; හන්ත්වා, නසා; කිඤ්චික්ඛමාදෙති, කිසි වස්තුවක් පැහැර ගනී ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

7. යො නරො, යම් මනුෂ්‍යයෙක්; සක්ඛිපුට්ඨො, සාක්ෂි විචාරණ ලද්දේ; අත්තහෙතු, තමා හෙතුකොට ගෙන හෝ; පර හෙතු, අනුන් හේතුකොට ගෙන හෝ; ධන හෙතුව, යම් ධනයක් හේතුකොට හෝ; මුසා බ්‍රෑති, බොරු කියාද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

8. යො, යමෙක්; ඤාතීනං වා, නෑයන්ගේ හෝ; සඛීනං වා, යහලුවන්ගේ හෝ; දාරෙසු, භාර්‍යාවන් කෙරෙහි; සහසා, බලාත්කාරයෙන්; සම්පියෙන වා, එකක්හුගේ ප්‍රෙමයෙන් හෝ උභය

9 යො මාතරං වා පිතරං වා
ජිණ්ණකං ගතයොබ්බනං,
පහූසන්තො නභරති
තං ජඤ්ඤා වසලො ඉති.

10 යො මාතරං වා පිතරං වා
භාතරං භගිනිං සසුං,
හන්ති රොසෙති වාචාය
තං ජඤ්ඤා වසලො ඉති.

11 යො අත්ථං පුච්ඡිතොසන්තො
අනත්ථමනුසාසති,

---

ප්‍රේමයෙන් හෝ; පතිදිස්සති, දක්නා ලැබේද හෙවත් අනාචාරයෙහි හැසිරේද; තං, එබඳු පුද්ගලයා; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

9. යො, යමෙක්, තෙම; පහූසන්තො, බොහෝ ධන ධාන්‍ය ඇත්තේ; ජිණ්ණකං, ජරපත් වූ; ගතයොබ්බනං, පහවගිය යෞවන බව ඇති; මාතරං වා, මව හෝ; පිතරං වා, පියා හෝ; න භරති, පොෂණය නො කෙරේ ද; තං ඔහු, වසලො ඉති වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

10. යො, යමෙක් තෙම; මාතරං වා, මවට හෝ; පිතරං වා, පියාට හෝ; භාතරං භගිනිං සසුං, සහෝදර සහෝදරියන් හා නැදිමයිලන්ට හෝ; හනති, හිංසා කෙරේ ද; වාචාය, වචනයෙන් රොසෙති, ක්‍රොධ කෙරේ ද, තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

11. යො, යමෙක් තෙම; අත්ථං, අර්ථයක්; පුච්ඡිතො සන්තො, විචාරණ ලද්දේම; අනත්ථමනුසාසති, අනර්ථයක්ම ප්‍රකාශ කෙරේ ද;

පටිච්ඡන්නෙන මන්තෙති
තං ජඤ්ඤා වසලො ඉති.

12 යො කත්වා පාපකං කම්මං
මා මං ජඤ්ඤාති ඉච්ඡති,
යො පටිච්ඡන්න කම්මන්තො
තං ජඤ්ඤා වසලො ඉති.

13 යො වෙ පරකුලං ගන්ත්වා
භුත්වාන සුචිභොජනං,
ආගතං න පටිපූජෙති
තං ජඤ්ඤා වසලො ඉති.

---

පටිච්ඡන්නෙන, සැඟවීම් වශයෙන්; මන්තෙති, මන්ත්‍රණ කෙරේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

12. යො, යමෙක් තෙම; පාපකං කම්මං කත්වා, පව්කම් කොට; මා මං ජඤ්ඤාති ඉච්ඡති, මා නො දනීවායි කැමති වේද; යො, යමෙක් තෙම; පටිච්ඡන්න කම්මන්තො, අනුන් නොදන්වා සඟවා කරන ලාමක ක්‍රියා ඇත්තේ ද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

13. යො, යමෙක් තෙමේ; පරකුලං ගන්ත්වා, ඤාති මිත්‍රාදි අන් ගෙයකට ගොස්; සුචිභොජනං, යහපත් භොජනයක්; භුත්වාන, අනුභව කොට; ආගතං, පසුව තමාගේ ගෙට පැමිණි ඔවුන්ට, න පටිපූජෙති, ආහාර පානයන් නොදේද; තං, ඔහු; වෙ, එකාන්තයෙන්; වසලො ඉති, වසලයා යයි; ජඤ්ඤා, දත යුතුයි.

14 යො බ්‍රාහමණං වා සමණං වා
අඤ්ඤං වාපි වණිබ්බකං,
මුසාවාදෙන වඤ්චෙති
තං ජඤ්ඤා වසලො ඉති.

15 යො බ්‍රාහමණං වා සමණං වා
භත්තකාලෙ උපට්ඨිතෙ,
රොසෙති වාචා න ච දෙති
තං ජඤ්ඤා වසලො ඉති.

16 අසතං යො'ධ පබ්‍රූති
මොහෙන පලිගුණ්ඨිතො,
කිඤ්චික්ඛං නිජිගිංසානො
තං ජඤ්ඤා වසලො ඉති.

---

14. යො, යමෙක් තෙම; බ්‍රාහමණං වා, බ්‍රාහ්මණයකු හෝ; සමණ වා, ශ්‍රමණයකු හෝ; අඤ්ඤං වණිබ්බකං වාපි, අන් කිසි යාචකයකු හෝ තමාගේ ගෙට පැමිණි කල්හි; මුසාවාදෙන, බොරු කියා; වඤ්චෙති, වඤ්චා කෙරේ ද; තං, ඔහු; වසලො ඉති, වසල යෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

15. යො, යමෙක් තෙම; බ්‍රාහමණං වා, බ්‍රාහ්මණයකු හෝ; සමණං වා, ශ්‍රමණයකු හෝ; භත්තකාලෙ උපට්ඨිතෙ, පෙරවරු වේලෙහි පැමිණි කල්හි; න ච දෙති, කිසිවක් නොදේද; රොසෙති වාචා, නුසුදුසු වචන කියමින් රෝස් උපදවාද; තං, එබඳු පුද්ගලයා; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

16. ඉධ, මේ ලෝකයෙහි; යො, යමෙක් තෙම; මොහෙන පලිගුණ්ඨිතො, මොහයෙන් වැසෙන ලද්දේ; කිඤ්චික්ඛං, කිසියම් දෙයක්; නිජිගිංසා නො, නොදී වලකමින්; අසතං පබ්‍රූති, අසත්

17 යොචත්තානං සමුක්කංසෙ
පරංචමවජානති
නිහීනො සෙන මානෙන
තං ජඤ්ඤා වසලො ඉති.

18 රොසකො කදරියො ච
පාපිච්ඡො මච්ඡරී සඨො,
අහිරීකො අනොත්තාපී
තං ජඤ්ඤා වසලො ඉති.

19 යො බුද්ධං පරිභාසති
අථවා තස්ස සාවකං,
පරිබ්බාජං ගහට්ඨං වා
තං ජඤ්ඤා වසලො ඉති.

---

පුරුෂ වචන කියාද; තං, ඔහු වසලො ඉති, වසලයයි; ජඤ්ඤා, දත යුතුයි.

17. යො, යමෙක් තෙම; සෙන මානෙන; සවකීය උඩඟු මානයෙන්; නිහිනො; පිරිහුනේ; අත්තානං, තමන්; සමුක්කංසෙ, උඩඟු කෙරේද; පරංච, අන්‍යයාට; අවජානති, නිඳු කෙරේද හෙවත් හෙලාදකීද; තං, ඔහු; වසලො ඉති, වසලයයි; ජඤ්ඤා, දත යුතුයි.

18. රොසකො කදරියො ච, යමෙක් අනුන්ට ක්‍රොධ කෙරේද; මච්ඡරී, තද මසුරු සිත් ඇත්තේද; පාපිච්ඡො, පව්වූ අදහස් ඇත්තේද; සඨො, නැති ගුණයෙන් පෙනී සිටීද; අහිරිකො, ලජ්ජා නැත්තේද; අනොත්තාපි, පවට බිය නැත්තේද; තං ඔහු; වසලො ඉති, වස්ලයයි; ජඤ්ඤා, දත යුතුයි.

20 යො වෙ අනරහා සන්තො
අරහං පටිජානාති,
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ
එස ඛො වසලාධමො,
එතෙ ඛො වසලා වුත්තා
මයා වො යෙ පකාසිතා.

21 න ජච්චා වසලො හොති
න ජච්චා හොති බ්‍රාහ්මණො,
කම්මනා වසලො හොති
කම්මනා හොති බ්‍රාහ්මණො.

---

19. යො, යමෙක් තෙම; බුද්ධං, බුදුන්ට ද; අථවා, නවද; තස්ස සාවකං, උන්වහන්සේගේ ශ්‍රාවකයන්ටද; පරිබ්බාජං, පරිබ්‍රාජික යන්ටද; ගහට්ඨං වා, ගෘහස්ථයන්ටද; පරිභාසති, පිරිහෙලාද; තං, ඔහු; වසලො ඉති, වසලයෙකැයි; ජඤ්ඤා, දත යුතුයි.

20. යො, යමෙක් තෙම; අනරහා සන්තො, රහත් නුවූයේම; අරහං, රහත් යයි; පටිජානාති, අඟවාද; සබ්‍රහ්මකෙ, බ්‍රහ්මයා සහිත වූ, ලොකෙ, ලොකයෙහි; එස ඛො, මෙ තෙම; වෙ, එකාන්ත යෙන්; චොරො, පළමුවෙනි මහ සොරා වේ; වසලාධමො, මේ තෙමේ චණ්ඩාලයන්ගෙන් අධම වේ; මයා, මා විසින්; වො, තොපට යෙ වසලා, යම් වසල කෙනෙක්; පකාසිතා, ප්‍රකාශ කරණ ලද්දහුද; එතෙ ඛො, ඒ වසලයෝ; වුත්තා, ආයසී ධම් වශයෙන් කියන ලද්දහුය.

21. න ජච්චා වසලො හොති, ජාතිය හෙතුකොට ගෙන චණ්ඩාලයෙක් නොවේ; න ජච්චා හොති බ්‍රාහමණො, ජාතිය හෙතු කොට ගෙන බ්‍රාහ්මණද නොවේ; කම්මනා වසලො හොති, නපුරු ක්‍රියාව හෙතුකොට ගෙන චණ්ඩාල වේ; කම්මනා හොති බ්‍රාහමණො; යහපත් ක්‍රියාව හෙතුකොට ගෙන බ්‍රාහ්මණ වේ.

22 තදමිනාපි විජානාථ
යථා මෙදං නිදස්සනං,
චණ්ඩාලපුත්තො සොපාකො
මාතඞ්ගො ඉති විස්සුතො.

23 සො යසං පරමං පත්තො
මාතඞ්ගො'යං සුදුල්ලභං,
ආගඤ්ඡුං තස්සුපට්ඨානං
ඛත්තියා බ්‍රාහ්මණා බහූ.

24 සො දෙවයානමාරුය්හ
විරජං සො මහාපථං,
කාමරාගං විරාජෙත්වා
බ්‍රහ්මලොකූපගො අහු.

---

22.-23. යථා, යම්සේ; මෙ, මාගේ; ඉදං නිදස්සනං, මේ උපමා දැක්වීමක් ඇද්ද; තදමිනාපි විජානාථ, ඒ ජාතිය හෙතුකොට ගෙන සැඩොල් නොවන බව මෙයින්ද දැන ගනිව්; චණ්ඩාලපුත්තො, සැඩොල් පුත් වූ; සොපාකො, බලුමස් කන හෙයින් සොපාකයයි කියන ලද; මාතඞ්ගො ඉති, මාතඞ්ගයයි ප්‍රසිද්ධවූ; අයං සො මාතඞ්ගො, ඒ මේ මාතඞ්ග තෙමේ; සුදුල්ලභං, ඉතා දුකසේ ලැබිය යුතු වූ; පරමං යසං, උතුම් යසසට; පත්තො, පැමිණියේය; ඛත්තියා බ්‍රාහ්මණා බහු, ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි බොහෝ දෙන; තස්සුපට්ඨානං, ඔහට උපස්ථානයට; ආගඤ්ඡුං, ගියාහුය.

24. සො, ඒ සොපාක තෙරතෙමේ; විරජං, රාගාදී රජස් රහිතවූ; මහාපථං, මහතුන්ගේ මහා මාර්ගයවූ; සො දෙවයාන මාරුය්හ, ඒ අෂ්ටසමාපත්ති සංඛ්‍යාත දිව්‍ය යානාවට නැගී; කාම රාගං විරාජෙත්වා, කාමරාගය පහකොට; බ්‍රහ්මලොකූපගො අහු, උත්පත්ති වශයෙන් බ්‍රහ්මලොකයට පැමිණියේ විය.

25 න තං ජාති නිවාරෙසි
බ්‍රහ්මලොකූපපත්තියා,
අජඣායක කුලෙ ජාතා
බ්‍රාහමණා මනතබඬුනො.

26 නෙව පාපෙසු කමෙමසු
අභිණහමූපදිසසරෙ,
දිටෙඨවධමෙම ගාරයහා
සමපරායෙ ච දුගගතිං
න තෙ ජාති නිවාරෙති
දුගගචචා ගරහාය වා

27 න ජචචා වසලො හොති
න ජචචා හොති බ්‍රාහමණො,

---

25-26. ජාති, ජාතිය; තං, ඔහු; බ්‍රහ්මලොකූපපත්තියා, බඹ ලොව ඉපදීමෙන්; න නිවාරෙසි, නොවැළැක්විය; මනතබඬුනො, මන්ත්‍ර අධ්‍යයනයෙන් කුල් යවන; අජඣායක කුලෙ ජාතා, ප්‍රසිඬ බ්‍රාහ්මණ කුලයෙහි උපන්නාවූ; බ්‍රාහ්මණා, වෙදයම නොහොත් මන්ත්‍රයම පිහිට කොට ඇති බ්‍රාහ්මණයෝ; පාපෙසු කමෙමසු, පව් කිරීමෙහි; අභිණහමූපදිසසරෙ, නිතර පව් කරන බව දක්නා ලැබෙද්ද; නෙව, ඒ බ්‍රාහ්මණයෝ; දිටෙඨවධමෙම, මෙලොවදීම; ගාරයහා, නිඥුවට පැමිණෙන්නෝ වෙත්; සමපරායෙ ච, පරලෙව් හිදී; දුගගතිං, දුගති නම් වූ සතර අපායට පැමිණෙන්නෝ වෙත්; ජාති, (උතුමැයි සලකන) ජාතිය; තෙ, ඒ සත්වයන්; දුගගචචා, පරලොව අපායෙන් හෝ; ගරහායවා, මෙලොව නිඥුවෙන් හෝ; න නිවාරෙති, නො නවත්වන්නේය.

කම්මනා වසලො හොති
කම්මනා හොති බ්‍රාහ්මණොති.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච, අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය. මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙල

---

27. ජච්චා, ජාතිය හෙතුකොට ගෙන; වසලො න හොති, වසලයෙක් නො වන්නේය; ජච්චා, ජාතිය හෙතුකොට ගෙන; බ්‍රාහ්මණො න හොති, බ්‍රාහ්මණයෙක්ද නො වන්නේය; කම්මනා වසලො හොති, ක්‍රොධ ඊර්ෂ්‍යා මානාදී හීන වූ පාප ක්‍රියාවෙන් වසලයෙක් වන්නේය; කම්මනා හොති බ්‍රාහ්මණො, ක්‍රොධාදී පාපකර්මයෙන් තොර වූ කරුණාදී යහපත් ක්‍රියාවෙන් උතුම් ජාතිය වූ බ්‍රාහ්මණයෙක් වන්නේ යයි වදාළ සේක.

එවං වුත්තෙ, මෙසේ වදාළ කල්හි; අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො, අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම; භගවන්තං, බුද්ධරජාණන් වහන්සේට; එතදවොච, මෙසේ සැළ කෙළේය; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, දහම් දෙසුම ඉතා යහපත; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; අභික්කන්තං, දහම් දෙසුම ඉතා යහපත; භො ගොතම, භවත් ගෞතමයන් වහන්ස; නික්කුජ්ජිතං වා, මුනින් තබන ලද භාජනයක්; උක්කුජ්ජෙය්‍ය වා, උඩුකුරු කොට තබන්නේ හෝ; සෙය්‍යථාපි, යම්සේද; පටිච්ඡන්නං, වැසී තිබුණු යමක්; විවරෙය්‍ය වා, විවෘත කොට දක්වන්නේ හෝ යම්සේද; මූළ්හස්ස, මං මුළාවූවෙකුට; මග්ගං ආචික්ඛෙය්‍ය වා, මඟ කියන්නේ හෝ යම්සේද; චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති ඉති, ඇස් ඇත්තෝ රූපයන්

පජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසා'හං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකං මං භවං ගොතමො ධාරෙතු. අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

වසල සුත්තං

---

දකින්වායි; අන්ධකාරෙ, අඳුරෙහි; තෙල පජ්ජොතං ධාරෙය්‍ය වා, තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද; එවං එව, එපරිද්දෙන්ම; භොතා ගොතමෙන, භවත් ගෞතමයන් වහන්සේ විසින්; අනෙක පරියායෙන, නොයෙක් පරිද්දෙන්; ධම්මො පකාසිතො, ධර්මය දෙශනා කරන ලද්දේය; එසා'හං, මේ මම; භවන්තං ගොතමං, භවත් ගෞතමයන් වහන්සේද; ධම්මඤ්ච, ධර්මයද; භික්ඛු සඞ්ඝඤ්ච, භික්ෂුසඞ්ඝයාද; සරණං ගච්ඡාමි, පිහිට කොට යමි; භවං ගොතමො, භවත් ගෞතමයන් වහන්සේ; අජ්ජතග්ගෙ, අද පටන්; පාණුපෙතං, දිවිහිමි කොට; සරණං ගතං, සරණ ගියාවූ; උපාසකං, උපාසකයෙකැයි; මං, මා; ධාරෙතු දරාගන්නා සේක්වා.

වසල සූත්‍රය යි.

## සච්ච විභඞ්ග සුත්තං

29. එවං මෙ සුතං එකං සමයං භගවා, බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති, භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මා සම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්ම චක්කං පවත්තිතං අප්පතිවත්තියං

---

29. මෙ, මා විසින්; එවං සුතං, (මේ සූත්‍ර ධර්මය) මෙසේ අසන ලදී; එකං සමයං, එක් සමයෙක්හි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; බාරාණසියං, බරණැස් නුවර; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහි; විහරති, වැඩ වාසය කර වදාරණ සේක; තත්‍ර ඛො, ඒකල්හි වනාහි; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛවො ඉති, මහණෙනි කියා; භික්ඛූ, භික්‍ෂූන්ට; ආමන්තෙසි, ආමන්ත්‍රණය කර වදාළ සේක; තෙ භික්ඛූ, ඒ භික්‍ෂූහු; භදන්තෙ ඉති, පින්වතුන් වහන්සැයි කියා; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචන දුන්හ; භගවා, භාග්‍යවතුන් වහන්සේ; එතං, මේ මතු කියන කාරණය; අවොච, වදාළ සේක.

භික්ඛවෙ, මහණෙනි; අරහතා, අහීත් වූ; සම්මාසම්බුද්ධෙන, සම්‍යක් සම්බුඩවූ; තථාගතෙන, තථාගතයන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහිදී; ලොකස්මිං, ලොකයෙහි; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බ්‍රාහ්මණයකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ;

සමණෙන වා බ්‍රාහමණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං යදිදං චතුන්නං අරියසච්චානං, ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං,

කතමෙසං චතුන්නං? දුක්ඛස්ස අරියසච්චස්ස, ආචික්ඛණා —පෙ— දුක්ඛසමුදයස්ස, අරියසච්චස්ස ආචික්ඛනා —පෙ— දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, ආචික්ඛනා —පෙ— දුක්ඛනිරොධගාමිනීපටිපදා අරිය

---

බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ, කෙනචි වා, අන් කිසිවකු විසින් හෝ; (නැවත) අප්පතිවත්තියං, පැවැත්විය නො හැක්කාවූ; යදිදං, යම් මේ; චතුන්නං අරියසච්චානං, චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ; ආචික්ඛනා, ප්‍රකාශ කිරීමය; දෙසනා, දේශනා කිරීමය; පඤ්ඤපනා, පැණවීමය; පට්ඨපනා, තැබීමය; විවරණා, විස්තර කිරීමය; විභජනා, විභාග කිරීමය; උත්තානීකම්මං, අතිප්‍රකට කිරීමය යන; අනුත්තරං ධම්මචක්කං, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේය.

කතමෙසං චතුන්නං, කවර චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේද යත්? දුක්ඛස්ස අරියසච්චස්ස, දුඃඛාර්‍ය්‍යසත්‍යයාගේ; ආචික්ඛනා ප්‍රකාශ කිරීමය; දෙසනා, දේශනා කිරීමය; පඤ්ඤපනා, පැණවීමය; පට්ඨපනා, පිහිටුවීමය; විවරණා, විස්තර කිරීමය; විභජනා, විභාග කිරීමය; උත්තානීකම්මං, අතිප්‍රකට කිරීමය යන මේ ධර්මයද; දුක්ඛ සමුදයස්ස, අරියසච්චස්ස, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයාගේ; ආචික්ඛනා,

**සච්චස්ස ආචික්ඛනා -පෙ- තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මාසම්බුද්ධෙන, බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං, සමණෙන වා බ්‍රහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං.**

---

ප්‍රකාශ කිරීමය; දෙසනා කිරීමය; පඤ්ඤපනා, පැනවීමය; පට්ඨපනා; පිහිටුවීමය; විවරණා, විස්තර කිරීමය; විභජනා, විභාග කිරීමය; උත්තානීකම්මං, අතිප්‍රකට යන මේ ධර්මයද; දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යයාගේ; ආචික්ඛනා, ප්‍රකාශ කිරීමය, දෙසනා, දෙශනා කිරීමය; පඤ්ඤපනා, පැනවීමය; පට්ඨපනා, පිහිටුවීමය; විවරණා, විස්තර කිරීමය; විභජනා, විභාග කිරීමය; උත්තානීකම්මං, අතිප්‍රකට කිරීමය යන මේ ධර්මයද; දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චස්ස, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයාගේ; ආචික්ඛනා, ප්‍රකාශ කිරීමය; දෙසනා, දෙශනා කිරීමය; පඤ්ඤපනා, පැනවීමය; පට්ඨපනා, පිහිටුවීමය; විවරණා, විස්තර කිරීමය; විභජනා, විභාග කිරීමය; උත්තානීකම්මං, අතිප්‍රකට කිරීමය යන මේ ධර්මයද; භික්ඛවෙ, මහණෙනි; අරහතා අර්හත් වූ; සම්මාසම්බුද්ධෙන, සම්‍යක් සම්බුද්ධ වූ; තථාගතෙන, තථාගතයන් විසින්; බාරාණසියං, බරණැස; මිගදායෙ, මිගදාය නම් ලද; ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහිදී; ලොකස්මිං, ලොකයෙහි; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බ්‍රාහ්මණයකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුණා වා, බ්‍රහ්මයකු විසින් හෝ; කෙනචි වා, අන් කිසිවකු විසින්; අප්පතිවත්තියං, නො පැවැත්විය හැකිවූ; අනුත්තරං ධම්මචක්කං, ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලද්දේය.

යදිදං ඉමෙසං චතුන්නං අරිය සච්චානං, ආචික්ඛනා -පෙ- සෙවෙථ භික්ඛවෙ සාරිපුත්ත මොග්ගල්ලානෙ, පණ්ඩිතා භික්ඛූ අනුග්ගාහකා බ්‍රහ්මචාරීනං, සෙය්‍යථාපි භික්ඛවෙ ජනෙත්ති එවං සාරිපුත්තො. සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙතා එවං මොග්ගල්ලානො, සාරිපුත්තො භික්ඛවෙ සොතාපත්ති ඵලෙ විනෙති. මොග්ගල්ලානො උත්තමත්ථෙ විනෙති.

---

යදිදං, යම්බඳුවූ; ඉමෙසං චතුන්නං අරියසච්චානං, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ; ආචික්ඛනා, දුක්ඛාදි ආර්‍ය්‍යසත්‍ය නමැයි කියා දෙශනා කිරීම; -පෙ- භික්ඛවෙ, මහණෙනි; සාරිපුත්ත මොග්ගල්ලානෙ, ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනයන් දෙදෙන; සෙවෙථ, (චතුරාර්‍ය්‍යසත්‍ය යන්ගේ අවබොධය පිණිසා) තොපි සෙවනය කරව්; භික්ඛවෙ, මහණෙනි; සාරිපුත්ත මොග්ගල්ලානෙ, ශාරීපුත්‍ර මෞද්ගල්‍යායනයන් දෙදෙන; භජථ, (චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේ දැනීම; පිණිස තොපි) භජනය කරව්; බ්‍රහ්මචාරීනං, බඹසර ඇත්තවුන්ට; පණ්ඩිතා, පණ්ඩිතවූ; භික්ඛූ, භික්ෂූහු; අනුග්ගාහකා, ආමිස සංග්‍රහ ධර්‍ම සංග්‍රහ යන සංග්‍රහද්වයෙන් අනුග්‍රහ කරන්නාහුය; භික්ඛවෙ, මහණෙනි; ජනෙත්ති, වැදූ මව්; සෙය්‍යථාපි, යම්සේද; සාරිපුත්තො, ශාරීපුත්‍ර තෙමේ; එවං, මෙබඳුම්ය; ජාතස්ස, උපන්නාහට; ආපාදෙතා, පොෂ්‍යය කරන්නා; සෙය්‍යථාපි, යම්සේද; මොග්ගල්ලානො, මෞද්ගල්‍යායන තෙමේ; එවං, මෙ බඳුමය; භික්ඛවෙ, මහණෙනි; සාරිපුත්තො, ශාරිපුත්‍ර තෙම; සොතාපත්ති ඵලෙ, සෝවාන්ඵලයෙහි; විනෙති සත්ත්වයන් හික්මවයි; මොග්ගල්ලානො, මෞද්ගල්‍යායන තෙම; උත්තමත්ථෙ, අර්හත් ඵලයෙහි; විනෙති, සත්ත්වයන් හික්මවයි.

සාරිපුත්තො භික්ඛවෙ පහොති චත්තාරි අරියසච්චානි විත්ථාරෙන ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤපෙතුං පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං ති, ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො උට්ඨායාසනා විහාරං පාවිසි. තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො අචිරපක්කන්තස්ස භගවතො භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවොති, ආවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරි-පුත්තස්ස පච්චස්සොසුං.

---

භික්ඛවෙ, මහණෙනි; සාරිපුත්තො, ශාරීපුත්‍ර තෙම; චත්තාරි අරියසච්චානි, සතර ආය්‍ර්‍යසත්‍යයන්; විත්ථාරෙන, විස්තර වශයෙන් ආචික්ඛිතුං, කියන්ටද, දෙසෙතුං, දෙශනා කරන්ටද; පඤ්ඤපෙතුං, පණවන්ටද; පට්ඨපෙතුං, ස්ථාපණීය කරන්ටද; විවරිතුං, විවෘත කරන්ටද; විභජිතුං, විභජනය කරන්ටද; උත්තානීකාතුං, ප්‍රකට කරන්ටද; පහොති ඉති, හැක්කේ යයි වදාළ සේක; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ඉදං, මේ චතුරාය්‍ර්‍යසත්‍යය ධර්මය; අවොච, වදාළ සේක; ඉදං වත්වා (මේ ධර්මය) වදරා; සුගතො, තථාගතයන් වහන්සේ; ආසනා උට්ඨාය, ආසනයෙන් නැගිට; විහාරං, විහාරංයට; පාවිසි, ප්‍රවිෂ්ට වූසේක; තත්‍ර ඛො, එකල්හි වනාහි; ආයස්මා සාරිපුත්තො, ආයුෂ්මත්වූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ; භගවතො, භාග්‍යවතුන් වහන්සේ; අචිරපක්කන්තස්ස, විහාරයට වැඩ නොබෝ කලකදී; ආවුසො, ඇවැත්නි; භික්ඛවෙ ඉති, මහණෙනි කියා; භික්ඛූ, භික්ෂූන්; ආමන්තෙසි, ආමන්ත්‍රණය කළ සේක; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; ආයස්මතො, ආයුෂ්මත්වූ, සාරිපුත්තස්ස, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට; පතිඅස්සොසුං, පිළිවදන් ඇස්සූහ.

ආයස්මා සාරිපුත්තො එතදවොච, තථාගතෙන ආවුසො අරහතා සම්මාසම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ, අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං.

යදිදං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජන

---

ආයස්මා, ආයුෂ්මත්වූ; සාරිපුත්තො, ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ; එතං අවොච, මේ මතු ප්‍රකාශ වන ධර්මය කී සේක; ආවුසො, ඇවැත්නි; අරහතා, අර්හත්වූ; සම්මාසම්බුද්ධෙන, සම්‍යක් සම්බුද්ධ වූ; තථාගතෙන, තථාගතයන් වහන්සේ විසින්; බාරාණසියං, බරණැස; මිගදායෙ, මිගදාය නම්වූ; ඉසිපතනෙ, එනම් ආරාමයෙහිදී; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහ්මණෙන වා, බ්‍රාහ්මණයකු විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; බ්‍රහ්මුනා වා, බ්‍රහ්මයකු විසින් හෝ; ලොකස්මිං, ත්‍රිවිධ ලොකයෙහි; කෙනචි වා, කිසිවකු විසින් හෝ; අප්පටිවත්තියං නො පැවැත්විය හැක්කාවූ; අනුත්තරං, නිරුත්තර වූ; ධම්මචක්කං, ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලදී.

යං ඉදං, යම් බඳුවූ මේ; චතුන්නං අරියසච්චානං, චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ; ආචික්ඛනා, වැදූරීමය; දෙසනා, දෙශනා කිරීමය; පඤ්ඤපනා, පැණවීමය; පට්ඨපනා, ස්ථාපණය කිරීමය; විවරණා, විවෘත කිරීමය; විභජනා, විභජනය කිරීමය; උත්තානිකම්මං,

උත්තානි කම්මං, කතමෙසං චතුන්නං? දුක්ඛස්ස අරියසච්චස්ස ආචික්ඛනා -පෙ- දුක්ඛසමුදයස්ස අරියසච්චස්ස, ආචික්ඛනා -පෙ- දුක්ඛනිරොධස්ස අරිය සච්ච ස්ස ආචික්ඛනා -පෙ- දුක්ඛනිරොධ ගාමිනී පටිපදා අරියසච්චස්ස, ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානිකම්මං,

කතමඤ්චාවුසො දුක්ඛං අරිය-සච්චං? ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා මරණම්පි දුක්ඛං, සොකපරිදෙව

---

ප්‍රකට කිරීමය යන මේ දෙශනාවයි; කතමෙසං චතුන්නං, කවර ආර්‍ය්‍යසත්‍යයන් සතර දෙනෙකුන්ගේද යත්? දුක්ඛස්ස අරියසච්චස්ස, දුක්ඛාර්‍ය්‍ය සත්‍යයාගේ; ආචික්ඛනා, වැදූරීමය, -පෙ- දුක්ඛ සමුදයස්ස අරියසච්චස්ස, දුක්ඛසමුදයාර්‍ය්‍ය සත්‍යයාගේ, ආචික්ඛනා, වැදූරීමය; -පෙ- දුක්ඛනිරොධස්ස අරියසච්චස්ස, දුක්ඛනිරෝධාර්‍ය්‍ය සත්‍යයාගේ; ආචික්ඛනා, වැදූරීමය; -පෙ- දුක්ඛනිරොධගාමිනීපටිපදා අරිය සච්චස්ස, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයාගේ; ආචික්ඛනා, වැදූරීමය; දෙසනා, දෙශනා කිරීමය; පඤ්ඤපනා, පැණවීමය; පට්ඨපනා, ස්ථාපණය කිරීමය; විවරණා, විවෘත කිරීමය යන මේ දෙශනාවයි.

ආවුසො, ඇවැත්නි; දුක්ඛං අරියසච්චං, දුක්ඛාර්‍ය්‍යසත්‍යය; කතමඤ්ච, කවරේද? ජාති අපි, ජාතිය (හෙවත්) ඉපදීමද? දුක්ඛා, දුක්වත්නීය; ජරා අපි, ජරාව (හෙවත්) දිරීමද; දුක්ඛා, දුක්

දුක්ඛ දොමනස්සුපායාසා දුක්ඛා, යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා, කතමා චාවුසො ජාති? යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චතාවුසො ජාති;

කතමා චාවුසො ජරා, යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං

---

වන්නීය; මරණං අපි, මරණයද; දුක්ඛං, දුක් වන්නේය; සොක, ශොක කිරීමය; පරිදෙව, වැලපීමය; දුක්ඛ, කය හටගන්නා දුකය; දොම්නස්ස, සිත හටගන්නා දොම්නසය, උපායාසා, දැඩි ආයාසය; (යන මොහු) දුක්ඛා, දුක් වන්නාහුය; යම්පිච්ඡං, යම් කැමති දෙයක් (හෙවත්) යමක් පතමින්; නලභති, නොලබාද; තම්පි දුක්ඛං, හෙද දුක් වන්නේය; සංඛිත්තෙන, සංක්ෂෙපයෙන්; පඤ්චුපාදානක්ඛන්ධා, උපාදානස්කන්ධයෝ පස්දෙන; දුක්ඛා, දුක් වන්නාහුය; ආවුසො, ඇවැත්නි; ජාති, ජාති තොමෝ; කතමාච, කවරීද? තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන්ගේ; තම්හි තම්හි සත්තනිකායෙ, ඒ ඒ සත්ව සමූහයෙහි; යා ජාති, යම්බදු ඉපදීමක් ඇද්ද; සඤ්ජාති, හට ගැන්මක් වේද; ඔක්කන්ති, උත්පත්ති ස්ථානයට ඇතුල්වීමක් ඇද්ද; අභිනිබ්බත්ති, විශෙෂයෙන් ඉපදීමක් ඇද්ද; ඛන්ධානං පාතුභාවො, පරමාර්ථ වශයෙන් ස්කන්ධයන්ගේ පහළවීමෙක් ඇද්ද, ආවුසො, ඇවැත්නි; අයං, මේතොමෝ; ජාති වුච්චති, ජාතියයි, කියනු ලැබේ.

පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො, අයං වුච්චතාවුසො ජරා, කතමඤ්චාවුසො මරණං? යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො, ඉදං වුච්චතාවුසො මරණං;

---

ආවුසො, ඇවැත්නි; ජරා, ජරා තොමෝ; කතමාච, කවරිද? තම්හි තම්හි සත්තනිකායෙ, ඒ ඒ සත්වනිකායෙහි උපන්නාවූ; තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන්ගේ; යා ජරා, යම් ජරාවක් වන්නීද; ජීරණතා, ජරාවෙන් සත්වයන් දිරන බවද; ඛණ්ඩිච්චං, (දත් ඇට) කැඩුන බව (හෙවත්) ගැලවුන බවද; පාලිච්චං, කෙස් ලොම් පැසී සුදුවූ බවද; වලිත්තචතා, රැලි හැගුණු සම් ඇති බවද; ආයුනො සංහානි, ආයුෂයාගේ හානිය (හෙවත්) ගෙවීමද; ඉන්ද්‍රියානං, චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ; පාරිපාකො, මුහුකුරා යාමක් ඇද්ද; ආවුසො, ඇවැත්නි; අයං, මෝතොමෝ; ජරා වුච්චති, ජරාව යයි කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; මරණං, මරණය තෙම; කතමඤ්ච, කවරේද? තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන්ගේ; තම්හා තම්හා සත්තනිකායා, ඒ ඒ සත්වනිකායෙන්; යා චුති, යම් චුත වීමක් ඇද්ද; චවනතා, ජීවිතය ගැලවුන බවද; භෙදො, (පරමාර්ථ) වශයෙන් ස්කන්ධයන්ගේ බිඳීමද; අන්තරධානං, (රූප ස්කන්ධාදීන්ගේ) අතුරුදන් වීමද; මච්චුමරණං, සම්මුති මරණින් මිය යාමද; කාලකිරියා, මරණ කාලක්‍රියාවද; කලෙබරස්ස, ශරීරයාගේ; නික්ඛෙපො, දැමීමක් ඇද්ද; ආවුසො, ඇවැත්නි; ඉදං, මේ කාරණය තෙම; මරණං වුච්චති, මරණ යයි කියනු ලැබේ.

කතමාචාවුසො සොකො, යො බො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස, සොකො සොචනා සොචිතත්තං, අන්තො සොකො අන්තො පරිසොකො අයං වුච්චතාවුසො සොකො, කතමොචාවුසො පරිදෙවො, යො බො ආවුසො අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස, අඤ්ඤතරඤ්ඤ

---

ආවුසො, ඇවැත්නි; සොකො, ශෝකය තෙම; කතමොච, කවරේද? ආවුසො, ඇවැත්නි; අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන (නොයෙක් ප්‍රභෙද ව්‍යසනයන් අතුරෙන්) එක්තරා ව්‍යසනයකින්; සමන්නාගතස්ස, (වැලඳ ගැන්මෙන්) යුක්තවූ සත්ත්වයාගේද; අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ ධම්මෙන, (හිරගෙයි වැටීම් බැඳුම් ලැබීම් ආදීවූ) නානාප්‍රකාරවූ දුක් ස්වභාවන් අතුරෙන් එක්තරා එකක් විසින්; ඵුට්ඨස්ස, ස්පර්ශකොට වැළඳ ගත්තාහුගේ; යො බො සොකො, යම් ශොක කිරිමෙක් ඇද්ද; සොචනා, (ශරීරාභ්‍යන්තරය වියලන ස්වභාවෙන්) ශොක කරන, බවය; සොචිතත්තං, ශොක කළ බවය; අන්තො සොකො, (මුඛ නාසා කන් සිදුරු ආදි) ශරීරාභ්‍යන්තරය වියලන ස්වභාව වූ; අන්තො පරිසොකො, ශරීරාභ්‍යන්තරය හාත්පසින් වියලන ලද ස්වභාව වූ යමක් වේද; ආවුසො, ඇවැත්නි ; අයං, මේ තෙම; සොකො වුච්චති, ශොකයයි කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; පරිදෙවො, පරිදෙවය තෙම; කතමොච, කවරේද; ආවුසො, ඇවැත්නි; අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස, (ඤාතිව්‍යසනාදී) නානාප්‍රකාර ව්‍යසනයන් අතුරෙන් එක්තරා ව්‍යසනයකින් සමන්විතවූ සත්ත්වයාගේද; අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස, එක්තරා කිසි දුකම

තරෙන දුක්ඛ ධම්මෙන ඵුට්ඨස්ස, ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං, පරිදෙවිතත්තං, අයං වුච්චතාවුසො පරිදෙවො;

කතමඤ්චාවුසො දුක්ඛං, යං ඛො ආවුසො කායිකං දුක්ඛං කායිකං අසාතං කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිත, ඉදං වුච්චතා-වුසො දුක්ඛං, කතමඤ්චාවුසො දොමනස්සං, යං ඛො ආවුසො චෙතසිකං දුක්ඛං අසාතං, මනො

---

කාරණයකින් යට කරන ලද පුද්ගලයාගේද; යො ඛො ආදෙවො, (නම් පමණක් කියා හැඬීම වූ) යම් ආදෙවයක් ඇද්ද; පරිදෙවො, (ගුණ වර්ණනා කොට) හැඬීම වූ පරිදෙවය; ආදෙවනා, (ගුණ වර්ණනා කොට) හැඬීමය; ආදෙවිතත්තං, (නම් කියා) හැඬීමේ ස්වභාවය; පරිදෙවිතත්තං, (ගුණ වර්ණනා කොට) හැඬීමේ ස්වභාවය; යන යමෙක් ඇද්ද; ආවුසො, ඇවැත්නි; අයං, මේ තෙම; පරිදෙවො වුච්චති, පරදෙව යයි කියනු ලැබේ.

ආවුසො, ඇවැත්නි; දුක්ඛං, දුක්ඛය; කතමඤ්ච, කවරේද? ආවුසො, ඇවැත්නි; යං ඛො කායිකං දුක්ඛං,යම් කයෙහි හටගත්තා වූ; දුකක් ඇද්ද; කායිකං, කයෙහි හටගන්නාවූ; අසාතං, නො මිහිරි වූ අප්‍රාසු කාරණය; කායස්මඵස්සජං, කය හා එක්ව ස්පර්ශ වීමෙන් උපන්නාවූ; අසාතං වෙදයිතං, කර්කශ වෙදනාව වූ; දුක්ඛං, දුකක් වේද? ඉදං, මේ කයෙහි උපන් දුක; දුක්ඛං වුච්චති, ස්වභාව යෙන්ම දුකයයි කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; දොමනස්සං, දෞර්මනස්‍යය; කතමඤ්ච, කවරේද? ආවුසො, ඇවැත්නි; චෙතසිකං, සිතෙහි හටගත්තා වූ; යං ඛො දුක්ඛං, යම්බඳු වූ දුකක් වේද;

සම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං
ඉදං වුච්චතාවුසො දොමනස්සං:

කතමො චාවුසො උපායාසො?
යො ඛො ආවුසො අඤ්ඤතරඤ්ඤ
තරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස
අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ
ධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපා–
යාසො ආයාසිතත්තං උපායා
සිතත්තං අයං වුච්චාවුසො උපා–
යාසො, කතමඤ්චාවුසො යම්පිච්ඡං

---

චෙතසිකං, සිතෙහි හටගත්තාවූ; අසාතං, අමධුර භාවයක් වේද; මනොසම්ඵස්සජං, සිතට (අමනොඥ අරමුණු ස්පර්ශවීමෙන් උපන්නා වූ; දුක්ඛං, දුකක් වේද; අසාතං; සැප නුවූ; වෙදයිතං, විඳීමක් වේද; ආවුසො, ඇවැත්නි, ඉදං, මේ තෙම; දොමනස්සං වුච්චති, දොම්නස යයි කියනු ලැබේ.

ආවුසො, ඇවැත්නි; උපායාසො, උපායාසය තෙම; කතමො ච, කවරේද? ආවුසො, ඇවැත්නි; අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන, (ඥාති ව්‍යසනාදි නානාප්‍රකාර ව්‍යසනයන් අතුරෙන්) එක්තරා යම් ව්‍යසනයකින් යුක්ත වූවහුගේද; අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන, එක්තරා යම් දුක් ස්වභාවයකින්; ඵුට්ඨස්ස, යට කරන ලද්දහුගේ; ආයාසො, (ක්ලාන්ත ස්වභාව වූ) ආයාසයෙක් ඇද්ද; උපායාසො, බලවත් ආයාසයෙක් ඇද්ද; ආයාසිතත්තං, ක්ලාන්තවූ ස්වභාවය; උපායාසිතත්තං, දැඩි ක්ලාන්තවූ ස්වභාවය; ආවුසො, ඇවැත්නි; අයං, මේ තෙම; උපායාසො, උපායාසයයි; වුච්චති, කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; යම්පිච්ඡං, යම් කැමති දෙයක්; න

න ලභති තම්පි දුක්ඛං? ජාති ධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති, අහො වත මයං න ජාති ධම්මා අස්සාම, නච වත නො ජාති ආගච්ඡෙය්‍යාති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

ජරාධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති, අහො වත මයං න ජරාධම්මා අස්සාම, නච වත නො ජරා ආගච්ඡෙය්‍යාති, න

---

ලභති, නොලබාද; තම්පි දුක්ඛං, හෙ ද දුක් වන්නේය යනු: කතමඤ්ච, කවරේද? ආවුසො, ඇවැත්නි; ජාති ධම්මානං, සසර නොයෙක් ජාතිවල පිළිබඳ ගන්නා ස්වභාව ඇත්තාවූ; සත්තානං, සත්වයන්ට; එවං, මෙසේ; ඉච්ඡා, තණ්හාවක්; උප්පජ්ජති, උපදී; (කෙසේ ද?) මයං, අපි; න ජාතිධම්මා අස්සාම, භවයෙහි උපදින ස්වභාව නැත්තෝ වන්නමු නම්; නො, අපට; වත, ඒකාන්තයෙන්; ජාති, භවයෙහි හටගැන්ම; නච ආගච්ඡෙය්‍ය, නොම එන්නෙ නම්; අහො වත, ඉතා යෙහෙක; (යත) එතං, මේ කාරණය; ඉච්ඡාය, කැමැත්තෙන්; නඛොපන පත්තබ්බං, පැමිණිය හැකි නොවේ; ඉදම්පි, මේද; යම්පිච්ඡං න ලභති, ආසා කරන ලද යමක් නොලබාද; තම්පි දුක්ඛං, හෙද දුක් වන්නේය.

ආවුසො, ඇවැත්නි; ජරාධම්මානං, ජරාව ස්වභාව කොට ඇත්තාවූ; සත්තානං, ප්‍රාණීන්ට; එවං ඉච්ඡා, මෙසේ ආසාවක්; උප්පජ්ජති, උපදනේය; මයං, අපි; න ජරාධම්මා අස්සාම, ජරා ස්වභාව කොට ඇති නොවෙමු නම්; නො, අපට; වත, ඒකාන්ත යෙන්; නච ජරා ආගච්ඡෙය්‍ය, ජරාව නො එන්නේ නම්; අහො

ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, ව්‍යාධිධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති, අහො වත මයං න ව්‍යාධිධම්මා අස්සාම, නච වත නො ව්‍යාධි ආගච්ඡෙය්‍යාති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

මරණධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති, අහො

---

වත, ඉතා යෙහෙක; එතං, මේ කාරණය ඉච්ඡාය, කැමැත්තෙන් නොහොත් ආසාවෙන්; න ඛො පන පත්තබ්බං, නො පැමිණිය හැක්කේය; ඉදම්පි, මේද; යම්පිච්ඡං කැමැති වූ යමක්; න ලභති නොලබා නම්; තම්පි දුක්ඛං, ඔහෙද දුක් වන්නේය; ආවුසො, ඇවැත්නි; ව්‍යාධිධම්මානං, රොග ඇතිවීම සවභාව කොට ඇත්තාවූ; සත්තානං, සත්වයන්ට; එවං, මෙසේ; ඉච්ඡා, කැමැත්තක්; උප්පජ්ජති, උපදී; මයං, අපි න ව්‍යාධිධම්මා අස්සාම, රොග සවභාව කොට ඇත්තෝ නොවමු නම්; නො, අපට; වත, එකාන්තයෙන්; නච ව්‍යාධි ආගච්ඡෙය්‍ය, ව්‍යාධියක් නොම පැමිණෙන්නේ නම්; අහො වත ඉති, ඉතා යෙහෙකැයි; එතං, මේ කාරණය; ඉච්ඡාය ආසාවෙන්, න ඛො පන පත්තබ්බං, නො පැමිණිය හැක්කේමය; ඉදම්පි, මෙද; යම්පිච්ඡං න ලභති, යම් කැමති දෙයක් නො ලබාද; තම්පි දුක්ඛං, ඒත් දුක් වන්නේය.

ආවුසො, ඇවැත්නි; මරණධම්මානං, මැරීම සවභාවක් වශයෙන් ඇත්තාවූ; සත්තානං, සත්වයන්ට; එවං ඉච්ඡා, මෙසේ කැමැත්තක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; න මරණධම්මා අස්සාම, මරණ සවභාව

වත මයං න මරණධම්මා අස්සාම, නච වත නො මරණං ආගච්ඡෙය්‍යාති, න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං, ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

සොකපරිදෙව දුක්ඛදෙමනස්සුපායාසධම්මානං ආවුසො සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති, අහො වත මයං න සොකපරිදෙව දුක්ඛදෙමනස්සුපායාසධම්මා අස්සාම, නච වත නො සොකපරිදෙව දුක්ඛදෙමනස්සුපායාසා ආගච්ඡෙය්‍යුන්ති, න ඛො පනෙතං

---

නැතිවමු නම්; නො, අපට; වත, එකාන්තයෙන්; මරණං, මරණය; නච ආගච්ඡෙය්‍ය, නො පැමිණෙන්නේ නම්; අහො වත ඉති, ඉතා යෙහෙකැයි; එතං, මේ කාරණය; ඉච්ඡාය, ආසාවෙන්; න ඛො පත පත්තබ්බං, නො පැමිණිය හැක්කේමය; ඉදම්පි, මේද; යම්පිච්ඡං න ලභති, යම් කැමති දෙයක් නොලබාද; තම්පි දුක්ඛං, ඒත් දුක් වන්නේය.

ආවුසො, ඇවැත්නි; සොකපරිදෙවදුක්ඛ දෙමනස්සුපායාස ධම්මානං, සොක හැඬුම් කායික දුක් දෙම්නස් දැඩි ආයාස ස්වභාව යන් ඇත්තාවූ; සත්තානං, සත්ත්වයන්ට; එවං, මෙසේ; ඉච්ඡා, ආසාවක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; න සොකපරිදෙවදුක්ඛ දෙමනස්සුපායාසධම්මා අස්සාම, සොක හැඬුම් දුක් දෙම්නස් දැඩි ආයාස ස්වභාවයන් ඇත්තෝ නොවමු නම්; නො, අපට; සොක පරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා, සොක විලාප දුක් දෙම්නස් දැඩි

ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං
න ලභති තම්පි දුක්ඛං, කතමා
චාවුසො සංඛිත්තෙන පඤ්චුපාදා-
නක්ඛන්ධා දුක්ඛා? සෙය්‍යථීදං, රූපූ
පාදානක්ඛන්ධො වෙදනූපාදා-
නක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො
සංඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූ
පාදානක්ඛන්ධො ඉමෙ වුච්චන්තා
වුසො සංඛිත්තෙන පඤ්චුපාදා
නක්ඛන්ධා දුක්ඛා, ඉදං වුච්චතාවුසො
දුක්ඛං අරියසච්චං.

---

ආශාසයෝ; නව වත ආගච්ඡෙය්‍යුං, නොමඑත්තාහු නම්; අහො වත ඉති, ඉතා යෙහෙකැයි; එතං, මේ කාරණය; ඉච්ඡාය, ආසා වෙන්; න ඛො පන පත්තබ්බං, නො පැමිණිය හැකිමය; ඉදම්පි මේද; යම්පිච්ඡං න ලභති, යම් කැමති දෙයක් නො ලබාද, තම්පි දුක්ඛං, හෙද දුක් වන්නේය; ආවුසො, ඇවැත්නි; සංඛිත්තෙන, සංක්‍ෂෙපයෙන්; පඤ්චුපාදානක්ඛන්ධා, පඤ්චවිධ උපාදානස්කන්ධයෝ; දුක්ඛා, දුක්ය; යනු කතමාච, කවරීද? සෙය්‍යථීදං, ඔහු කවරහුද යත්; රූපූපාදානක්ඛන්ධො, කෙලෙස් සහිත රූපස්කන්ධය(නොහොත්) සසර චුතව උපදනාවූ සතර මහාභූතාදී රූප රාශිය; වෙදනූපාදානක්ඛන්ධො, (සැප දුක් උපෙක්‍ෂා යන වෙදනා තුනක් වූ) කෙලෙස් සහිත වෙදනාස්කන්ධය; සඤ්ඤූපාදානක්ඛන්ධො; රූපසංඥාදී සංඥා රාශි වූ සංඥා උපාදානස්කන්ධය; සංඛාරූපදානක්ඛන්ධො, ඵස්සාදීවූ සංස්කාර උපාදානස්කන්ධය; විඤ්ඤාණූපාදානක්ඛන්ධො, (අර්ථයන් දන්නා සිත්වූ) කෙලෙස් සහිත විඥානස්කන්ධය; ආවුසො, ඇවැත්නි; සංඛිත්තෙන, සංක්‍ෂෙපයෙන්; දුක්ඛා, දුක්වූ පඤ්චුපාදානක්ඛන්ධා, පස් උපාදානස්කන්ධයෝ; ඉමෙ වුච්චන්ති, මොහු යයි කියනු ලැබෙත්; ආවුසො, ඇවැත්නි; ඉදං, මේ තෙම; දුක්ඛං අරියසච්චං, දුක්ඛාර්‍ය්‍යසත්‍යයයි; වුච්චති, කියනු ලැබේ.

කතමඤ්චාවුසො දුක්ඛසමුදයං අරියසච්චං? යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං, කාම තණ්හා භවතණ්හා විභවතණ්හා. ඉදං වුච්චතාවුසො දුක්ඛසමුදයං අරියසච්චං. කතමඤ්චාවුසො දුක්ඛ නිරොධං අරියසච්චං? යො තස්සා යෙව තණ්හාය අසෙසවිරාග

---

ආවුසො; ඇවැත්නි; දුක්ඛසමුදයං අරියසච්චං, දුක්ඛසමුදය නම්වූ ආය්‍ය්‍ය සත්‍යය; කතමඤ්ච, කවරේද? පොනොභවිකා; නැවත සංසාරයෙහි ඉපදීම කරන්නාවූ; නන්දිරාග සහගතා, සතුටුවන (නොහොත්) ඇලෙන රාගය සමග එකතුවූ; තත්‍ර තත්‍රාභි නන්දිනී, ඒ ඒ උපන් ආත්ම භාවයෙහි ඇල්ම කරන්නාවූ; යා අයං තණ්හා, යම් මේ තණ්හාවක් (නොහොත්) ආසාවක් වේද; සෙය්‍යථිදං, ඒ කවරේද? කාමතණ්හා, කාමරාග වශයෙන් පවත්නා තණ්හාවය; භවතණ්හා, භවයෙහි ඇල්ම නොහොත් (සදාකාලික බවක් සිතා ගත්) ශාස්වත දෘෂ්ටිය සමග පවත්නා ආසාවය; විභවතණ්හා, (සත්වයෙක් යම් භවයක මරණයට පත්වූ කල ඉන් මතු උත්පත්ති යක් නැත යන දෘෂ්ටියෙන් ඒ භවයෙහි සැප විඳීමට ආසා කළාවූ) උච්ඡේද දෘෂ්ටිය සමග පවත්නා ආසාවය.

ආවුසො, ඇවැත්නි; ඉදං, මෙය; දුක්ඛසමුදයං අරියසච්චං, දුක්ඛ සමුදයාය්‍ය්‍ය සත්‍යයයි; වුච්චති, කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; දුක්ඛ නිරොධං අරියසච්චං, දුක්ඛනිරොධාය්‍ය්‍ය සත්‍යය; කතමඤ්ච, කවරේද? තස්සායෙව තණ්හාය, (කාමතණ්හාදි වශයෙන්) තුන් ආකාරවූ එම තණ්හාවගේ හෙවත් ආසාවගේ; යො අසෙසවිරාග නිරොධො, නිරවශෙෂවූ යම් නො ඇලීමෙන් (හෝ) ප්‍රහාණයෙන් නිරුද්ධ කිරීමක් වේද; චාගො, යම් ආලය ඇරීමක් වේද; පටිනිස්සග්ගො, සර්‍වාකාරයෙන් නිශ්ශෙෂ කොට ඒ ආලයාගේ

නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, ඉදං වුච්චතාවුසො දුක්ඛනිරොධං අරියසච්චං.

කතමඤ්චාවුසො දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං? සම්මාදිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි,

දුරලීමක් වේද; මුත්ති, ඒ ආලයාගේ මිදීමක් (හෙවත්) එයින් ගැලවීමක් වේද; අනාලයෝ, යම් ආලය නැතිවීමෙක් ඇද්ද; ආවුසො, ඇවැත්නි; ඉදං, මේ; දුක්ඛනිරොධං අරියසච්චං, දුක් නැති කිරීම වූ ආය්‍ය සත්‍යයයි; වුච්චති; කියනු ලැබේ.

ආවුසො, ඇවැත්නි; දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං, දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාසී සත්‍යය තෙම; කතමඤ්ච, කවරේද? අයං එව, මෙම; අරියො, උතුම්වූ; අට්ඨඞ්ගිකො, අඞ්ග අටක් ඇත්තාවූ; මග්ගො, මාර්ගයයි; සෙය්‍යථීදං, ඒ කවරේද? සම්මාදිට්ඨි, (මිථ්‍යාදෘෂ්ටියට විරුඬවූ) සම්‍යක් දෘෂ්ටිය හෙවත් මනාකොට නුවණින් දක්මය; සම්මාසංකප්පො, (මිථ්‍යා සංකල්පනාවට විරුඬවූ) සම්‍යක් සංකල්පනාවය හෙවත් යහපත් කොට කල්පනා කිරීමය; සම්මාවාචා, සම්‍යක්වචනය හෙවත් මනාකොට වචන කීමය; සම්මාකම්මන්තො, සම්‍යක් කර්මාන්තය හෙවත් මනාකොට කයින් ක්‍රියා කිරීමය; සම්මාආජීවො, සම්‍යක් ආජීවය හෙවත් ජීවිකාව යහපත් සේ පැවැත්මය; සම්මාවායාමො, සම්‍යක් ව්‍යායාමය හෙවත් මනාකොට උත්සාහ කිරීමය; සම්මාසති, (සිහිමුලා නොව මනාකොට සිහි කිරීමය; සම්මාසමාධි, මනාකොට සිත එකඟ කිරීමය යන මේයි;

කතමාචාවුසො <u>සම්මාදිට්ඨි?</u> යං ඛො ආවුසො දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනිපටිපදාය ඤාණං, අයං වුච්චතාවුසො සම්මාදිට්ඨි.

කතමොචාවුසො <u>සම්මාසංකප්පො</u>, නෙක්ඛම්මසංකප්පො අව්‍යාපාදසංකප්පො අවිහිංසාසංකප්පො අයං වුච්චතාවුසො සම්මාසංකප්පො.

---

ආවුසො, ඇවැත්නි, සම්මාදිට්ඨි, සම්‍යක් දෘෂ්ටි තොමෝ; කතමාච, කවරීද? ආවුසො, ඇවැත්නි; යං ඛො දුක්ඛෙ ඤාණං, දුක කෙරෙහි මේදුකයයි යම් දැනීමක් වේද; දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛසමුදය කෙරෙහි (මේ දුක් ඉපදීමය යන දැනීමක් වේද? දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධය කෙරෙහි (මේ දුක් නැති වීමය යන යම්) දැනීමක් වේද? දුක්ඛනිරොධගාමිනියාපටිපදාය ඤාණං, දුක් නිරුඬ කිරීමට යන පිළිපැදීමෙහි (මේ පිළිපැදීමය යන යම්) දැනීමක් වේද; ආවුසො, ඇවැත්නි; අයං, මෝතොමෝ; සම්මාදිට්ඨි වුච්චති, සම්‍යක් දෘෂ්ටිය යයි කියනු ලැබේ.

ආවුසො, ඇවැත්නි; සම්මාසංකප්පො, සම්‍යක් සංකල්පනාව; කතමාච, කවරේද? නෙක්ඛම්මසංකප්පො, (ගිහිගෙන් නික්මීමෙහි හෙවත් පඤ්චකාම සෙවනයෙන් බැහැර යාමෙහි පැවති) නෛෂ්ක්‍රම්‍ය සංකල්පනාවය; අව්‍යාපාද සංකප්පො, අනුන් කෙරෙහි වෛර රහිතව අන්‍යයෝ සැපසේ ජීවත් වෙත්වයි සිතන අව්‍යාපාද සංකල්පනාවය; අවිහිංසා සංකප්පො, (සත්ව හිංසා වැලකීමෙහි පැවති) අවිහිංසා සංකල්පනාවය; ආවුසො, ඇවැත්නි; අයං, මේ;

කතමාචාවුසොසම්මාවාචා? මුසාවාදා වෙරමණී පිසුණාවාචා වෙරමණී ඵරුසාවාචා වෙරමණී සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චතාවුසො සම්මාවාචා. කතමොචාවුසො සම්මාකම්මන්තො? පාණාතිපාතාවෙරමණී අදින්නාදානාවෙරමණී කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, අයං වුච්චතාවුසො සම්මාකම්මන්තො. කතමොචාවුසො සම්මාආජීවො, ඉධාවුසො අරියසාවකො මිච්ඡා ආජීවං

සම්මාසංකප්පො, සම්‍යක් සංකල්පනාවයයි; වුච්චති, කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; සම්මාවාචා, සම්‍යක් වචනය; කතමාච, කවරිද? මුසාවාදා වෙරමණී, බොරු කීමෙන් වැලකීමය; පිසුනාවාචා වෙරමණී, කේලාම් කීමෙන් වැලකීමය; ඵරුසාවාචා වෙරමණී, අනුන් ගටා රළු වචන කීමෙන් වැලකීමය; සම්ඵප්පලාපා වෙරමණී, තුච්ඡවූ මිථ්‍යා කථා කිරීමෙන් වැලකීමය; ආවුසො, ඇවැත්නි; අයං, මේතොමේ; සම්මාවාචා වුච්චති, සම්‍යක් වචනයයි කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; සම්මාකම්මන්තො, සම්‍යක් කර්මාන්තය; කතමොච, කවරේද? පාණාතිපතා වෙරමණී, සතුන් දිවි නැසීමෙන් වැලකීමය; අදින්නාදනා වෙරමණී, අදත්තාදනයෙන් වැලකීමය; කාමෙසුමිච්ඡාචරා වෙරමණී, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකීමය; අයං, මේ තෙම; සම්මාකම්මන්තො, සම්‍යක් කර්මාන්තයයි; වුච්චති, කියනු ලැබේ.

ආවුසො, ඇවැත්නි; සම්මාආජීවො, සම්‍යක් ආජීවය නම්; කතමොච, කවරේද? ආවුසො, ඇවැත්නි; ඉධ, මේ ශාසනයෙහි; අරියසාවකො, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම; මිච්ඡාආජීවං පහාය, (පූපයෙන්

පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චතාවුසො සම්මා ආජීවො. කතමො චාවුසො සම්මා වායාමො, ඉධාවුසො භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.

උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං

උපයන ලද දෙසිති කරන වරදවූ ආජීවය හැර; සම්මාආජීවෙන, නිවරදවූ ආජීවයෙන්; ජීවිකං කප්පෙති, ජීවිකාව කෙරෙයි; ආවුසො, ඇවැත්නි; අයං, මේ; සම්මාආජීවො, සම්‍යග් ආජීවයයි; වුච්චති, කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; සම්මාවායාමො, සම්‍යක් ව්‍යායාමය; කතමො ච, කවරේද? ආවුසො, ඇවැත්නි; ඉධ, මේ ශාසනයෙහි, භික්ඛු, මහණතෙම; අනුප්පන්නානං, නූපන්නාවූ පාපකානං, ලාමකවූ; අකුසලානං ධම්මානං, අකුශල ධර්‍මයන්ගේ අනුප්පාදාය, නො ඉපදීම පිණිස; ඡන්දං ජනෙති, (ඒ ඒ පාපධර්‍මය නූපදනා පිළිවෙත් පිරිමට) ආලය උපදවන්නේය; වායමති, ඊට නිසි ව්‍යායාම කරන්නේය; විරියං ආරභති, (එබඳුවූ අකුසල් තමා කරා නොපැමිණෙන ලෙස) වීර්‍ය්‍ය පවත්නේය; චිත්තං පග්ගණ්හාති, (මූලා ජනයන් සේ සිතට විසඟ නොව වීර්‍ය්‍ය කිරීමෙන්) චිත්තපරිග්‍රහණය කරන්නේය; පදහති, ඒකාන්තයෙන් සම් නහර ඇට පමණක් ඉතිරිව ශරීරයෙහි සෙසු ලේ මස් වියලී යතුදු මේ වීර්‍ය්‍ය නො හරිමියි ඉටාගෙන කළමනා වීර්‍ය්‍ය පවත්නේය.

උප්පන්නානං, (සමුදාචාර වශයෙන් තමන්ට) උපන්නාවූ පාපකානං, ලාමකවූ; අකුසලානං ධම්මානං, අකුශල ධර්‍මයන්ගේ; පහානාය, ප්‍රහාණය පිණිස හෙවත් නැසීම පිණිස; ඡන්දං ජනෙති;

ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.

උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීය්‍යොභා

---

ඒ ඒ පාපකර්මය නූපදනා පිළිවෙත් පිරිමට ආලය උපදවන්නේය; වායමති, ඊට නිසි ව්‍යායාම කරන්නේය; විරියං ආරභති, එබඳු අකුසල් තමා කරා නො පැමිණෙන ලෙස වීර්‍ය්‍ය පවත්වන්නේ; චිත්තං පග්ගණ්හාති, මූලා ජනයන් සේ සිතට වසඟ නොව වීර්‍ය්‍ය කිරීමෙන් චිත්තපරිග්‍රහණය කරන්නේය; පදහති, ඒකාන්තයෙන් සම් නහර ඇට පමණක් ඉතිරිව ශරීරයෙහි සෙසු ලේ මස් වියලී යතුදු මේ වීර්‍ය්‍යය නො හරිමියි ඉටාගෙන කළමනා වීර්‍ය්‍ය පවත් වන්නේය; අනුප්පන්නානං, තමා කෙරෙහි නූපන්නාවූ; කුසලානං ධම්මානං, ප්‍රථම ධ්‍යානාදි කුසල ධර්මයන්ගේ; උප්පාදාය; ඉපදීම පිණිස; ඡන්දං ජනෙති, යම් ප්‍රකාරයකින් ප්‍රථම ධ්‍යානාදී ඒ නූපන් කුසලධර්මයන්ගේ ප්‍රතිලාභය වේද එසේ වූ පිළිවෙත් සාධකං ආලය කරන්නේය; වායමති, ව්‍යායාම කරන්නේය; විරියං ආරභති, එම කුසලධර්මයන් උපදවා ගැනීමට නිසි පිළිවෙත් සාධක වීර්‍ය්‍ය සිත්හි පවත්වන්නේය; වායමති, ව්‍යායාම කරන්නේය; විරියං ආරභති, වීර්‍ය්‍ය සිත්හි පවත්වන්නේය; චිත්තං පග්ගණ්හාති, වීර්‍ය්‍ය කිරීමෙන් චිත්තපරිග්‍රහණය කරන්නේය; පදහති, දෘඪතර වූ වීර්‍ය්‍ය සමාදාන යෙන් යෙදී එම කුසලධර්මයන්ගේ ප්‍රතිලාභයට කළමනා වීර්‍ය්‍ය කරන්නේය.

උප්පන්නානං, තමාගේ සන්තානයෙහි උපන්නාවූ; කුසලානං ධම්මානං, ප්‍රථමධ්‍යානාදී කුසලධර්මයන්ගේ; ඨිතියා, සිටීමට හෙවත් ස්ථිර කොට තමා කෙරෙහි පිහිටුවා ගන්නා පිණිස; අසම්මොසාය,

භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අයං වුච්චතාවුසො සම්මාවායාමො.

කතමාචාවුසො සම්මාසති? ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොම-

---

එම කුසලධර්මයන්ගේ විනාශ නොවීම පිණිස; භිය්‍යොභාවාය, වඩ වඩා වර්‍ධනය වීම පිණිස; වෙපුල්ලාය, විපුලව පතළවීම පිණිස; භාවනාය, භාවනාවගේ; පාරිපූරියා, පරිපූර්‍ණත්වය පිණිස; ඡන්දං ජනෙති, එම කුසලධර්මයන්ගේ සපිතියට නිසි පිළිවෙත් සාධක ආලය උපදවන්නේය; වායමති, එසේම කුසල ධර්මයන්ගේ සපිතියට නිසි ව්‍යායාම කරන්නේය; විරියං ආරභති, ඊට කළමනා වීර්‍ය්‍ය පටන් ගන්නේය; චිත්තං පග්ගණ්හාති, වීර්‍ය්‍ය කරණයෙන්ම චිත්තය අල්වා ගන්නේය; පදහති, ඉතා දැඩි සමාදානයෙන් වීර්‍ය්‍ය කරන්නේය; ආවුසො, ඇවැත්නි; අයං, මේ; සම්මාවායාමො වුච්චති, සම්‍යක් ව්‍යායාම යයි කියනු ලැබේ.

ආවුසො, ඇවැත්නි; සම්මාසති, සම්‍යක් සිහිය නම්; කතමාච, කවරීද? ආවුසො, ඇවැත්නි; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, සසර භය දක්නා යම්කිසි මහණෙක් තෙම; කායෙ, චුද්දසවිධ කායගතානුස්මෘති භාවනාවෙහි; ආතාපී, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව; සම්පජානො, සම්පජඤ්ඤ සඞ්ඛ්‍යාතවූ නුවණින් යුක්තව; සතිමා, කායපරිග්‍රාහක සිහියයි කියන ලද ශරීරයාගේ අසාර අසුභ වශයෙන් කය සිහි කරන්නාවූ සිහියෙන් යුක්ත වූයේ; ලොකෙ, ලුජ්ජන පලුජ්ජනාර්ථයෙන් ලොක නම්වූ මේ ශරීරයෙහි; අභිජ්ඣා, කාමච්ඡන්දයයි කියන ලද ලොභයද; දොමනස්සං, ව්‍යාපාදයයි කියන

**නස්සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං.**

**චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපිසම්පජානො සතිමාවිනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්සං,**

---

ලද නොසතුටු බවද යන මේ පාපධර්‍මයන්; විනෙය්‍ය, අනිත්‍යාදී නොයෙක් ආදීනව කාරණ සිහි කිරීමෙන් පාපයට අවකාශ නොදී සංසිඳුවාගෙන; කායානුපස්සී විහරති, කායගතාසති භාවනාව, සිත්හි කරමින් වාසය කරන්නේය; වෙදනාසු, සුඛ දුක්ඛ උපෙක්ෂා වශයෙන් නොයෙක් ප්‍රකාරවූ වෙදනාවන් කෙරෙහි; ආතාපී, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇති; සම්පජානො, සම්පජඤ්ඤ නම් ලද ඤාණයෙන් යෙදීමෙන් වාසය කරන්නාවූ; සතිමා, වෙදනා පරිග්‍රාහක සිහියයි කියන ලද සුව දුක් ආදී නොයෙක් වෙදනාවන් ගේම එකාකාරව නොසිට වහා බිඳී යාමෙන් දියබුබුලු සේ අස්ථිර වූ එකාකාරව නොපවත්නා ස්වභාව සිහි කරන්නාවූ සිහියෙන් යුක්ත වූ තැනැත්තේ; ලොකෙ, ලොකයෙහි; අභිජ්ඣා, ලොභයද; දෙමනස්සං, දෞර්මනස්‍යයද; විනෙය්‍ය, හැර, වෙදනානුපස්සී විරහති, වෙදනානුපස්සනාව සිත්හි කරමින් වාසය කරන්නේය.

චිත්තෙ, රාග ද්වේෂ මොහාදී නොයෙක් ප්‍රභෙද ඇති චිත්තයෙහි ආතාපී,කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ; සම්පජානො, සම්පජඤ්ඤ සංඛ්‍යාත ඤාණයෙන් සමන්විත වූයේ; සතිමා, චිත්තපරිග්‍රාහක සිහියයි කියන ලද චිත්තයාගේ ස්වභාවාදීනව සිහි කරන්නාවූ සිහියෙන් යුක්තව වාසය කරන තැනැත්තේ; ලොකෙ, ඇතිව නැතිවන විශෙෂයෙන්ම නැතිවන කාරණය හෙතුකොට ගෙන ලුජ්ජන පලුජ්ජනාර්ථයෙන් ලොක නම් ලද චිත්ත ලොකයෙහි; අභිජ්ඣා, කාමච්ඡන්දයයි කියන ලද ලොභයද; දෙමනස්සං, නොසතුටු බවද යන මේ පාපධර්‍මයන්; විනෙය්‍ය, තදඞ්ගවිෂ්කම්භන වශයෙන් සංසිඳුවාගෙන;චිත්තානුපස්සී විහරති,චිත්තයාගේ ස්වභාවාදීනව සිහි කරන භාවනාව මෙනෙහි කරමින් වාසය කරන්නේය.

ධම්මෙසු ධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං. අයං වුච්චතාවුසො සම්මාසති./ කතමා චාවුසො සම්මාසමාධි, ඉධාවුසො භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති.

---

ධම්මෙසු, පඤ්චනීවරණ ධර්මයන් ආදීවූ ධර්මයන් කෙරෙහි; ආතාපී, කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇති; සතිමා, සිහියෙන් සමන්විත වූයේ; සම්පජානො, සම්පජඤ්ඤයයි නම් ලද ඥානයෙන් යුක්ත වූයේ; ලොකෙ, යථොක්තාර්ථයෙන් ලොකයයි ලද නම් ඇති නීවරණාදී ධර්ම ලොකයෙහි; අභිජ්ඣා, කාමච්ඡන්දයයි නම් ලද ලොභයද; දොමනස්සං, ව්‍යාපාද යයි නම් ලද නොසතුටු බවද යන මේ පාපධර්මයන්; විනෙය්‍ය, සංසිඳුවා නිශ්චලව හිඳ; ධම්මානුපස්සී විහරති, නීවරණාදී ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවාදිතව සිහි කරන ධර්මානුස්මෘති භාවනාව සිහි කරමින් වාසය කරන්නේය; ආවුසො, ඇවැත්නි; අයං, යථොක්ත මේ කාරණා තොමෝ; සම්මාසති වුච්චති, සම්‍යක් සිහියයි කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; සම්මා සමාධි, සම්‍යක් සමාධිය; කතමා ච, කවරීද? ආවුසො, ඇවැත්නි; ඉධ, මේ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; කාමෙහි, පඤ්චකාම ගුණයන්ගෙන්; විවිච්ච එව, වෙන්වම; අකුසලෙහි ධම්මෙහි, අකුසල ස්වභාවයන්ගෙන්; විවිච්ච, වැලක; සවිතක්කං, විතර්ක සහිත වූ; සවිචාරං, විචාර සහිත වූ; විවෙකජං, නීවරණයන් කෙරෙන් සිත දුරුවීමෙන් හුදකලා වූ විවෙක හෙතුවෙන් උපන්නාවූ; පීතිසුඛං, කය සිත පිනවීම වූ ප්‍රීතිය හා සැප ඇත්තාවූ; පඨමජ්ඣානං, පළමුවෙනි ධ්‍යානයට; උපසම්පජ්ජ, තමාගේ සන්තානයෙහි ඉපදීම් වශයෙන් පැමිණ; විහරති, වාසය කෙරේ.

විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො, සුඛං ච කායෙන පටිසංවෙදෙති, යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති.

---

විතක්කවිචාරානං, විතර්ක විචාර යන දෙදෙනාගේ; වූපසමා, සංසිඳවීමෙන්; අජ්ඣත්තං සම්පසාදනං, කිසිසේත් සිත ඇලීමක් නැති හෙයින් තමා තුළ සිත පැදීම කරන්නාවූ; චෙතසො එකොදිභාවං, චිත්තයාගේ එකඟ බව හෙවත් එකසීමාවෙහි පවත්නා බවක් වූ; අවිතක්කං, විතර්ක නැත්තාවූ; අවිචාරං, විචාර නැත්තාවූ; සමාධිජං, සිත එකඟ කිරීම වූ සමාධියෙන් උපන්නාවූ, පීතිසුඛං, සිත කය පිනායාම හා සැප ඇති; දුතියජ්ඣානං, දෙවෙනි ධ්‍යානයට; උපසම්පජ්ජ, සන්තානයෙහි ඉපදීමෙන් පැමිණ; විහරති, ධ්‍යානයට සුදුසු වූ ඊර්‍ය්‍යාපථයෙන් වාසය කෙරේ; පීතියාච, ප්‍රීතියගේද; විරාගා, විරාගයෙන් හෙවත් එහි නො ඇලීමෙන්; උපෙක්ඛකොච, මධ්‍යස්ථ ස්වභාව ඇතිවද; විහරති, වාසය කෙරේ; සතොච, සිහි ඇත්තේද; සම්පජානො, නුවණැත්තේද; සුඛංච, සුවයද; කායෙන, කයින්; පටිසංවෙදෙති, විඳී; යං, යම්බඳු වූ ඒ තුන්වෙනි ධ්‍යාන යුක්තවූ පුද්ගලයා; උපෙක්ඛකො, පක්ෂයක නොපැවැත්මෙන් මධ්‍යස්ථ වූයේ; සතිමා, සිහි ඇත්තේ; සුඛවිහාරි ඉති, සැප විහරණ ඇත්තේයයි; අරියා, ආර්‍ය්‍යයෝ; ආචික්ඛන්ති, කියත්ද; තං තතියජ්ඣානං, ඒ තුන්වෙනි ධ්‍යානයට; උපසම්පජ්ජ, පැමිණ; විහරති, වාසය කෙරේ.

සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා, පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්ථංගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති, අයං වුච්චතාවුසො සම්මාසමාධි, ඉදං වුච්චතාවුසො දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං, තථාගතෙන ආවුසො අරහතා සම්මාසම්බුද්ධෙන, බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං.

---

සුඛස්ස ච පහාණා, කයෙහි හටගත්තා සැපය පහකිරීමෙන්ද; දුක්ඛස්ස ච පහාණා, කය හටගත්තා දුක නැති කිරීමෙන්ද; පුබ්බෙව, පූර්වයෙහිම; සොමනස්ස දොමනස්සානං, සොම්නස් දොම්නස් දෙදෙනාගේ; අත්ථංගමා, නැති වීමෙන්; අදුක්ඛං, දුක් නුවූ; අසුඛං, සැපනුවූ; උපෙඛා සතිපාරිසුද්ධිං, අපක්ෂපාත සිහියෙන් පිරිසිදු බැව් ඇත්තාවූ; චතුත්ථජ්ඣානං, සතරවෙනි ධ්‍යාන කුසල චිත්තයට; උපසම්පජ්ජ, පැමිණ, විහරති, ඊට යොග්‍යවූ ඊර්‍ය්‍යාපථයෙන් යුක්තව වාසය කෙරේ; ආවුසො, ඇවැත්නි; අයං, මේ ධර්මයතෙම; සම්මාසමාධි වුච්චති, සම්‍යක් සමාධියයි කියනු ලැබේ; ආවුසො, ඇවැත්නි; ඉදං, මේ ධර්මය තෙම; දුක්ඛනිරොධගාමිනිපටිපදා අරිය සච්චං, දුක් නිරුද්ධ කිරීමට පමුණුවන්නාවූ ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යයි කියනු ලැබේ.

ආවුසො, ඇවැත්නී; අරහතා, අර්හත් නම්වූ; සම්මාසම්බුද්ධෙන, සම්‍යක් සම්බුද්ධ වූ; තථාගතෙන, තථාගත නම්වූ බුදුරජානන් වහන්සේ විසින්; බාරාණසියං, බාරාණ නදිය යන ගඞ්ගාද්වයකින් සමලඞ්කෘත හෙයින් බාරාණසී නම්වූ; මිගදායෙ, මිගදාය නම් ලද;

අප්පතිවත්තියං, සමණෙන වා බ්‍රාහමණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං, යදිදං ඉමෙසං චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මන්ති, ඉදම වොචායස්මා සාරිපුත්තො, අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

සච්චවිභඞ්ග සුත්තං.

---

ඉසිපතනෙ, ඉසිපතනාරාමයෙහිදී; සමණෙන වා, ශ්‍රමණයකු විසින් හෝ; බ්‍රාහමණෙන වා, බ්‍රාහමණයක් විසින් හෝ; දෙවෙන වා, දෙවියකු විසින් හෝ; මාරෙන වා, මාරයකු විසින් හෝ; ලොකස්මිං, ත්‍රිවිධ ලොකයෙහි; කෙනචි වා, කිසිවෙකු විසින් හෝ; අප්පතිවත්තියං, නොපැවැත්විය හැක්කාවූ; අනුත්තරං, නිරුත්තරවූ ධම්මචක්කං, ධර්මචක්‍රය; පවත්තිතං, පවත්වන ලදී; යං ඉදං; යම්බඳු වූ; ඉමෙසං චතුන්නං අරියසච්චානං, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ; ආචික්ඛනා, වැදූරීමද; දෙසනා, දෙශනා කිරීමද; පඤ්ඤපනා, දුක්ඛ සත්‍යාදීන්ගේ දැක්වීමද; පට්ඨපනා, තැබීමද; විවරණා, විවෘත කිරීමද; විභජනා, විභජනා, විභාග කිරීමද; උත්තානීකම්මං ඉති, ප්‍රකට කිරීමදැයි යන මේ ධර්මදෙශනාවයි; ආයස්මා, අයුෂ්මත් වූ; සාරිපුත්තො, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ; ඉදං, මේ යථොක්ත ධර්මය; අවොච, වදාළ සේක; අත්තමනා, සතුටු සිත් ඇත්තාවූ; තෙ භික්ඛූ, ඒ භික්ෂූහු; ආයස්මතො, ආයුෂ්මත් වූ; සාරිපුත්තස්ස, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ; භාසිතං, භාසිතය; අභිනන්දුං ඉති, සතුටින් පිළිගත්තාහුය.

සච්චවිභඞ්ග සූත්‍රයයි.

ආටානාටිය සුත්තං.

30. එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ, අථ ඛො චත්තාරො මහාරාජා මහතියා ච යක්ඛසෙනාය මහතියා ච ගන්ධබ්බසෙනාය මහතියා ච කුම්භණ්ඩසෙනාය මහතියා ච නාගසෙනාය චතුද්දිසං රක්ඛං ඨපෙත්වා චතුද්දිසං ගුම්බං ඨපෙත්වා චතුද්දිසං ඔවරණං ඨපෙත්වා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසං

මෙ, මා විසින්; එවං සුතං, මේ සූත්‍රධර්මය මෙසේ අසනලදී; එකං සමයං, එක් සමයෙක්හි, භගවා, භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ; රාජගහෙ, රජගහා නුවර; ගිජ්ඣකූටෙ පබ්බතෙ, ගිජ්ඣකූට පර්වතයෙහි; විහරති, වැඩ වාසය්කර වදරන සේක; අථ ඛො, එකල්හි; වතාහි; චත්තාරො මහාරාජා, ධ්‍රතරාෂ්ට්‍රාදී සතර වරම් මහරජදරුවෝ; මහතියා ච යක්ඛසෙනාය, මහත්වූ යක්ෂ සේනාවකින්ද; මහතියා ච ගන්ධබ්බසෙනාය, මහත්වූ ගන්ධර්ව සේනාවකින්ද; මහතියා ච කුම්භණ්ඩසෙනාය, මහත්වූ කුම්භාණ්ඩ සේනාවකින්ද; මහතියා ච නාගසෙනාය, මහත්වූ නාග සේනාවකින්ද; චතුද්දිසං, සිව්දිග; රක්ඛං ඨපෙත්වා, ශක්‍රදෙවේන්ද්‍රයාහට ආරක්ෂා පිහිටුවා; චතුද්දිසං, සිව්දිග; ගුම්බං ඨපෙත්වා, මහාබලසේනාව තබා; චතුද්දිසං, සිව්දිග; ඔවරණං ඨපෙත්වා, සේනාව තරයේලා සිටුවා; අභික්කන්තාය රත්තියා, පෙරයම් රෑ ඉක්මුණු කල්හි; අභික්කන්තවණ්ණා, මනොඥවූ ජවිවණ් ඇත්තෝ; කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා, ගිජ්ඣකූට පර්වතය මුලුල්ල හාත්පසින් බබුලුවා.

කමිංසු; උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, තෙපි ඛො යක්ඛා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ

---

භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන යම් තැනෙක්හිද; තෙන එතැනට; උපසංකමිංසු, එළඹියාහුය; උපසංකමිත්වා, එළැඹ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, මනාකොට වැඳ; එකමන්තං, එකත්පසෙක; නිසිදිංසු, හුන්නාහුය; තෙ පි ඛො යක්ඛා, සිව්වරම් රජුන් සමඟ පැමිණි ඒ යක්ෂයෝද; අප්පෙකච්චෙ, ඇතැම් කෙනෙක්; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, සකසා වැඳ; එකමන්තං, එකත් පසෙක; නිසීදිංසු, උන්හ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; භගවතා සද්ධිං, භාග්‍යවතුන් වහන්සේ හා සමග; සම්මොදිංසු, සතුටු වූහ; සම්මොදනීයං, සතුටුවිය යුතුවූ; සාරානීයං, සිහි කටයුතු වූ; කථං, කථාවක්; විතිසාරෙත්වා, කොට නිමවා; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, උන්හ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනෙක්හිද; තෙන, එදෙසට; අඤ්ජලිං පනාමෙත්වා, අඤ්ජලි ප්‍රණාමයකොට; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, උන්හ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; නාමගොත්තං සාවෙත්වා, නම්ගොත් අස්වා; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, උන්හ; අප්පෙකච්චෙ, ඇතැම් යක්ෂ කෙනෙක්; තුණ්හිභූතා, නිශ්ශබ්ද

නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නො ඛො වෙස්සවණො මහාරාජා භගවන්තං එතදවොච.

සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ උළාරා යක්ඛා භගවතො පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා සන්ති හි භන්තෙ

---

වූවාහු; එකමන්තං, එකත්පසෙක; නිසීදිංසු, හුන්හ; එකමන්තං නිසින්නො ඛො, එකත්පස්ව උන්නාමවූ; වෙස්සවණොමහාරාජා, වෙසමුණු මහරජ තෙමේ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; එතදවොච, මෙය සැළ කෙළේය.

භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; අප්පසන්නා, අප්‍රසන්නාවූ; උළාරා යක්ඛා, මහේශාක්‍ය යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; පසන්නා, ප්‍රසන්නාවූ; උළාර යක්ඛා, මහේශාක්‍ය යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හට; අප්පසන්නා, අප්‍රසන්නාවූ; මජ්ඣිමා යක්ඛා, මධ්‍යම ආනුභාව ඇති යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හට; පසන්නා, ප්‍රසන්නාවූ; මජ්ඣිමා යක්ඛා, මධ්‍යම ආනුභාව ඇති යක්ෂයෝද; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හට; අප්පසන්නා, අප්‍රසන්නාවූ; නීචා.

නීචා යක්ඛා භගවතො අප්පසන්නා, සන්තිහි භන්තෙ නීචා යක්ඛා භගවතො පසන්නා, යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා අප්පසන්නායෙව භගවතො, තං කිස්සහෙතු?

භගවාහි භන්තෙ පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති, අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති, කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාදා වෙරමණියා ධම්මං දෙසෙති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණියා

යක්ඛා, නීච යක්ෂයෝද; සන්තිහි, ඇත්තාහුය; භන්තෙ, ස්වාමීනි, භගවතො, භාග්‍යවත්හට; පසන්නා, ප්‍රසන්නාවූ; නීචා යක්ඛා, නීච යක්ෂයෝද; සන්තිහි, ඈත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; යක්ඛා, යක්ෂයෝ; යෙභුය්‍යෙන ඛො පන, බොහෝ සෙයින්ම; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; අප්පසන්නායෙව; අප්‍රසන්නයෝමය; තං කිස්ස හෙතු, ඊට හෙතු කවරේද?

භන්තෙ, ස්වාමීනි; භගවාහි, භාග්‍යවතුන් වහන්සේ; පාණාතිපාතා වෙරමණියා, ප්‍රාණඝාතයෙන් වැළැක්ම පිණිස; ධම්මං දෙසෙති, දහම් දෙසන සේක; අදින්නාදානා වෙරමණියා, අයිනාදනින් වැළැක්ම පිණිස; ධම්මං දෙසෙති, දහම් දෙසන සේක; කාමෙසුමිච්ඡාචාරා වෙරමණියා, කාමමිථ්‍යාචාරයෙන් වැළැක්ම පිණිස; ධම්මං දෙසෙති, දහම් දෙසන සේක; මුසාවාදා වෙරමණියා, මුසාවාදයෙන් වැළැක්ම පිණිස; ධම්මං දෙසෙති, දහම් දෙසන සේක; සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා, මද ප්‍රමාද දෙකට

**ධම්මං දෙසෙති, යෙභුය්‍යෙන බො පන භන්තෙ යක්ඛා අප්පටිවිරතා යෙව පාණාතිපාතා, අප්පටිවිරතා අදින්නාදානා, අප්පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා, අප්පටිවිරතා මුසාවාදා, අප්පටිවිරතා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා.**

**තෙසං තං හොති අප්පියං අමනාපං, සන්ති හි භන්තෙ භගවතො සාවකා අරඤ්ඤෙ වනපත්ථානි සෙනාසනානි පටිසෙවන්ති අප්ප–**

---

කාරණයවූ රහමෙර පීමෙන් වැලැක්වීම පිණිස; ධම්මං දෙසෙති, දහම් දෙසත සේක; එහෙයිනි. භන්තෙ, ස්වාමීනි; යක්ඛා, යක්ෂයෝ; යෙභුය්‍යෙන බො පන, බොහෝ සෙයින්ම; පාණාතිපාතා, ප්‍රාණ ඝාතයෙන්; අප්පටිවිරතා යෙව, නො වැලැක්කාහුමය; අදින්නාදානා, අයිනාදනින් අප්පටිවිරතා යෙව, නො වැලැක්කාහුමය; කාමෙසු මිච්ඡාචාරා, කාමමිථ්‍යාචාරයෙන්; අප්පටිවිරතා යෙව, නො වැලැක්කාහුමය; මුසාවාදා බොරු කීමෙන්; අප්පටිවිරතා යෙව, නො වැලැක්කාහුමය; සුරාමෙරයමජ්ජපමාදට්ඨානා, මද ප්‍රමාදයට කාරණයවූ රහමෙර පීමෙන්; අප්පටිවිරතා යෙව, නොවැලැක්කාහුමය.

තෙසං, ඒ යක්ෂයන්ට; තං, ඒ ධර්මය; අප්පියං හොති, අප්‍රිය වේ; අමනාපං, අමනොඥ වේ; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍ය වතුන් වහන්සේගේ; සාවකාසන්තිහි, ශ්‍රාවකයෝ ඇත්තාහුමය; (ඒ ශ්‍රාවකයෝ) අරඤ්ඤෙ, අරණ්‍යයෙහි; වනපත්ථානි, වනයට ඇතුළත්වූද; පන්තානි, ප්‍රාන්තවූද හෙවත් ඉතා දුරවූද අප්පසද්දානි,

සද්දානි අප්පනිග්ඝොසානි, විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලාන සාරුප්පානි, තත්‍ථ සන්ති උළාරායක්ඛා නිවාසිනො යෙ ඉමස්මිං භගවතො පාවචනෙ අප්පසන්නා තෙසං පසාදාය.

උග්ගණ්හාතු භන්තෙ භගවා ආටානාටියං රක්ඛං, භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය

---

සවල්ප ශබ්ද ඇති නොහොත් නිශ්ශබ්දවූ; අප්පනිග්ඝොසානි, මහත් ඝොෂා හෙවත් කොලාහල නැත්තාවූ; විජනවාතානි, ජනයන්ගේ හැසිරීමෙන් උපදනා පවන් නැත්තාවූ; මනුස්සරාහසෙය්‍යකානි, මිනිසුන්ගේ රහසට සුදුසු වූ; පටිසල්ලාන, ප්‍රතිසංලීනයට හෙවත් සිත එකඟ කිරීමට; සාරුප්පානි, සුදුසු වූ; සෙනාසනානි, සෙනසුන්; පටිසෙවන්ති, සෙවනය කෙරෙත්; තත්‍ථ, ඒ වනසෙනසුන්හි; නිවාසිනො, නිබඳ වාසය කරන්නාවූ; උළාරා යක්ඛා, මහානුභාව යක්‍ෂයෝ; සන්ති, ඇත්තාහුය; යෙ, යම් යක්‍ෂ කෙනෙක්; භගවතො, භාග්‍යවත්හුගේ; ඉමස්මිං පාවචනෙ, මේ ත්‍රිපිටක බුද්ධවචනයෙහි; අප්පසන්නා, ප්‍රසන්න නොවීද; තෙසං, ඔවුන්ගේ; පසාදාය, පැහැදීම පිණිස; භන්තෙ, ස්වාමීනි, භගවා, භාග්‍යවතුන් වහන්සේ, භික්ඛූනං, භික්‍ෂූන්ගේද; භික්ඛුණීනං, භික්‍ෂුණීන්ගේද; උපාසකානං, උපාසකවරුන්ගේද; උපාසිකානං, උපාසිකාවරුන්ගේද; ගුත්තියා රක්ඛාය, උවදුරු වැලැක්ම හා ආරක්‍ෂා පිණිසද; අවිහිංසාය, වෙහෙස නොවන බැව් පිණිසද; ඵාසු විහාරාය, පහසු විහරණය පිණිසද; ආටානාටියං

ඵාසුවිහාරායාති, අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන, අථ ඛො වෙස්සවණ්ණො මහාරාජා භගවතො අධිවාසනං විදිත්වා තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි.

1 විපස්සිස්ස නමත්ථු
චක්ඛුමන්තස්ස සිරීමතො,
සිඛිස්ස පි නමත්ථු
සබ්බභූතානුකම්පිනො.

2 වෙස්සභුස්ස නමත්ථු
න්හාතකස්ස තපස්සිනො,

---

රක්ඛං, ආටානාටිය නම් ආරක්ෂාව හෙවත් පිරිත; උග්ගණ්හාතු ඉති, ඉගෙන වදාරණ සේක්වා, භගවා, භාග්‍යවතුන් වහන්සේ; තුණ්හී භාවෙන, නිශ්ශබ්ද භාවයෙන්; අධිවාසෙසි, ඉවසා වදාළ සේක; අථ ඛො, ඉක්බිත්තෙන්; වෙස්සවණ්ණො මහරාජා, වෙසමුණු මහරජ තෙමේ; භගවතො, භාග්‍යවත්හුගේ; අධිවාසනං විදිත්වා, ඉවසීම දැන; තායං වෙලායං, ඒ වේලායෙහි; ඉමං ආටානාටියං රක්ඛං, මේ ආටානාටිය පිරිත; අභාසි, කීයේය; කෙසේද යත්?

1. චක්ඛුමන්තස්ස; ප්‍රඥාචක්ෂුස ඇත්තාවූ; සිරිමතො, ශ්‍රීමත්වූ; විපස්සිස්ස, විපස්සී නම් බුදුරජහට; නමත්ථු නමස්කාර වේවා; සබ්බභූතානුකම්පිනො; සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇත්තාවූ; සිඛිස්සපි, සිඛී නම් බුදුරජාණන් වහන්සේටද; නමත්ථු, නමස්කාර වේවා.

2. න්හාතකස්ස තපස්සිනො, නිහතකෙලශිවූ; කෙලෙසුන් නවන වෙර ඇති; වෙස්සභුස්ස, වෙස්සභූ නම් බුදුරජහටද; නමත්ථු;

නමත්ථු කකුසන්ධස්ස
මාරසේනා පමද්දිනො.

3 කොණාගමනස්ස නමත්ථු
බ්‍රාහමණස්ස වුසීමතො,
කස්සපස්ස නමත්ථු
විප්පමුත්තස්ස සබ්බධී.

4 අඞ්ගීරසස්ස නමත්ථු
සක්‍යපුත්තස්ස සිරීමතො,
යො ඉමං ධම්මමදෙසෙසි
සබ්බදුක්ඛා පනූදනං.

---

නමස්කාර වේවා; මාරසෙනා පමද්දිනො, පඤ්චවිධ මාරසේනාව දප මැඩලූ; කකුසන්ධස්ස, කකුසඳ නම් බුදුරජහටද; නමත්ථු, නමස්කාර වේවා.

3. බ්‍රාහමණස්ස, බහා තබන ලද පව් ඇති; වුසීමතො, වැස නිමවන ලද මාර්ග බ්‍රහමචය්‍යී ඇති; කොණාගමනස්ස, කොණාගම නම් බුදුරජහටද; නමත්ථු, නමස්කාර වේවා; විප්පමුත්තස්ස සබ්බධී, සියලු කෙලෙසුන් කෙරෙන් විශෙෂයෙන් මිදුනාවූ; කස්සපස්ස, කාශ්‍යප නම් බුදුරජහටද; නමත්ථු, නිමස්කාර වේවා.

4. යො, යම් සර්‍වඥකෙනෙක්; සබ්බදුක්ඛා පනූදනං, සියලු දුක් දුරු කරන්නාවූ; ඉමං ධම්මං, මේ ධර්‍මය; අදෙසෙසි, වදාළ සේක්ද; අඞ්ගීරසස්ස, අඞ්ගීරස නම්වූ; සිරීමතො, ශ්‍රීමත්වූ; ශාක්‍යපුත්තස්ස, ශාක්‍යපුත්‍ර වූ ඒ ගොයුම්ගොත් බුදුරජහටද; නමත්ථු, නමස්කාර වේවා.

5 යෙ චාපි නිබ්බුතා ලොකෙ
යථාභූතං විපස්සිසුං,
තෙ ජනා අපිසුණා
මහන්තා වීතසාරදා.

6 හිතං දෙවමනුස්සානං
යං නමස්සන්ති ගොතමං,
විජ්ජාචරණ සම්පන්නං
මහන්තං වීතසාරදං.

7 යතො උග්ගච්ඡති සූරියො
ආදිච්චො මණ්ඩලීමහා,
යස්ස චුග්ගච්ඡමානස්ස
සංවරීපි නිරුජ්ඣති.

---

5. ලොකෙ, සත්වලොකයෙහි; යෙ චාපි නිබ්බුතා, යම් රහත් කෙනෙක් නිර්වාණහුද; යථාභූතං, තත්වූ පරිද්දෙන්; විපස්සිසුං, උදයව්‍යයාදි විදර්ශනා කළාහුද; තෙ ජනා, ඒ නිකෙලශ ජනයෝ; අපිසුණා, පෙහෙසුන් වදන් නැත්තාහ; මහන්තා, මහත් බවට පැමිණියාහ; වීතසාරදා, පහවූ සංසාරභය ඇත්තාහු හෙවත් නිර්භීයහ; (ඒ රහතන් වහන්සේලාටද නමස්කාර වේවා.

6. විජ්ජාචරණ සම්පන්නං, අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයන් ගෙන් යුක්තවූ; මහන්තං, මහත් බවට ගියාවූ; වීතසාදරං, පහවූ බිය ඇති; හිතං දෙමවනුස්සානං, දෙව්මිනිසුන්ට හිතවූ; යං ගොතමං, යම් ගෞතම ගොත්‍රොත්භූත බුදුකෙනෙකු; නමස්සන්ති, නමස්කාර කෙරෙත්ද? ඒ සර්වඥයන් වහන්සේටද නමස්කාර වේවා.

7. ආදිච්චො මණ්ඩලීමහා, අදිතිපුත්‍රවූ දිලිසෙන මහත් මඬුලු ඇති; සූරියො, සූර්ය්‍යතෙම; යතො උග්ගච්ඡති, යම් තැනකින් උද

8 යස්ස චුග්ගතෙ සූරියෙ
දිවසොති පවුච්චති,
රහදෙපි තත්‍ථ ගම්භීරො
සමුද්දො සරිතොදකො,

9 එවං තං තත්‍ථ ජානන්ති
සමුද්දො සාරිතොදකො,
ඉතො සා පුරිමා දිසා
ඉති නං ආචික්ඛති ජනො,

10 යං දිසං අභිපාලෙති
මහාරාජා යසස්සිසො.

---

වේද; යස්ස චුග්ගච්ඡමානස්ස, යම් සූර්‍ය්‍යයෙකු උදාවන කල්හි; සංවරීපි, රාත්‍රියද; නිරුජ්ඣති, නිරුද්ධ වේද.

8. සූරියෙ, සූර්‍ය්‍යයා; යස්ස ච, යම් දිගකින්; උග්ගතෙ, උදාවූ කල්හි; දිවසොති පවුච්චති, දිනයයි කියනු ලැබේද; තත්‍ථ, එතැන්හි ගම්භීරො, ගැඹුරුවූ; රහදෙපි, පතළාවූ; සරිතොදකො, ජලය ඇති; සමුද්දො, සමුද්‍රයයි කියූ ජලනිධියෙක්ද ඇත්තේය.

9. තත්‍ථ, එතත්හි පතළාවූ ජලය ඇති; තං සරිතොදකො, ඒ ජලනිධිය; සමුද්දො, සමුද්‍රයයි; එවං, මෙසේ; ජානන්ති, දනිත්; ඉතො, මේ මහමෙරින්; සා, ඕතොමෝ; පුරිමාදිසා, පෙරදිග වන්නීය; ජනො, ජන තෙමේ; නං, ඒ දිසාවට; ඉති, මෙසේ; (පෙර දිගයයි) ආචික්ඛති, කියයි.

10-11-12-13. යසස්සි, යසපිරිවර ඇත්තාවූ; සො මහාරාජා, ඒ වරම් මහරජ තෙමේ; යං දිසං, යම් දිසාවක්; අභිපාලෙති, මනා කොට රක්‍ෂා කෙරේද; ගන්‍ධබ්බානං ආධිපති, ගන්‍ධර්වයන්ට අධිපතිවූ හෙතෙමේ; ධතරට්ඨො නාම ඉති, ධෘතරාෂ්ට්‍ර නම් වන්නේය; සො,

ගන්ධබ්බානං ආධිපති
ධතරට්ඨො ඉති නාමසො

11 රමතී නච්චගීතෙහි
ගන්ධබ්බෙහි පුරක්ඛතො,
පුත්තාපි තස්ස බහවො
ඒකනාමාති මෙ සුතං.

12 අසීතිං දස ඒකො ච
ඉන්දනාමා මහබ්බලා,
තෙ චාපි බුද්ධං දිස්වාන
බුද්ධං ආදිච්චබන්ධුනං.

13 දූරතොව නමස්සන්ති
මහන්තං වීතසාරදං,

---

චරම් මහරජ තෙමේ; ගන්ධබ්බෙහි පුරක්ඛතො, (ශ්වෙත වස්ත්‍රාභරණයෙන් සැරසී දූවාතමයවූ කඩුලලඟ ගෙත කෙළලක්ෂයක් ඇලි අසුන් නැඟී කෙළලක්ෂයක්) ගන්ධර්ව භටයන් විසින් පිරිවන ලද්දේ; නච්චගීතෙහි, ලක්ෂගණන් තළුවන් පිරිවරා රඟමඬුලු බැඳ නෘත්‍ය ගීතයෙන්; රමති, සිත් අලවා වාසය කරන්නේය; ඉන්දනාමා, ඉන්ද්‍ර යන නම් ඇති; මහබ්බලා, මහත් බල ඇත්තාවූ; අසීතිං, දස ඒකොච, එකානුවක් පමණවූ; තස්ස, ඔහුගේ; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝද; ඒකනාමාති, එක නම් ඇත්තාහු යයි; මෙ, මා විසින්; සුතං, අසන ලදී; තෙචාපි, ඔව්හුද; මහන්තං, මහත් බවට පැමිණියාවූ; වීතසාරදං, (චතුර්වෛශාරද්‍ය ඥානයෙන්) විසාරද වූ, බුද්ධං, (සම්මොහ නිද්‍රාපගමනයෙන් ප්‍රබුද්ධවූ හෙයින්) බුද්ධ නම්වූ; ආදිච්ච බන්ධුනං, (සූර්‍ය්‍යවංශයෙහි උපන් හෙයින් ආදිච්චබන්ධු නම්වූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; දිස්වාන, දැක; දූරතොව, දුරින්ම; නමස්සන්ති; නමස්කාර කෙරෙති; පුරිසාජඤ්ඤ, පුරුෂාජානීයය;

නමො තෙ පුරිසාජඤ්ඤ
නමො තෙ පුරිසුත්තම.

කුසලෙන සමෙක්ඛසි, අමනුස්සාපි
තං වන්දන්ති සුතං නෙතං අභිඤ්ඤ
සො තස්මා එවං වදෙමසෙ ජිනං
වන්දථ ගොතමං ජිනං වන්දාම
ගොතමං විජ්ජාචරණසම්පන්නං
බුද්ධං වන්දාම ගොතමං.

14 යෙන පෙතා පවුච්චන්ති
පිසුණා පිට්ඨිමංසිකා,

---

තෙ, තුඹවහන්සේට; නමො අත්‍ථු, නමස්කාර වේවා; පුරිසුත්තම, පුරුෂොත්තමය; තෙ, තුඹවහන්සේට; නමො අත්‍ථු, නමස්කාර වේවායි කියා; දූරතොාව, දුරින්ම; නමස්සන්ති, නමස්කාර කෙරෙති.

කුසලෙන සමෙක්ඛසි, නිරවද්‍යවූ නිපුණවූ සර්‍වඥතාඥනයෙන් ආශයානුසයාදී විභාග පරඥන වශයෙන් මහාජනයා බලන්නෙහි යයි කියා; අමනුස්සාපි, අමනුෂ්‍යයෝද; තං, තුඹවහන්සේට, වන්දන්ති, වඳිති; එතං, ඒ එසේය කියා අමනුෂ්‍යයන් හා දෙවියන් විසින් නමස්කාර කිරීම; නො, අප විසින්; අභිඤ්ඤසො, වරින්වර; සුතං, අසන ලද; තස්මා, ඒ කාරණයෙන්; එවං වදෙමසෙ, මෙසේ කියම්හ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නා;ජිනං, සර්‍වඥයන් වහන්සේට; වන්දථ, නමස්කාර කරව්දැයි අප විසින් විචාරන ලද යක්‍ෂයෝ; ගොතමං, ගෞතම් ගොත්‍රයෙහි උපන්නාවූ; ජිනං, සර්‍වඥයන් වහන්සේට; වන්දාම, අපි නමස්කාර කරම්හයි කියති; විජ්ජාචරණ සම්පන්නං, විද්‍යාචරණ ගුණයෙන් සමන්විතවූ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ බුද්ධං, සර්‍වඥයන් වහන්සේට; වන්දාම, අපි නමස්කාර කරම්හයි කිවාහුය.

පාණාතිපාතිනො ලුද්දා
චොරා නෙකතිකා ජනා.

15 ඉතො සා දක්ඛිණා දිසා
ඉති නං ආචික්ඛතී ජනෙ,
යං දිසං අභිපාලෙති
මහාරාජා යසස්සි සො,

16 කුම්භණ්ඩානං ආධිපති
විරූළ්හො ඉති නාමසො,
රමතී නච්චගීතෙහි
කුම්භණ්ඩෙහි පුරක්ඛතො,

---

14. යෙන, යම් දිශාභාගයකින්; පෙතා, මෘතශරීරයෝ; පවුච්චන්ති, ගෙන යෙතියි කියනු ලැබෙද්ද; පිසුණා, ප්‍රියසූන්‍යවාදීවූ; පිට්ඨිමංසිකා, පිටෙහි මස් කන්නාක් මෙන් පරාංමුඛයෙහි තිඳු කරන්නාවූ; පාණාතිපාතිනො, ප්‍රාණඝාත කරන්නාවූ; ලුද්දා, වැද්දන් වැනිවූ; නෙකතිකා ජනා, වඤ්චා දන්නාවූ ජනයෝ යම් දිගකින් ගෙන යෙතෙයි කියනු ලැබෙද්ද.

15. ඉතො, මේ මහමෙරු පර්වතයෙන්;සා, ඕතොමෝ; දක්ඛිණා දිසා, දක්ෂිණදිශා නම් වන්නීය; ජනො, ජනතෙමේ, නං, ඒ දිසාවට; ඉති ආචික්ඛති, දකුණු දිශාවයයි මෙසේ කියන්නේය, යසස්සි, යස පිරිවර සම්පත් ඇත්තාවූ; මහාරාජා, ඒ වරම් මහරජ තෙමේ; යං දිසං, යම් දිශාභාගයක්; අභිපාලෙති, රක්‍ෂා කෙරේද.

16-17. කුම්භණ්ඩානං ආධිපති, කුම්භාණ්ඩයන්ට අධිපතිවූ; විරූළ්හො ඉති; විරූඪ්ය යන නම් ඇති; සො, ඒ වරම් රජතෙමේ, කුම්භණ්ඩෙහි පුරක්ඛතො, කුම්භාණ්ඩයන් විසින් පිරිවරන ලද්දේ; නච්චගීතෙහි, නෘත්‍යගීතයෙන්; රමති, සිත් අලවා වාසය කරන්

17 පුත්තා පි තස්ස බහවො
එකනාමාති මෙ සුතං,
අසීතිං දස එකො ච
ඉන්දනාමා මහබ්බලා.

18 තෙ චාපි බුද්ධං දිස්වාන
බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතොව නමස්සන්ති
මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ
නමො තෙ පුරිසුත්තම.

කුසලෙන සමෙක්ඛසි, අමනුස්සාපි
නං වන්දන්ති සුතං නෙතං අභිණ්හ

---

න්‍ෝය; තස්ස, ඒ විරූළ්හ නම් මහරජුගේ; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝ: එක නාමාති, එක නම ඇත්තාහුයයි, මෙ, මා විසින්; සුතං, අසන ලදී; මහබ්බලා, මහත් බල ඇති; ඉන්දනාමා, ශක්‍රදෙවෙන්‍ද්‍රයාගේ නම් ඇති ඔවුහු; අසීතිං දස එකො ච, ඒකානුවක්ද වන්නාහ.

18. තෙ චාපි, ඒ පුත්‍රයෝද; ආදිච්චබන්ධුනං, සූර්‍ය්‍යබන්ධුවූ; බුද්ධං, සර්‍වඥයන් වහන්සේ, දිස්වාන, දැක; මහන්තං, මහත් බවට පැමිණියාවූ; වීතසාරදං, වීතසාරදවූ; බුද්ධං, සර්‍වඥයන් වහන්සේ; දූරතොව, දුරදීම; නමස්සන්ති, නමස්කාර කෙරෙති, පුරිසාජඤ්ඤ, පුරුෂශ්‍රෙෂ්ඨයාණන් වහන්ස; තෙ, නුඹවහන්සේට; නමො, නමස්කාර වේවා; පුරිසුත්තම, පුරුෂොත්තමය; තෙ, නුඹවහන්සේට, නමො, නමස්කාර වේවා.

කුසලෙන සමෙක්ඛසි, සර්‍වඥතාඥනයෙන් මහජනයා බලන සේක; ඒ කාරණයෙන්; අමනුස්සාපි, අමනුෂ්‍යයෝද; නං, නුඹ

**සො, තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දාම ගොතමං, විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දාම ගොතමං.**

**19 යත්ථ චොග්ගච්ඡති සූරියො
ආදිච්චො මණ්ඩලී මහා,
යස්ස චොග්ගච්ඡමානස්ස
දිවසො පි නිරුජ්ඣති.**

**20 යස්ස චොග්ගතෙ සූරියෙ
සංචරීති පවුච්චති**

---

වහන්සේට, වන්දනති, විදිති; එතං, මේ වචනය; තො, අප විසින්; අභිණ්හසො, වරින් වර; සුතං, අසන ලදි; තස්මා, ඒ කාරණයෙන්; එවං වදෙමසෙ, මෙසේ කියම්හ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ, ජිනං, සර්‍වඥයන් වහන්සේට; වන්දථ, නමස්කාර කරව් දූයි විචාරන ලද යක්‍ෂයෝ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන් නාවූ; ජිනං, සර්‍වඥයන් වහන්සේට; වන්දාම, නමස්කාර කරම්හ; විජ්ජාචරණසම්පන්නං, විද්‍යාචරණ රක්‍ෂයෙන් යුක්තාවූ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ; බුද්ධං, සර්‍වඥයන් වහන්සේට; වන්දාම, අපි නමස්කාර කරම්හයි කියති.

19-20. යත්ථ, යම් දිශාභාගයෙක්හි; ආදිච්චො, අදිතිපුත්‍රවූ, මණ්ඩලී මහා, මහත් මණ්ඩලයක් ඇති; සූරියො, සූර්‍ය්‍යදිව්‍යපුත්‍ර තෙමේ; චොග්ගච්ඡති, අස්තයට යේද; යස්ස චොග්ගච්ඡමානස්ස, යම් සූර්‍ය්‍යයකු අස්තයට යන විට; දිවසොපි, දිවාභාගය නිරුජ්ඣති, අන්තර්ධාන වේද; යස්ස චොග්ගතෙ සූරියෙ, යම් සූර්‍ය්‍යයෙකු අස්තයට ගිය කල්හි; සංචරීති පවුච්චති, ඕතොමෝ රාත්‍රියයි කියනු ලැබේද;

රහදෙ පි තත්‍ථ ගම්භීරෙ
සමුද්දෙ සරිතොදකො.

21 එවං තං තත්‍ථ ජානන්ති
සමුද්දෙ සරිතොදකො,
ඉතො සා පච්ඡිමා දිසා
ඉති නං ආචික්ඛති ජනො.
යං දිසං අභිපාලෙති
මහාරාජා යසස්සි සො.

22 නාගානං ආධිපති
විරූපක්ඛො ඉති නාමසො,
රමති නච්චගීතෙහි
නාගෙහි පුරක්ඛතො.

---

තත්‍ථ, ඒ පශ්චිම දිශාභාගයෙහි; ගම්භීරෙ, ගැඹුරු ඇති; සරිතොදකො, පතළාවූ ජල ඇති; සමුද්දෙ, සමුද්‍රසඞ්ඛ්‍යාතවූ; රහදෙපි, තඩාගයෙක් ඇත්තේය.

21. තත්‍ථ, ඒ දිශාභාගයෙහි; තං, ඒ තඩාගය; සමුද්දෙ, සමුද්‍ර සඞ්ඛ්‍යාතවූ; සරිතොදකො, පතළ වූ ජල ඇත්තේයයි; එවං ජානන්ති, මෙසේ දනිති; ඉතො, මේ මහාමෙරු පර්‍වතයෙන්; සා, ඒ දිශාව; පච්ඡිමාදිසා, පශ්චිමදිශා නම් වන්නීයයි; ජනො, ජනතෙමේ; ඉති ආචික්ඛති, මෙසේ කියන්නේය; යසස්සී, යසපිරිවර ඇත්තාවූ; සො මහාරාජා, ඒ වරම් මහරජ තෙමේ; යං දිසං, යම් දිශාභාගයක්; අභිපාලෙති, රක්‍ෂා කරන්නේද.

22. නාගානං, නාගයන්ට; ආධිපති, ආධිපත්‍යය කරන්නාවූ; විරූපක්ඛො ඉති නාම, විරූපාක්‍ෂ නම්වූ; සො, ඒ වරම් මහරජ තෙමේ; නාගෙහි පුරක්ඛතො, (ප්‍රවාලමය වස්ත්‍රාභරණයෙන් සැරසී

23 පුත්තාපි තස්ස බහවො
එකනාමාති මෙ සුතං,
අසීතිං දස එකොච
ඉන්දනාමා මහබ්බලා.

24 තෙ චාපි බුද්ධං දිස්වාන
බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතොව නමස්සන්ති
මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ
නමො තෙ පුරිසුත්තම.

---

ප්‍රවාලමය වූ කඩු පලඟ ගෙන කෙළලක්‍ෂයක් පමණ සුරක්තවූ අශ්වයන් පැතනැඟී කෙළලක්‍ෂයක් නාග) භටයන් විසින් පිරිවරන ලද්දේ; නච්චගීතෙහි රමති, නෘත්‍ය ගීතයෙන් සිත් අලවා වාසය කරන්නේය.

23. තස්ස, ඒ වරම් මහරජහුගේ; බහවො, බොහෝවූ; පුත්තාපි, පුත්‍රයෝද; ඉන්දනාමා, ඉන්ද්‍ර යන නම් ඇතිව; මහබ්බලා, මහත් බල ඇත්තාහු; අසීතිං දසඑකොච, ඒකානුවක් පමණ වූ ඔවුහුද; එක නාමාති, එකම නම් ඇත්තාහයි, මෙ සුතං, මා විසින් අසන ලද.

24. තෙ චාපි, ඉන්ද්‍ර නම්වූ ඒ පුත්‍රයෝද; ආදිච්චබන්ධුනං, සූර්‍ය වංශ ඇත්තාවූ; බුද්ධං, කෙලශ නිද්‍රාපගමයෙන් ප්‍රසිද්ධ වූ, මහන්තං, මහත් බවට පැමිණියාවූ; වීතසාර්දං, විසාරදවූ; බුද්ධං, සර්‍වඥයන් වහන්සේ; දිස්වාන, දැක දූරතොව, දුරදීම; නමස්සන්ති, නමස්කාර කෙරෙත්; පුරිසාජඤ්ඤ, පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස; තෙ, නුඹ වහන්සේට; නමො, නමස්කාර වේවා; පුරිසුත්තම, පුරුෂොත්තමය; තෙ, ඔබවහන්සේට; නමො, නමස්කාර වේවා.

**කුසලේන සමෙක්ඛසි, අමනුස්සාපි තං වන්දන්ති සුතං නෙතං අභිණ්හසො, තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දාම ගොතමං, විජ්ජාචරණ සම්පන්නං බුද්ධං වන්දාම ගොතමන්ති.**

**25 යෙන උත්තරකුරූ රම්මා**
**මහානෙරු සුදස්සනො,**
**මනුස්සා තත්ථ ජායන්ති**
**අමමා අපරිග්ගහා.**

---

කුසලේන සමෙක්ඛසි; සර්වඥතයෙන් ජනාවලොකනය කරන සේකැයි කියා; අමනුස්සාපි, අමනුෂයෝද; තං, නුඹවහන්සේට; නමස්කාර කෙරෙත්; එතං, මේ කාරණය; නො, අප විසින්; අභිණ්හසො, නිතර (නැවත නැවත); සුතං, අසන ලදී; තස්මා, එහෙයින්; එවං වදෙමසෙ, මෙසේ කියම්හ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ; ජිනං, සර්වඥයන් වහන්සේ; වන්දථ, නමස්කාර කරව්දැයි; (විචාරන ලද යක්ෂයෝ) ගොතමං, ගෞතම නම්වූ; ජිනං, සර්වඥයන් වහන්සේට; වන්දාම, වඳිමු යයි කියත්; විජ්ජාචරණ සම්පන්නං, විද්‍යාචරණ ගුණයෙන් යුක්තවූ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; වන්දාම, අපි නමස්කාර කරම්හයි කියති.

25. යෙන, යම් දිශාභාගයෙක්හි; රම්මා, අභිරමණියට යොග්‍ය වූ; උත්තරකුරූ දිවයින පිහිටියේද; සුදස්සනො අතිශයින් දක්නුම්කළු වූ, මහානෙරු, මහාමෙරු පර්වතය වන්නේද; තත්ථ, ඒ උතුරුකුරු දිවයිනෙහි; අමමා, මාගේ වස්ත්‍රාභරණය යනාදී මමත්වයක් නැත්තාවූ; අපරිග්ගහා, මාගේ පුත්‍රයාය මාගේ භාර්‍ය්‍යාවය යන විශෙෂ ගැන්ම නැත්තාවූ; මනුස්සා, මනුෂ්‍යයෝ; ජායන්ති, උපදිත්.

26 න තෙ බීජං නවපන්ති
නපි නීයන්ති නඞ්ගලා,
අකට්ඨපාකිමං සාලිං
පරිභුඤ්ජන්ති මානුසා.

27 අකණං අථුසං සුද්ධං
සුගන්ධං තණ්ඩුලප්ඵලං,
තුණ්ඩිකීරෙ පචිත්වාන
තතො භුඤ්ජන්ති භොජනං.

28 ගාවිං එකඛුරං කත්වා
අනුයන්ති දිසො දිසං,
පසුං එකඛුරං කත්වා
අනුයන්ති දිසො දිසං.

---

26–27. තෙ, ඒ අමනුෂ්‍යයෝ; බීජං, ධාන්‍ය බීජය; න වපන්ති, නොවපුරත්; නඞ්ගලා, නගුල්ද (කෘෂිකර්ම පිණිස); නපිනීයන්ති, නොගෙන යනු ලැබෙති; මානුසා, මනුෂ්‍යයෝ; අකට්ඨපාකිමං, කෘෂිකර්ම නොකළ වනයෙහි ස්වයංජාතව පැසුනාවූ; අකණඅථුසං, කුඩු පොතු නැති; සුද්ධං, පිරිසුදුවූ; සුගන්ධං, සුවඳ ඇති; තණ්ඩුලප්ඵලං, සහල් ඵලකොට ඇති; සාලිං, හැල්සාල්; තුණ්ඩිකීරෙ පචිත්වාන, ස්වර්ණ භාජනයෙහි පිස; තතො, ඒ රත්සැලියෙන් ගෙන; භොජනං භුඤ්ජන්ති, භොජනය අනුභව කෙරෙත්.

28. ගාවිං එකඛුරං කත්වා, දෙනුන් අල්වාගෙන එකඛුර වාහන කොට හෙවත් අශ්ව යානාවකට මෙන් පිටට නැගී; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති; පසුං, චතුෂ්පද ජාතීන් එකඛුරං කත්වා, එකඛුර වාහනයක් කොට හෙවත් අශ්ව යානාවක් මෙන් කොට; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති.

29 ඉත්ථිවාහනං කත්වා
අනුයන්ති දිසො දිසං,
පුරිසවාහනං කත්වා
අනුයන්ති දිසො දිසං.

30 කුමාරිවාහනං කත්වා
අනුයන්ති දිසො දිසං,
කුමාරවාහනං කත්වා
අනුයන්ති දිසො දිසං.

තෙ යානෙ අභිරූහිත්වා සබ්බා-
දිසා අනුපරියන්ති පචාරා තස්ස
රාජිනො.

---

29. ඉත්ථිවාහනං කත්වා, ස්ත්‍රීන් වාහන කොට; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති; පුරිසවාහනං කත්වා, පුරුෂයන් වාහන කොට; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති.

30. කුමාරිවාහනං කත්වා, කුමාරිකාවන් වාහන කොට රථයෙහි යොදා; දිසොදිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති; කුමාරවාහනං කත්වා, කුමරුවන් වාහන කොට රථයෙහි යොදා; දිසො දිසං, දිශානුදිශායෙහි; අනුයන්ති, සඤ්චාරය කෙරෙති.

තස්ස රාජිනො, ඒ වෙසවුණු මහරජහුගේ; තෙ පචාරා, ඒ පිරිවර යක්ෂයෝ; යානෙ අභිරූහිත්වා, හස්ත්‍යශ්වාදිවූ අනෙක ප්‍රකාර වූ යානාවන් නැගී; සබ්බාදිසා, සියලු දිශාභාගයෙහි; අනුපරියන්ති, වටකොට ඇවිදිති.

31 හත්ථියානං අස්සයානං
දිබ්බං යානං උපට්ඨිතං,
පාසාදා සිවිකා චෙව
මහාරාජස්ස යසස්සිනො,
තස්ස ච නගරා ආහු
අන්තලික්ඛෙ සුමාපිතා.

ආටානාටා කුසිනාටා පරකුසිනාටා නාටපුරියා පරකුසිතනාටා, උත්තරෙන කපීවන්තො ජනොඝමපරෙනච, නවනවතියො අම්බර අම්බරවතියො ආලකමන්දා නාම

---

31. හත්ථියානං, ඇත්වාහනයටද; අස්සයානං, අශ්වයානාවටද; දිබ්බංයානං, මෙයින් පිටත් දිව්‍යයානාවටද; උපට්ඨිතං, එළඹ සිටියේය; යසස්සිනො, යසපිරිවර ඇත්තාවූ; මහාරාජස්ස, වෙසවුණු මහරජහට; පාසාදා, ප්‍රාසාදයෝද; සිවිකාචෙව, සිවි ගෙවල්ද වෙත්.

තස්ස ච, ඒ වෛශ්‍රවණ මහරජහුගේද; අන්තලික්ඛෙ, අන්තරීක්ෂයෙහි; සුමාපිතා,මොනවට මවන ලද;ආටානාටා; ආටානාට නවූ වූ නුවරෙක; කුසිනාටා, කුසිනාටා නම් වූ නුවරෙක; පර කුසිනාටා, පරකුසිනාටා නම් වූ නුවරෙක; නාටපුරියා, නාටපුරියා නම් වූ නුවරෙක; පරකුසිතනාටා, පරකුසිතනාටා නම් වූ නුවරෙක යන; නගරා, නගර සමූහයෝ; ආහු, වූවාහුය.

උත්තරෙන, උතුරුදිගින්; කපීවන්තො, කපීවන්ත නම් නුවරෙක; අපරෙනච, පැල දෙසින්; ජනොඝං නම් නුවරෙක; නව නවතියො, නවනවතිය නම් එක් නුවරෙක; අම්බර අම්බරවතියෝ, අම්බර අම්බරවතී නම් එක් නුවරෙක; ආලකමන්දනාම රාජධානී;

**රාජධානී, කුවෙරස්ස ඛො පන මාරිස මහාරාජස්ස විසාණා නාම රාජධානි, තස්මා කුවෙරො මහාරාජා වෙස්සවණ්ණොති පවුච්චති, පච්චෙ සන්තා පකාසෙන්ති තතොලා තත්තලා තතොතලා, ඔජසි තෙජසි තතොජසි සූරොරාජා අරිට්ඨො නෙමි, රහදො පි තත්ථ ධරණී නාම, යතො මෙඝා පවස්සන්ති වස්සා— යතො පතායන්ති සභාපි තත්ථ**

---

ආලකමන්‍ද තම් රාජධානියක්ද වෙයි; මාරිස, නිදුකාණන් වහන්ස; කුවෙරස්ස ඛො පන මහාරාජස්ස, කුවෙර නම් මහරජහුගේ වනාහි; විසාණා නාම රාජධානී, විෂාණා නම් රාජධානියෙක්ද ඇත්තීය; තස්මා, ඒ කාරණයෙන්; කුවෙරො මහාරාජා, කුවෙර නම් මහරජ තෙම; වෙස්සවණ්ණොති පවුච්චති, වෛශ්‍රවණයයි කියනු ලැබෙයි; පච්චෙසන්තො, වෙන් වශයෙන් කරුණු පරීක්‍ෂා කරත්තාවූ; තතොලා, තතොලා නම් යක්‍ෂයෙක; තත්තලා, තත්තලා නම් යක්‍ෂයෙක; තතොතලා, තතොතලා නම් යක්‍ෂයෙක; ඔජසි, ඔජසි නම් යක්‍ෂයෙක; තෙජසි, තෙජසි නම් යක්‍ෂයෙක; තතොජසි, තතොජසි නම් යක්‍ෂයෙක; සූරො, සූර නම් යක්‍ෂයෙක; රාජා, රාජා නම් යක්‍ෂයෙක හෙවත් සූරොරාජා, සූරරාජ නම් යක්‍ෂයෙක; අරිට්ඨො, අරිට්ඨ නම් යක්‍ෂයෙක; නෙමි, නෙමි නම් යක්‍ෂයෙක; අරිට්ඨො නෙමි, අරිට්ඨනෙමි නම් යක්‍ෂයෙක යන මේ දෙලොස් යක්‍ෂයෝ හසුන් ප්‍රකාශ කෙරෙත්.

තත්ථ, ඒ විෂාණා නම් රාජධානියෙහි; රහදොපි, පතස් යොදුන් පමණ තඩාගයද; ධරණී නම් වන්නීය; යතො, යම් තඩාගයකින් ජලය ගෙන; මෙඝා, වලාවෝ; පවස්සන්ති, වෂී කෙරෙද්ද; වස්සා, වලාවෝ, යතො, යම් තඩාගයෙකින්, පතායන්ති, පැතිරෙත්ද;

භගලවතී නාම යත්ථ යක්ඛා පයිරුපාසන්ති.

32 තත්ථ නිච්චඵලා රුක්ඛා
නානාදිජ ගණායුතා,
මයූරකොඤ්චාභිරුද
කොකිලාභිහි වග්ගුභි.

33 ජීවංජීවක සද්දෙත්ථ
අථො ඔට්ඨවචිත්තකා,
කුකුත්ථකා කුළීරකා
වනෙ පොක්ඛරසාතකා.

---

තත්ථ, ඒ තඩාග තීරයෙහි; සභාපි, දෙලොස් යොදුන් රත්නසභා ශාලාවද; භගලවතීනාම, එනම් වන්නීය; යත්ථ, යම් ශාලාවෙක්; යක්ඛා, යක්‍ෂයෝ; පයිරුපාසනාති, වටින් රැස්ව හිඳිත් ද.

32. තත්ථ, ඒ ශාලාව හාත්පස්හි; නිච්චඵලා රුක්ඛා, නිරන්තර ඵල හරිත වෘක්‍ෂයෝද; නානාදිජගණායුතා, නොයෙක් පක්‍ෂි සමූහයාගෙන් යුක්තවෙත් කෙසේද? මයූරි, මොණරුන් විසින්ද; කොඤ්චා, කොස් ලිහිණියන් විසින්ද; අභිරුද, පවත්වන ලද මධුර නාද ඇත්තාහුය; කොකිලාභිහි වග්ගුභි, මනොඥ කොකිල පක්‍ෂීන් විසින්ද පවත්වන ලද මධුර නාද ඇත්තාහුය.

33. ජීවංජීවකං සද්දෙත්ථ, මේ විල්තෙර ජීවංජීවක පක්‍ෂීන් විසින් පවත්වන ලද ශබ්ද ඇත්තෙත්ය; අථො ඔට්ඨව චිත්තකා, නැවත ඔට්ඨව චිත්තක නම් පක්‍ෂීහුද; කුකුත්ථකා, වලිකුකුළෝද; කුළීරකා, රත්වත් කකුළුවෝද; පොක්ඛරසාතකා, පුෂ්කරසාතක නම් පක්‍ෂීහුද හෙවත් තල්රේරුද; වනෙ, පද්මවනයෙහි; හැසිරෙත්තාහ.

34 සූකසාලික සද්දෙත්ථ
දණ්ඩමානවකානිච,
සොභති සබ්බකාලං සා
කුවෙරනලිනී සදා.

35 ඉතො සා උත්තරා දිසා
ඉති නං ආචික්ඛති ජනො,
යං දිසං අභිපාලෙති
මහාරාජා යසස්සි සො.

36 යක්ඛානං ආධිපති
කුවෙරො ඉති නාමසො,

---

34. එහි, මේ පුෂ්කරණියෙහි; සූකසාලික, ගිරා සැලලිහිණි යන්ගේ; සද්දෙ, ශබ්ද ඇත්තේය; දණ්ඩමානවකානිච, දණ්ඩමානවක නම් පක්ෂිහුද හැසිරෙන්නාහ; සා කුවෙරනලිනී, ඒ කුවෙර නම් මහරජහුගේ ධරණී නම් පුෂ්කරණිතොමෝ; සබ්බකාලං, සෑම සෘතුයෙහිම; සදා, නිරන්තරයෙන්; සොභති, ශොභමානව බබලන්නීය.

35. ඉතො, මේ මහාමෙරු පර්වතයෙන්; සා, ඹතොමෝ; උත්තරදිසා, උතුරුදිශාවට යයි; ජනො, ජනතෙම; නං, ඒ දිශාවට ඉති ආචික්ඛති, මෙසේ කියන්නේය; යසස්සී, යසපිරිවර ඇත්තාවූ; සො මහාරාජා, ඒ වරම් මහරජතෙමේ; යං දිසං, ගම් දිශාවක්; අභිපාලෙති, මොනවට පාලනය කෙරේද.

36. යක්ඛානං, යක්ෂයන්ගේ; ආධිපති, අධිස්වාමිවූ; කුවෙරො ඉති නාම, කුවෙර නම් වූ; සො, ඒ වරම් මහරජතෙම; මකෙඛහි පුරක්ඛතො, (රන්වන් වස්ත්‍රාභරණයෙන් සැරහී ස්වර්ණමය වූ කඩු පලඟ ගෙන කෙළ ලක්ෂයක් පමණ රන්වන් අශ්වයන් පැනනැගී කෙළ ලක්ෂයක්) යක්ෂසෙනාවන් විසින් පිරිවරණ ලද්දේ; නවව

රමති නච්චගීතෙහි
යක්ඛෙහි පුරක්ඛතො.

37 පුත්තාපි තස්ස බහවො
එකනාමාති මෙ සුතං,
අසීතිං දස එකො ච
ඉන්දනාමා මහබ්බලා,

38 තෙ චාපි බුද්ධං දිස්වාන
බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතොව නමස්සන්ති
මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ
නමො තෙ පුරිසුත්තම.

---

ගීතෙහි රමති, ලක්ෂගණන් නළුවන් පිරිවරා රඟමඩුලු බැඳ නෘත්‍ය ගීතයෙන් සිත් අලවා වාසය කරන්නේය.

37. තස්ස, ඒ වෙසවුණු මහරජහුගේ; බහවො පුත්තාපි, බොහෝ පුත්‍රයෝද; එකනාමාති, එක නම් ඇත්තාහුයි; මෙ සුතං, මා විසින් අසන ලදී; මහබ්බලා, මහත්වූ බල ඇති; ඉන්දනාමා, ඉන්ද්‍ර යන නම් ඇති ඔව්හු; අසීතිං දස එකො ච, එකානූවක්ද වෙති.

38. තෙ චාපි, ඒ ඉන්ද්‍ර යන නම් ඇති පුත්‍රයෝද; ආදිච්චබන්ධුනං, සූර්‍ය්‍යවංශ ඇත්තාවූ; බුද්ධං, කෙලශ නිද්‍රාපගමනයෙන් ප්‍රබුද්ධවූ; බුද්ධං, සර්‍වඥයන් වහන්සේ; දිස්වාන, දැක; මහන්තං, මහත් බවට පැමිණියාවූ; වීතසාරදං, විසාරදවූ සර්‍වඥයන් වහන්සේ දැක; දූරතොව, දුරදීම; නමස්සන්ති, නමස්කාර කෙරෙත්; පුරිසාජඤ්ඤ, පුරුෂ ශ්‍රෙෂ්ඨයාණන් වහන්ස; තෙ, නුඹවහන්සේට; නමො, නමස් කාර වේවා; පුරිසුත්තම, පුරුෂොත්තමය; තෙ, නුඹවහන්සේට; නමො, නමස්කාර වේවා.

කුසලෙන සමෙක්ඛසි, අමනුස්සා පි තං වන්දන්ති සුතං නෙතං අභිණ්හ සො, තස්මා එවං වදෙමසෙ ජිනං වන්දථ ගොතමං ජිනං වන්දාම ගො ත මං, විජ්ජාචරණසම්පන්නං බුද්ධං වන්දාම ගොතමන්ති.

අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති, යස්ස කස්සචි මාරිස, භික්ඛුස්ස වා

---

කුසලෙන සමෙක්ඛසි, සර්වඥතාඥානයෙන් ජනයන් බලන්නෙහි යයි; අමනුස්සාපි, අමනුෂ්‍යයෝද; තං වන්දන්ති, නුඹවහන්සේ වඳිත් යයි; එතං, මේ කාරණය; නො, අප විසින්; අභිණ්හසො, වරින්වර; සුතං, අසන ලදි; තස්මා, ඒ කාරණයෙන්; එවං වදෙමසෙ, මෙසේ කියම්හ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ; ජිනං, සර්වඥයන් වහන්සේ; වන්දථ, වඳිව්ද; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ, ජිනං, සර්වඥයන් වහන්සේ; වන්දාම, වඳිම්හ; විජ්ජාචරණ සම්පන්නං, අෂ්ටවිද්‍යා පසළොස්චරණ ගුණයෙන් යුක්තාවූ; ගොතමං, ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ; බුද්ධං, සර්වඥයන් වහන්සේ; වන්දාම ඉති, වඳිමුයයි මෙසේ කියම්හ.

මාරිස, නිදුකාණන් වහන්ස; අයං ඛො සා ආටානාටියාරක්ඛා, ඒ මේ ආටානාටිය පිරිත එනාහි; භික්ඛූනං, භික්ෂූන්ගේද; භික්ඛුණීනං, භික්ෂුණීන්ගේද; උපාසකානං, උපාසකවරුන්ගේද; උපාසිකානං, උපාසිකා වරුන්ගේද; ගුත්තියාරක්ඛාය, ආධ්‍යාත්මික බාහිර උවදුරු වැළැක්ම පිණිස; අවිහිංසාය, හිංසා වැළැක්ම පිණිස; ඵාසුවිහාරායාති, ඵාසුවිහාරය පිණිස පවතී; මාරිස; නිදුකාණන්

භික්ඛුණියා වා, උපාසකස්ස වා උපාසිකාය වා, අයං ආටානාටියා රක්ඛා, සුග්ගහීතා භවිස්සති සමත්තා පරියාපුණ්ණා, තඤ්චෙ අමනුස්සො, යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛ-පොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛපාරි-සජ්ජො වා යක්ඛපචාරො වා, ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා,

---

වහන්ස; යස්ස කස්සචි, යම්කිසි; භික්ඛුස්ස වා, භික්ෂුවක් විසින් හෝ; භික්ඛුණියා වා, භික්ෂුණියක් විසින් හෝ; උපාසකස්ස වා, උපාසකයකු විසින් හෝ; උපාසිකාය වා, උපාසිකාවක් විසින් හෝ; අයං ආටානාටියා රක්ඛාය, මේ ආටානාටිය පිරිත; සුග්ගහිතා භවිස්සති, මනාකොට ඉගෙන ගන්නා ලද්දීද; සමත්තා පරියාපුණ්ණා, සර්වප්‍රකාරයෙන් පුහුණුකොට නිස්සරණාධ්‍යාශයෙන් මෛත්‍රී චිත්තය පෙරදූරි කොට පදව්‍යඤ්ජන නොපිරිහෙලා කියනු ලද්දේද; චෙ, ඉදින්, තං, ඒ ආටානාටිය පිරිත ඉගෙන ගත්තාවූ ඔහු; අමනුස්සො, භූත පිසාචාදී අමනුෂ්‍යයෙක් තෙමේ; යක්ඛො වා, යක්ෂයෙක් හෝ; යක්ඛිණී වා, යකින්නියක් හෝ; යක්ඛපොතකො වා, යක් පැටෙක් හෝ; යක්ඛපොතිකා වා, යක්පැටියෙක් හෝ; යක්ඛමහාමත්තො වා, යක් මහඇමතියෙක් හෝ; යක්ඛපාරිසජ්ජො වා, යක් පිරිසෙහි වූවෙක් හෝ; යක්ඛපචාරො වා, යක් මෙහෙකරුවෙක් හෝ; ගන්ධබ්බො වා, ගඳඹෙක් හෝ; ගන්ධබ්බී වා, ගඳඹ ඉතිරියක් හෝ; ගන්ධබ්බපොතකො වා, ගඳඹ පැටවෙක් හෝ; ගන්ධබ්බපොතිකා වා, ගඳඹ පැටියක් හෝ;

ගන්ධබ්බමහාමත්තා වා ගන්ධබ්බපාරිසජ්ජා වා ගන්ධබ්බපචාරො වා, කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩමහාමත්තා වා කුම්භණ්ඩපාරිසජ්ජා වා කුම්භණ්ඩපචාරො වා, නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාගමහාමත්තා වා නාගපාරිසජ්ජා වා නාගපචාරො වා.

---

ගන්ධබ්බමහාමත්තා වා, ගඳඹ මහඇමතියෙක් හෝ; ගන්ධබ්බපාරිසජ්ජා වා, ගඳඹ පිරිසෙහි වූවෙක් හෝ; ගන්ධබ්බපචාරො වා, ගඳඹ මෙහෙකරුවෙක් හෝ; කුම්භණ්ඩො වා, කුම්භාණ්ඩයෙක් හෝ; කුම්භණ්ඩී වා, කුම්භාණ්ඩ ස්ත්‍රියක් හෝ; කුම්භණ්ඩපොතකො වා, කුම්භාණ්ඩපොතකයෙක් හෝ; කුම්භණ්ඩපොතිකා වා, කුම්භාණ්ඩපොතිකාවක් හෝ; කුම්භණ්ඩමහාමත්තා වා, කුම්භාණ්ඩ මහඇමතියෙක් හෝ; කුම්භණ්ඩපාරිසජ්ජා වා, කුම්භාණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ; කුම්භණ්ඩපචාරො වා, කුම්භාණ්ඩ මෙහෙකරුවෙක් හෝ; නාගො වා, නාගයෙක් හෝ; නාගිනී වා, නැයිතියක් හෝ, නාගපොතකො වා, නාගපොතිකයෙක් හෝ; නාගපොතිකා වා, නාගපොතිකාවක් හෝ; නාගමහාමත්තා වා, නාග මහාමාත්‍යයෙක් හෝ; නාගපාරිසජ්ජා වා, නාග පිරිසෙහි වූවෙක් හෝ; නාගපචාරො වා, නාග මෙහෙකරුවෙක් හෝ.

පදුට්ඨචිත්තො, ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, න මෙසො මාරිස අමනුස්සො ලභෙය්‍ය, ගාමෙසු වා නිගමෙසු වා, සක්කාරං වා ගරුකාරං වා, න මෙසො මාරිස අමනුස්සො ලභෙය්‍ය, ආලකමන්දාය රාජධානියා වත්ථුං වා වාසං වා, න මෙසො මාරිස අමනුස්සො ලභෙය්‍ය, යක්ඛානං සමිතිං ගන්තුං, අපිස්සුනං මාරිස අමනුස්සා,

---

පදුට්ඨචිත්තො, අතිශයින් දූෂිත වූ සිත් ඇත්තේ; ගච්ඡන්තං වා, අනුගච්ඡෙය්‍ය, යන්නාහු අනුව යන්නේ හෝ වේද; ඨිතං වා, උපතිට්ඨෙය්‍ය, සිටියාහු සමීපයෙහි සිටිනේ හෝ වේද; නිසින්නං වා, උපනිසීදෙය්‍ය, හිඳිනහු සමීපව හිඳිනේ හෝ වේද; නිපන්නං වා, උපනිපජ්ජෙය්‍ය, සැතපෙන්නහු සමීපයෙහි සැතපෙන්නේ හෝ වේද; මාරිස, නිදුකාණන් වහන්ස; මෙ, මාගේ; සො අමනුස්සො, ඒ අමනුෂ්‍ය තෙම; ගාමෙසු වා, ගම්හි හෝ; නිගමෙසු වා, නියම්ගම්හි හෝ; සක්කාරං වා, සත්කාරයක් හෝ; ගරුකාරං වා, ගරු කිරීමක් හෝ; න ලභෙය්‍ය, නොලබන්නේය; මාරිස, නිදුකාණන් වහන්ස; මෙ, මාගේ; සො අමනුස්සො, ඒ අමනුෂ්‍ය තෙමේ; ආලකමන්දාය නාම රාජධානියා, ආලකමන්දා නම්වූ නුවරෙහි; වත්ථුං වා, ගෘහ වස්තුවක් හෝ; වාසං වා, එහි වාසයක් හෝ; න ලභෙය්‍ය, නො ලබන්නේය, මාරිස, නිදුකාණන් වහන්ස; මෙ, මාගේ, සො අමනුස්සො, ඒ අමනුෂ්‍යතෙම; යක්ඛානං සමිතිං ගන්තුං, යක්ෂ සමාගම්යට යන්නටද; න ලභෙය්‍ය, නොලබන්නේය; මාරිස; නිදුකාණන් වහන්ස; අපිස්සු, නවද; නං, ඔහු; අමනුස්සා,

අ න ව යඟ මපි නං කරෙයျුං අවිවයඟං.

අපිසසූනං මාරිස අමනුසසා, අතතාඟිපි පරිපුණණාඟි පරිභාසාඟි පරිභාසෙයျුං, අපිසසු නං මාරිස අමනුසසා, රිතතමපි පතතං සීසෙ නිකකුජෙජයျုං, අපිසසු නං මාරිස අමනුසසා සතතධාපිසස මූඩං ඵාලෙයျုං, සනතිහි මාරිස අමනුසසා චණඩා රුදදා රභසා, තෙ නෙව මහාරාජානං ආදියනති, න මහා

---

අමනුෂ්‍යයෝ; අනවයහමපි කරෙයျුං, ආවාහයටද යොග්‍ය නො කෙරෙති; අවිවයහමපි, විවාහයටද යොග්‍ය නො කෙරෙති.

මාරිස, නිදුකාණන් වහන්ස; අපිසසු නං, තවද ඔහුට; අමනුසසා, අමනුෂ්‍යයෝ; අතතාඟිපි, ආත්ම සමබනධිවූ; පරිපුණණාඟි, සමපූර්ණවූ; පරිභාසාඟි පරිභාසෙයျုං, කළාර පකෂි කළාර දනත යනාදීන් ආත්මභාවය එලවා අකෂරයන් සම්පූර්ණව ඇසෙන පරිද්දෙන් යකෂාක්‍රොෂ නම්වූ පරිභව වචනයෙන් නිඤකොට බණන්නාහ; මාරිස, නිදුකාණන් වහන්ස; අපිසසුනං, තවද ඔහු අමනුෂ්‍යයෝ; සීසෙ, ඔහුගේ හිසෙහි; රිතතමපි පතතං නිකකුජෙජයျုං, හිස් ලොහෝ පාත්‍රයක්ද නමන්නාහ; මාරිස, නිදුකාණන් වහන්ස; අපිසසුනං, තවද; අමනුසසා, අමනුෂ්‍යයෝ; අසස, ඔහුගේ; මූඩං අපි, මූදුනද; සතතධා ඵාලෙයျုං, සත්කඩක් කොට පළන්නාහ; මාරිස, නිදුකාණන් වහන්ස; චණඩා, චණඩවූ; රුදදා, රෞද්‍රවූ; රභසා, වෙගවත් වූ හෙවත් කරණොතතරිය කරණ යෙන් යුකතවූ; අමනුසසා, අමනුෂ්‍යයෝ; සනතිහි, ඇත්තාහුමය;

රාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිස කානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති.

සෙය්‍යථාපි මාරිස රඤ්ඤො මාගධස්ස විජිතෙ චොරා, තෙ නෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති,

---

තෙ, ඒ අමනුෂ්‍යයෝ; මහාරාජානං, සතර වරම් මහරජදරුවන්ගේ වචනය; න ආදියන්ති, නො ගනිත්මය; මහාරජානං, ඒ වරම් මහරජ දරුන්ගේ; පුරිසකානං, අමාත්‍ය වූ අටවිසි යක්සෙනවි යන්ගේ වචනය; න ආදියන්ති, නො ගනිති; මහාරාජානං, සතර වරම් මහරජදරුන්ගේ පුරිසකානං, අටවිසි යක්සෙනෙවියන් සම්බන්ධිවූ; පුරිසකානං, නයුකන පුරුෂයන්ගේ වචනය; න ආදියන්ති, නො ගනිති; මාරිස, නිදුකාණන් වහන්ස; තෙ ඛො තෙ අමනුස්සා, ඒ මේ අමනුෂ්‍යයෝ වූකලී; මහාරාජානං, සතර වරම් මහරජදරුවන්ට; අවරුද්ධා නාම වුච්චන්ති, පසමිතුරෝ යයි කියනු ලැබෙත්.

මාරිස, නිදුකාණන් වහන්ස; මාගධස්ස රඤ්ඤො, මගධෙශ්වර වූ බිම්සර මහරජහුගේ; විජිතෙ, රටෙහි; චොරා, යම් සොර කෙනෙක්; සෙය්‍යථාපි, යම්සේද; තෙ, ඒ සොරහු; මාගධස්ස රඤ්ඤො, මගධෙශ්වරවූ බිම්සර මහරජහුගේ වචනය; නෙව ආදියන්ති, නොම ගණිත්; රඤ්ඤො මාගධස්ස, මගධෙශ්වර වූ බිම්සර මහරජහුගේ; පුරිසකානං, අමාත්‍යයන්ගේ වචනය, න ආදි

තෙ ඛො තෙ මාරිස මහාචොරා රඤ්ඤො මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති.

එවමෙව ඛො මාරිස සන්ති හි අමනුස්සා චණ්ඩා රුද්දා රභසා, තෙ නෙව මහාරාජානං, ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාම වුච්චන්ති, යො හි

---

යන්ති, නොගනිත්; රඤ්ඤො මාගධස්ස, බිම්සර මහරජහුගේ; පුරුසකානං, අමාත්‍යයන් සම්බන්ධවූ; පුරිසකානං, නියුක්ත පුරුෂයන්ගේ වචනය; න ආදියන්ති, නොගනිත්; මාරිස, නිදුකාණන් වහන්ස; තෙ ඛො තෙ මහාචොරා, ඒ මේ මහාසොරහු වනාහි; මාගධස්ස රඤ්ඤො, මගධෙශ්වරවූ බිම්සර මහරජහුගේ; අවරුද්ධානාම වුච්චන්ති, පසමිතුරෝ යයි කියනු ලැබෙත්.

මාරිස, නිදුකාණන් වහන්ස; එවමෙව ඛො, එපරිද්දෙන්ම; චණ්ඩා, චණ්ඩ වූ; රුද්‍රා, රෞද්‍ර වූ; රභසා, වෙගවත්වූ; අමනුස්සා, අමනුෂ්‍යයෝ; සන්තිහි, ඇත්තාහුමය; තෙ, ඒ අමනුෂ්‍යයෝ; මහාරාජානං, සතර වරම් මහරජදරුවන්ගේ වචනය; න ආදියන්ති, නො ගනිති; මහාරාජානං, වරම් මහරජදරුවන්ගේ; පුරිසකානං, ඉන්ද්‍රාදී අෂ්ටවිංශති, යක්ෂ සෙනාධිපතින්ගේ වචනය; න ආදියන්ති, නො පිළිගනිති; මහාරාජානං, වරම් මහරජදරුවන්ගේ; පුරිසකානං, යක්ෂ සෙනාධිපතීන් අයිති පුරුෂයන්ගේ වචනය; න ආදියන්ති, නො පිළිගන්නාහ; මාරිස, නිදුකාණන් වහන්ස; තෙ ඛො තෙ අමනුස්සා, ඒ මේ අමනුෂ්‍යයෝ; මහාරජානං, වරම් රජදරුවන්ට

කොචි මාරිස අමනුස්සො, යක්ඛො වා යක්ඛිණී වා යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා, යක්ඛමහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා, ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බමහාමත්තො වා ගන්ධබ්බපාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා, කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩපොතිකා වා

---

අවරුද්ධා නාම වුච්චන්ති, පසමිතුරෝ තමැයි කියනු ලැබෙත්; මාරිස, නිදුකාණන් වහන්ස; යො හි කොචි අමනුස්සො, යම්කිසි අමනුෂ්‍යයෙක් තෙමේ; යක්ඛො වා, යක්ෂයෙක් හෝ; යක්ඛිණී වා, යකිණියක් හෝ; යක්ඛපොතකො වා, යක්ෂ පොතකයෙක් හෝ; යක්ඛපොතිකා වා, යක්ෂපොතිකාවක් හෝ; යක්ඛමහාමත්තො වා, යක්ෂ මහාමාත්‍යයෙක් හෝ; යක්ඛපාරිසජ්ජො වා, යක්ෂ පිරිසෙහි වූවෙක් හෝ, යක්ඛපචාරො වා, යක් මෙහෙකරුවෙක් හෝ; ගන්ධබ්බො වා, ගන්ධර්වයෙක් හෝ; ගන්ධබ්බී වා, ගන්ධර්ව ස්ත්‍රියක් හෝ; ගන්ධබ්බපොතකො වා, ගන්ධර්ව පොතකයෙක් හෝ; ගන්ධබ්බපොතිකා වා, ගන්ධර්වපොතිකාවක් හෝ; ගන්ධබ්බමහාමත්තො වා, ගන්ධර්ව මහ ඇමතියෙක් හෝ; ගන්ධබ්බපාරිසජ්ජො වා, ගන්ධර්ව පිරිසෙහි වූවෙක් හෝ; ගන්ධබ්බපචාරො වා, ගන්ධර්ව මෙහෙකරුවෙක් හෝ; කුම්භණ්ඩො වා, කුම්භාණ්ඩයෙක් හෝ; කුම්භණ්ඩී වා, කුම්භාණ්ඩියක් හෝ; කුම්භණ්ඩපොතකො වා, වා, කුම්භණ්ඩ පොතකයෙක් හෝ; කුම්භණ්ඩපොතිකා වා, කුම්භණ්ඩ පොතිකාවක් හෝ; කුම්භණ්ඩ මහාමත්තො වා, කුම්භණ්ඩ මහ

කුම්භණ්ඩපචාරො වා නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාගපොතිකා වා, නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා නාගපචාරො වා, පදුට්ඨචිත්තො;

භික්ඛුං වා භික්ඛුණිං වා, උපාසකං වා උපාසිකං වා, ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍යං, ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං,

---

ඇමතියෙක් හෝ; කුම්භපාරිසජ්ජො වා, කුම්භණ්ඩ පිරිසෙහි වූවෙක් හෝ; කුම්භණ්ඩපචාරො වා, කුම්භණ්ඩ මෙහෙකරුවෙක් හෝ; නාගො වා, නාගයෙක් හෝ; නාගිනී වා, නාගිනියක් හෝ; නාගපොතකො වා, නාගපෝතකයෙක් හෝ; නාගපොතිකා වා, නාග පොතිකාවක් හෝ නාගමහාමත්තො වා, නාගමහාමාත්‍යයෙක් හෝ; නාගපරිසජ්ජො වා, නාග පිරිසෙහි වූවෙක් හෝ; නාගපචාරො වා, නාග මෙහෙකරුවෙක් හෝ; පදුට්ඨචිත්තො, ප්‍රකර්ෂයෙන් දූෂිත සිත් ඇත්තේ;

භික්ඛුං වා, භික්ෂුවක් හෝ; භික්ඛුණිං වා, භික්ෂුණියක් හෝ; උපාසකං වා, උපාසකයක්හු හෝ; උපාසිකං වා, උපාසිකාවක් හෝ; ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය, යන්නහු හා සමග යන්නේ හෝ වේද; ඨිතං වා උපතිට්ඨෙය්‍ය, සිටියාහු සමීපව සිටින්නේ හෝ වේද; නිසින්නං වා උපනිසීදෙය්‍ය, හුන්නහු සමීපව හිඳින්නේ හෝ වේද; නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය, සැතපුනාහු සමීපව සැතපෙන්නේ හෝ වේද; මහායක්ඛානං, පිදියයුතු යක්ෂවූද; සෙනාපතී-

උජ්ඣාපෙතබ්බං විකන්දිතබ්බං විරවිතබ්බං, අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො නමුඤ්චතීති.

කතමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං.

---

නං, යක්ෂසෙනාවට අධිපතිවූ; මහාසෙනාපතීනං, එහෙයින්ම මහාසෙනාධිපතිවූ; ඉමෙසං යක්ඛානං, මේ යක්ෂයන්ට; අයං යක්ඛො ගණ්හාති, මේ යක්ෂතෙමේ අල්වා ගන්නේය; අයං යක්ඛො, මේ යක්ෂතෙමේ; ආවිසති, ආවෙස වන්නේය; අයං යක්ඛො, මේ යක්ෂ තෙමේ; හෙඨෙති, උපන්නාවූ රොගාදීන් වඩිනය කරවමින් පීඩා කෙරෙයි; අයං යක්ඛො, මේ යක්ෂතෙම; විහෙඨෙති, විශෙෂයෙන් පීඩා කෙරෙයි; අයං යක්ඛො, මේ යක්ෂතෙමේ; හිංසති, හිංසා කෙරෙයි; අයං යක්ඛො විහිංසති, මේ යක්ෂතෙමේ විශෙෂයෙන් හිංසා කෙරෙයි; අයං යක්ඛො නමුඤ්චතීති, මේ යක්ෂතෙමේ නොහරනේයයි කියා; උජ්ඣාපෙතබ්බං, යක්ෂසෙනාධිපතීන්ට දන්විය යුතුයි; විකන්දිතබ්බං, අඬගා කිය යුතුයි; විරවිතබ්බං, මුරගා කිය යුතුයි.

කතමෙසං යක්ඛානං, කවර යක්ෂකෙනෙකුන්ට; කතමෙසං මහා යක්ඛානං, කවර මහායක්ෂ කෙනෙකුන්ට; සෙනාපතීනං, කවර සෙනෙවිරත් කෙනෙකුන්ට; මහාසෙනාපතීනං, කවර මහ සෙනෙවිරත් කෙනෙකුන්ට අඬගා කිය යුත්තේද?

39 ඉන්දෝ සොමො වරුණො ච
භාරද්වාජෝ පජාපති,
චන්දනො කාමසෙට්ඨො ච
කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච.

40 පණාදො ඔපමඤ්ඤො ච
දෙවසූතො ච මාතලී,
චිත්තසෙනො ච ගන්ධබ්බො
නාලො රාජා ජනෙසභො.

41 සාතාගිරො හෙමවතො
පුණ්ණකො කරතියො ගුලො
සිවකො මුචලින්දො ච
වෙස්සාමිත්තො යුගන්ධරො,

---

39. ඉන්දෝ, ඉන්ද්‍රය; සොමො, සොමය: වරුණො ච, වරුණය; භාරද්වාජෝ, භාරද්වාජය; පජාපතී, පජාපතිය; චන්දනො, චන්දනය; කාමසෙට්ඨො ච, කාමසෙට්ඨය; කින්නුඝණ්ඩු, කින්නුඝණ්ඩුය; නිඝණ්ඩු ච, නිඝණ්ඩුය.

40. පණාදො, පණාදය; ඔපමඤ්ඤො ච, ඔපමඤ්ඤය; දෙවසූතො ච, දෙවසූතය; මාතලී, මාතලීය; චිත්තසෙනො ච, චිත්‍රසෙනය; ගන්ධබ්බො, ගන්ධර්වය; නලො, නලය; රාජා, රාජය; ජනෙසභො, ජනෙසභය.

41. සාතාගිරො, සාතාගිරිය; හෙමවතො, හෙමවතය; පුණ්ණකො, පුණ්ණකය; කරතියො, කරතියය; ගුලො, ගුලය; ගුලය; සිවකො, සිවකය; මුචලින්දො ච, මුචලින්දය; වෙස්සාමිත්තො; වෙස්සාමිත්තය; යුගන්ධරො, යුගන්ධරය.

42 ගොපාලො සුප්පගෙධො ච
හිරි නෙත්ති ච මන්දියො,
පඤ්චාලචණ්ඩො ආලවකො
පජ්ජුන්නො සුමනො
සුමුඛො දධිමුඛො,
මණිමාණිචරො දීඝො
අථො සෙරීසකො සහ,

ඉමෙසං යක්ඛානං මහායක්ඛානං,
සෙනාපතීනං මහාසෙනාපතීනං,
උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං
විරවිතබ්බං, අයං යක්ඛො ගණ්හාති,

---

42. ගොපාලො, ගොපාලය, සුප්පගෙධො ච, සුප්පගෙධය; හිරි, හිරිය; නෙත්ති ච, නෙත්තිය, මන්දියො, මන්දියය; පඤ්චාලචණ්ඩො, පඤ්චාලචණ්ඩය; ආලවකො, ආලවකය; පජ්ජුන්නො, පජ්ජුන්නය; සුමනො, සුමනය; සුමුඛො, සුමුඛය; දධිමුඛො දධිමුඛය; මණිමාණිචරො, මණිමාණිචරය; දීඝො, දීඝය; අථො, නවද; සහ, මොවුන් සමග වූ; සෙරීසකො, සෙරීසකය යන මොව්හුයි.

මහායක්ඛානං, මහායක්ෂවූ; සෙනාපතීනං, යක්ෂසෙනාවට අධිපතිවූ; මහාසෙනාපතීනං, මහාසෙනාවට අධිපතිවූ මේ යක්ෂයන්ට; අයං යක්ඛො ගණ්හාති, මේ යක්ෂතෙමේ අල්වන්නේය; අයං යක්ඛො ආවිසති, මේ යක්ෂතෙමේ ආවෙශ වන්නේය; අයං යක්ඛො හෙඨෙති, මේ යක්ෂතෙමේ උපන්නාවූ රොගාදිය වඬනය කරමින් පීඩා කරන්නේය; අයං යක්ඛො විහෙඨෙති, මේ යක්ෂතෙමේ විශෙෂයෙන් පීඩා කරන්නේය; අයං යක්ඛො හිංසති, මේ යක්ෂතේමේ මාංශ රුධිරාදිය ශොෂනය කරමින් හිංසා කරන්නේය, අයං යක්ඛො විහිංසති, මේ යක්ෂතෙමේ විශෙෂයෙන් හිංසා කරන්

අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො න මුඤ්චතීති;

අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුනීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති. හන්ද ච දනි මයං මාරිස ගච්ඡාම, බහුකිච්චා මයං බහුකරණීයාති, යස්සදනි තුම්හෙ මහාරාජානො

තේය; අයං යක්ඛො න මුඤ්චතීති, මේ යක්ෂතෙමේ, අපස්මාර ග්‍රහණය කොට නොහරත්තේයයි කියා; ඉමෙසං යක්ඛානං, මේ යකුන්ට; උජ්ඣාපෙතබ්බං, දන්විය යුතුයි; වික්කන්දිතබ්බං, අඬගා කිය යුතුයි; විරවිතබ්බං, පෙර ලෙසින් මුරගා කිය යුතුයි.

මාරිස, නිදුකාණන් වහන්ස; අයං ඛො සා ආටානාටියා රක්ඛා, ඒ මේ ආටානාටිය ආරක්ෂාව වනාහි; භික්ඛූනං, භික්ෂූන්ගේද, භික්ඛුණීනං, භික්ෂුණීන්ගේද; උපාසකානං, උපාසකවරුන්ගේද; උපාසිකානං, උපාසිකාවරුන්ගේද; ගුත්තියා, සංවරණය පිණිස; රක්ඛාය, ආරක්ෂාව පිණිස; අවිහිංසාය, වෙහෙස නොවන පිණිස; ඵාසුවිහාරාය, පහසුවිහරණය පිණිස පවතී; මාරිස, නිදුකාණන් වහන්ස; මයං, අපි; බහුකිච්චා, බොහෝ කෘත්‍ය ඇත්තම්හ; බහුකරණීයා, බොහෝ කතීව්‍ය ඇත්තම්හ; හන්ද, එබැවින්; ඉදනි, දැන්; මයං, අපි; ගච්ඡාමාති, යම්හයි කියා බුදුරජාණන් වහන්සේට

කාලං මඤ්ඤථාති, අථ ඛො චත්තාරො මහාරාජා උට්ඨායාසනා, භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු, තෙපි ඛො යක්ඛා උට්ඨායාසනා, අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු,

අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං

---

සැලකළෝය; මහාරාජානො, වරම් මහරජදරුවෙනි; තුම්හෙ; තෙපි; ඉදානි, දැන්; යස්ස, යම් ගමනක් සිතව්ද ඒ ගමනට; කාලං මඤ්ඤථාති, කල්දනුවයි වදාළසේක; අථ ඛො, ඉක්බිත්තෙන්; චත්තාරො මහාරාජා, සතර වරම් මහරජදරුවෝ; උට්ඨායාසනා, හුනස්නෙන් නැගිට; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේට; අභිවාදෙත්වා, නමස්කාරකොට; පදක්ඛිණං කත්වා, ප්‍රදක්ෂිණාකොට; තත්ථෙවන්තරධායිංසු, එතැන්හිම අන්තර්ධාන වූවාහුය; තෙපි ඛො යක්ඛා, ඒ යක්ෂයෝ වනාහි; උට්ඨායාසනා, හුනස්නෙන් නැගී, අප්පෙකච්චෙ, සමහර යක්ෂකෙනෙක්; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; අභිවාදෙත්වා, සකසා වැඳ; පදක්ඛිණං කත්වා, ප්‍රදක්ෂිණාකොට; තත්ථෙවන්තරධායිංසු, එතැන්හිම අන්තර්ධාන වූවාහුය.

අප්පෙකච්චෙ, සමහර යක්ෂකෙනෙක්; භගවතා සද්ධිං, බුදුරජාණන් වහන්සේ හා සමග; සම්මොදිංසු, සතුටු වූවාහුය;

**සාරාණීයං වීතිසාරෙත්වා තතෙථ වන්තරධායිංසු, අප්පෙකච්චෙ යෙන භගවා, තෙනඤ්ජලිං පණාමෙත්වා තත්ථෙවන්තරධායිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙවන්තරධායිංසූති.**

තතියක භාණවාරං.

---

**අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි, ඉමං භික්ඛවෙ රත්තිං චත්තාරො මහාරාජා, මහතියා ච යක්ඛසෙනාය,**

---

සම්මොදනීයං, සතුටු විය යුතුවූ; සාරාණීයං, සිහිකට යුතුවූ; කථං, කථාවත්; වීතිසාරෙත්වා, කොට නිමවා; තත්ථෙවන්තරධායිංසු; එතැන්හිම අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, සමහර යක්ෂකෙනෙක්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; යෙන, යම් තැනැක්හිද; තෙන එතැන්හි; අඤ්ජලිං පනාමෙත්වා, ඇඳිලි බැඳ; තත්ථෙවන්තරධායිංසු, එතැන්හිම; අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, සමහර යක්ෂකෙනෙක්; නාමගොත්තං සාවෙත්වා, නම්ගොත් අස්වා; තත්ථෙවන්තරධායිංසු, එතැන්හිම අතුරුදන් වූහ; අප්පෙකච්චෙ, සමහර යක්ෂකෙනෙක්; තුණ්හීභූතා, නිශ්ශබ්ද වූවෝ; තත්ථෙවන්තරධායිංසූති, එතැන්හිම අතුරුදන් වූහ.

තුන් බණවරයි.

---

අථ ඛො, ඉක්බිත්තෙන්; භගවා, භාග්‍යවත් තෙමේ; තස්සා රත්තියා අච්චයෙන, ඒ රාත්‍රියෙහි ඇවෑමෙන්; භික්ඛූ ආමන්තෙසි, භික්ෂූන් ඇමතූ සේක; භික්ඛවෙ, මහණෙනි, ඉමං රත්තිං, මේ ඉකුත් රාත්‍රියෙහි; චත්තාරො මහාරාජා, සතර වරම් මහරජද්‍රුවෝ; මහතියා ච යක්ඛසෙනාය, මහත් යක්ෂසෙනාවකින්ද; මහතියා ච

මහතියා ච ගන්ධබ්බසෙනාය,
මහතියා ච කුම්භණ්ඩසෙනාය,
මහතියා ච නාගසෙනාය, චතුද්දිසං
ගුම්බං ඨපෙත්වා චතුද්දිසං ඔවරණං
ඨපෙත්වා අභික්කන්තාය රත්තියා
අභික්කන්තවණ්ණා කෙවලකප්පං
ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙනාහං
තෙනුපසංකමිංසු උපසංකමිත්වා මං
අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු:

තෙපි ඛො භික්ඛවෙ යක්ඛා,
අප්පෙකච්චෙ මං අභිවාදෙත්වා එක

---

ගන්ධබ්බසෙනාය, මහත් ගන්ධර්ව සේනාවකින්ද; මහතියා ච කුම්භණ්ඩසෙනාය, මහත් කුම්භාණ්ඩ සේනාවකින්ද; මහතියා ච නාගසෙනාය, මහත් නාගසේනාවකින්ද; චතුද්දිසං රක්ඛං ඨපෙත්වා, සිව්දිග සක් දෙවිඳුහට ආරක්ෂා පිහිටුවා; චතුද්දිසං ගුම්බං ඨපෙත්වා, සිව්දිග මහා බලසේනාව තබා; චතුද්දිසං ඔවරණං ඨපෙත්වා, සිව්දිග සේනාව තරයලා සිටුවා; අභික්කන්තාය රත්තියා, පෙරයම් රෑය ඉක්මුණු කල්හි; අභික්කන්තවණ්ණා, අතිශයින් මනොඥ ඡවිවර්ණ ඇත්තාහු; කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා, සියලු ගිජ්ඣකූට පර්වතය එකාලොක කොට බබුලුවා; යෙනාහං, මම යම් ගිජ්ඣකූට පර්වතයෙක්හි වාසය කෙළෙම්ද; තෙන, එතැන්හි; උපසංකමිංසු, එළඹියාහුය; උපසංකමිත්වා, එළැඹ; මං අභිවාදෙත්වා, මා වැඳ; එකමන්තං නිසීදිංසු, එකත්පසෙක්හි හුන්නාහුය.

භික්ඛවෙ, මහණෙනි; තෙපි ඛො යක්ඛා, වෙසමුණු මහ රජ්ජුරුවන් සමඟ ආ ඒ යක්ෂයෝද; අප්පෙකච්චෙ, සමහර කෙනෙක් මං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, මට නමස්කාර කොට එකත්

මන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ යෙනාහං තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නො බො භික්ඛවෙ වෙස්සවණ්ණො මහාරාජා මං එතදවොච.

සන්තිහි භන්තෙ උළාරා යක්ඛා භගවතො අප්පසන්නා, සන්තිහි

---

පසෙක හුන්නාහුය, අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු, සමහර කෙනෙක්; මා සමග සතුටු වූවාහුය; සම්මොදනීයං, සතුටු විය යුතුවූ; සාරාණීයං, සිහි කට යුතුවූ; කථං, කථාවත්; වීතිසාරෙත්වා, කොට නිමවා; එකමන්තං නිසීදිංසු, එකත්පසෙක හුන්නාහුය; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; අහං, මම; යෙන, යම් තැනෙක්හිද; තෙන, එතැන්හි; අඤ්ජලිං පණාමෙත්වා, දෙහොත් මුදුන්දී වැඳ; එකමන්තං නිසීදිංසු, එකත්පසෙක හුන්නාහුය; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; නාමගොත්තං සාවෙත්වා, නම්ගොත් අස්වා; එකමන්තං නිසීදිංසු, එකත්පසෙක්හි හුන්හ; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; තුණ්හීභූතා, තුෂ්ණීම්භූතව; එකමන්තං, එකත් පසෙක; නිසීදිංසු; හුන්නාහුය; භික්ඛවෙ, මහණෙනි; එකමන්තං නිසින්නො බො, එකත්පස්ව හුන්නාම වූ; වෙස්සවණ්ණො මහාරාජා, වෛශ්‍රවණ මහරජ තෙමේ; මං, මට; එතදවොච, මෙසේ දැන්විය.

භන්තෙ උළාරා යක්ඛා භගවතො පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ මජ්ඣිමා යක්ඛා භගවතො පසන්නා, සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො අප්පසන්නා, සන්ති හි භන්තෙ නීචා යක්ඛා භගවතො පසන්නා, යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා, අප්පසන්නායෙව භගවතො, තං කිස්සහෙතු? භගවා හි භන්තෙ

---

භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවතුන් වහන්සේට; අප්පසන්නා, අප්‍රසන්නවූ; උළාරා යක්ඛා, ආනුභාවසම්පන්න යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හට; පසන්නා, ප්‍රසන්නවූ; උළාරා යක්ඛා, ආනුභාව සම්පන්නවූ යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හට; අප්පසන්නා, අප්‍රසන්නාවූ; මජ්ඣිමා යක්ඛා, මධ්‍යමානුභාව ඇති යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හට; පසන්නා, ප්‍රසන්නාවූ; මජ්ඣිමා යක්ඛා, මධ්‍යමානුභාව ඇති යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හට; අප්පසන්නා, අප්‍රසන්න වූ; නීචා යක්ඛා, අල්පේශාක්‍ය යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හට; පසන්නා, ප්‍රසන්නාවූ; නීචා යක්ඛා, අල්පේශාක්‍ය යක්ෂයෝ; සන්ති හි, ඇත්තාහුමය; භන්තෙ, ස්වාමීනි; යක්ඛා, යක්ෂයෝ; යෙභුය්‍යෙන ඛො පන, බොහෝසේම වනාහි; භගවතො, භාග්‍යවත්හට; අප්පසන්නායෙව, අප්‍රසන්නයෝමය; තං කිස්ස හෙතු? ඊට හේතුව කවරේද? භන්තෙ, ස්වාමීනි; භගවා හි, භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ වනාහි; පාණාතිපාතා

පාණාතිපාතා වෙරමණියා ධම්මං දෙසෙති, අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති, කාමෙසුමිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාදා වෙරමණියා ධම්මං දෙසෙති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති, යෙභුය්‍යෙන ඛො පන භන්තෙ යක්ඛා අප්පටිවිරතා යෙව පාණාතිපාතා, අප්පටිවිරතා අදින්නාදානා, අප්පටිවිරතා කාමෙසුමිච්ඡාචාරා, අප්පටිවිරතා මුසාවාදා, අප්පටිවිරතා සුරාමෙරය

---

වෙරමණියා ධම්මං දෙසෙති, ප්‍රාණඝාතයෙන් වෙන්වන පිණිස ධර්ම දෙශනා කර වදරන සේක.

අදින්නාදානා වෙරමණියා ධම්මං දෙසෙති, අදත්තාදානයෙන් වැළැක්ම පිණිස ධර්මදෙශනා කරන සේක; කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා ධම්මං දෙසෙති, කාමමිථ්‍යාචාරයෙන් වැළැක්ම පිණිස ධර්මදෙශනා කරන සේක; මුසාවාදා වෙරමණියා ධම්මං දෙසෙති, මුසාවාදයෙන් වැළැක්ම පිණිස ධර්මදෙශනා කරන සේක; සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා ධම්මං දෙසෙති, මද ප්‍රමාද දෙකට කාරණවූ රහමෙර පානයෙන් වැළැක්ම පිණිස ධර්මදෙශනා කරන සේක; භන්තෙ, ස්වාමීන් වහන්ස; යක්ඛා, යක්ෂයෝ; යෙභුය්‍යෙන ඛො පන, බොහෝ සෙයින්ම වනාහි; පාණාතිපාතා අප්පටිවිරතා, ප්‍රාණඝාතයෙන් නොවැළැක්කාහුමය; අදින්නාදාන අප්පටිවිරතා, අයිනාදතින් නොවැළැක්කාහුමය; කාමෙසු මිච්ඡාචාරා අප්පටිවිරතා, කාමමිථ්‍යාචාරයෙන් නොවැළැක්කාහුමය; මුසාවාදා

මජ්ජපමාදට්ඨානා, තෙසං තං හොති
අප්පියං අමනාපං, සන්තිහි භන්තෙ
භගවතො සාවකා අරඤ්ඤෙ වන
පත්ථානි පන්තානි සෙනාසනානි
පටිසෙවන්ති අප්පසද්දානි අප්ප
නිග්ඝොසානි, විජනවාතානි, මනුස්ස
රාහසෙය්‍යකානි පටිසල්ලාන සාරුප්
පානි, තත්ථ උළාරා යක්ඛා
නිවාසිනො, යෙ ඉමස්මිං භගවතො
පාවචනෙ අප්පසන්නා, තෙසං
පසාදාය, උග්ගණ්හාතු භන්තෙ

---

අප්පටිවිරතා, බොරු කීමෙන් නොවැළැක්කාහුමය; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා අප්පටිවිරතා, සුර පානයෙන් නොවැළැක්කාහුමය; තෙසං, එසේවූ යක්ෂයන්ට; තං, ඔබවහන්සේගේ ධර්මය; අප්පියං හොති, අප්‍රිය වේ; අමනාපං, අමනොඥ වේ; භන්තෙ, ස්වාමීනි; භගවතො, භාග්‍යවත්හුගේ; සාවකා, ශ්‍රාවකයෝ; සන්තිහි, ඇත්තාහුමය.

අරඤ්ඤෙ, මහා අරණ්‍යයෙහි වූද; වනපත්ථානි, වනයට ඇතුළත් වූද; පන්තානි, ගම්වැස්සන්ගේ වාසස්ථානයට ඉතා දුර වූද; අප්පසද්දානි, මනුෂ්‍යයන්ගේ බොහෝ ශබ්ද නැත්තාවූ; අප්පනිග්ඝොසානි, බොහෝ ඝොෂා නැත්තාවූ; විජනවාතානි, මනුෂ්‍යයන්ගේ රහසට යොග්‍යවූ (භික්ෂූන්ගේ ධ්‍යානභාවනාදි නිවැරැදි රහස් ක්‍රියාවට යොග්‍යවූ; පටිසල්ලාන සාරුප්පානි, සිත එකඟ කර ගැන්මට සුදුසු වූ; සෙනාසනානි, සෙනාසනයන්; පටිසෙවන්ති, සෙවනය කෙරෙත්; තත්ථ, ඒ අරණ්‍යයෙහි; නිවාසිනො, නිබඳ වාසය කරන්නාවූ; උළාරා යක්ඛා, ආනුභාවසම්පන්න යක්ෂයෝ; සන්තිහි, ඇත්තාහුමය; යෙ, යම් කෙනෙක්; භගවතො, භාග්‍යවත්හුගේ; ඉමස්මිං පාවචනෙ, මේ ත්‍රිපිටක බුඬ වචනයෙහි; අප්පසන්නා, අප්‍රසන්නයෝ ද; තෙසං

භගවා ආටානාටියං රක්ඛං භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති, අධිවාසෙසිං ඛො අහං භික්ඛවෙ තුණ්හීභාවෙන, අථ ඛො භික්ඛවෙ වෙස්සවණො මහාරාජා මං අධිවාසනං විදිත්වා තායං වෙලායං ඉමං ආටානාටියං රක්ඛං අභාසි.

---

පසාදය, ඔවුන්ගේ පැහැදීම පිණිස; භනෙත, ස්වාමීන් වහන්ස; භගවා, භාග්‍යවතුන් වහන්සේ; භික්ඛූනං, භික්‍ෂූන්ගේද; භික්ඛුණීනං, භික්‍ෂුණීන්ගේද; උපාසකානං, උපාසකවරුන්ගේද; උපාසිකානං, උපාසිකාවන්ගේද; ගුත්තියා, උවදුරු වැළැක්ම පිණිසද; රක්ඛාය, ආරක්‍ෂාව පිණිසද; අවිහිංසාය, හිංසා නොවන පිණිසද; ඵාසු විහාරාය, සැපවිහරණය පිණිසද; ආටානාටියං රක්ඛං, ආටානාටිය පිරිත; උග්ගණ්හාතු ඉති, ඉගෙණ වදාරන සේක්වා; භික්ඛවෙ, මහණෙනි; අහං, මම; තුණ්හීභාවෙන, නිශ්ශබ්ද භාවයෙන්; අධිවාසෙසිං, ඉවසූයෙම්මය; භික්ඛවෙ, මහණෙනි; අථ ඛො, ඉක්බිත්තෙන්; වෙස්සවණො මහාරාජා, වෙසවුණු මහරජතෙම; මං අධිවාසනං විදිත්වා, මාගේ ඉවසීම දැන; තායං වෙලායං, ඒ වෙලා යෙහි; ඉමං ආටානාටියං රක්ඛං, මේ ආටානාටිය පිරිත; අභාසි, කීයේය.

මෙතැන් සිට අෂ්ටව්‍යාඛ්‍යානය සුගමයි.

විපසසිසස නමත්ථු
චකඛුමනතසස සිරිමතො.
සිඛිසස පි නමත්ථු
සබබභූතානුකමපිනො.

වෙසසභුසස නමත්ථු
නහාතකසස තපසසිනො,
නමත්ථු කකුසනධසස
මාරසෙනා පමද්දිනො.

කොණාගමනසස නමත්ථු
බ්‍රාහමණසස වුසීමතො,
කසසපසස නමත්ථු
විපපමුතතසස සබබධි.

අඞගීරසසස නමත්ථු
සක්‍යපුතතසස සිරීමතො.
යො ඉමං ධමමමදෙසෙසි
සබබදුකඛාපනූදනං.
යෙ චාපි නිබබුතා ලොකෙ
යථාභූතං විපසසිසුං,
තෙ ජනා අපිසුණා
මහනතා වීතසාරදා.

හිතං දෙවමනුස්සානං
යං නමස්සන්ති ගොතමං,
විජ්ජාචරණසම්පන්නං
මහන්තං වීතසාරදං.

යතො උග්ගච්ඡති සූරියො
ආදිච්චො මණ්ඩලී මහා,
යස්සචුග්ගච්ඡමානස්ස
සංවරීපි නිරුජ්ඣති.

යස්ස චුග්ගතෙ සූරියෙ
දිවසොති පවුච්චති,
රහදෙපි තත්ථ ගම්භීරො
සමුද්දෙ සරිතොදකො.

එවං නං තත්ථ ජානන්ති
සමුද්දො සරිතොදකො,
ඉතො සා පුරිමා දිසා
ඉති නං ආචික්ඛතී ජනො.

යං දිසං අභිපාලෙති
මහාරාජා යසස්සිසො,
ගන්ධබ්බානං ආධිපති
ධතරට්ඨො ඉති නාමසො.

රමති නච්චගීතෙහි
ගන්ධබ්බෙහි පුරක්ඛතො,
පුත්තාපි තස්ස බහවො
එකනාමාති මෙ සුතං.

අසීතිං දසඑකො ච
ඉන්දනාමා මහබ්බලා,
තෙ චාපි බුද්ධං දිස්වාන
බුද්ධං ආදිච්චබන්ධුනං.

දූරතොව නමස්සන්ති
මහන්තං වීතසාරදං,
නමො තෙ පුරිසාජඤ්ඤ
නමො තෙ පුරිසුත්තම.

කුසලෙන සමෙක්ඛසි,
අමනුස්සාපි තං වන්දන්ති
සුතං නෙතං අභිණ්හ සො
තස්මා එවං වදෙම්සෙ

ජිනං වන්දථ ගොතමං
ජිනං වන්දාම ගොතමං,
විජ්ජාචරණසම්පන්නං
බුද්ධං වන්දාම ගොතමං.

යෙන පෙතා පවුච්චන්ති
පිසුණා පිට්ඨිමංසිකා,

පාණාතිපාතිනෝ ලුද්දා
චොරා නෙකාතිකා ජනා.

ඉතො සා දක්ඛිණා දිසා
ඉති නං ආචික්ඛති ජනො,
යං දිසං අභිපාලෙති
මහාරාජා යසස්සිසො.

කුම්භණ්ඩානං ආධිපති
විරූළ්හො ඉති නාම සො,
රමති නච්චගීතෙහි
කුම්භණ්ඩෙහි පුරක්ඛතො.

පුත්තාපි තස්ස බහවො
එකනාමාති මෙ සුතං,
අසීතිං දසඑකො ච
ඉන්දනාමා මහබ්බලා.

තෙ චාපි බුද්ධං දිස්වාන
බුද්ධං ආදිච්චබන්ධුනං
දූරතොව නමස්සන්ති
මහන්තං වීතසාරදං.

නමො තෙ පුරිසාජඤ්ඤ
නමො තෙ පුරිසුත්තම,

කුසලෙන සමෙක්ඛසි
අමනුස්සා පි තං වන්දන්ති.

ඛුත්තං නෙත්තං අභිඤ්ඤාය සො
තස්මා එවං වදෙමසෙ
ජිනං වන්දථ ගොතමං
ජිනං වන්දාම ගොතමං.

විජ්ජාචරණසම්පන්නං
බුද්ධං වන්දාම ගොතමන්ති,
යත්‍ථ චොග්ගච්ඡති සුරියො
ආදිච්චො මණ්ඩලී මහා.

යත්‍ථ චොග්ගච්ඡමානස්ස
දිවසො පි නිරුජ්ඣති.
යත්‍ථ චොග්ගතෙ සූරියෙ
සංවරීති පවුච්චති,

රහදෙ පි තත්‍ථ ගම්භීරො
සමුද්දෙ සරිතොදකො.
එවන්තං තත්‍ථ ජානන්ති
සමුද්දෙ සරිතොදකො,

ඉතො සා පච්ඡිමා දිසා
ඉති නං ආචික්ඛති ජනො,

යං දිසං අභිපාලේති
මහාරාජා යසස්සි සො.
නාගානං ආධිපති
විරූපක්ඛො ඉති නාමසො,
රමති නච්චගීතෙහි
නාගෙහි පුරක්ඛතො.
පුත්තාපි තස්ස බහවො
එකනාමාති මෙ සුතං,
අසීතිං දස එකො ච
ඉන්දනාමා මහබ්බලා.
තෙ චාපි බුද්ධං දිස්වාන
බුද්ධං ආදිච්ච බන්ධුනං,
දූරතොව නමස්සන්ති
මහන්තං වීතසාරදං.
නමො තෙ පුරිසාජඤ්ඤ
නමො තෙ පුරිසුත්තම,
කුසලෙන සමෙක්ඛසි
අමනුස්සාපි තං වන්දන්ති.
සුතං නෙතං අභිණ්හසො
තස්මා එවං වදෙමසෙ,

ජිනං වන්දථ ගොතමං
ජිනං වන්දාම ගොතමං.
විජ්ජාචරණසම්පන්නං
බුද්ධං වන්දාම ගොතමන්ති,
යෙන උත්තරකුරූ රම්මා
මහානෙරු සුදස්සනො.
මනුස්සා තත්ථ ජායන්ති
අමමා අපරිග්ගහා,
න තෙ බීජං පවපන්ති
න පි නීයන්ති නඞ්ගලා.
අකට්ඨපාකිමං සාලිං
පරිභුඤ්ජන්ති මනුස්සා,
අකණං අථුසං සුද්ධං
සුගන්ධං තණ්ඩුලප්ඵලං.
තුණ්ඩිකීරෙ පචිත්වාන
තතො භුඤ්ජන්ති භොජනං,
ගාවිං එකඛුරං කත්වා
අනුයන්ති දිසො දිසං.
පසුං එකඛුරං කත්වා
අනුයන්ති දිසො දිසං,

ඉත්ථිවාහනං කත්වා
අනුයන්ති දිසො දිසං.

පුරිසවාහනං කත්වා
අනුයන්ති දිසො දිසං,
කුමාරිවාහනං කත්වා
අනුයන්ති දිසො දිසං.

කුමාරවාහනං කත්වා
අනුයන්ති දිසො දිසං,
තෙ යානෙ අභිරූහිත්වා
සබ්බාදිසා අනුපරියන්තිපචාරා
තස්ස රාජිනො.

හත්ථියානං අස්සයානං
දිබ්බංයානං උපට්ඨිතං
පාසාද සිවිකා චෙව
මහාරාජස්ස යසස්සිනො.

තස්ස ච නගරා ආහු
අන්තලික්ඛෙ සුමාපිතා.
ආටානාටා කුසිනාටා පරකුසි
නාටානාට පුරියා පරකුසිතනාටා.

උත්තරෙන කපීවන්තො ජනොඝ
මපරෙනච, නව නවුතියො අම්බර
අම්බරවතියො ආලකමන්දා නාම
රාජධානි,කුවෙරස්ස ඛො පන මාරිස
මහාරාජස්ස විසාණා නාමරාජධානී
තස්මා කුවෙරො මහාරාජා වෙස්ස
වණොති පවුච්චති. පච්චෙසන්තො
පකාසෙන්ති තතොලා තත්තලා
තතොතලා, ඔජසි තෙජසි තතො
ජසි සූරො රාජා අරිට්ඨො නෙමි,
රහදෙපි තත්ථ ධරණීනාම, යතො
මෙඝා පවස්සන්ති වස්සායතො පතා
යන්ති, සභාපි තත්ථ භගලවතී
නාම යත්ථ යක්ඛා පයිරුපාසන්ති.

තත්ථ නිච්චඵලා රුක්ඛා
නානාදිජ ගණායුතා,
මයූරකොඤ්චාභිරුදා,
කොකිලාභීහි වග්ගුහි,

ජීවංජීවක සද්දෙත්ථ
අථො ඔට්ඨව චිත්තකා,

කුකුත්ථකා කුලීරකා
වනෙ පොක්ඛරසාතිකා.

සූකසාලිකසද්දෙත්ථ
දණ්ඩමානවකාතිච,
සොභති සබ්බකාලං සා
කුවෙරනලිනී සදා.

ඉතො සා උත්තරා දිසා
ඉති නං ආචික්ඛති ජනො.
යං දිසං අභිපාලෙති
මහාරාජා යසස්සිසො.

යක්ඛානං ආධිපති
කුවෙරො ඉති නාමසො,
රමති නච්චගීතෙහි
යක්ඛෙහි පුරක්ඛතො.

පුත්තාපි තස්ස බහවො
එකනාමාති මෙ සුතං,
අසිතිං දස එකො ච
ඉන්දනාමා මහබ්බලා.

තෙ චාපි බුද්ධං දිස්වාන
බුද්ධං ආදිච්චබන්ධුනං,
දූරතොව නමස්සන්ති
මහන්තං වීතසාරදං.

නමො තෙ පුරිසාජඤ්ඤ
නමො තෙ පුරිසුත්තම,
කුසලෙන සමෙක්ඛසි
අමනුස්සා පි තං වන්දන්ති.

සුතං නෙතං අභිණ්හසො
තස්මා එවං වදෙමසෙ
ජිනං වන්දථ ගොතමං,
ජිනං වන්දාම ගොතමං
විජ්ජාචරණසම්පන්නං
බුද්ධං වන්දාම ගොතමං.

අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති, යස්ස කස්සචි මාරිස භික්ඛුස්ස වා භික්ඛුණියා වා, උපාසකස්ස වා උපාසිකාය වා, අයං ආටානාටියා රක්ඛා සුග්ගහිතා භවිස්සති සමත්තා

පරියාපුතා, තඤ්චෙ අමනුස්සො, යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛපොතකො වා යක්ඛපොතිකා වා යක්ඛ මහාමත්තො වා යක්ඛපාරිසජ්ජො වා යක්ඛපචාරො වා, ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බපොතකො වා ගන්ධබ්බපොතිකා වා, ගන්ධබ්බ මහාමත්තො වා ගන්ධබ්බ පාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා, කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා, කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩ පොතිකා වා, කුම්භණ්ඩමහාමත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො වා කුම්භණ්ඩපචාරො වා, නාගො වා නාගිනී වා, නාගපොතකො වා නාග පොතිකා වා, නාගමහාමත්තො වා නාගපාරිසජ්ජො වා, නාගපචාරො වා ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා උප

නිපජ්ජෙය්‍ය; න මෙසො මාරිස අමනුස්සො ලභෙය්‍ය, ගාමෙසු වා නිගමෙසු වා, සක්කාරං වා ගරුකාරං වා, නමෙ සො මාරිස අමනුස්සො ලභෙය්‍ය, ආලකමන්දාය රාජධානියා වත්ථුං වා වාසං වා, නමෙ සො මාරිස අමනුස්සො ලභෙය්‍ය, යක්ඛානං සමිතිං ගන්තුං, අපිස්සුනං මාරිස අමනුස්සා, අනවය්හම්පි නං කරෙය්‍යුං අවිවය්හං, අපිස්සුනං මාරිස අමනුස්සා, අත්තාහි පි පරිපුණ්ණාහි පරිභාසාහි පරිභාසෙය්‍යුං, අපිස්සුනං මාරිස අමනුස්සා. රිත්තම්පි පත්තං සීසෙ නික්කුජ්ජෙය්‍යුං, අපිස්සුනං මාරිස අමනුස්සා, සත්තධාපිස්ස මුද්ධා ඵාලෙය්‍යුං. සන්තිහි මාරිස අමනුස්සා චණ්ඩා රුද්දා රභසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස

අමනුස්සා, මහාරාජානං අවරුද්ධා නාමවුච්චන්ති, සෙය්‍යථාපි මාරිස රඤ්ඤො මාගධස්ස විජිතෙ චොරා, තෙ නෙව රඤ්ඤො මාගධස්ස ආදියන්ති, න රඤ්ඤො මාගධස්ස පුරිසකානං ආදියන්ති, නරඤ්ඤො මාගධස්ස පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස මහාචොරා, රඤ්ඤො මාගධස්ස අවරුද්ධා නාම වුච්චන්ති, එවමෙව ඛො මාරිස සන්තිහි අමනුස්සා චණ්ඩා රුද්ධා රභසා, තෙ නෙව මහාරාජානං ආදියන්ති, න මහාරාජානං පුරිස කානං ආදියන්ති, න මහාරාජානං පුරිසකානං පුරිසකානං ආදියන්ති, තෙ ඛො තෙ මාරිස අමනුස්සා. මහා රාජානං අවරුද්ධා නාම වුච්චන්ති, යොහි කොචි මාරිස අමනුස්සො, යක්ඛො වා යක්ඛිණී වා, යක්ඛ පොතකො වා යක්ඛපොතිකා

වා, යක්ඛමහාමත්තො වා යක්ඛ
පාරිසජ්ජො වා යක්ඛපචාරො වා,
ගන්ධබ්බො වා ගන්ධබ්බී වා, ගන්ධබ්බ
පොතකො වා ගන්ධබ්බපොතිකා වා,
ගන්ධබ්බ මහාමත්තො වා ගන්ධබ්බ
පාරිසජ්ජො වා ගන්ධබ්බපචාරො වා,
කුම්භණ්ඩො වා කුම්භණ්ඩී වා,
කුම්භණ්ඩපොතකො වා කුම්භණ්ඩ
පොතිකා වා, කුම්භණ්ඩ මහා
මත්තො වා කුම්භණ්ඩපාරිසජ්ජො
වා කුම්භණ්ඩපචාරො වා, නාගො වා
නාගිනී වා, නාගපොතකො වා නාග
පොතිකා වා, නාග මහාමත්තො වා
නාගපාරිසජ්ජො වා නාගපචාරො
වා, පදුට්ඨචිත්තො, භික්ඛුං වා
භික්ඛුනිං වා, උපාසකං වා උපාසිකං
වා, ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය,
ඨිතං වා උපතිට්ඨෙය්‍ය, නිසින්නං
වා උපනිසීදෙය්‍ය, නිපන්නං වා, උප
නිපජ්ජෙය්‍ය, ඉමෙසං යක්ඛානං මහා

යක්ඛානං, සෙනාපතීනං මහාසෙනා
පතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දි
තබ්බං විරවිතබ්බං, අයං යක්ඛො
ගණ්හාති, අයං යක්ඛො ආවිසති,
අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො
විහෙඨෙති, අයං යක්ඛො හිංසති,
අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො
නමුඤ්චතීති, කතමෙසං යක්ඛානං
මහායක්ඛානං සෙනාපතීනං මහා
සෙනාපතීනං.

ඉන්දො සොමො වරුණො ච
භාරද්වාජො පජාපති,
චන්දනො කාමසෙට්ඨො ච
කින්නුඝණ්ඩු නිඝණ්ඩු ච.

පණාදො ඔපමඤ්ඤො ච
දෙවසූතො ච මාතලි,
චිත්තසෙනො ච ගන්ධබ්බො
නලො රාජා ජනෙසභො.

සාතාගිරො හෙමවතො
පුණ්ණකො කරතියො ගුලො,
සිවකො මුචලින්‍දො ච
වෙස්සාමිත්තො යුගන්‍ධරො.

ගොපාලො සුප්පගෙධො ච
හිරි නෙත්ති ච මන්‍දියො
පඤ්චාලචණ්ඩො ආලවකො
පජ්ජුන්නො සුමනො

සුමුඛො දධිමුඛො,
මණිමාණිවරො දීඝො,
අථො සෙරීසකො සහ.

ඉමෙසං යක්ඛානං මහායක්ඛානං, සෙනාපතීනං මහාසෙනාපතීනං, උජ්ඣාපෙතබ්බං වික්කන්දිතබ්බං විරවිතබ්බං, අයං යක්ඛො ගණ්හාති, අයං යක්ඛො ආවිසති, අයං යක්ඛො හෙඨෙති, අයං යක්ඛො විහෙඨෙති, අයං යක්ඛො හිංසති, අයං යක්ඛො විහිංසති, අයං යක්ඛො න මුඤ්චතීති,

අයං ඛො සා මාරිස ආටානාටියා රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති හන්ද ච දානි මයං මාරිස ගච්ඡාම. බහුකිච්චා මයං බහුකරණීයාති, යස්සදානි තුම්හෙ මහාරාජානො කාලං මඤ්ඤථාති.

අථ ඛො භික්ඛවෙ චත්තාරො මහාරාජා උට්ඨායසනා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු අප්පෙකච්චෙ මම සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා තත්ථෙවන්තරධායිංසු අප්පෙකච්චෙ

---

අථ ඛො, ඉක්බිත්තෙන්; භික්ඛවෙ, මහණෙනි; චත්තාරො මහාරාජා, සතර වරම් මහරජදරුවෝ; උට්ඨායාසනා, හුනස්නෙන් නැගී; මං අභිවාදෙත්වා, මා වැඳ; පදක්ඛිණං කත්වා, ප්‍රදක්ෂිණා කොට තත්ථෙවන්තරධායිංසු, එතැන්හිම අන්තර්ධාන වූවාහුය; අප්පෙකච්චෙ, වෛශ්‍රවණයාගේ ඒ යක්ෂයෝ සමහර කෙනෙක්; මම සද්ධිං, මා හා සමග; සම්මොදිංසු, සතුටු වූවාහුය; සම්මොදනීයං, සතුටු විය යුතුවූ; සාරාණීයං, සිහිකටයුතුවූ; කථං, කථාවත්; වීතිසාරෙත්වා, කොට නිමවා; තත්ථෙවන්තරධායිංසු, එතැන්හිම අන්තර්ධාන වූවාහුය; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; අහං, මම; යෙන, යම්

යෙනාහං, තෙනඤ්ජලිං පණා- මෙත්වා තත්ථෙවන්තරධායිංසු, අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා තත්ථෙවන්තරධායිංසු, අප්පෙකච්චෙ තුණ්හීභූතා තත්ථෙවන්තරධායිංසූති.

උග්ගණ්හාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, පරියාපුණාථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, ධාරෙථ භික්ඛවෙ ආටානාටියං රක්ඛං, අත්ථසංහිතාය භික්ඛවෙ ආටානාටියා

---

තැනෙක්හිද; තෙන, එතැන්හි; අඤ්ජලිං පණාමෙත්වා, දෙහොත් මුදුනෙහි තබා වැඳ; තත්ථෙවන්තරධායිංසු, එතැන්හිම අන්තර්ධාන වූවාහුය; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; නාම ගොත්තං සාවෙත්වා, නම්ගොත් අස්වා; තත්ථෙවන්තරධායිංසු, එතැන්හිම අන්තර්ධාන වූවාහුය; අප්පෙකච්චෙ, සමහර කෙනෙක්; තුණ්හීභූතා, තුෂ්ණීම්භූතව; තත්ථෙවන්තරධායිංසූති, එතැන්හිම අන්තර්ධාන වූවාහුයි.

භික්ඛවෙ, මහණෙනි; ආටානාටියං රක්ඛං, ආටානාටිය නම් ආරක්ෂා පිරිත; උග්ගණ්හාථ, පදව්‍යඤ්ජන නොපිරිහෙළා උගනිව්; භික්ඛවෙ, මහණෙනි; ආටානාටියං රක්ඛං, ආටානාටිය නම් ආරක්ෂා පිරිත; පරියාපුණාථ, නිරන්තරයෙන් පුහුණු කරව; භික්ඛවෙ, මහණෙනි; ආටානාටියං රක්ඛං, ආටානාටිය නම් ආරක්ෂා පිරිත; ධාරෙථ, සිත්හි ලා ධරව්; භික්ඛවෙ, මහණෙනි; ආටානාටියං රක්ඛං, ආටානාටිය ආරක්ෂා පිරිත; අත්ථසංහිතාය, මෙලෝ පරලෝ දෙක්හි කැමති අර්ථයන් සිද්ධකොට දීමට සමර්ථ හෙයින් අර්ථවත්ය; භික්ඛූනං, භික්ෂූන්ටද; භික්ඛුනීනං, භික්ෂුණීන්ටද; උපාසකානං, උපාසක

රක්ඛා, භික්ඛූනං භික්ඛුණීනං, උපාසකානං උපාසිකානං, ගුත්තියා රක්ඛාය අවිහිංසාය ඵාසුවිහාරායාති. ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

**චතුත්ථ භාණවාරං නිට්ඨිතං.**

---

වරුන්ටද; උපාසිකානං, උපාසිකා වරුන්ටද යන සතර පිරිසට; ගුත්තියා, අමනුෂ්‍යයින්ගෙන් වන උවදුරු නිවාරණය පිණිසද; රක්ඛාය, ආරක්‍ෂා පිණිසද; අවිහිංසාය, ආවෙස ආදී පීඩා නොවන පිණිසද; ඵාසු විහාරායාති, සතර ඉරියව්වෙහිම යක්‍ෂ උපද්‍රව නැතිව සැපසේ විසීම පිණිසද වන්නේය; භගවා, භාග්‍යවත් තෙමේ; ඉදමවොච, වරම් රජදරුවන් විසින් පළමුවෙන් කී හෙයින් දෙව භාෂිත වූ මේ සූත්‍රය දෙවෙනි වර ශ්‍රී මුඛයෙන් දෙශනාකොට වදාළ සේක; අත්තමනා, සතුටු සිත් ඇති; තෙ භික්ඛූ, ඒ ඇසූ භික්‍ෂූන් වහන්සේ; භගවතො භාසිතං, සර්වඥයන් වහන්සේගේ වචනයට; අභිනන්දුන්ති, විශෙෂයෙන් සතුටු සන්තොෂ වූවාහුය.

**ආටානාටිය සූත්‍රය නිමියේ යි.**

---

සතර බණවර කියා නිමවන ලදී.

# ඇණවුම් පිරිත

යෙ සන්තා සන්තචිත්තා තිසරණ සරණා එත්ථ ලොකන්තරෙ වා
භුම්මා භුම්මා ච දෙවා ගුණගණ ගහණබ්‍යාවටා සබ්බකාලං
එතෙ ආයන්තු දෙවා වරකණකමයෙ මෙරුරාජෙ වසන්තො
සන්තො සන්තොසහෙතුං මුනිවරවචනං සොතුමග්ගං සමග්ගං,

සබ්බෙසු චක්කවාළෙසු යක්ඛා දෙවා ච බ්‍රහ්මුණො
යං අම්හෙහි කතං පුඤ්ඤං සබ්බසම්පත්තිසාධකං,
සබ්බෙ තං අනුමොදිත්වා සමග්ගා සාසනෙ රතා
පමාදරහිතා හොන්තු ආරක්ඛාසු විසෙසතො.

සාසනස්ස ච ලොකස්ස වුඩ්ඪී භවතු සබ්බදා
සාසනම්පි ච ලොකඤ්ච දෙවා රක්ඛන්තු සබ්බදා,
සද්ධිං හොන්තු සුඛී සබ්බෙ පරිවාරෙහි අත්තනො
අනීඝා සුමනා හොන්තු සහ සබ්බෙහි ඤාතිභි.

රාජතො වා චොරතො වා මනුස්සතො වා අමනුස්සතො වා අග්ගිතො වා උදකතො වා පිසාචතො වා ඛාණුකතො වා කණ්ටකතො වා නක්ඛත්තතො වා ජනපද රොගතො වා අසද්ධම්මතො වා අසන්දිට්ඨිතො වා අසප්පුරිසතො වා චණ්ඩහත්ථි අස්සමිග ගොන කුක්කුර අහිවිච්ඡිකමණිසප්පදීපි අච්ඡ තරච්ඡ සූකර මහිස යක්ඛ රක්ඛසාදීහි නානාභයතො වා නානාරොගතො වා නානාඋපද්දවතො වා ආරක්ඛං ගණ්හන්තු// පණිධානතො පට්ඨාය තථාගතස්ස දස පාරමියො දසඋපපාරමියො දසපරමත්ථපාරමියො පඤ්චමහාපරිච්චාගෙ තිස්සො චරියා පච්ඡිමභවෙ ගබ්භොක්කන්තිං ජාතිං අභිනික්ඛමණං පධානචරියං බොධිපල්ලඞ්කෙ මාරවිජයං සබ්බඤ්ඤුත ඤාණං පටිවෙධං නවලොකුත්තර ධම්මෙති සබ්බෙපිමෙ බුද්ධගුණෙ ආවජ්ජිත්වා වෙසාලියා තීසු පාකාරන්තරෙසු තියාම රත්තිං පරිත්තං කරොන්තො ආයස්මා ආනන්දත්ථෙරො විය කාරුඤ්ඤචිත්තං උපට්ඨපෙත්වා කොටිසතසහස්සෙසු චක්කවාළෙසු දෙවතා, යස්සාණං පතිගණ්හන්ති යඤ්ච වෙසාලියං පුරෙ, රොගාමනුස්ස දුබ්භික්ඛ සම්භූතං තිවිධං භයං, ඛිප්පමන්තරධාපෙසි පරිත්තං තං භණාමහෙ.

## බුද්ධානුස්සති භාවනාව.

1 බුද්ධානුස්සති මෙත්තා ච අසුභං මරණස්සති,
ඉති ඉමා චතුරා රක්ඛා භික්ඛු භාවෙය්‍ය සීලවා.
2 අනන්තවිත්ථාරගුණං ගුණතොනුස්සරං මුනිං,
භාවෙය්‍ය බුද්ධිමා භික්ඛු බුද්ධානුස්සතිමාදිතො.

3 සවාසනෙ කිලෙසෙසො එකො සබ්බෙ නිඝාතිය,
අහු සුසුද්ධසන්තානො පූජානඤ්ච සදාරහො.

4 සබ්බකාලගතෙ ධම්මෙ සබ්බෙ සම්මා සයං මුනි,
සබ්බාකාරෙන බුජ්ඣිත්වා එකො සබ්බඤ්ඤුතං ගතො.

5 විපස්සනාදි විජ්ජාහි සීලාදි චරණෙහි ච,
සුසමිද්ධෙහි සම්පන්නො ගගණාභෙහි නායකො.

6 සම්මා ගතො සුභං ඨානං අමොඝවචනො ච සො,
තිවිධස්සාපි ලොකස්ස ඤාතා නිරවසෙසතො.

7 අනෙකෙහි ගුණොඝෙහි සබ්බසත්තුත්තමො අහු,
අනෙකෙහි උපායෙහි නරදම්මෙ දමෙසි ච.

8 එකො සබ්බස්ස ලොකස්ස සබ්බසත්තානුසාසකො,
භාග්‍යඉස්සරියාදීනං ගුණානං පරමො නිධි,

9 පඤ්ඤස්ස සබ්බධම්මෙසු කරුණා සබ්බ ජන්තුසු,
අත්තත්ථානං පරත්ථානං සාධිකා ගුණජෙට්ඨිකා.

10 දයාය පාරමී චිත්වා පඤ්ඤායත්තාන මුද්ධරි,
උද්ධරි සබ්බධම්මෙ ච දයාමඤ්ඤෙ ච උද්ධරි.

11 දිස්සමානො පි තාවස්ස රූපකායො අචින්තියො,
අසාධාරණඤාණඩ්ඪෙ ධම්මකායෙ කථාවකාති.

---

## මෙත්තා භාවනා.

1 අත්තූපමාය සබ්බෙසං සත්තානං සුඛකාමතං,
පස්සිත්වා කමතො මෙත්තං සබ්බසත්තෙසු භාවයෙ.

2 සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො අහං නිච්චං අහං විය,
හිතා ච මෙ සුඛී හොන්තු මජ්ඣත්තා චථ වෙරිනො.

3 ඉමම්හි ගාමක්ඛෙත්තම්හි සත්තා හොන්තු සුඛී සදා,
තතො පරඤ්ච රජ්ජෙසු චක්කවාළෙසු ජන්තුනො.

4 සමන්තා චක්කවාළෙසු සත්තානන්තෙසු පාණිනො.
සුඛිනො පුග්ගලා භූතා අත්තභාවගතා සියුං.

5 තථා ඉත්ථී පුමා චෙව අරියා අනරියාපි ච,
දෙවා නරා අපායට්ඨා තථා දසදිසාසුවාති.

---

## අසුභ භාවනා.

1 අවිඤ්ඤාණසුභනිභං සවිඤ්ඤාණසුභං ඉමං,
කායං අසුභතො පස්සං අසුභං භාවයෙ යති.

2 වණ්ණසණ්ඨානගන්ධෙහි ආසයොකාසතො තථා,
පටික්කූලානි කායෙ මෙ කුණපානි ද්වි සොළස.

3 පතිතම්හාපි කුණපා ජෙගුච්ඡං කායනිස්සිතං,
ආධාරො හි සුචී තස්ස කායො තු කුණපෙ ඨිතං.

4 මීළ්හෙ කිමිව කායොයං අසුචිම්හි සමුට්ඨිතො,
අන්තො අසුචි සම්පුණ්ණො පුණ්ණවච්චකුටි විය.

5 අසුචි සන්දතෙ නිච්චං යථා මෙදකථාලිකා,
නානා කිමි කුලාවාසො පක්කචන්දනිකා විය.

6 ගණ්ඩභූතො රොගභූතො වණභූතො සමුස්සයො,
අතෙකිච්ඡොතිජෙගුච්ඡො පභින්නකුණපූපමොති.

---

## මරණානුස්සති භාවනා.

1 පවාතදීප තුල්‍යාය සායුසන්තතියාක්ඛයං,
පරූපමාය සම්පස්සං භාවයෙ මරණස්සතිං,

2 මහාසම්පත්ති සම්පත්තා යථා සත්තා මතා ඉධ,
තථා අහං මරිස්සාමි මරණං මම හෙස්සති.

3 උප්පත්තියා සහෙවෙදං මරණං ආගතං සදා,
මරණත්ථාය ඔකාසං වධකො විය එසති.

4 ඊසකං අනිවත්තන්තං සතතං ගමනුස්සුකං,
ජීවිතං උදයා අත්ථං සුරියො විය ධාවති.

5 විජ්ජුබුබ්බුල උස්සාව ජලරාජි පරික්ඛයං,
ඝාතකොව රිපු තස්ස සබ්බත්ථාපි අවාරියො.

6 සුයසත්ථාම පුඤ්ඤිද්ධි බුද්ධි වුද්ධි ජිනද්වයං,
ඝාතෙසි මරණං ඛිප්පං කා තු මාදිසකෙ කථා.

7 පච්චයානඤ්ච වෙකල්‍යා බාහිරජ්ඣත්තුපද්දවා,
මරාමොරං නිමෙසාපි මරමානො අනුක්ඛණන්ති.

---

## අට්ඨාවජ්ජනීය සංවෙගවත්ථූනි.

1 භාවෙත්වා චතුරාරක්ඛා ආවජ්ජෙය්‍ය අනන්තරං,
මහාසංවෙගවත්ථූනි අට්ඨ අට්ඨිතවීරියො.

2 ජාති ජරා ව්‍යාධි චුති අපායා අතීත අප්පත්තකවට්ටදුක්ඛං,
ඉදනි ආහාරගවෙට්ඨිදුක්ඛං සංවෙගවත්ථූනි ඉමානි අට්ඨ.

3 පාතො ච සාය මපිචෙව ඉමං විධිඤ්ඤූ,
ආසෙවතෙ සතතමත්තහිතාභිලාසී.
පප්පොති සො තිවිපුලං හතපාරිපන්ථො,
සෙට්ඨං සුඛං මුනිවිසිට්ඨමතං සුඛෙන චාති.

## රන්දෙන ගාථා.

1 සබ්බ සඞ්ඛත ධම්මෙසු ඔත්තප්පාකාරසණ්ඨිතා,
ඤාණමොහිතහාරාතං ධම්මසංවෙග සඤ්ඤිතා.

2 සසිරීකතරො නාථො කෙතුමාලායලඞ්කතො,
දක්ඛිණාවත්තකෙසොසි නීලාමලසිරොරුහො.

3 උණ්හීසසීසො රුචිරො පරිපුණ්ණසිරො වරො,
අතොලොකියමුද්ධාසි සුගන්ධතර මුද්ධනො

4 උණ්හීසරුචිරොදර ලලාටතටසොභිතො,
මුදුතුලතිභොදතඋණ්ණා මණ්ඩල මණ්ඩිතො.

5 ඉන්දචාපනිභො නීල භුතටාකසුසජ්ජිතො,
කඤ්චනංකුස සඞ්කාස තුඞ්ගනාසො විරොචති.

6 ලොචනද්වයමාභාති පඤ්චවණ්ණ සමුජ්ජලං,
දෙහං දෙව විමානම්හි මණිජාලූපමුත්තමං.

7 රංසිමාල නමො තුය්හං බුද්ධසෙනාදි පඤ්ජරං,
එවං තං බුද්ධ ජානාථ බුද්ධං දසවිලොචනං.

## ජින පඤ්ජරය.

1 ජයාසනගතා වීරා ජෙත්වා මාරං සවාහිනිං,
චතුසච්චාමතරසං යෙ පිවිංසු නරාසභා.

2 තණ්හඞ්කරාදයො බුද්ධා අට්ඨවීසති නායකා,
සබ්බෙ පතිට්ඨිතා මය්හං මත්ථකෙ තෙ මුනිස්සරා.

3. සිරෙ පතිට්ඨිතා බුද්ධා ධම්මො ච මම ලොචනෙ
සඞ්ඝො පතිට්ඨිතො මය්හං උරෙ සබ්බගුණාකරො.

4 හදයෙ අනුරුද්ධො ච සාරිපුත්තො ච දක්ඛිණෙ,
කොණ්ඩඤ්ඤො පිට්ඨිභාගස්මිං මොග්ගල්ලානොසි වාමකෙ.

5 දක්ඛිණෙ සවනෙ මය්හං ආහුං ආනන්ද රාහුලා,
කස්සපො ච මහානාමො උභොසුං වාමසොතකෙ.

6 කෙසන්තෙ පිට්ඨිභාගස්මිං සුරියො ච පභංකරො,
නිසින්නො සිරිසම්පන්නො සොභිතො මුනිපුඞ්ගවො.

7 කුමාරකස්සපො නාම මහෙසී චිත්‍රවාදකො,
සො මය්හං වදනෙ නිච්චං පතිට්ඨාසි ගුණාකරො.

8 පුණ්ණො අඞ්ගුලිමාලො ච උපාලි නන්ද සීවලී,
ථෙරා පඤ්ච ඉමෙ ජාතා ලලාටෙ තිලකා මම.

9 සෙසාසීති මහාථෙරා විජිතා ජිනසාවකා,
ජලන්තා සීල තෙජෙන අඞ්ගමඞ්ගෙසු සණ්ඨිතා.

10 රතනං පුරතො ආසි දක්ඛිණෙ මෙත්තසුත්තකං,
ධජග්ගං පච්ඡතො ආසි වාමෙ අඞ්ගුලිමාලකං.

11 ඛන්ධමොරපරිත්තඤ්ච ආටානාටිය සුත්තකං,
ආකාසච්ඡදනං ආසි සෙසා පාකාර සඤ්ඤිතා.

12 ජිනානාබලසංයුත්තෙ ධම්මපාකාරලඞ්කතෙ,
වසතො මෙ චතුකිච්චෙන සදා සම්බුද්ධ පඤ්ජරෙ.

13 වාතපිත්තාදි සංජාතා බාහිරජ්ඣත්තුපද්දවා,
අසෙසා විලයං යන්තු අනන්තගුණ තෙජසා.

14 ජිනපඤ්ජර මජ්ඣට්ඨං විහරන්තං මහීතලෙ,
සදා පලෙන්තු මං සබ්බෙ තෙ මහාපුරිසාසභා.

15 ඉච්චෙවමච්චන්ත කතො සුරක්ඛො,
ජිනානුභාවෙන ජිතුපපද්දවො,
බුද්ධානුභාවෙන හතාරිසඞ්ඝො,
චරාමි සද්ධම්මනුභාවපාලිතො.

16 ඉච්චෙවමච්චන්ත කතො සුරක්ඛො
ජිනානුභාවෙන ජිතූපපද්දවො,
ධම්මානුභාවෙන හතාරිසඞ්ඝො,
චරාමි සද්ධම්මනුභාවපාලිතො.

17 ඉච්චෙවමච්චන්ත කතො සුරක්ඛො
ජිනානුභාවෙන ජිතූපපද්දවො,
සඞ්ඝානුභාවෙන හතාරිසඞ්ඝො,
චරාමි සද්ධම්මනුභාවපාලිතො.

18 සද්ධම්මපාකාර පරක්ඛිතොස්මි
අට්ඨාරියා අට්ඨ දිසාසු හොන්ති,
එත්ථන්තරෙ අට්ඨනාථා භවන්ති,
උද්ධං විතානංව ජිනා ඨිතා මෙ.

19 භින්දන්තො මාරසෙනං මම සිරසි ඨිතො බොධිමාරුය්හ සත්ථා
මොග්ගල්ලානොසි වාමෙ වසති භුජතටෙ දක්ඛිණෙ සාරිපුත්තො
ධම්මො මජ්ඣෙ උරස්මිං විහරති භවතො මොක්ඛතොමොරයොනිං
සම්පත්තො බොධිසත්තො චරණයුගගතො භානුලොකෙකනාථො.

20 සබ්බාවමඞ්ගලමුපද්දව දුන්නිමිත්තං
සබ්බීතිරොග ගහදෛස මසෙසනින්දා,
සබ්බන්තරාය භයදුස්සුපිනං අකන්තං
බුද්ධානුභාව පවරෙන පයාතු නාසං.

21 සබ්බාවමඞ්ගලමුපද්දව දුන්නිමිත්තං
සබ්බීතිරොග ගහදෛස මසෙසනින්දා,
සබ්බන්තරාය භයදුස්සුපිනං අකන්තං
ධම්මානුභාව පවරෙන පයාතු නාසං.

22 සබ්බාවමඞ්ගමුපද්දවං දුන්නිමිත්තං
සබ්බීතිරොග ගහදෛස මසෙසනින්දා,
සබ්බන්තරාය භයදුස්සුපිනං අකන්තං
සඞ්ඝානුභාව පවරෙන පයාතු නාසං.

---

අනුත්ට කියන කල මය්හං යන්ත තුය්හං යනුද මෙ යන්ත තෙ යනුද මම යන්ත තව යනුද මං යන්ත තං යනුද චරාමි යන්ත චරාසි යනුද යොදා කියනු.

ආයුවඩ්ඪකො ධනවඩ්ඪකො යසවඩ්ඪකො සිරිවඩ්ඪකො සුඛවඩ්ඪකො හොතු සබ්බදා දුක්ඛරොග භයාවෙරා සොකාසත්තුපද්දවා අනෙකා අන්තරායාපි විනස්සන්තු ච තෙජසා ජය සිද්ධි ධනලාභං සොත්ථි භාග්‍යං සුඛං බලං සිරිආයු ච වණ්ණො ච භොගවුඩ්ඪි ච තෙ සදා සතවස්සංච ආයු ච ජයසිද්ධි ච හොතු තෙ

(සියලු රොගභයට ද යක්ෂභයට හා ග්‍රහදෝෂවලට ද යහපති)

---

## ගිනි පිරිත

ජාලො මහාජාලො ජාලං මහාජාලං ජාලිතෙ මහාජලිතෙ ජාලිතං මහාජාලිතං මුඛෙ මුඛෙ සම්පතෙන මුඛං මුඛං සම්පත්තං සුතං ගමිති සුතං ගමිති මිගසිති මිගසිති දිට්ඨලා දන්තලා මණ්ඩලා රොකිලා කරලා දුබ්බලා රිත්ති රිත්ති ලිත්ති ලිත්ති කිත්ති කිත්ති මිත්ති මිත්ති චිත්ති චිත්ති මුත්ති මුත්ති වුත්ති වුත්ති ධාරති ධාරනිති සිරිධිති මතිතෙජොජයසිද්ධි මහිද්ධි මහාගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ද්වත්තිංස මහාපුරිසලක්ඛණානුභාවෙන අසීත්‍යනුබ්‍යඤ්ජනානුභාවෙන අට්ඨුත්තරසත මඞ්ගලානුභාවෙන ඡබ්බණ්ණරංස්‍යනුභාවෙන කෙතුමාලානුභාවෙන දසපාරමිතානුභාවෙන දස උපපාරමිතානුභාවෙන දසපරමත්ථ පාරමිතානුභාවෙන සීල සමාධි පඤ්ඤානුභාවෙන බුද්ධානුභාවෙන ධම්මානුභාවෙන සංඝානුභාවෙන තෙජානුභාවෙන ඉද්ධ්‍යානුභාවෙන බලානුභාවෙන ඤෙය්‍ය ධම්මානුභාවෙන චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන නවලොකුත්තර ධම්මානුභාවෙන අට්ඨඞ්ගික මග්ගානුභාවෙන අට්ඨසමාපත්ත්‍යානුභාවෙන ඡළභිඤ්ඤානුභාවෙන චතුසච්චානුභාවෙන දසබල ඤාණානුභාවෙන සබ්බඤ්ඤුත ඤාණානුභාවෙන මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛානුභාවෙන සබ්බපරිත්තානුභාවෙන රතනත්තයානුභාවෙන රතනත්තය සරණානුභාවෙන තුය්හං සබ්බ රොග සොකුපද්දව දුක්ඛදෙමනස්සුපායාසාපි විනස්සන්තු සබ්බන්තරායාපි විනස්සන්තු සබ්බසංකප්පා තුය්හං සමිජ්ඣන්තු දීඝායුකො හොතු සතවස්සජීවෙන සමංගිකො හොතු සබ්බදා ආකාස පබ්බත වනභූමි ගඞ්ගා මහාසමුද්ද ආරක්ඛක දෙවතා සදා අම්හෙ අනුරක්ඛන්තු පදක්ඛිතො එවතු සබ්බ බුද්ධ සබ්බධම්ම සබ්බ සඞ්ඝානුභාවෙන සදා සොත්ථි භවන්තු තෙ-සබ්බ බුද්ධානුභාවෙන සබ්බධම්මානුභාවෙන සබ්බසඞ්ඝානුභාවෙන බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං ඉති තිණ්ණංරතනානං ආනුභාවෙන චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන පිටකත්තයානුභාවෙන ජිනසාවකානුභාවෙන

## අංගුලිමාල පිරිත්.

පරිත්තං යං භණන්තස්ස නිසින්නට්ඨාන ධොවනං,
උදකම්පි විනාසෙති සබ්බමෙව පරිස්සයං,
සොත්ථිනා ගබ්භවුට්ඨානං යංච සාධෙති තං ඛණෙ
ථෙරස්සඞ්ගුලිමාලස්ස ලොකනාථෙන භාසිතං
කප්පට්ඨායි මහා තෙජං පරිත්තං තං භණාමහෙ

යතොහං භගිනි අරියාය ජාතියා ජාතො නාභිජානාමි සංචිච්ච පාණං ජීවිතා වොරොපෙතා තෙන සච්චෙන සොත්ථි තෙ හොතු සොත්ථි ගබ්භස්සාති.

මේ පිරිත සර්වඥයන් වහන්සේ විසින් අඞ්ගුලිමාල තෙරුන් වහන්සේට උගන්වා වදාරණ ලදී. මෙයින් ප්‍රසූත කිරීමට අපහසු ස්ත්‍රීන්ට පිරිත් කොට පැන් යටිබඩ ගෑමෙන් ඉතා සැපසේ ප්‍රසවය සිදුවෙයි. සර්වඥයන් වහන්සේ ඒ සඳහාම වදාරණ ලදී.

## ජය පිරිත.

සිරිධිතිමතිතෙජො ජයසිද්ධි මහිද්ධි මහාගුණං අපරිමිත පුඤ්ඤාධිකාරස්ස සබ්බන්තරාය නිවාරණසමත්ථස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ද්වත්තිංස මහාපුරිසලක්ඛණානුභාවෙන අසීත්‍යනුබ්‍යඤ්ජන ලක්ඛණානුභාවෙන අට්ඨුත්තර සතමඞ්ගලානුභාවෙන ඡබ්බණ්ණරංස්‍යානුභාවෙන කෙතුමාලානුභාවෙන දස පාරමිතානුභාවෙන දස උප පාරමිතානුභාවෙන දස පාරමිතානුභාවෙන සීලසමාධි පඤ්ඤානුභාවෙන බුද්ධානුභාවෙන ධම්මානුභාවෙන ඤෙය්‍යධම්මානුභාවෙන චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන නවලොකුත්තර ධම්මානුභාවෙන අට්ඨංගිකමග්ගානුභාවෙන අට්ඨසමාපත්තියානුභාවෙන ඡළභිඤ්ඤානුභාවෙන මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛානුභාවෙන සබ්බ පාරමිතානුභාවෙන රතනත්තය සරණානුභාවෙන තුය්හං සබ්බරොග සොක උපද්දව දුක්ඛදොමනස්සුපායාසා විනස්සන්තු සබ්බ සංකප්පා තුය්හං සමිද්ධි හොන්තු සතවස්ස ජීවෙන සමංගිතා හොතු සබ්බදා ආකාස පබ්බත වනභූමි තටාක ගංගා මහාසමුද්ද ආරක්ඛක දෙවතා සදා තුම්හෙ අනුරක්ඛන්තු සබ්බ බුද්ධානුභාවෙන සබ්බධම්මානුභාවෙන සබ්බ සඞ්ඝානුභාවෙන බුද්ධ රතනං ධම්ම රතනං සංඝ රතනං තිණ්ණං රතනානං ආනුභාවෙන චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන පිටකත්තයානුභාවෙන ජිනසාවකානුභාවෙන සබ්බෙ තෙ රොගා සබ්බෙ තෙ අන්තරායා සබ්බෙ තෙ අවමඞ්ගලා විනස්සන්තු.

භාවෙන ජිනසාවකානුභාවෙන සබ්බෙ තෙ රොගා සබ්බෙ තෙ අන්තරායා සබ්බෙ තෙ උපද්දවා සබ්බෙ තෙ දුන්නිමිත්තා සබ්බෙ තෙ අවමඞ්ගලා විනස්සන්තු ආයුවඩ්ඪකො ධනවඩ්ඪකො සිරිවඩ්ඪකො යස වඩ්ඪකො බලවඩ්ඪකො වණ්ණවඩ්ඪකො සුඛවඩ්ඪකො හොතු සබ්බදා. දුක්ඛරොගභයාවෙරා සොකාසබ්බුපද්දවා අනීකා අන්තරායාච විනස්සන්තුච තෙසජා. ජයසිද්ධි ධනංලාභං සොත්ථිභාග්‍යං සුඛං බලං සිරි ආයු ච වණ්ණො ච භොගවුඩ්ඪි ච යසවා සතවස්සා ච ආයු ච ජීවසිඞ්ඪි ච හොතු තෙ. භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා සබ්බබුද්ධානුභාවෙන සදා සොත්ථි භවන්තු තෙ. පඤ්චමාරජිනො නාථො පත්තො සම්බොධිමුත්තමං චතුසච්චං පකාසෙසි මහාවීරං නමාමහං එතෙන සච්චවජ්ජෙන සබ්බමාරා පලායන්තු. තතියවාරං.

---

## අටවිසි පිරිත.

1 තණ්හංකරො මහාවීරො-මෙධංකරො මහා යසො
සරණංකරො ලොකහිතො-දීපඞ්කරො ජුතින්ධරො

2 කොණ්ඩඤ්ඤො ජනපාමොක්ඛො-මඞ්ගලො පුරිසාසභො
සුමනො සුමනො ධීරො-රෙවතො රතිවද්ධනො.

3 සොභිතො ගුණසම්පන්නො-අනොමදස්සි ජනුත්තමො.
පදුමො ලොකපජ්ජොතො-නාරදෙ වරසාරථි.

4 පදුමුත්තරො සත්ත සාරො සුමෙධො අග්ගපුග්ගලො,
සුජාතො සබ්බලොකග්ගො-පියදස්සි නරාසභො.

5 අත්ථදස්සී කාරුණිකො-ධම්මදස්සී තමොනුදෙ,
සිද්ධත්ථො අසමො ලොකෙ-තිස්සො වරද සංවරො.

6 ඵුස්සො වරද සම්බුද්ධො-විපස්සී ච අනූපමො,
සිඛී සබ්බහිතො සත්ථා-වෙස්සභූ සුඛදායකො.

7 කකුසන්ධො සත්ථවාහො-කොනාගමනො රණංජහො,
කස්සපො සිරිසම්පන්නො-ගොතමො සක්‍යපුංගවො.

8 තෙසං සච්චෙන සීලෙන-ඛන්තිමෙත්ත බලෙන ච
තෙ'පි මං අනුරක්ඛන්තු-ආරොග්‍යෙන සුඛෙන වාති.

9 යංදුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච-යොචාමනාපොසකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං-බුද්ධානුභාවෙන විනාසමෙන්තු.

යංදුන්නිමිත්තං -පෙ- ධම්මානුභාවෙන -පෙ- යංදුන්නිමිත්තං -පෙ- සංඝානුභාවෙන විනාසමෙන්තු.

1 දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා භයප්පත්තා ච නිබ්භයා,
සොකප්පත්තා ච නිස්සොකා හොන්තු සබ්බෙ'පි පාණිනො

2 එත්තාවතා ච අම්හෙහි-සම්භතං පුඤ්ඤසම්පදං,
සබ්බෙ දෙවා අනුමොදන්තු-සබ්බ සබ්බසම්පත්ති සිද්ධියා.

3 දානං දදන්තු සද්ධාය සීලං රක්ඛන්තු සබ්බදා,
භාවනාභිරතා හොන්තු-ගච්ඡන්තු දෙවතා ගතා.

4 සබ්බෙ බුද්ධා බලප්පත්තා-පච්චෙකානඤ්ච යං බලං,
අරහන්තානඤ්ච තෙජෙන-රක්ඛං බන්ධාමි සබ්බසො.

5 නක්ඛත්තයක්ඛ භූතානං-පාපග්ගහනිවාරණා,
පරිත්තස්සානුභාවෙන-හන්තු තෙසං උපද්දවෙ.

6 ආකාසට්ඨා ච භුම්මට්ඨා-දෙවානාගා මහිද්ධිකා,
පුඤ්ඤන්තං අනුමොදිත්වා-චිරං රක්ඛන්තු සාසනං.

---

## පිරිත් පේකිරීම.

අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතන නිරොධො, සළායතනනිරොධ ඵස්ස නිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදාන නිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා

ජරා මරණං සොකපරිදෙව, දුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අනෙකජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛජාති පුනප්පුනං.
ගහකාරක දිට්ඨෝසි-පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං.
විසංඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගාති.

ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති-සුපටිපන්නො භගවතො සාවකසංඝො උජුපටිපන්නො භගවතො සාවකසංඝො ඤායපටිපන්නො භගවතො සාවකසංඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසංඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

---

## ජයමඞ්ගල ගාථා.

1 බාහුං සහස්සමභිනිම්මිත සායුධං තං
ගිරිමෙඛලං උදිතඝොර සසෙනමාරං
දානාදි ධම්මවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ජයමඞ්ගලානි.

2 මාරාතිරෙක මභියුජ්ඣිත සබ්බරත්තිං
ඝොරං පනා'ලවක මක්ඛමථද්ධයක්ඛං
ඛන්තී සුදන්තවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ජයමඞ්ගලානි.

3 නාලාගිරිං ගජවරං අතිමත්තභූතං
දවග්ගිචක්කමසනීව සුදරුණං තං,
මෙත්තම්බුසෙකවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ජයමඞ්ගලානි.

4 උක්ඛිත්තඛග්ගමතිහත්ථ සුදාරුණං තං
ධාවං තියොජනපථ'ංගුලිමාලවන්තං,
ඉද්ධීභිසංඛතමනො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ජයමඞ්ගලානි.

4 කත්වාන කට්ඨමුදරං ඉව ගබ්භිනීයා
චිඤ්චාය දුට්ඨවචනං ජනකායමජ්ඣෙ,
සන්තෙන සොමවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ජයමඞ්ගලානි.

6 සච්චං විහාය මතිසච්චක වාදකෙතුං
වාදාභිරොපිතමනං අතිඅන්ධභූතං
පඤ්ඤාපදීපජලිතො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

7 නන්දො'පනන්ද භුජගං විබුධං මහිද්ධිං
පුත්තෙන ථෙරභුජගෙන දමාපයන්තො,
ඉද්ධූපදෙස විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ජයමඞ්ගලානි.

8 දුග්ගාහදිට්ඨිභුජගෙන සුදට්ඨහත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි බකාභිධානං
ඤාණාගදෙන විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ[1] ජයමඞ්ගලානි.

9 එතා'පි බුද්ධ ජයමඞ්ගල අට්ඨගාථා
යො වාචකො දින දිනෙ සරතෙ මතන්දී,
හිත්වාන නෙක විවිධානි චුපද්දවානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො සපඤ්ඤො.

භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ දෙවතා,
සබ්බ බුද්ධානුභාවෙන සදා සොත්ථි භවන්තු මෙ
භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ දෙවතා,
සබ්බ ධම්මානුභාවෙන සදා සොත්ථි භවන්තු මෙ.

භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ දෙවතා,
සබ්බ සඞ්ඝානුභාවෙන සදා සොත්ථි භවන්තු මෙ.

---

1 අනුන්ට කියන කල "තෙ" යන්න යොදා කියනු.

**පිරිත් ජේකිරීමේදී මෙහි මුල්භාගයෙහි ආවාවූ කරණීයමෙත්ත සූත්‍රය, රතන සූත්‍රය යන සූත්‍ර මෙතැනට දෙශනා කටයුතුයි.**

යස්සානිමිත්තං අවමඞ්ගලඤ්ච
යො චාමතාපො සකුණස්ස සද්දො.
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
බුද්ධා'නුභාවෙන විනාසමෙන්තු.

යස්සානිමිත්තං අවමඞ්ගලඤ්ච
යොචාමතාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
ධම්මා'නුභාවෙන විනාසමෙන්තු.

යස්සානිමිත්තං අවමඞ්ගලඤ්ච-
යො චාමතාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
සංඝානුභාවෙන විනාසමෙන්තු.

සබ්බෙ බුද්ධා බලප්පත්තා-පච්චෙකානඤ්ච යං බලං
අරහන්තානඤ්ච තෙජෙන-රක්ඛං බන්ධාමි සබ්බසො.

---

## මහා ජයමඞ්ගල ගාථා

මහාකාරුණිකො නාථො හිතාය සබ්බපාණිනං,
පූරෙත්වා පාරමී සබ්බා පත්තො සම්බොධි මුත්තමං
එතෙන සච්චවජ්ජෙන හොතු මෙ ජයමඞ්ගලං.

මහාකාරුණිකො නාථො හිතාය සබ්බපාණිනං
පූරෙත්වා පාරමී සබ්බා පත්තො සම්බොධි මුත්තමං,
එතෙන සච්චවජ්ජෙන හොතු මෙ ජයමඞ්ගලං.

මහාකාරුණිකො නාථො හිතාය සබ්බපාණිනං,
පූරෙත්වා පාරමී සබ්බා පත්තො සම්බොධි මුත්තමං
එතෙන සච්චවජ්ජෙන හොතු මෙ ජයමඞ්ගලං.

ජයන්තො බොධියා මූලෙ සක්‍යානං නන්දිවඩ්ඪනො,
එවං මය්හං ජයො හොතු ජයස්සු ජයමඞ්ගලං.

ජයන්තො බොධියා මූලෙ සක්‍යානං නන්දිවද්ධනො.
එවං මය්හං ජයො හොතු ජයස්සු ජයමඞ්ගලං.

ජයන්තො බොධියා මූලෙ සක්‍යානං නන්දිවඩ්ඪනො.
එවං මය්හං ජයො හොතු ජයස්සු ජයමඞ්ගලං.

සක්කත්වා බුද්ධරතනං ඔසධං උත්තමං වරං,
හිතං දෙවනුස්සානං බුද්ධතෙජෙන සොත්ථිනා.
නස්සන්තු'පද්දවා සබ්බෙ දුක්ඛා වූපසමෙන්තු මෙ[1]

සක්කත්වා ධම්මරතනං ඔසධං උත්තමං වරං,
පරිළාහූ'පසමනං ධම්මතෙජෙන සොත්ථිනා.
නස්සන්තු'පද්දවා සබ්බෙ භයා වූපසමෙන්තු මෙ.[1]

සක්කත්වා සඞ්ඝරතනං ඔසධං උත්තමං වරං,
ආහුණෙය්‍යං පාහුණෙය්‍යං සඞ්ඝ තෙජෙන සොත්ථිනා.
නස්සන්තු'ප්පද්දවා සබ්බෙ රොගා වූපසමෙන්තු මෙ.[1]

යං කිඤ්චි රතනං ලොකෙ විජ්ජති විවිධා පුථු,
රතනං බුද්ධ සමං නත්ථි තස්මා සොත්ථි භවන්තු මෙ.[1]

යං කිඤ්චි රතන ලොකෙ විජ්ජති විවිධා පුථු,
රතනං ධම්මසමං නත්ථි තස්මා සොත්ථි භවන්තු මෙ.[1]

යං කිඤ්චි රතනං ලොකෙ විජ්ජති විවිධා පුථු,
රතනං සඞ්ඝසමං නත්ථි තස්මා සොත්ථි භවන්තු මෙ.[1]

නත්ථි මෙ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරණං වරං
එතෙන සච්චවජ්ජෙන හොතු මෙ[1] ජයමඞ්ගලං.

නත්ථි මෙ සරණ අඤ්ඤං ධම්මො මෙ සරණං වරං
එතෙන සච්චවජ්ජෙන හොතු මෙ[1] ජයමඞ්ගලං.

නත්ථි මෙ සරණං අඤ්ඤං සඞ්ඝො මෙ සරණං වරං
එතෙන සච්චවජ්ජෙන හොතු මෙ[1] ජයමඞ්ගලං

---

1 අනුන්ට කියන කල 'මෙ' යන්න 'තෙ' යනුද 'මය්හං' යන්න 'තුය්හං' යනුද යොදා කියනු.

සබ්බීතියො විවජ්ජන්තු සබ්බරොගො විනස්සතු
මා මෙ භවත්වන්තරායො සුඛීදීඝායුකොභ.

සබ්බීතියො විවජ්ජන්තු සබ්බරොගො විනස්සතු
මා මෙ භවත්වන්තරායො සුඛීදීඝායුකොභව.

සබ්බීතියො විවජ්ජන්තු සබ්බරොගො විනස්සතු
මා මෙ භවත්වන්තරායො සුඛීදීඝායුකොභව.

භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ දෙවතා,
සබ්බබුද්ධා'නුභාවෙන සදා සොත්ථි භවන්තු මෙ.

භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ දෙවතා,
සබ්බධම්මා'නුභාවෙන සදා සොත්ථි භවන්තු මෙ.

භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ දෙවතා,
සබ්බසඞ්ඝා'නුභාවෙන සදා සොත්ථි භවන්තු මෙ.

නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගහ නිවාරණා,
පරිත්තස්සා'නුභාවෙන හන්තු තෙසං උපද්දවෙ.

නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගාහ නිවාරණා.
පරිත්තස්සා'නුභාවෙන හන්තු තෙසං උපද්දවෙ.

නක්ඛත්ත යක්ඛ භූතානං පාපග්ගහ නිවාරණා,
පරිත්තස්සා'නුභාවෙන හන්තු තෙසං උපද්දවෙ.

---

## විහාර අස්න

වෙසක් මස පුරසැටවක් පිරි සතවක්තම් තිපිය ලත් බදද, මෙ දවසැ, කටුපුළුල බද සෙංකඩගල නාථදෙවාලයට දක්ෂිණ දශාභාගයෙහිවූ පුෂ්පාරාම විහාරාභ්‍යන්තරයෙහි උපෝෂථාගාරයට බොහෝ ධාතු වරුන්වහන්සේ වඩා මහාසංඝයා වහන්සේත් රැස්ව පෙරයම් රාත්‍රියෙහි බණ සමහර කරන තැනට මේ දෙවාලයෙහි අධිගෘහීත දෙවිමහරජාණන් තමනුත් තමන්ගේ සහාය පිරිවර දෙවියනුත් සංදෘෂ්ට-සම්භක්ත දෙවියනුත් උපවෙනෙහි දෙවියනුත් නොහැර කැඳවාගෙන මඞ්ගල සූත්‍රාදි බණ අසනු පිණිස ඊම සමග

මහා සඞ්ඝයා වහන්සේ සඟව වදාළ මෙහෙවර සංඝාණත්තියා නුගුළුවා ඉයයුතු.

සගම, පස්ගම, අරත්තත, මාදන්වල, විල්වළ, කඩදෙර, මොරපාය, දිඹුල, පුසුල්පිටිය, **නියංගම්පායස්ථානය,** වල්වාසගොඩ, සැලව, අමර, මැදිලිය, දිප්පිටිය, බම්පතේ, කාරියගම, ගල්ලැල්ල, අළුත්නුවර, පරණනුවර, මාබෙල, මාකඩවර, හිගුල, **කජ්ජාගොඩ,** පදීදෙර, උතුරාවල, **අම්බුලුගල,** දනගිරිගල, වාගිරිගල, ලෙනගල, අලවතුර, වතුර, **මාකුරාව,** කවුඩුගම බිසෝවෙල, දූදිගම, අරත්දෙර, දෙරවක, මඩබඩවිට, තොටගෙදර, මදුරුපිටිය, අත්තන ගල්ල, ඌරුවෙල, ගොඩගෙදර, **දෙරණගොඩ,** යටවත්ත, රාගම, මීගමුව, දඩගමුව, දඹදෙනිය, බෙලිගල, තවගමුව, බමුණුගම, වට්ටාරම, වතුදෙණිය, පුහුරිය, ගල්බඩගම, කොල්ලුර, ඔකඳපොළ, උඩපොළ, අල්ගම, නවකෙළගමුව, **ඇත්කඳ විහාරය,** කුරුණෑගල, කුරුවෙතියාගල, ආඳුගල, ඉබ්බාගල, යක්දෙස්සාගල, තාඵගම, සංවැල්ල, කඩිකාව, මලහණේ, කබල්ලෑලෙන, නියඳවනේ, **නාගල විහාරය,** රුස්වේරුව, තලංගමුව, පෙරියකඩුව, **දේවගිරි විහාරය,** සංගමු විහාරය, උතුරුපච් විහාරය, බුජස්ලෙන, යාත්ලෙන, ජයකඩු ලෙන, සභැලෙන, කුඹුරුලෙන, රිදීලෙන, රම්බඩගල්ල, දෙල්විට, විල්ගම, අස්ගිරිය, රුසිගම, අම්බැක්ක, මිලිලවංතය, **බම්බාවිහාරය,** රත්ගිරිදඹුල්ල, සීගිරිය, කලාවැව, බළල්ලෑව, අනුරාධපුරයෙහි **ශ්‍රී මහා බොධීන් වහන්සේය,** ලෝවාමහාප්‍රසාදස්ථානය, මිරිසවැටි විහාරය, අභයගිරි විහාරය, දෙනානකය, හගිරිතකය, රත්නමාලි චෛත්‍යය, ථූපාරාම චෛත්‍යය, මිහින්තලේ, අටසැටලෙන, නිතුපත්පාණ, සුරුළුමහමුනියාව, මුත්තේස්සරම, ඇත්තල, මක්කම, මන්නාරම, මාන්තොට්ටම, පොම්පරප්පුව, මල්විල, දෙමළපට්ටනමෙහි නාග කෝවිල, **කඳුරුගොඩ විහාරය,** තෙළිපල, මල්ලාගම, මිනිවංගමු විහාරය, තත්නි දිවයින, අග්නි දිවයින, නාග දිවයින, පුවගු දිවයින, කාරදිවයින, මොල්ලියාවල, ත්‍රිකුණාමලය, විල්ගම් වෙහෙර, තිස්සමහ වෙහෙර, ඉලන්දගොඩ, කදුරුකෝට්ට යෙහි ඇතුබදය, ලංකාතිලකය, ගඩලාදෙණිය, විජයොත්පාය, **අභයගිරි විහාරය,** ජේතවන විහාරය, කපිල විහාරය, ඉසිපතනා රාමය, කුසිනාරායය, පූර්වාරාමය, දක්ෂිණාරාමය, පශ්චිමාරාමය, උත්තරාරාමය, සළුම්ණිසැය, සිළුම්ණිසැය, දෙමළමහාසැය, **පොළොන්නරු විහාරය,** සුළුන්නරු විහාරය, සිතුල්පවු විහාරය, ධනඤ්ජය විහාරය, කුකුළුවා විහාරය, දිඹුලාගල් විහාරය, තඹං වෙහෙර, මියුගුණා වෙහෙර, සොරොන්නාතොට, බදුලු වෙහෙර, ශුද්ධනපිටිය, රුහුණුබද කතරගම, උග්ගල් අළුත්නුවර

තඹගමුව, මූල්ගිරිය, **ඕවාගිරිවිහාරය,** දෙවිනුවරයෙහි දිව්‍යරාජභවනය, ඔත්පිළිමගෙය, සිටිපිළිමගෙය, ගල්ගණේ, වැලිගම අග්‍රබෝධි විහාරය, පරගොඩ විහාරය, තොටගමු විහාරය, ගලපාත විහාරය, බෝධිමලු විහාරය, **වනවාස විහාරය,** බෙන් වෙහෙර, බෙන්තොට, කළුතොට, සොරණ, විසිදූගම, කොතලාවල, රඹුක්කන, **පානදුරේ දේවාලය,** බෙල්ලන්විල, පැපිළියාන, නාවින්න, විජයාරාමය, සුභද්‍රාරාමය, ජයවර්ධන, කෝට්ටයෙහි පිළිමගෙය, ෂන්මුඛදේවාලය, කිත්සිරිමෙවන් කැලණිය, රජමහ කැලණිය, **විභීෂණ දේවාලය,** වැලිවිට, බොල්ලෑගල, සේවාගම, දිසාපතිනුගය, කඩුදෙවොල, බෝමිරිය, සංවැල්ල, කොහෙල්බටුවාව, **අතුරුගිරි විහාරය,** දෙණගමුව, දෙල්ගමුව, බටුගෙදර, දෙණවක, සපරගමුව, මාණියම්ගම් විහාරය, හිලීමලය, සමන්තකූටපර්වතය, දිවාගුහාව, බල්ලාහෙල, සිඳගල, කළුගමුව, **ගංගාතිලක විහාරය,** කුඹල්ඔලුව, අළුදෙණිය, කොටකෝදෙනිය, ඉළුපැන්දෙණිය, සේන්දෙණිය, නියගමමන, අරනාන, සත්තානාගොඩ, වේගිරිය, අම්බැක්ක, ලංකාතිලකය, වටදාගෙය, ගඩලාදෙණිය, දූලිවෙල, ගහුල්දෙණිය, උරුලෑවත්ත, කොටබෝගොඩ, රන්මුංගොඩ, දෙල්දෙණිය, මැණික්දිවෙල, මොණරාගොඩ, කොලුගල, වල්ගම්පාය, දන්තොට වතුර, **සියඹලාගොඩ,** දෛඩම්වෙල, දියකෙළිනාවෙල, සූරියගොඩ, කොබ්බෑකඩුව, ගන්නෝරුව, කුළුගම්මන, මාලගම්මන, අනාරගම, මැදවෙල ගල්ලෑල්ල, දෛලපිල්ල, අලවතුගොඩ, කොහොන, නිබ්බටුවාව, ඇඹිල්ල විහාරය, **ආලෝක විහාරය,** කුරුවාබෝගම්බර, කඩුවෙල, දුනුවිල, ඇඹෙල, නිත්තවෙල, සිරිමල්වත්ත, අමුණුගම **ගඩගාරාම විහාරය,** සෙංකඩගල අළුත් විහාරය, පරණ විහාරය, නාග විමානය, උපෝසථාරාමය, **ශ්‍රී දංෂ්ට්‍රාදළදා මන්දිරය** ඇතුළු සියලු විහාර දේවාලයවල අධිගෘහිත දෙවිමහරජාණන් තමනුත් තමන්ගේ සහාය පිරිවර දෙවියනුත් සන්දෘෂ්ට-සම්භක්ත දෙවියනු නොහැර කැඳවාගෙන මංගල සූත්‍රාදී බණ අසනු පිණිස ඊම-සමග මහා සංඝයා වහන්සේට අභිමතයේ අභිමතයේ අභිමතයේ අභිමතයි අභිමතයි අභිමතයි-සමග මහා සංඝයා වහන්සේ සඟව වදාල මෙහෙවර සංඝාණත්තිය නුගුළුවා ඉයයුතු.

## දොරකඩ අස්න

සෞශීල්‍යාදී අමිත ගුණ ගණාංගයෙන් උපලක්ෂිතවූ පින්වත් ස්වාමීන්වහන්ස! විචිත්‍රවර්ණෝපශෝභිතවූ මෙම මණ්ඩපද්වාරයෙහි මිනිස්සු ඇති–

නෛකතොජෝ බලපරාක්‍රම ප්‍රතාපාලඞ්කෘත සුරේන්ද්‍රාරාධනා වට ගියාවූ දේවදූතයා වන මම මෙහි අවුත් සිටිනෙමි-

ස්වස්ති ශ්‍රීකර මනොරම්‍ය කනකගිරි ශෘඞ්ග තුඞ්ගාලඞ්කාර ලඞ්කා පුරප්‍රවරාධීශ්වර වෛවස්වත මනුවංශ ශ්‍රී මහාසම්මත මහා රාජාධි රාජොත්තම වරවංශාභිජාත ලක්ෂණ සම්පූර්ණ මහිරක්ෂණ දක්ෂ ස්වර්ණවර සිංහාසනාරූඪ අඞ්ග වඞ්ග කලිඞ්ග තෙලිඞ්ග බඞ්ගාල පරඞ්ගි ඕලන්ද කර්ණාට ගුජ්රාදී පරමණ්ඩලෙශ්වර-ගජතුරඟ කනක මණි භූෂණ දිව්‍යාම්බර ස්වර්ණ ශිවිකාදී නානාප්‍රකාර භාගධෙය නීත-රාජ බෘන්ද නන්දිතොත්තුඞ්ග මකර තොරණ මහාද්වාර රාජිත නිත්‍ය සත්‍ය ධර්ම ප්‍රවර්ධිත-සුරරාජ සම්භොග කරරාජ ඉවතෙජ ගරරාජ දෘස්වීර රිපුරාජ ගජහාර කෘතසිත මෘගරාජ තිහරාජ කවි භොජ නරධීර මහරාජ මනුරාජ කුලරාජ යසබීජ-භූවිචාප නෘප දීප සරචාප ධරසූර බහුකොප රණචොර ජනතාප සකලාප සිඛි චාහ උපමාන සසිමාන-සිරිසාර ව්‍රතසාර ඝනසාර තර ලොකපුරන්දර පරරාජ භයඞ්කර වීරරාජ ජයඞ්කර සිරිධාරභුජන්දර භූලොකපුරන්දර දිනෙශ්වර කුලෙශ්වර ගජෙශ්වර ජිනෙශ්වර රාජපරමෙශ්වර වූ සකල ලොක දශ දිශාභ්‍යන්තරයෙහි පතළාවූ ඝනබහල රිපුතිමිර හරණ නිකර විධ්වංසනය කිරීමෙන් අරුණ තරුණ කිරණ ප්‍රභා මණ්ඩිත ප්‍රාදුර්භූත සූර්‍ය්‍යදිව්‍යරාජයා මෙන්-ශ්‍රී ලඞ්කාද්වීපයෙහි නානාවිධ ශත්‍රු අන්ධකාර සන්දෙහ දූරීභූත කෙරෙමින් ලොක ශාසනාභිවෘද්ධි වර්ධනය කිරීම සඳහා ඉන්ද්‍රොපෙන්ද්‍ර චන්ද්‍රශෙඛර ප්‍රජා පත්‍යාදි දිව්‍යරාජ සමූහයා විසින්-සකල පුණ්‍යසම්භාරයෙන් නිර්මිත කොට සිතුමිණි රුවණක් මෙන් පහළ කරන ලද්දාවූ-අපගේ දිපචක්‍රවර්ති ස්වාමීන්වහන්සේගේ අඛිලලොක පූජිත ප්‍රශස්ත ශශිබිම්බ ප්‍රතිබිම්බ ස්වරූපානු ලක්ෂණ ආඥා චක්‍රය පැවැත්තාවූ-මහීවරවධූසුලලිත ලලාටසල්ලාභ්‍යන්තර කොට ඇති සුප්‍රතිෂ්ඨිත කර්ණයුග්මයක් බඳුවූ රුහුණු මායා පිහිටි රටය යන ත්‍රිංසිහලාභ්‍යන්තර යෙන් මායා රටට අන්තගීතවූ-පෙ-මෙම පින්කමට ඇතුළත් දායක මූලික කාරකාදි සකල ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ ජනයන්ට-අරිෂ්ට දර්ශනීය දිග්දාහ උල්කා රුධිරාම්බර ධූමකෙතු වක්‍රානු වක්‍ර ග්‍රහසංඝට්ටන භූමිකම්පා-ගාන්ධර්ව ගීතපරිවෙශණ රක්තභානුප්‍රාකාර ගොපුරද්වාර

පතන වෘක්ෂවෘපිවෙෂට හෙද දිවාතුරඟ සූති නිසාකාරව පුවජ
මණ්ඩූක ශෙවත මණ්ඩූක දශීත මෘගතරප්‍රසූතිශ්වානශෘගාල
හේකාර හෝකාරාදීරව-අකාලපුෂ්පඵල කපොත උලූකනාග මෙඝ
පක්ෂි ඇටිකුළු කොබෝ ඩෙබර ගෘහප්‍රවෙශ තෙල් වේ තුඹස්
ගෙරි කුරුපහර ක්ෂුද්‍රස්ථූල මීබන්ධන ඡදනාගමන ශුනක බිළාල
කලහ කාක මෛථුන දශීන නිසා ඉන්ද්‍රචාප ශකුන ගොචර ග්‍රහණ
පශුබන්ධ වෛකෘති පාංශු වර්ෂණ භූම්‍යාරම්භ වනාරම්භ ගෘහාරම්භ
ප්‍රාකාර බන්ධනාදියෙන් සඤ්ජාත වූ ද නොහොත්-මෙම පින්කට
කරවීමට ඇතුළත් දශක මූලික කාරකාදී සකල ශ්‍රද්ධාන්විත සත්
පුරුෂ ජනයන්ගේ බාහ්‍යාභ්‍යන්තරොත්පන්න දුඃ ස්වප්න
දුර්නිමිත්ත කලිකලහ වෛකල්‍ය විග්‍රහ විවාදදීන් වත්නා වූ-
අෂ්ටාතිරෙක නවුති සඞ්ඛ්‍යාත ව්‍යාධියෙන් හා සංවත්සර ඍතු
පරිවර්තනොපක්‍රම ජන්ම නක්ෂත්‍රාධිපති ග්‍රහදූෂණාදි සකලානතරාය
සමෝපද්‍රව නිවාරණයකොට-කීර්තිතාරහාරතුෂාරකහ්ලාර ක්ෂීරස්ඵ
ටික ක්ෂීරාර්ණවාකාර-අරුණකර කිරණස්ඵුරණතරුණාරුණ
ප්‍රවලාඞ්කුර ප්‍රවාලාර්ණවවර්ණ සුරභි මරතරු හද්‍රසට නවනිධින්
සාදෘශ්‍ය වූ සකලෛශ්වර්‍ය්‍යාභිවෘද්ධි වන්නය කරනු පිරිස ධෘතරාෂ්ට්‍ර
විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණය යන සතරවරම් දෙවිමහ රජදරුවන්
ඇතුළු වූ සෑම දෙවියෝම සහ පිරිවරින් වැඩි සේක.

දෛරකඩ අස්න නිමි.

---

## අනුශාසනා.

මෙතැන්හි රැස්වූ දෙවියන්ට පඬුරු පිණිස,

සුප්‍රතිපන්න ඍජුභාවාදි රක්ෂිත පොෂිත ශීලස්කන්ධ ගුණ
ප්‍රතාපාලඞ්කෘත-ශ්‍රී නිකෙතන වර චාරුදෙහ ශ්‍රීසාර විරාජිත දූරී
කෘතාශෙෂ දොෂාන්ධකාර ප්‍රකීර්ණ නෛකගුණගණානුභාවොපපන්න
මහා සඞ්ඝයා වහන්සේ-ස්වර්ග මර්ත්‍ය පාතාල සඞ්ඛ්‍යාත භුවනත්‍රය
වාසී සමස්ත සත්ත්වහිතාභිවෘද්ධිය පිණිස-බාලජන සංසර්ග විරහිතව
අඛණ්ඩිතාචාර මණ්ඩිත පණ්ඩිත ජන භජනසෙවන පර්‍ය්‍යුපාසන
සම්භාෂණාදී වූ අටතිසක් මඞ්ගල්‍ය කථාවන් කරණකොට ගෙන-

අනල්ප කල්පොපචිත කුශල බල සමුද්භාට දශබල චතුවෛශාරද්‍ය-ඥතාදී ගුණගණමණි මයුඛ විසර විස්ඵුරිතාමිත ධර්මකාය සම්පත්තීන් විශුද්ධ වූ ත්‍රිභුවනෛක තිලක සකලඥෙය සාගර පාර ගතානෙක ගුණ රත්නමන්දිරාශෙෂ ජන වන්‍දනීය මකුට මණි මරීචි කදම්බ චුම්බිත චරණතබ කිරණ ශ්‍රෙණීන් විරාජමාන වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ විසින් මධු මද මුදිත ලලිත රතිකර මනොහර කුරවිකනාද නිර්විශෙෂාෂ්ටාඞ්ග සමුපෙත මධුර ස්වරයෙන් දෙශනා කරන ලද අඥත ජනසංසගීාප ගමාදි අෂ්ටොත්තර ත්‍රිංශත් ප්‍රභෙද මඞ්ගල ලක්ෂණයෙන් උප ලක්ෂිතවූ ධර්මාර්ථ දෙශනා ප්‍රතිවෙධ ගම්භීර සුර මනුජ සුරාසුරොරග ශ්‍රවණ ජන මන කර්ණරසායන වූ මේ මඞ්ගල සූත්‍රය ගණ සජ්ඣායනා කොට වදාළසේක. එහි පින් අනුමොදන් විය යුත්තේය. මෙම පින්කම කරවීමට දායකවූ ප්‍රධානාප්‍රධාන සකල සත්පුරුෂ සාධුජනයන් විසින් සත්දවසක් මුළුල්ලේහි දුර්වාර සපරිවාර ඝොරමාරායසිංහංකාර නිර්මාපනෛක දක්ෂ යක්ෂ රාක්ෂස ගරුඩ ගන්ධර්වසිද්ධ විද්‍යාධර මෞලි මණි මාලාලඞ්කෘත අංඝ්‍රිපද්ම යුග්මයක් ඇති බුද්ධාදි රත්නත්‍රය විෂයෙහි පවත්වන ලද-දීපපූජා ධූපපූජා පුෂ්පපූජා සුගන්ධපූජා වන්‍දන මානනාදී සත්කාර කරණයෙන් ජනිත වූ පින් අනුමෝදන් විය යුත්තේය.

ශීල සමාධි ප්‍රඥ විමුක්ති විමුක්තිඥනාද්‍යනෙක ගුණ භූෂණ භූෂිතා ශෙෂ විෂධරොරග ගරුඩ ගණ සදෘස මාර වීර තිමිර නිධන දිවාකරාකාර චාරුතර ශ්‍රී සාර විරාජිත ශ්‍රී ඝන සකල ශාසනොදය කාරී ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන සර්වීරාන්වයාගත විසුද්ධ ප්‍රාතිමොක්ෂ සංවරශීල සංසිද්ධ ප්‍රසිද්ධ ගුණ ප්‍රශස්ත මහා සඞ්ඝයා වහන්සේ විෂයෙහි පවත්වන ලද ආවාස දාන ආසනදාන ප්‍රත්‍යයදාන තාම්බූල දාන කර්පූර දාන අඤ්ජලි කර්ම සාමීචි කර්මාදියෙන් ජනිත වූ පින් අනුමෝදන් විය යුත්තේය. ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර සුයාම සන්තුෂිතාදී කාමාවචර දිව්‍යරාජයන් විසින් ද එහි පින්-පෙ-නෙකවිධ මණිසිඛර විනිර්ගත අමෘතකර කිරණ නිභ හිමපටල ප්‍රකටිත සිසිර ශ්‍රීකරවාරි පූරිත නිර්ජඣරාකුල ගිරින්ද්‍රිජ්ඣර නීලධාරාලඞ්කෘත මේරුයුගන්ධරෙෂධර කරවීක සුදර්ශන නෙමින්ධර

චිත්‍රකූටාශ්වකර්ණ කෛලාස වින්ධ්‍ය ගන්ධමාදන මන්දාවල මලයාදි පර්වතසර්වාසී දිව්‍යසමූහයා විසින් ද එහි පින් -පෙ- අන්තරීක්ෂ විමාන යෙහි වාසය කරන රවි චන්ද්‍ර කුජ බුධ ගුරු ශුක්‍ර ශනි රාහු කේතුය යන නවග්‍රහයන් විසින් ද එහි පින් -පෙ- අශ්විත්‍යාදි සප්තවිංශති නක්ෂත්‍ර තාරකාවන්ට අධිපති වූ දෙවදෛත්‍යාදි සප්තවිංශති දේවතාවන් විසින් ද එහි පින් -පෙ- මේ ශ්‍රී ලඞ්කාවීපයෙහි අධිගෘහිත බදිරදෙහලි වංශොද්භූත උත්පලවර්ණ සුමන කාර්තිකෙය විභීෂණ සඞ්ඛ්‍යාත සතරදෙවාලයෙහි දෙවිමහරජදරුවන් විසින් ද එහි පින් -පෙ- මහීවර වධූදර නාභිමණ්ඩලාකාර ප්‍රශස්ත කජඞ්ගල සලලවතී ශ්වෙතකර්ණකද්භූත උශිරධ්වජාභිධාන පශ්චිමාන්ත පරිච්ඡේද නිමිත්ත භූත නදීග්‍රාම නිගම ප්‍රතිමණ්ඩිත මධ්‍යදෙශයෙහි වූ පාණ්ඩව ගිජ්ඣකූට ඉසිගිලි වේභාර වෙපුල්‍ය පර්වතාදියෙහි අධිගෘහිත දේවතාවන් විසින් ද එහි පින් -පෙ- ඉන්ද්‍රසොමාග්නි නෛරුතිවාරුණ්‍යාදි අෂ්ටදික්පාලයන් විසින් ද එහි පින් -පෙ- ඉන්ද්‍ර සොමවරුණ භාරද්වාජ ප්‍රජාපත්‍යාදි අෂ්ටවිංශති යක්ෂ සෙනාධිපතීන් විසින්ද එහි පින් -පෙ-ආදිත්‍ය වසුවිශ්වාදි ගණ දේවතාවන් විසින් ද එහි පින් -පෙ-පුෂ්පදන්තෛරාවත්‍ය කුවේර මණිභද්‍රාදි භූතගණයා විසින් ද එහි පින් -පෙ- සියලු බොධිවෘක්ෂ චෛත්‍ය ප්‍රතිමා ගෘහ ග්‍රාමාරාම විහාර නගරාරණ්‍ය තරුවන සර සරිත් සාගර විමනාදියෙහි අධිගෘහිත දේවතාවන් විසින් ද එහි පින් -පෙ- කර්ණාට ලාට කාශ්මීර කාම්බොජ කම්පිලල හරිපුඤ්ජ නෙපාල සබර බර්බර ගුර්ජර චීන මහචීන-ගන්ධාර ජලධාර මොධාර සිරිරට්ඨ කුරුරට්ඨ මහාරට්ඨ වගුරට්ඨ සොතනන පුරතන්න ප්‍රත්‍යන්තකල්‍යාණතුරාන මකීටානන ගොටානන මහාගොටානන ගයා භෘඞ්ග අඞ්ග වඞ්ග තුඞ්ග තුරඞ්ග කඞ්ග කොඞ්ග කාලිඞ්ග තෛලිඞ්ග ලාඩ ගෞඩ ද්‍රවිඩ ඔඩ්ඩි වඞ්ග පාරසි කෞසි ඌරුමුසි කාරල කේරල නෙපාල මලයාල බඞ්ගාල රොජ වරරොජ ප්‍රතිකාල් අරමණ මලලව තොණ්ඩ පාණ්ඩි මණ්ඩල කාවෙරි කායල සියල්මාදී සර්ව දෙශාධි ගෘහිත දේවතාවන් විසින් ද එහි පින් -පෙ- වටවිටප කිසලයා ලඞ්කෘතානානාන්‍යග්‍රොධාසවත්ථවකුලපාටලාශොක සරලසාලසල්ලකී පලාශ තිකුම්භ නිම්බ ජම්බීර ජම්බු දුම්බර කදම්බාදි තරුවන ගහණයෙහි අධිගෘහිත දේවතාන් විසින් ද එහි පින් -පෙ- ගඞ්ගා යමුනා සරස්වතී සින්ධු චන්ද්‍රභාගා භගීරථී නර්මදාදි වූ ගඞ්ගාවෙහි

අධිගෘහිත දෙවතාවන් විසින් ද එහි -පෙ- ප්‍රබල පවනබල ලුලිතනිතාන්ත සන්තතස්‍යන්දිත වෙග වද් ඝිත්ඝිර පිණ්ඩ මණ්ඩිතචණ්ඩිම්ග්‍රාහ ෂණ්ඩාඛණ්ඩ නිව සිත මූඛරිත දිඞ්මුඛ විද්‍යුත්ප්‍රායකල්ලෝල මාලා සමුල්ලසිත වෙලාතට නිකට මුක්ති මුක්තා ප්‍රවාලඋත්තුඞ්ගතරඞ්ගාභිරාම චතුස්සාගර සංරක්ෂණයෙහි නියුක්තක්‍රමොන්නත නිම්බපත්‍රාකාර භ්‍රැයුක්මයකින් හා-හාව භාවලීලාකටාක්ෂ ප්‍රේමනීය නයනා මෘත ප්‍රතිභාග සමස්ත රූපලාවණ්‍යවිශෙෂ සම්පත්තියෙන් යුක්ත වූ මණිමෙඛලා නම් දිව්‍යාඞ්ගනාව විසින් ද එහි පින් -පෙ- හෙම සිංහාසනාසීන දක්ෂිණකර ගෘහිතකනක කලසාභිරාම වූ මහි කාන්තාව විසින් ද එහි පින් -පෙ- සුගන්ධ මකරන්දකිණ්ණපුෂ්ප පිඤ්ජරිත මත්තාලි නිකර නිශෙවිතවිචිත්‍ර ශත පත්‍රාසනාරූඪ වූ සරස්වතී දිව්‍යාඞ්ගනාව විසින් ද එහි පින් -පෙ- අසුර සුරාධීශ්වර වූ වෙපචිත්ත්‍යාදි අසුරෙන්ද්‍රයන් විසින් ද එහි පින් -පෙ- උරග පුරාධීශ්වර වූ මණි කණක ක්‍රිටකූට ප්‍රතිෂ්ඨිත ශඞ්ඛපාල මහාකාලාදි නාගෙන්ද්‍රයන් විසින් ද එහි පින් -පෙ- ජලස්ථල වෘක්ෂ පර්වත විශ්‍රැතානෙක ප්‍රශ්‍රවණ ජලගම්භීරකන්දරාන්තර නිස්තල නිකුඤ්ජර නිර්ඣර ප්‍රපාත ගිරි ශිඛර සිඛු පද්මාකාරාදීන් වාසස්ථානකොට ඇති දෙව සමූහයා විසින් ද එහි පින් -පෙ-

මෙසේ යථොක්ත වූ මේ සියලුම පින් අනුමෝදන්ව අධිකතර සම්පත්තීන් සමෘද්ධ වූ දිව්‍යසමූහයා විසින්- මේ පින්කම කරවීමට ඇතුළත් දායක කාරකාදීන්ට අමනොඥ අසන්තුෂ්ටදුෂ්ටාරිෂ්ට අමනුෂ්‍ය කෙනෙක් ඇත් නම්- ඔවුන්ට අවවාදනුශාසනාකොට අවවාදක්ෂම වූ නම් හිත සුඛකරණ ප්‍රවෘත්ත සාධුභාවයෙහි පිහිටුවා කායික මානසික ව්‍යසන සහිත තිථි කරණහොරා මුහුතී නවග්‍රහාදි පීඩා සන්හිඳුවා ආයුරාරොගයාදි සකලෛශ්වර්‍යාභිවෘද්ධි වඩිනය කටයුත්තේය. එසේත් අවවාදක්ෂම නොවන්නාවූ සථබ්ධ විපරීතාධ්‍යාශයෙන් යුක්ත වූ අමනුෂ්‍ය කෙනෙක් වූ නම් චතුර්දිශාධිපති වූ ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණ යන සකල යක්ෂ රාක්ෂසාධිපති සතරවරම් දෙව්මහ රජදරුවන් විසින් භික්ෂු භික්ෂුණ්‍යාදි වූ සිව්වනක් පාරිෂද්‍යයන්ගේ ගොපන රක්ෂාවරණ අවිහිංසා ඵාසුවිහරණය පිණිස මහාකරුණා ඥානයෙන්

දෙශනා කරණ ලද්දාවූ-සකල සත්‍වහිත විධායක ප්‍රබුද්ධ බුද්ධි ඇති නෙක වාදීභ කුම්භ නිර්භෙදන කෙශරීභූත මාර වීර සම්ඥ රාජොත්තමයාණන් වහන්සේ විසින්-සප්ත රත්නප්‍රාකාර ගොපුර පරිඛා පරික්ෂිප්ත රක්ෂාවරණයෙන් යුක්තවූ රාජගෘහ නගරවරා සන්නයෙහි වූ ගිජ්ඣවිහඞ්ගාකාර කූටාලඞ්කෘත හෙයින් ගිජ්ඣකූට නම් වූ පර්වත මස්තකයෙහි සන්ධ්‍යාවලා ප්‍රභාරඤ්ජිත ඉන්ද්‍රචාප විද්‍යුල්ලතාශත පරික්ෂිප්ත තරුණ රවිකිරණ කණකගිරි ශිඛරයක් සේ අචින්ත්‍යානොපමෙය වූ ප්‍රඥප්තවර බුද්ධාසනාරූඪව වැඩහිඳ දෙශනා කරන ලද්දාවූ-කොටි ශතසහස්‍ර චක්‍රවාළ වාසී යක්ෂරාක්ෂස ගරුඩ ගන්ධර්ව සිද්ධභූත ප්‍රෙත පිශාචාදීන් විසින් අවිලඞ්ඝනීය වූ ආඥා ඇති මේ ආටානාටිය සූත්‍රාන්ත ධර්මදෙශනාව-මේ වැඩ උන් දෙදෙනා වහන්සේ ඇතුළු වූ මහ සඞ්ඝයා වහන්සේ ලවා පිරුවාවන සේක-තුන්යම් රාත්‍රි මුළුල්ලෙහි ක්ෂාන්ති ක්ෂමොපශමාදීන් සිට බණ අසා ශාසනොපකාරී වූ රත්නත්‍රය ශරණපරායණ සකල සත් පුරුෂ සාධුජනයන්ට සෘතුපරිවර්තනොපක්‍රම ස්වපක්ෂ ප්‍රතිපක්ෂ යක්ෂ රාක්ෂ තරක්ෂ වෘද්ධොක්ෂ මහොක්ෂ මහිෂ මෙෂාශිර්විෂොපපද්‍රව ග්‍රහ සංක්‍රාන්ති දුඃස්වප්න දුර්නිමිත්ත කලිකලහ වෛකල්‍ය විග්‍රහ විවාදාදීන් වන්නාවූ-සකලාන්තරාය සර්වොපද්‍රව නිවාරණය කොට-කීර්තිසාර හාර තුෂාර කහ්ලාර ක්ෂීරස්ඵටික ක්ෂීරාර්ණවාකාර-අරුණකරකිරණස්ඵුරණතරුණාරුණප්‍රවාලාඞ්කුර ප්‍රවාලාර්ණවවර්ණ-සුරභි සුර තරු භද්‍රසට නවනිධීන් සාදෘශ්‍ය වූ සකලෛශ්වර්‍ය්‍යාභිවෘද්ධි වර්ධනය කටයුතු.

අනුශාසනාව නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු